199 වන කාණ්ඩය - 5 වන කලාපය
தொகுதி 199 - இல. 5
**Volume 199 - No. 5**

2011 මැයි 25 වන බදාදා
2011 மே 25, புதன்கிழமை
**Wednesday, 25th May, 2011**

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**ජනාධිපතිතුමාගෙන් ලත් සන්දේශය:**
මහජන ආරක්ෂක ප්‍රකාශනය

**නිවේදන:**
"ඒ" ස්ථාවර කාරක සභාව : අතිරේක සාමාජිකයන්
"බී" ස්ථාවර කාරක සභාව : අතිරේක සාමාජිකයන්

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
විදේශ කටයුතු අමාත්‍යතුමා සහ ඉන්දියානු නියෝජිතයන් විසින් නිකුත් කරන ලද ඒකාබද්ධ නිවේදනය

**හෘදය රෝග සැත්කම් පහසුකම් වැඩි කිරීම:**
සෞඛ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය

**නාවික හමුදා (සංශෝධන) පනත් කෙටුම්පත:**
පළමුවන වර කියවන ලදී

**පළිබෝධ නාශක පාලනය කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත:**
දෙවන වර සහ තුන්වන වර කියවා සම්මත කරන ලදී

**කල් තැබීම :**
ක්‍රීඩාවේ සංවර්ධනයට පවතින බාධාවන් ඉවත් කිරීම

**ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු**

---

# பிரதான உள்ளடக்கம்

**சனாதிபதியிடமிருந்து வந்த செய்தி:**
பொதுசனப் பாதுகாப்புப் பிரகடனம்

**அறிவிப்புக்கள்:**
நிலைக்குழு "ஏ" : மேலதிக உறுப்பினர்கள்
நிலைக்குழு "பி" : மேலதிக உறுப்பினர்கள்

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**தனி அறிவித்தல் மூல வினா**
வெளிநாட்டலுவல்கள் அமைச்சர் மற்றும் இந்தியப் பிரதிநிதிகள் விடுத்த கூட்டறிக்கை

**இருதயநோய்ச் சத்திரசிகிச்சை வசதிகளை அதிகரித்தல்:**
சுகாதார அமைச்சரினது கூற்று

**கடற்படை (திருத்தம்) சட்டமூலம்:**
முதன்முறை மதிப்பிடப்பட்டது

**பீடைகொல்லிகளைக் கட்டுப்படுத்தல் (திருத்தம்) சட்டமூலம்:**
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது

**ஒத்திவைப்புப் பிரேரணை:**
விளையாட்டு அபிவிருத்திக்கு நிலவும் இடையூறுகளை நீக்குதல்

**வினாக்களுக்கு எழுத்துமூல விடைகள்**

---

# PRINCIPAL CONTENTS

MESSAGE FROM THE PRESIDENT:
Public Security Proclamation

ANNOUNCEMENTS:
Standing Committee "A" : Additional Members
Standing Committee "B": Additional Members

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
Joint Statement made by Minister of External Affairs and Representatives of India

INCREASE OF HEART SURGERY FACILITIES:
Statement by Minister of Health

NAVY (AMENDMENT) BILL:
Read the First time.

CONTROL OF PESTICIDES (AMENDMENT) BILL:
Read a Second, and the Third time, and passed

ADJOURNMENT MOTION:
Removal of obstacles impeding Sport Development

WRITTEN ANSWERS TO QUESTIONS

# පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
## PARLIAMENT

***2011 මැයි 25 වන බදාදා***
*2011 மே 25, புதன்கிழமை*
*Wednesday, 25th May, 2011*

***අ. භා. 1.00ට පාර්ලිමේන්තුව රැස්විය. කථානායකතුමා [ගරු චමල් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.***
*பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சமல் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.*
*The Parliament met at 1.00 p.m., MR. SPEAKER [THE HON. CHAMAL RAJAPAKSA] in the Chair.*

## ජනාධිපතිතුමාගෙන් ලත් සන්දේශය
## சனாதிபதியிடமிருந்து வந்த செய்தி
## MESSAGE FROM THE PRESIDENT

### මහජන ආරක්ෂක ප්‍රකාශනය
### பொதுசனப் பாதுகாப்புப் பிரகடனம்
### PUBLIC SECURITY PROCLAMATION

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

පහත සඳහන් සන්දේශය අතිගරු ජනාධිපතිතුමාගෙන් මා වෙත ලැබී තිබෙනවා.

**"ශ්‍රී ලංකා ජනාධිපති**
இலங்கை சனாதிபதி
President of Sri Lanka

ජීජේඑල්/308
2011 මැයි මස 06 වන දින
කොළඹ දී ය.

ගරු කථානායකතුමනි,

(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 12 වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රකාශනයෙන් මා විසින් ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදාවල සියලුම සාමාජිකයින් දිවයිනේ සියලුම පරිපාලන දිස්ත්‍රික්ක තුළ සක්‍රිය සේවය සඳහා කැඳවන ලදී.

ඉහත කී ප්‍රකාශනය නිකුත් කිරීමට හේතුව ත්‍රස්තවාදය සහ යම් මහජන කැළඹීමක් වැළැක්වීම සහ මැඩ පැවැත්වීම පිණිස බව පාර්ලිමේන්තුව වෙත දැනුම් දෙනු ලැබේ.

මහින්ද රාජපක්ෂ"

# නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

පුරාවස්තු සුරැකීමේ සංවිධානය (සංස්ථාගත කිරීමේ), සීමාසහිත ශ්‍රී විද්‍යාවාස සමාජසේවා සංගමය (සංස්ථාගත කිරීමේ), පිළියන්දල ධර්මශාස්ත්‍රෝදය පිරිවෙන් විහාරස්ථ සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ), පහලගම ශ්‍රී සෝමරතන නාහිමි පදනම (සංස්ථාගත කිරීමේ), අනුරාධපුර ශ්‍රී පුෂ්පදාන සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ), ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ), ශ්‍රී ලංකා ව්‍යවහාරික සංඛ්‍යානවිද්‍යා ආයතනය (සංස්ථාගත කිරීමේ), අතරගල්ල එක්සත් ප්‍රජා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ), සමාධි ප්‍රජා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) සහ මාතර රාහුල විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය (කොළඹ ශාඛාව) (සංස්ථාගත කිරීමේ) නමැති පනත් කෙටුම්පත් සලකා බැලීම පිණිස 139 වැනි ස්ථාවර නියෝගය යටතේ "ඒ" සහ "බී" ස්ථාවර කාරක සභාවල සභාපති වශයෙන් නියෝජ්‍ය කථානායක සහ කාරක සභාපති ගරු චන්ද්‍රිම වීරක්කොඩි මහතා මවිසින් පත් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

තවද, ඒ ඒ ස්ථාවර කාරක සභාවලට අතිරේක සාමාජිකයන් වශයෙන් මවිසින් නම් කරන ලද ගරු මන්ත්‍රීවරුන්ගේ නම් සියල්ලම ඇතුළත් නිවේදන දහයක් වෙන් වෙන් වශයෙන් **සභාගත*** කරන බවත් දන්වනු කැමැත්තෙමි.

** **සභාමේසය මත තබන ලද නාම ලේඛනය :***
** சபாபீடத்தில் வைக்கப்பட்ட பெயர்ப் பட்டியல் :*
** List of names tabled:*

### "ඒ" ස්ථාවර කාරක සභාව : අතිරේක සාමාජිකයන්
### நிலைக்குழு "ஏ" : மேலதிக உறுப்பினர்கள்
### STANDING COMMITTEE "A" : ADDITIONAL MEMBERS

පුරාවස්තු සුරැකීමේ සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය
ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා
ගරු පියසේන ගමගේ මහතා
ගරු සී.පී.ඩී. බණ්ඩාරනායක මහතා
ගරු ලසන්ත අලගියවන්න මහතා
ගරු අනුර දිසානායක මහතා
ගරු පී. හැරිසන් මහතා
ගරු දුනේෂ් ගන්කන්ද මහතා
ගරු දයාසිරි ජයසේකර මහතා
ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
ගරු සීනිතම්බි යෝගේස්වරන් මහතා
ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
ගරු නෙරන්ජන් වික්‍රමසිංහ මහතා
ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා
ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා

தொல்பொருட்களை பாதுகாக்கும் ஒழுங்கமைப்பு (கூட்டி ணைத்தல்) சட்டமூலம்

கௌரவ (திருமதி) சுமேதா ஜீ. ஜயசேன
கௌரவ அநுர பிரியதர்ஷன யாப்பா
கௌரவ பியசேன கமகே
கௌரவ சீ.பி.டீ. பண்டாரநாயக்க

கௌரவ லசந்த அலகியவன்ன

கௌரவ அநுர திசாநாயக்க

கௌரவ பீ. ஹரிசன்

கௌரவ துனேஷ் கங்கந்த

கௌரவ தயாசிறி ஜயசேகர

கௌரவ ரீ. ரஞ்ஜித் த சொய்சா

கௌரவ சீனித்தம்பி யோகேஸ்வரன்

கௌரவ இரான் விக்கிரமரத்ன

கௌரவ நெரன்ஜன் விக்கிரமசிங்க

கௌரவ எரிக் பிரசன்ன வீரவர்தன

கௌரவ எம்.ஏ. சுமந்திரன்

ORGANIZATION OF PROTECTION OF ANTIQUITIES (INCORPORATION) BILL

Hon. (Mrs.) Sumedha G. Jayasena

Hon. Anura Priyadharshana Yapa

Hon. Piyasena Gamage

Hon. C. P. D. Bandaranaike

Hon. Lasantha Alagiyawanna

Hon. Anura Dissanayake

Hon. P. Harrison

Hon. Dunesh Gankanda

Hon. Dayasiri Jayasekara

Hon. T. Ranjith de Zoysa

Hon. Seeniththamby Yoheswaran

Hon. Eran Wickramaratne

Hon. Neranjan Wickremasinghe

Hon. Eric Prasanna Weerawardhana

Hon. M. A. Sumanthiran

සීමාසහිත ශ්‍රී විද්‍යාවාස සමාජසේවා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය

ගරු පියසේන ගමගේ මහතා

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා

ගරු නිර්මල කොතලාවල මහතා

ගරු සජිත් ප්‍රේමදාස මහතා

ගරු දිලිප් වෙදආරච්චි මහතා

ගරු අජිත් කුමාර මහතා

ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි

ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා

ගරු රන්ජන් රාමනායක මහතා

ගරු ජානක වක්කුඹුර මහතා

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය

ගරු එස්. ශ්‍රීතරන් මහතා

ගරු ඊ. සරවනපවන් මහතා

மட்டுப்படுத்தப்பட்ட ஸ்ரீ வித்யாவாச சமூக சேவைகள் சங்கம (கூட்டிணைத்தல்) சட்டமூலம்

கௌரவ (திருமதி) சுமேதா ஜீ. ஜயசேன

கௌரவ பியசேன கமகே

கௌரவ மஹிந்த யாப்பா அபேவர்தன

கௌரவ சந்திரசிறி கஜதீர

கௌரவ நிர்மல கொத்தலாவல

கௌரவ சஜித் பிரேமதாஸ

கௌரவ திலிப் வெதஆரச்சி

கௌரவ அஜித் குமார

கௌரவ (வண.) எல்லாவல மேதானந்த தேரர்

கௌரவ மொஹான் லால் கிரேரு

கௌரவ ரன்ஜன் ராமநாயக்க

கௌரவ ஜானக வக்கும்புர

கௌரவ (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம

கௌரவ சி. சிறீதரன்

கௌரவ ஈ. சரவணபவன்

SRI VIDYAWASA SOCIAL SERVICE ASSOCIATION LIMITED (INCORPORATION) BILL

Hon. (Mrs.) Sumedha G. Jayasena

Hon. Piyasena Gamage

Hon. Mahinda Yapa Abeywardena

Hon. Chandrasiri Gajadeera

Hon. Nirmala Kotalawala

Hon. Sajith Premadasa

Hon. Dilip Wedaarachchi

Hon. Ajith Kumara

Hon. (Ven.) Ellawala Medhananda Thero

Hon. Mohan Lal Grero

Hon Ranjan Ramanayake

Hon. Janaka Wakkumbura

Hon.(Mrs.) Sriyani Wijewickrama

Hon. S. Shritharan

Hon. E. Saravanapavan

පිළියන්දල ධර්මශාස්ත්‍රෝදය පිරිවෙන් විහාරස්ථ සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත

ගරු ජීවන් කුමාරණතුංග මහතා

ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා

ගරු ජයරත්න හේරත් මහතා

ගරු නිර්මල කොතලාවල මහතා

ගරු අචල ජාගොඩගේ මහතා

ගරු විජයදාස රාජපක්ෂ මහතා

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා

ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා

ගරු එස්. විනෝ මහතා

ගරු වික්ටර් ඇන්ටනි මහතා

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා

ගරු තිලංග සුමතිපාල මහතා

ගරු සුජීව සේනසිංහ මහතා

ගරු රෝසි සේනානායක මහත්මිය

ගරු වසන්ත සේනානායක මහතා

பிலியந்தல தர்மசாஸ்தரோதய பிரிவேன் விகாரஸ்த சங்வர்தன சபாவ (கூட்டிணைத்தல்) சட்டமூலம்

கௌரவ ஜீவன் குமாரணதுங்க

கௌரவ ஏ.டீ. சுசில் பிரேமஜயந்த

கௌரவ ஜயரத்ன ஹேரத்

கௌரவ நிர்மல கொத்தலாவல

கௌரவ அசல ஜாகொடகே

கௌரவ விஜயதாஸ ராஜபக்ஷ

கௌரவ சுனில் ஹந்துன்னெத்தி

கௌரவ செல்வம் அடைக்கலநாதன்

கௌரவ எஸ். வினோ

கௌரவ விக்டர் அந்தனீ

கௌரவ இரான் விக்கிரமரத்ன

கௌரவ திலங்க சுமதிபால

கௌரவ சுஜீவ சேனசிங்க

கௌரவ (திருமதி) ரோஸி சேனாநாயக்க

கௌரவ வசந்த சேனாநாயக்க

PILIYANDALA DHARMASHASTRODAYA PIRIVEN VIHARASTHA SANWARDHANA SABHAWA (INCORPORATION) BILL

Hon. Jeewan Kumaranatunga

Hon. A. D. Susil Premajayantha

Hon. Jayarathna Herath

Hon. Nirmala Kotalawala

Hon. Achala Jagodage

Hon. Wijeyadasa Rajapakshe

Hon. Sunil Handunnetti

Hon. Selvam Adaikkalanathan

Hon. S. Vino

Hon. Victor Antony

Hon. Eran Wickramaratne

Hon. Thilanga Sumathipala

Hon. Sujeewa Senasinghe

Hon. (Mrs.) Rosy Senanayake

Hon. Vasantha Senanayake

පහලගම ශ්‍රී සෝමරතන නාහිමි පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත

ගරු පී. දයාරත්න මහතා

ගරු එස්. බී. නාවින්න මහතා

ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මහතා

ගරු රංජිත් සියඹලාපිටිය මහතා

ගරු ලලිත් දිසානායක මහතා

ගරු ඩුලිප් විජේසේකර මහතා

ගරු කරු ජයසූරිය මහතා

ගරු විජයදාස රාජපක්ෂ මහතා

ගරු තලතා අතුකෝරල මහත්මිය

ගරු පී. අරියනේත්‍රන් මහතා

ගරු ටිරාන් අලස් මහතා

ගරු වසන්ත අලුවිහාරේ මහතා

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය

ගරු පොන්. සෙල්වරාසා මහතා

ගරු කනක හේරත් මහතා

பஹலகம சிறீ சோமரத்தன நாஹிமி தேரர் மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்

கௌரவ பீ. தயாரத்ன

கௌரவ எஸ்.பீ. நாவின்ன

கௌரவ ஏ.பி. ஜகத் புஷ்பகுமார

கௌரவ ரன்ஜித் சியம்பலாப்பிடிய

கௌரவ லலித் திசாநாயக்க

கௌரவ துலீப் விஜேசேக்கர

கௌரவ கரு ஜயசூரிய

கௌரவ விஜயதாஸ ராஜபக்ஷ

கௌரவ (திருமதி) தலதா அதுகோரல

கௌரவ பா. அரியநேத்திரன்

கௌரவ டிரான் அலஸ்

கௌரவ வசந்த அலுவிஹாரே

கௌரவ (டாக்டர்) (திருமதி) சுதர்ஷினி பர்னாந்துபுள்ளே

கௌரவ பொன். செல்வராசா

கௌரவ கனக ஹேரத்

PAHALAGAMA SRI SOMARATHANA NAYAKA THERO FOUNDATION (INCORPORATION) BILL

Hon. P. Dayaratna

Hon. S. B. Nawinne

Hon. A. P. Jagath Pushpakumara

Hon. Ranjith Siyambalapitiya

Hon. Lalith Dissanayake

Hon. Duleep Wijesekera

Hon. Karu Jayasuriya

Hon. Wijeyadasa Rajapakshe

Hon. (Mrs.) Thalatha Atukorale

Hon. P.Ariyanethran

Hon. Tiran Alles

Hon. Wasantha Aluwihare

Hon. (Dr.) (Mrs.) Sudharshini Fernandopulle

Hon. Pon. Selvarasa

Hon. Kanaka Herath

අනුරාධපුර ශ්‍රී පුෂ්පදාන සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත

ගරු තිස්ස කරල්ලියද්ද මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු දුමින්ද දිසානායක මහතා

ගරු සිරිපාල ගමලත් මහතා

ගරු ඩබ්ලිව්. බී. ඒකනායක මහතා

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු විජිත හේරත් මහතා

ගරු පී. හැරිසන් මහතා

ගරු චන්ද්‍රානි බණ්ඩාර ජයසිංහ මහත්මිය

ගරු සිවශක්ති ආනන්දන් මහතා

ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි

ගරු එස්.සී. මුතුකුමාරණ මහතා

ගරු සීනිතම්බි යෝහේස්වරන් මහතා

ගරු ශෙහාන් සේමසිංහ මහතා

அனுராதபுரம் ஸ்ரீ புஷ்பதான அபிவிருத்தி ஸ்தாபனம் (கூட்டிணைத்தல்) சட்டமூலம்

கௌரவ திஸ்ஸ கரல்லியத்த

கௌரவ எஸ்.எம். சந்திரசேன

கௌரவ துமிந்த திசாநாயக்க

கௌரவ சிறிபால கமலத்

கௌரவ டபிள்யூ. பி. ஏக்கநாயக்க

கௌரவ காமினி ஜயவிக்கிரம பெரேரா

கௌரவ லக்ஷ்மன் கிரிஎல்ல

கௌரவ விஜித ஹேரத்

கௌரவ பீ. ஹரிசன்

கௌரவ (திருமதி) சந்திராணி பண்டார ஜயசிங்க

கௌரவ சிவசக்தி ஆனந்தன்

கௌரவ (வண.) எல்லாவல மேதானந்த தேரர்

கௌரவ எஸ்.சீ. முத்துகுமாரன

கௌரவ சீனித்தம்பி யோகேஸ்வரன்

கௌரவ செஹான் சேமசிங்க

ANURADHAPURA SRI PUSHPADANA DEVELOPMENT FOUNDATION (INCORPORATION) BILL

Hon. Tissa Karalliyadda
Hon. S. M. Chandrasena
Hon. Duminda Dissanayake
Hon. Siripala Gamalath
Hon. W. B. Ekanayake
Hon. Gamini Jayawickrama Perera
Hon. Lakshman Kiriella
Hon. Vijitha Herath
Hon. P. Harrison
Hon. (Mrs.) Chandrani Bandara Jayasinghe
Hon. Sivasakthy Ananthan
Hon. (Ven.) Ellawala Medhananda Thero
Hon. S. C. Mutukumarana
Hon. Seeniththamby Yoheswaran
Hon. Shehan Semasinghe

## "බී" ස්ථාවර කාරක සභාව : අතිරේක සාමාජිකයන්
## நிலைக்குழு "பி" : மேலதிக உறுப்பினர்கள்
## STANDING COMMITTEE "B" : ADDITIONAL MEMBERS

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය
ගරු තිස්ස කරල්ලියද්ද මහතා
ගරු නිරූපමා රාජපක්ෂ මහත්මිය
ගරු එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා මහතා
ගරු අනුර දිසානායක මහතා
ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා
ගරු චන්ද්‍රානි බණ්ඩාර ජයසිංහ මහත්මිය
ගරු තලතා අතුකෝරල මහත්මිය
ගරු අනෝමා ගමගේ මහත්මිය
ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය
ගරු කමලා රණතුංග මෙනෙවිය
ගරු උපේක්ෂා ස්වර්ණමාලි මහත්මිය
ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
ගරු රෝසි සේනානායක මහත්මිය
ගරු මාලනී ෆොන්සේකා මහත්මිය

ஸ்ரீ லங்கா மகளிர் சம்மேளனம் (கூட்டிணைத்தல்) சட்டமூலம்

கௌரவ (திருமதி) சுமேதா ஜீ. ஜயசேன
கௌரவ திஸ்ஸ கரல்லியத்த
கௌரவ (திருமதி) நிரூபமா ராஜபக்ஷ
கௌரவ எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்
கௌரவ அநுர திசாநாயக்க
கௌரவ செல்வம் அடைக்கலநாதன்
கௌரவ (திருமதி) சந்திராணி பண்டார ஜயசிங்க
கௌரவ (திருமதி) தலதா அதுகோரல
கௌரவ (திருமதி) அனோமா கமகே
கௌரவ (டாக்டர்) (திருமதி) சுதர்ஷினி பர்னாந்துபுள்ளே
கௌரவ (செல்வி) கமலா ரணதுங்க
கௌரவ (திருமதி) உபேக்ஷா சுவர்ணமாலி
கௌரவ எம்.ஏ. சுமந்திரன்
கௌரவ (திருமதி) ரோஸி சேனாநாயக்க
கௌரவ (திருமதி) மாலனீ பொன்சேக்கா

SRI LANKA WOMEN'S CONFERENCE (INCORPORATION) BILL

Hon. (Mrs.) Sumedha G. Jayasena
Hon. Tissa Karalliyadda
Hon. (Mrs.) Nirupama Rajapaksa
Hon. M. L. A. M. Hizbullah
Hon. Anura Dissanayake
Hon. Selvam Adaikkalanathan
Hon. (Mrs.) Chandrani Bandara Jayasinghe
Hon. (Mrs.) Thalatha Atukorale
Hon. (Mrs.) Anoma Gamage
Hon. (Dr.) (Mrs.) Sudharshini Fernandopulle
Hon. (Ms.) Kamala Ranathunga
Hon.(Mrs.) Upeksha Swarnamali
Hon. M. A. Sumanthiran
Hon. (Mrs.) Rosy Senanayake
Hon. (Mrs.) Malani Fonseka

ශ්‍රී ලංකා ව්‍යවහාරික සංඛ්‍යානවිද්‍යා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත

ගරු රංජිත් සියඹලාපිටිය මහතා
ගරු ගීතාංජන ගුණවර්ධන මහතා
ගරු ජයරත්න හේරත් මහතා
ගරු අචල ජාගොඩගේ මහතා
ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
ගරු එස්. විනෝ මහතා
ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
ගරු දිළුම් අමුණුගම මහතා .
ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා
ගරු අජිත් පී. පෙරේරා මහතා
ගරු ජානක බණ්ඩාර මහතා
ගරු සීනිතම්බි යෝහේස්වරන් මහතා
ගරු මහාචාර්ය රාජීව විජේසිංහ මහතා
ගරු එම්.බී.ෆාරුක් මහතා

இலங்கை பிரயோக புள்ளிவிபரவியல் நிறுவகம் (கூட்டிணைத்தல்) சட்டமூலம்

கௌரவ ரன்ஜித் சியம்பலாப்பிடிய
கௌரவ கீதாஞ்ஜன குணவர்தன
கௌரவ ஜயரத்ன ஹேரத்
கௌரவ அசல ஜாகொடகே
கௌரவ ஆர். எம். ரன்ஜித் மத்துமபண்டார
கௌரவ சுனில் ஹந்துன்னெத்தி
கௌரவ எஸ். வினோ
கௌரவ அகில விராஜ் காரியவசம்
கௌரவ திலும் அமுனுகம
கௌரவ மொஹான் லால் கிரேரு
கௌரவ அஜித் பீ. பெரேரா
கௌரவ ஜானக பண்டார
கௌரவ சீனித்தம்பி யோகேஸ்வரன்
கௌரவ ராஜீவ விஜேசிங்க
கௌரவ எம்.பி. பாறூக்

INSTITUTE OF APPLIED STATISTICS, SRI LANKA (INCORPORATION) BILL

Hon. Ranjith Siyambalapitiya
Hon. Gitanjana Gunawardena
Hon. Jayarathna Herath
Hon. Achala Jagodage
Hon. R. M. Ranjith Madduma Bandara
Hon. Sunil Handunnetti
Hon. S. Vino
Hon. Akila Viraj Kariyawasam
Hon. Dilum Amunugama
Hon. Mohan Lal Grero
Hon. Ajith P. Perera
Hon. Janaka Banadara
Hon. Seeniththamby Yoheswaran
Hon. (Prof.) Rajiva Wijesinha
Hon. M. B. Farook

අතරගල්ල එක්සත් ප්‍රජා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත

ගරු පවිත්‍රාදේවී වන්නිආරච්චි මහත්මිය
ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
ගරු ටී. බී. ඒකනායක මහතා,
ගරු මුතු සිවලිංගම් මහතා
ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා
ගරු විජිත හේරත් මහතා
ගරු ගයන්ත කරුණාතිලක මහතා
ගරු ඒ. ඩී. චම්පික ප්‍රේමදාස මහතා
ගරු ඒ. විනායගමූර්ති මහතා
ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
ගරු නිරෝෂන් පෙරේරා මහතා
ගරු විදුර වික්‍රමනායක මහතා
ගරු රුවන් විජයවර්ධන මහතා
ගරු ඊ. සරවනපවන් මහතා

அத்தரகல்ல ஐக்கிய பிரஜைகளுக்கான அபிவிருத்தி அமைப்பு (கூட்டிணைத்தல்) சட்டமூலம்

கௌரவ (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி
கௌரவ (பேராசிரியர்) திஸ்ஸ விதாரண
கௌரவ லக்ஷ்மன் செனவிரத்ன
கௌரவ ரீ.பி. ஏக்கநாயக்க
கௌரவ முத்து சிவலிங்கம்
கௌரவ எச். ஆர். மித்ரபால
கௌரவ விஜித ஹேரத்
கௌரவ கயந்த கருணாதிலக்க
கௌரவ ஏ.டி. சம்பிக பிரேமதாச
கௌரவ அ. விநாயகமூர்த்தி
கௌரவ (டாக்டர்) ரமேஷ் பத்திரண
கௌரவ நிரோஷன் பெரேரா
கௌரவ விதுற விக்கிரமநாயக்க
கௌரவ ருவன் விஜேவர்தன
கௌரவ ஈ. சரவணபவன்

ATHARAGALLA UNITED COMMUNITY DEVELOPMENT FOUNDATION (INCORPORATION) BILL

Hon. (Mrs.) Pavithradevi Wanniarachchi
Hon. (Prof.) Tissa Vitarana
Hon. Lakshman Senewiratne
Hon. T. B. Ekanayake
Hon. Muthu Sivalingam
Hon. H. R. Mithrapala
Hon. Vijitha Herath
Hon. Gayantha Karunatileka
Hon. Champika Premadasa
Hon. A. Vinayagamoorthy
Hon. (Dr.) Ramesh Pathirana
Hon.  Niroshan Perera
Hon. Vidura Wickramanayaka
Hon. Ruwan Wijayawardhana
Hon. E. Saravanapavan

සමාධි ප්‍රජා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත

ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මහතා
ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා
ගරු ගාමිණී විජිත් විජිතමුණි ද සොයිසා මහතා
ගරු සරණ ගුණවර්ධන මහතා
ගරු අර්ජුන රණතුංග මහතා
ගරු මාවෛ සෝ. සේනාධිරාජා මහතා
ගරු අබ්දුල් හලීම් මහතා
ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
ගරු පී. අරියනේත්‍රන් මහතා
ගරු අශෝක් අබේසිංහ මහතා
ගරු සනී රෝහන කොඩිතුවක්කු මහතා
ගරු වයි.ජී. පද්මසිරි මහතා
ගරු තාරානාත් බස්නායක මහතා
ගරු විජයකලා මහේස්වරන් මහත්මිය
ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා

சமாதி சமூக அபிவிருத்தி மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்

கௌரவ ஏ.பீ. ஜகத் புஷ்பகுமார
கௌரவ எஸ்.எம். சந்திரசேன
கௌரவ காமினி விஜித் விஜிதமுனி சொய்சா
கௌரவ சரண குணவர்தன
கௌரவ அர்ஜுன ரணதுங்க
கௌரவ மாவை. சோ. சேனாதிராசா
கௌரவ அப்துல் ஹலீம்
கௌரவ பாலித ரங்கே பண்டார
கௌரவ பா. அரியநேத்திரன்
கௌரவ அசோக் அபேசிங்க
கௌரவ சனீ ரோஹன கொடிதுவக்கு
கௌரவ வை.ஜீ. பத்மசிரி
கௌரவ தாராநாத் பஸ்நாயக்க
கௌரவ (திருமதி) விஜயகலா மகேஸ்வரன்
கௌரவ எரிக் பிரசன்ன வீரவர்தன

SAMADHI COMMUNITY DEVELOPMENT FOUNDATION (INCORPORATION) BILL

Hon. A. P. Jagath Pushpakumara
Hon. S. M. Chandrasena
Hon. Gamini Wijith Wijithamuni de Zoysa
Hon. Sarana Gunawardena
Hon. Arjuna Ranatunga
Hon. Mavai S. Senathirajah
Hon. Abdul Haleem
Hon. Palitha Range Bandara
Hon. P. Ariyanethran
Hon. Ashok Abeysinghe
Hon. Sanee Rohana Kodithuvakku
Hon. Y. G. Padmasiri
Hon. Tharanath Basnayaka
Hon. (Mrs.) Vijayakala Maheswaran
Hon. Eric Prasanna Weerawardhana

මාතර රාහුල විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය (කොළඹ ශාඛාව) (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත

ගරු පියසේන ගමගේ මහතා
ගරු ගුණරත්න වීරකෝන් මහතා.
ගරු නිර්මල කොතලාවල මහතා
ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා
ගරු විජය දහනායක මහතා
ගරු මංගල සමරවීර මහතා
ගරු සජිත් ප්‍රේමදාස මහතා
ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
ගරු ගයන්ත කරුණාතිලක මහතා
ගරු සිවශක්ති ආනන්දන් මහතා
ගරු සනත් ජයසූරිය මහතා
ගරු බුද්ධික පතිරණ මහතා
ගරු ඒ. එම්. චාමික බුද්ධදාස මහතා
ගරු ඊ. සරවනපවන් මහතා
ගරු ශෙහාන් සේමසිංහ මහතා

மாத்தறை இராகுல கல்லூரி பழைய மாணவர் கழகம் (கொழும்புக் கிளை) (கூட்டிணைத்தல்) சட்டமூலம்

கௌரவ பியசேன கமகே
கௌரவ குணரத்ன வீரகோன்
கௌரவ நிர்மல கொத்தலாவல
கௌரவ எம்.கே.ஏ.டீ.எஸ். குணவர்தன
கௌரவ விஜய தஹநாயக்க
கௌரவ மங்கள சமரவீர
கௌரவ சஜித் பிரேமதாஸ
கௌரவ சுனில் ஹந்துன்னெத்தி
கௌரவ கயந்த கருணாதிலக்க
கௌரவ சிவசக்தி ஆனந்தன்
கௌரவ சனத் ஜயசூரிய
கௌரவ புத்திக பத்திரண
கௌரவ ஏ.எம். சாமிக புத்ததாஸ
கௌரவ ஈ. சரவணபவன்
கௌரவ செஹான் சேமசிங்க

RAHULA COLLEGE MATARA PAST STUDENTS' ASSOCIATION (COLOMBO BRANCH) (INCORPORATION) BILL

Hon. Piyasena Gamage
Hon. Gunaratne Weerakoon
Hon. Nirmala Kotalawala
Hon. M. K. A. D.S. Gunawardana
Hon. Wijaya Dahanayake
Hon. Mangala Samaraweera
Hon. Sajith Premadasa
Hon. Sunil Handunnetti
Hon. Gayantha Karunatileka
Hon. Sivasakthy Ananthan
Hon. Sanath Jayasuriya
Hon. Buddhika Pathirana
Hon. A. M. Chamika Buddhadasa
Hon. E. Saravanapavan
Hon. Shehan Semasinghe

# ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

2010 අංක 20 දරන විසර්ජන පනතේ 6 (1) වැනි වගන්තිය යටතේ ජාතික අය වැය දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂ අංක 240 යටතේ අය වැය සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය මඟින් සිදු කරන ලද පරිපූරක වෙන් කිරීම - 2011;

(235 වැනි අධිකාරය වන) රේගු ආඥාපනතේ 10 වැනි වගන්තිය යටතේ ආනයන තීරු ගාස්තු සම්බන්ධ යෝජනාව (2011.04.21) දිනැති අංක 1702/17 දරන අති විශේෂ ගැසට් පත්‍රය);

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 44 (2) වැනි ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු, 1985 අංක 48 දරන පනතින් සහ 1987 අංක 28 දරන පනතින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 (3), 14 සහ 20 වැනි වගන්ති යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2011 අප්‍රේල් මස 21 දිනැති අංක 1702/18 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියෝග;

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 44 (2) වැනි ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු, 2006 අංක 30 දරන ගෙවීම් උපක්‍රම වංචා පිළිබඳ පනතේ 8 (2) වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2008 පෙබරවාරි 14 දිනැති අංක 1536/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියෝග;

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි අනුව්‍යවස්ථාව සමඟ කියවිය යුතු, 2006 අංක 30 දරන ගෙවීම් උපක්‍රම වංචා පිළිබඳ පනතේ 8 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් එකී පනතේ 8 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ කාර්ය සඳහා විශේෂඥ මණ්ඩලයට තැනැත්තන් සහ ආයතනය පත් කරමින් සාදන ලදුව 2010 ඔක්තෝබර් 28 දිනැති අංක 1677/26 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියමය; සහ

2010 වර්ෂය සඳහා මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව. - [අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍ය ගරු දි.මු. ජයරත්න මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු එස්.බී. දිසානායක මහතා (උසස් අධ්‍යාපන අමාත්‍යතුමා)**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க - உயர் கல்வி அமைச்சர்)
(The Hon. S.B. Dissanayake - Minister of Higher Education)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(1) 2008, 2009 වර්ෂ සඳහා ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ වාර්ෂික වාර්තා;

(2) 2007 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ මානව සම්පත් අභිවර්ධන ආයතනයේ වාර්ෂික වාර්තාව සහ වාර්ෂික ගිණුම්;

(3) 2009 වර්ෂය සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව;

(4) 2007, 2008, 2009 වර්ෂ සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ වාර්ෂික වාර්තා සහ වාර්ෂික ගිණුම්;

(5) 2008 වර්ෂය සඳහා සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(6) 2005, 2006, 2007 වර්ෂ සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ වාර්ෂික වාර්තා;

(7) 2006, 2007, 2008 වර්ෂ සඳහා ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තා (පරිපාලන හා ගිණුම්);

(8) 2009 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ වාර්ෂික වර්තාව; සහ

(9) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තිස්එක්වැනි වාර්ෂික වාර්තාව-2009

මෙම වාර්තා උසස් අධ්‍යාපන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්නය?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, 2010- [බාධා කිරීමක්]

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

සකස් කර ගෙන යන්නේ. මා හිතන විධියට අපට මාස කිහිපයක් ඇතුළත 2010 වර්ෂයේ වාර්තාව ඉදිරිපත් කරන්න පුළුවන්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමනි, රටේ අනාගතය-[බාධා කිරීමක්]

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

මෙතැන ප්‍රමාදයක් තිබෙනවා, දිගටම. [බාධා කිරීමක්]ඔව්. අප ඒ නිසාම තමයි පැරණි වාර්තා සියල්ල ඉදිරිපත් කරමින් යන්නේ. අප හිතන විධියට 2010 වර්ෂයේ වාර්තාවත් අපට ඉතා ඉක්මනින් ඉදිරිපත් කරන්නට පුළුවන්.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகாலமைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)

ගරු කථානායකතුමනි, සාම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2008 වර්ෂය සඳහා ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් ප්‍රකාශනය ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව සාම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු පී. දයාරත්න මහතා (ආහාර සුරක්ෂිතතාවය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பீ. தயாரத்ன - உணவுப் பாதுகாப்பு அமைச்சர்)
(The Hon. P. Dayaratna - Minister of Food Security)

ගරු කථානායකතුමනි, මම පිළියන්දල, බෝකුන්දර, කුරුදුවත්ත පාර, අංක 240/16 දරන ස්ථානයේ පදිංචි විජිත වන්නිආරච්චි මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය (පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன - பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena - Minister of Parliamentary Affairs)

ගරු කථානායකතුමනි, මම වැලිමඩ, බ/වැලිමඩ මධ්‍ය මහා විද්‍යාලයේ සේවයේ නියුතු ඩී.එම්. කරුණාසේන මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා - පැමිණ නැත.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**

(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகாலமைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)

(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) කොළඹ 05, තිඹිරිගස්යාය පාර, අංක 131/4 දරන ස්ථානයේ පදිංචි ප්‍රේමා විජේසිංහ මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) කෝට්ටේ, මාදිවෙල, තලවතුගොඩ පාර, අංක 36 දරන ස්ථානයේ පදිංචි ඒ. කුසුමාවතී මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

**කථානායකතුමා**

(சபாநாயகர் அவர்கள்)

(Mr. Speaker)

ගරු ගාමිණී ලොකුගේ මහතා - පැමිණ නැත.

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා (කෘෂිකර්ම අමාත්‍යතුමා)**

(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன - கமத்தொழில் அமைச்சர்)

(The Hon. Mahinda Yapa Abeywardena - Minister of Agriculture)

ගරු කථානායකතුමනි, මම මාතර, වැවහමන්දූව, ප්‍රැන්සිස් කණ්ඩම්බි මාවත, අංක 68/1 දරන ස්ථානයේ පදිංචි වයි.කේ. කුලරත්න මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**කථානායකතුමා**

(சபாநாயகர் அவர்கள்)

(Mr. Speaker)

ගරු ඩිලාන් පෙරේරා මහතා - පැමිණ නැත.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා (සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා)**

(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து - கூட்டுறவு, உள்நாட்டு வர்த்தக அமைச்சர்)

(The Hon. Johnston Fernando - Minister of Co-operatives and Internal Trade)

ගරු කථානායකතුමනි, මම නිකවැරටිය, සේනානායකපුර, තොරණ හංදිය පදිංචි ඩී.එම්. ජයසුන්දර මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**කථානායකතුමා**

(சபாநாயகர் அவர்கள்)

(Mr. Speaker)

ගරු ජගත් බාලසූරිය මහතා - පැමිණ නැත.

**ගරු වාසුදේව නානායක්කාර මහතා (ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යතුමා)**

(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார - தேசிய மொழிகள், சமூக ஒருமைப்பாட்டு அமைச்சர்)

(The Hon. Vasudeva Nanayakkara - Minister of National Languages and Social Integration)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් හත පිළිගන්වමි.

(1) කළුතර උතුර, පන්සල පාර, අංක 37/5 බී. දරන ස්ථානයේ පදිංචි එස්.පී. ජයසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) කොළඹ 01, බ්‍රිස්ටල් වීදිය, අංක 29,1/1, දරන ස්ථානයේ පදිංචි බී.ඩී. සැමසන් මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) ඇහැලියගොඩ, කෙළින් වීදිය, අංක 277/ඒ. දරන ස්ථානයේ පදිංචි එම්.ටී.ඒ. මන්සූර් මහතාගෙන් ලැබුණු පෙත්සම;

(4) කුරුවිට, පැරඩයිස්, නව ජනපදය අංක 7 දරන ස්ථානයේ පදිංචි වී.පී. මිත්‍රපාල මහතාගෙන් ලැබුණු පෙත්සම;

(5) කටුගස්තොට, සේනාරත්ගම, අංක 106 ඒ. දරන ස්ථානයේ පදිංචි එම්.ජී. කරුණාරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම;

(6) අම්තිරිගල, පල්ලේකණුගල, "ශාන්තසිරි" නිවසෙහි පදිංචි වයි. ධර්මසේන මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(7) කුඩා වස්කඩුව, මානගොඩ, බණ්ඩාරගම පාර, අංක 32 ඒ. දරන ස්ථානයේ පදිංචි බී. සරත් චන්ද්‍රසිරි මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே - கடற்றொழில், நீரக வளமூலங்கள் அபிவிருத்தி பிரதி அமைச்சர்)

(The Hon. Susantha Punchinilame - Deputy Minister of Fisheries and Aquatic Resources Development)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් හතර පිළිගන්වමි.

(1) කළුතර උතුර, සමුද්‍රාසන්න පාර, අංක 14/11 දරන ස්ථානයේ පදිංචි එෆ්.ආර්. රජෙල් මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) කන්තලේ, රජඇල, යුනිට් 04, අංක 721 දරන ස්ථානයේ පදිංචි අයි.එම්. පියදාස මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) කන්තලේ, මොල්ලිපොතාන, සාලියපුර, අංක 1012/13 දරන ස්ථානයේ පදිංචි කේ.ජී. අජිත් දිසානායක මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(4) චීන වරාය, 6 කණුව, කප්පල්තුරෙයි, විලංකුලම, වැව් මාළු ධීවර සංගමයේ ටී. සුබ්‍රමනියම් තක්ෂණම් මහතාගෙන් ලැබුණු පෙත්සම.

**කථානායකතුමා**

(சபாநாயகர் அவர்கள்)

(Mr. Speaker)

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා - පැමිණ නැත.

**ගරු සී.පී.ඩී. බණ්ඩාරනායක මහතා (දේශීය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு சீ.பீ.டி. பண்டாரநாயக்க - சுதேச மருத்துவத்துறை பிரதி அமைச்சர்)

(The Hon. C.P.D. Bandaranaike - Deputy Minister of Indigenous Medicine)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) උඩුගම්පොල, වීදිය වත්ත, සුසිරි මාවත, අංක 31/1 දරන ස්ථානයේ පදිංචි එම්. අරුණ ප්‍රියන්ජිත් මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) ගම්පහ, තිලක පාර, අංක 29 දරන ස්ථානයේ පදිංචි කේ.එම්.එස්.එස්. පුෂ්පකුමාර මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) රාගම, අරලිය උයන, අංක 35/58 දරන ස්ථානයේ පදිංචි එල්.ආර්. ඥානරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු දුමින්ද දිසානායක මහතා - පැමිණ නැත.

**ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා (පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எச். ஆர். மித்ரபால - கால்நடைவளர்ப்பு, கிராமிய சனசமூக அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. H.R. Mithrapala - Deputy Minister of Livestock and Rural Community Development)
ගරු කථානායකතුමනි, මම බොරලැස්ගමුව, පිරිවෙන පාර, අංක 114/7 දරන ස්ථානයේ පදිංචි සී.ඩී.එච්. සමරප්පුලි මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ෆයිසර් මුස්තාපා මහතා - පැමිණ නැත.

**ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)
ගරු කථානායකතුමනි, මම මීරිගම, පහළගම, කිතුල්වල, අංක 45, "උදාර" නිවසෙහි පදිංචි පී.ඩී. සුනිල් ආරියරත්න මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**ගරු ඩබ්ලිව්.බී. ඒකනායක මහතා (වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு டபிள்யு.பி. ஏக்கநாயக்க - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ பிரதி அமைச்சர்)
(The Hon. W.B. Ekanayake - Deputy Minister of Irrigation and Water Resources Management)
ගරු කථානායකතුමනි, මම අනුරාධපුරය, 3 වන පියවර නො. 3187 දරන ස්ථානයේ පදිංචි ඩබ්ලිව්. ශිරානි ධම්මිකා මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා (බුද්ධ ශාසන හා ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எம்.கே.ஏ.டி.எஸ். குணவர்தன - பௌத்த சாசன, மத அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. M.K.A.D.S. Gunawardana - Deputy Minister of Buddha Sasana and Religious Affairs)
ගරු කථානායකතුමනි, මම කන්තලේ, වෙන්ඩ්‍රාසන්පුර, යුනිට් 15, අංක 1039/සී. දරන ස්ථානයේ පදිංචි එස්.එස්.එල්. සේනාධීර මහතාගෙන්ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**ගරු තිස්ස අත්තනායක මහතා**
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) දිගන, අළුත්වත්ත පාර, ස්වශක්ති මහවැලි නිවාස සංකීර්ණය, අංක 09 දරන ස්ථානයේ පදිංචි එම්.එම්. අබේරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) නෙළුන්දෙණිය, බංගලාතැන්න පදිංචි එස්.ඒ. ගුණසේකර මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) රාගම, හොරපේ, පන්සල පාර, අංක 53 දරන ස්ථානයේ පදිංචි එච්. ඩොමිනික් මෙන්ඩිස් මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) කඳාන, උස්වත්ත, දැවතොටුපොළ පාර, අංක 97/7 බී. දරන ස්ථානයේ පදිංචි ජී.එස්. ප්‍රනාන්දු මහතාගෙන් ලැබුණු පෙත්සම.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු චන්ද්‍රානි බණ්ඩාර ජයසිංහ මහත්මිය - පැමිණ නැත.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) මාදම්පේ, කැරුක්කුවටවනල පදිංචි කේ.එච්.ඒ. පෝල් රන්ජිත් මහතාගෙන් ලැබුණු පෙත්සම් දෙක;

(2) ඉළුක්හේන, කප්පන්ගමුව, අංක 233 දරන ස්ථානයේ පදිංචි ටී.එල්. චන්ද්‍රසේකර මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) පිළිමතලාව, ගිරාගම බේකරිය අංක 210 දරන ස්ථානයේ පදිංචි පී.කේ. විතානගේ මහතාගෙන් ලැබුණු පෙත්සම.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු අජිත් කුමාර මහතා - පැමිණ නැත.

ගරු දයාසිරි ජයසේකර මහතා - පැමිණ නැත.

**ගරු වික්ටර් ඇන්ටනි මහතා**
(மாண்புமிகு விக்டர் அந்தனீ)
(The Hon.Victor Antony)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) පනිරෙන්ඩාව, ඌරලිය, "ජනනි භාග්‍යා" නිවසෙහි පදිංචි ඒ.එම්.එස්.පී. අත්තනායක මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) හලාවත, සවරාන, ජයරත්නපුර පදිංචි ඒ.එම්.ඒ. ලතීප් මහතාගෙන් ලැබුණු පෙත්සම.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු සනත් ජයසූරිය මහතා - පැමිණ නැත.

ගරු බුද්ධික පතිරණ මහතා - පැමිණ නැත.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)
ගරු කථානායකතුමනි, මම දංකොටුව, මැටිකොටුව පාර, අංක 66 සී. දරන ස්ථානයේ පදිංචි එච්.ඒ.එම්. පෙරේරා මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**ගරු එස්. සී. මුතුකුමාරණ මහතා**
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரன)
(The Hon. S.C. Mutukumarana)

ගරු කථානායකතුමනි, මම මෙගොඩවැව, යකල්ල, හුරුළුවැව පාර පදිංචි අසංක ජයනාත් ප්‍රේමසිරි මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු නාමල් රාජපක්ෂ මහතා - පැමිණ නැත.

**ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා**
(மாண்புமிகு உதித் லொக்குபண்டார)
(The Hon. Udith Lokubandara)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) බදුල්ල, බදුලුඔය, කරමැටිය, අංක 2/10 දරන ස්ථානයේ පදිංචි ඩී.එම්. තිලකරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) කොළඹ 01, මහ ලේකම් ගොඩනැඟිල්ල, 3 වන මහල, පොලිස් මත් ද්‍රව්‍ය නාශක කාර්යාලයේ සේවයේ නියුතු ඩබ්ලිව්.ඒ.ජී. කීර්ති මහතාගෙන් ලැබුණු පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***

*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*

*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### ලංකා විදුලිබල මණ්ඩලය : ණය
### இலங்கை மின்சார சபை : கடன்
### CEYLON ELECTRICITY BOARD : DEBTS

0317/'10

1. **ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ලංකා විදුලිබල මණ්ඩලයට ලැබිය යුතු මුළු ණය මුදලේ ප්‍රමාණය කොපමණද;

(ii) ලංකා විදුලිබල මණ්ඩලයට වැඩිම මුදලක් ගෙවිය යුතු ණය ගැතියන් දස දෙනාගේ නම් කවරේද;

(iii) ලංකා විදුලිබල මණ්ඩලයේ අධික ණය බර හේතුවෙන් එය ලබා ගත් ණය මුදල් සඳහා ගෙවිය යුතු පොලී ප්‍රමාණය කොපමණද;

(iv) මෙම තත්ත්වයෙන් මිදීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද;

(v) ලංකා විදුලිබල මණ්ඩලය තම ණය හිමියන්ට ගෙවිය යුතු මුදල් ප්‍රමාණය කොපමණද;

(vi) ලංකා විදුලිබල මණ්ඩලය වැඩිම මුදලක් ගෙවිය යුතු ණය හිමියන් දස දෙනාගේ නම් කවරේද;

(vii) පසු ගිය වර්ෂ හය තුළ එම මුදල් ලැබිය යුතුව තිබූ දිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) විදුලි මිල ඉහළ යෑමට හේතු වී ඇත්තේ ලංකා විදුලිබල මණ්ඩලයේ අකාර්යක්ෂමතාව සහ එය විසින් ලබා ගෙන ඇති අධික ණය බව සත්‍යයක්ද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ලංකා විදුලිබල මණ්ඩලයට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ප්‍රකාශිත කොන්දේසි කවරේද;

(ii) ලංකා විදුලි බල මණ්ඩලය එම කොන්දේසි ඉටු කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද ?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

மின்வலு, எரிசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை மின்சார சபைக்கு செலுத்த வேண்டிய தாக உள்ள மொத்த கடன் தொகை எவ்வளவு என்பதையும்;

(ii) இலங்கை மின்சார சபைக்கான பத்து பெரிய கடன்பட்டோரின் பெயர்களையும்;

(iii) உயர்ந்த கடன் காரணமாக CEB ஆல் பெறப்பட்ட கடன்களுக்காக செலுத்த வேண்டிய வட்டியையும்;

(iv) இந்த நிலைமையை சமாளிப்பதற்கு எடுக்கப்படும் நடவடிக்கையையும்;

(v) கடன் கொடுத்தோருக்கு இலங்கை மின்சார சபை செலுத்தவேண்டியுள்ள தொகையையும்;

(vi) இலங்கை மின்சார சபையின் மிகப்பெரிய கடன் கொடுத்தோர் பத்து பேரின் பெயர்களையும்;

(vii) கடந்த ஆறு வருடங்களாக அப்பணம் செலுத்தப்பட வேண்டிய திகதிகளையும்

அவர் இச்சபைக்கு தெரிவிப்பாரா?

(ஆ) இலங்கை மின்சார சபையின் செயல்திறன் இன்மையும், அதன் உயர்ந்தளவு கடன்களுமே உயர்ந்த மின்கட்டணங் களுக்கும் எரிபொருள் விலைகளுக்குமான காரணங்க ளாகும் என்பது சரியானதா?

(இ) (i) இலங்கை மின்சார சபை மற்றும் இலங்கை பெற்றோலியக் கூட்டுத்தாபனம் ஆகியவற்றின் மீது ச.நா.நி இனால் பிரகடனப்படுத்தப்பட்ட நிபந்தனை களையும்,

(ii) அந் நிபந்தனைகளை இலங்கை மின்சாரசபையும், இலங்கை பெற்றோலியக் கூட்டுத்தாபனமும் நிறைவேற்றப் போகின்றனவா என்பதையும்

அவர் தெரிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Power and Energy:

(a) Will he inform this House-

(i) the total outstanding debts to Ceylon Electricity Board ;

(ii) the names of the ten biggest debtors to CEB ;

(iii) the interest cost required to pay for the money borrowed by CEB owing to its high debts;

(iv) the action that is being taken to overcome this situation;

(v) the amount that the CEB owes to its creditors;

(vi) the names of the 10 biggest creditors of CEB; and

(vii) the dates from which the money is due for the last 6 years?

(b) Whether it is correct, that the reasons for high Electricity prices are the inefficiency and high debts of CEB?

(c) Will he state-

(i) the conditions declared by the IMF on CEB ; and

(ii) whether the CEB is going to meet those conditions?

(d) If not, why?

**ගරු පාඨලී චම්පික රණවක මහතා (විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා)**

(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க - மின்வலு, எரிசக்தி அமைச்சர்)

(The Hon. Patali Champika Ranawaka - Minister of Power and Energy)

(අ) (i) 2010.10.31 දිනට ලංකා විදුලිබල මණ්ඩලය වෙත ඇති මුළු ණය ප්‍රමාණය

| | |
|---|---|
| වෙළඳ ණය | රු. 989,090,226.00 |
| විදි ආලෝකකරණය ණයගැතියෝ | රු. 7,533,786,268.00 |
| | 8,522,876,494.00 |

(ii)

| නම | | ලිපිනය | මුදල(රු.) |
|---|---|---|---|
| අණ දෙන නිලධාරි | ශ්‍රී ලංකා නාවික හමුදාව | ත්‍රිකුණාමලය | 110,253,571 |
| මෝල් කළමනාකරු | ජාතික කඩදාසි සංස්ථාව | කඩදාසි මෝල් අංශය | 102,736,400 |
| ගණකාධිකාරි (මෝල්) | ජාතික කඩදාසි සංස්ථාව | වාලච්චේනේ | 81,830,583 |
| සභාපති | ශ්‍රී ලංකා සීනි සංස්ථාව | කන්තලේ | 72,018,416 |
| අධ්‍යක්ෂ | ශික්ෂණ රෝහල | යාපනය | 42,342,216 |
| දිසාපති, වව්නියාව දිස්ත්‍රික්කය | පුන්නොදාම් සුබසාධක මධ්‍යස්ථානය | පුන්නොදාම් | 25,904,878 |
| සාමාන්‍යාධිකාරි | මාර්ග සංවර්ධන අධිකාරිය | සෙත්සිරිපාය, බත්තරමුල්ල | 21,403,644 |
| වෛද්‍ය අධිකාරි | මහ රෝහල | අනුරාධපුරය | 19,800,240 |
| ස්ථානභාර නිලධාරි | හමුදා කඳවුරු මූලස්ථානය | පලාලි | 19,557,004 |
| දිසාපති, වව්නියාව | මැණික් ෆාම් සහන ගම්මාන | කලාප 1, චෙට්ටිකුලම් | 17,872,934 |

(iii) අධික ණය බරක් නොමැත. එහෙත් සාමාන්‍ය මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාමට අවශ්‍ය පහසුකම් ලබා ගැනීමට 1971 අංක 38 දරන පනතේ විධි විධාන මත භාණ්ඩාගාර අනුමැතිය යටතේ රු. මිලියන 3,000ක අයිරා පහසුකම් හා රු. මිලියන 20,000ක කෙටි කාලීන ණය පහසුකම් සඳහා ප්‍රතිපාදන සලසා තිබේ.

(iv) පැන නොනඟී.

(v) නැත.

(vi) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ගෙවිය යුතු රු. 51,741,355/- මුදල භාණ්ඩාගාරය විසින් පවරා ගැනීමට එකඟත්වය පළ කර ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කර ගෙන යනු ලැබේ.

(vii) පැන නොනඟී.

(ආ) මෙය සාවද්‍යය. පහත සඳහන් විදුලි ඒකක පිරිවැය සහ විකුණුම් මිල සමඟ සසඳන විට තත්ත්වය අනාවරණය වේ.

| වර්ෂය | පුද්ගලික සැපයුම්කරුවන්ගෙන් විදුලි ඒකකයක් මිලදී ගත් මුදල (රු) | ලංවීමට පමණක් විදුලි ඒකකයක් ජනනය කිරීමට වැය වූ පිරිවැය (රු) | විදුලි ඒකකයක් විකිණීමෙන් ලත් ආදායම (රු) |
|---|---|---|---|
| 1994 | - | 0.31 | 3.76 |
| 1995 | - | 0.32 | 3.70 |
| 1996 | - | 1.45 | 4.02 |
| 1997 | - | 1.70 | 4.15 |
| 1998 | ඒෂියා පවර් - Rs.4.16 | 1.18 | 4.46 |
| | ලක්දනව් - Rs.3.93 | | |
| | කුල්වියාර් - මාලබේ - Rs.6.82 | | |
| | කුල්වියාර් - KKS - Rs.6.07 | | |
| 1999 | ඒෂියා පවර් - Rs.4.87 | 1.27 | 4.43 |
| | ලක්දනව් - Rs.4.16 | | |
| | කුල්වියාර් - මාලබේ - Rs.6.77 | | |
| | කුල්වියාර් - KKS - Rs.6.09 | | |
| 2000 | ඒෂියා පවර් - Rs.5.46 | 3.13 | 4.53 |
| | ලක්දනව් -Rs.4.60 | | |
| | කුල්වියාර් - මාලබේ - -- | | |
| | කුල්වියාර් - KKS - Rs.8.36 | | |
| | ලක්දනව් (Emergency) - Rs.9.70 | | |
| | කලම්බු පවර් (Barge) - Rs. 5.67 | | |
| 2001 | ඒෂියා පවර් - Rs.7.20 | 3.75 | 5.48 |
| | ලක්දනව් - Rs.6.44 | | |
| | කුල්වියාර් - මාලබේ - -- | | |
| | කුල්වියාර් - KKS - Rs.9.11 | | |
| | ලක්දනව් (Emergency) -Rs.10.37 | | |
| | කලම්බු පවර් (Barge) - Rs. 6.29 | | |

| වර්ෂය | පුද්ගලික සැපයුම්කරුවන්ගෙන් විදුලි ඒකකයක් මිලදී ගත් මුදල (රු) | ලංවීමට පමණක් විදුලි ඒකකයක් ජනනය කිරීමට වැය වූ පිරිවැය (රු) | විදුලි ඒකකයක් විකිණීමෙන් ලත් ආදායම (රු) |
|---|---|---|---|
| 2002 | ඒෂියා පවර් - Rs.8.12 | 5.36 | 7.25 |
| | ලක්දනව් - Rs.7.41 | | |
| | කුල්වියාර් - මාලබේ - -- | | |
| | කුල්වියාර් - KKS - Rs.8.60 | | |
| | ලක්දනව් (Emergency) - Rs.5.99 | | |
| | කලම්බු පවර් (Barge) - Rs.7.06 | | |
| | ඒස් පවර් මාතර - Rs.6.72 | | |
| | ඒස් පවර් හොරණ - Rs.6.13 | | |
| 2003 | ඒෂියා පවර් - Rs.9.04 | 2.03 | 7.68 |
| | ලක්දනව් - Rs.8.46 | | |
| | කුල්වියාර් - මාලබේ - -- | | |
| | කුල්වියාර් - KKS - Rs.12.23 | | |
| | ලක්දනව් (Emergency) - -- | | |
| | කලම්බු පවර් (Barge) - Rs. 8.30 | | |
| | ඒස් පවර් මාතර - Rs. 9.04 | | |
| | ඒස් පවර් හොරණ - Rs.8.72 | | |
| | ASE කැලණිතිස්ස - Rs.7.73 | | |
| 2004 | ඒෂියා පවර් - Rs.9.20 | 4.67 | 7.66 |
| | ලක්දනව් - Rs.8.20 | | |
| | කුල්වියාර් - මාලබේ - -- | | |
| | කුල්වියාර් - KKS - Rs.16.35 | | |
| | ලක්දනව් (Emergency) - -- | | |
| | කලම්බු පවර් (Barge) - Rs. 8.36 | | |
| | ඒස් පවර් මාතර - Rs. 8.68 | | |
| | ඒස් පවර් හොරණ - Rs.9.01 | | |
| | ASE කැලණිතිස්ස - Rs.8.60 | | |
| | හෙලදනව් - Rs.6.97 | | |

(ඇ) (i) එවැනි කොන්දේසියක් පිළිබඳව අමාත්‍යාංශයට වාර්තා වී නැත.

(ii) පැන නොනඟී.

(ඇ) පැන නොනඟී.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, ණය බරතාවෙන් විදුලිබල මණ්ඩලයට කිසි ප්‍රශ්නයක් නැහැ කියලා ඔබතුමාගේ පිළිතුර තුළ කියනවා. මීට මාස 04කට විතර ඉස්සෙල්ලා ඔබතුමා ඉංජිනේරුවන් සමඟ කථා කරන විට බොහොම අවංකව කියා තිබුණා, මේක තමයි අපට තිබෙන මූලික ප්‍රශ්නය කියලා. ඒකෙන් යම් ප්‍රතිශතයක වියදමක් අනිවාර්යයෙන්ම විදුලිබල මණ්ඩලය දරනවා. ඒ සම්බන්ධයෙන් ඒ අවස්ථාවේදී කිව්වේ දීර්ඝ කාලීන ණය බිලියන 154යි කියලා.ඒ කියන්නේ කෝටි 15,400යි. [බාධා කිරීමක්] එතුමා හොඳ උත්තරයක් දුන්නා. මේ තිබෙන ණය ප්‍රමාණය ඔබතුමන්ලාගෙන් සම්පූර්ණයෙන් අහක් කර තිබෙනවා නම්, ඒවා භාණ්ඩාගාරයේ තිබෙනවා නම් මීට වැඩිය අඩු මුදලකට විදුලි ඒකකයක් ලබා දෙන්න පුළුවන්නේ ඇමතිතුමනි. ඇයි, එහෙම දෙන්නේ නැත්තේ?

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)

ගරු කථානායකතුමනි, ලංකා විදුලිබල මණ්ඩලය වෙනුවෙන් රජය මඟින් අති විශාල මුදල් ප්‍රමාණයක් ආයෝජනය කර තිබෙනවා. ඒ ආයෝජනය කර තිබෙන දිගුකාලීන ණය බර දරන්නේ මහ භාණ්ඩාගාරය විසින්. ඒක ලංකා විදුලිබල මණ්ඩලයේ එදිනෙදා -දෛනික- මූල්‍ය කටයුතුවලට දැනට බලපෑමක් නැහැ. මහ භාණ්ඩාගාරය තමයි විවිධ ආයතනවලින් ලබා ගත්ත ණය මුදල් ගෙවනු ලබන්නේ. ඊට අමතරව ලැබීමට තිබුණු ප්‍රමාණයන් සැලකිය යුතු පරිද්දෙන් විසඳා ගන්න අපට පුළුවන් වුණා. විශේෂයෙන්ම ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට 2007, 2008 සහ 2009 වසරවල බිල් නොපියවීම නිසා බිලියන 51ක පමණ මුදලක් ගෙවීමට තිබුණා. ඒක මහා භාණ්ඩාගාරය විසින් භාර ගත්තා. ඒ වාගේම 2010.05.31 වන විට ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට බිලියන 8.163ක නොගෙවීමක් තිබුණා. දැන් අපි ඒ සියල්ලම ගෙවා අවසන්. 2011.04.30 වන විට ගෙවන්න කිසිම දෙයක් ඉතුරු වෙලා තිබුණේ නැහැ. 2010.05.31 වන දා වන විට ඍණ මිලියන 2,682ක බැංකු අයිරාවක් තිබුණා. ඒක 2011.04.30 වන විට ධන මිලියන 323කට ගෙනැල්ලා තිබෙනවා. ඒ නිසා අපට දැන් කෙටිකාලීන වශයෙන් එවැනි මූල්‍ය අර්බුදයක් පැන නැඟිලා නැති බව මා ඔබතුමාට ප්‍රකාශ කරන්න ඕනෑ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. 2010 ජුනි මාසයේ 19 වැනිදා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ අත්සන් කළ ගිවිසුමේ 8 වගන්තිය යටතේ තිබෙනවා, විදුලිබල මණ්ඩලය අනිවාර්යයෙන්ම තමන්ගේ සම්පූර්ණ ණය ප්‍රමාණය අවසන් කරලා ඒක පාඩු නොලබන ආයතනයක් බවට පරිවර්තනය කරන්නය කියලා. ඒක ක්‍රියාත්මක කළ නිසා තමයි විදුලි බිල අඩු කරන්නට බැරි වෙලා තිබෙන්නේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට යටත්ව ද ඔබතුමා කටයුතු කරන්නේ?

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)

ගරු කථානායකතුමනි, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් අපට කිසිම කොන්දේසියක් පනවලා නැහැ. විදුලිය බිලට බලපා තිබෙන ප්‍රධාන සාධකය 1995න් පස්සේ තාප විදුලිය භාවිතා කිරීමයි. උදාහරණයක් මම ඔබතුමාට කියන්නම්. විදුලිය හැටියට 2008 දී පෞද්ගලික අංශයෙන් තාප විදුලිය සියයට 37ක් අපි අර ගෙන තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, මම ඒකට පොඩ්ඩක් බාධා කරන්නද? මම අහලා තිබෙන ප්‍රශ්නය ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ලංකාවත් එක්ක ගිවිසුමකට අත්සන් කරලා තිබෙනවාය කියන එකයි. ඉතින් ඒක නැහැයි කියන්න බැහැ නේ.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)

ඉතින් මම ඒක ප්‍රතික්ෂේප කරනවා නේ. මම අමාත්‍යවරයා හැටියට කියන්නේ අපට කිසිම -

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

තුන්වැනි ප්‍රශ්නයක් නැහැ. දෙවන ප්‍රශ්නය තුළින්මයි අහන්නේ. ඒක අත්සන් කරලා තිබෙනවා.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)

ගරු මන්ත්‍රීතුමනි, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් අපට කිසිම කොන්දේසියක් ඉදිරිපත් වෙලා නැහැ. අපේ අමාත්‍යාංශයට හෝ විදුලිබල මණ්ඩලයට ඉදිරිපත් කරලාත් නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඔබතුමා වග කීමකින් ද කියන්නේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විදුලිබල මණ්ඩලයට-

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)

බොහොම පැහැදිලිව කියන්නේ. මම අවස්ථා ගණනාවක සාකච්ඡා කරලා තිබෙනවා. අපට කිසිසේත්ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කොන්දේසි නැහැ. නමුත් ලංකා විදුලිබල මණ්ඩලයේ විදුලි බිල වැඩි වන්නට හේතුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කොන්දේසි කියලා ඔබතුමා වැරදි නොමඟ යැවීමක් කරන්න උත්සාහ කරනවා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කොන්දේසි නොවෙයි ප්‍රශ්නය.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඒ ගිවිසුම මට අපේ ගරු ජෝශප් මයිකල් පෙරේරා ජොෂ්ඨ මන්ත්‍රීතුමා ලබා දුන්නා. මේක මහ බැංකු වාර්තාවේත් ඇතුළත් කරලා තිබෙනවා.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)

1995 ඉඳන් තාප විදුලියෙන් මේක දුවන නිසායි ප්‍රශ්නය තිබෙන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඔබතුමා දැන් කියන්නේ-

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
ගරු කථානායකතුමනි,-

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මගේ අතේ තිබෙන මේ වාර්තාව කරුණාකරලා හැන්සාඩ් වාර්තාවේ මුද්‍රණය කරන්නය කියලා මම ඉල්ලා සිටිනවා. මා එය **සභාගත*** කරනවා. මොකද, ඒක තමයි දැන් ප්‍රතික්ෂේප කරන්නේ.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
ගරු කථානායකතුමනි,-[බාධා කිරීම්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නිවාඩ් කබ්රාල් මහතා සහ ගරු සරත් අමුණුගම ඇමතිතුමා අත්සන් කරලා තිබෙන ගිවිසුම-

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු කථානායකතුමනි, ඒක හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කරන්න බැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා, අපි ඉස්සෙල්ලා ඇමතිතුමා කියන පිළිතුර අහගෙන ඉඳිමු. ඊට පස්සේ ඔබතුමාගේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, එතකොට මට අහන්න තිබෙන ප්‍රශ්නය අහලා වැඩක් නැති වෙනවා. මම දෙවැනි අතුරු ප්‍රශ්නයයි මේ අහන්නේ.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
ගරු කථානායකතුමනි, මට ප්‍රකාශ කරන්න තිබෙන්නේ මෙපමණයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කෙටියෙන් උත්තර දෙන්න.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
ගරු කථානායකතුමනි, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල කිව්වා හෝ නොකිව්වා හෝ, අපේ වර්තමාන සංයුක්ත සැලැස්මට අනුව 2016 සිට ස්ථාවර, මූල්‍යමය වශයෙන් කාටවත් ණය නැති ආයතනයක් බවට අපි ලංකා විදුලිබල මණ්ඩලය පරිවර්තනය කරනවා. ඒකේ මුල් පියවර අපි අරගෙන තිබෙනවා. පියවරෙන් පියවර අපි ඒ කටයුතු කරනවා. අවුරුදු 10කට පස්සේ - 2010දී - අපි ලංකා විදුලිබල මණ්ඩලය පාඩු නැති ආයතනයක් බවට පත් කළා. ඒ වාගේම ලංකා විදුලිබල මණ්ඩලය ණය බරින් නිදහස් කර ගත්තා. අද වෙන කොට අපට ඒ හැකියාව ලැබී තිබෙනවා. හැබැයි, ඒක කෙටි කාලීන දෙයක්. දිගු කාලීන සැලැස්ම අනුව 2016 දී ඒ ස්ථාවර තත්ත්වයට පත් කරන්න අපේ රජය ඒ නිශ්චිත ප්‍රතිපත්ති මත ක්‍රියාත්මක වනවා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කොන්දේසි තිබෙන කථාවක් අපේ අමාත්‍යාංශයට වාර්තා වෙලා නැහැ. ස්වාධීනව ඇති කර ගත් ක්‍රියාදාමයක් මඟින් තමයි අපි ඒ කටයුත්ත කර ගෙන යන්නේ. මම ඒක ප්‍රකාශ කරන්න ඕනෑ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
තුන්වැනි අතුරු ප්‍රශ්නය. ගරු ඇමතිතුමනි, 1995 වනතුරු මේ ප්‍රශ්නය තිබුණා කියලා කිව්වා. ඒ කියන්නේ එක්සත් ජාතික පක්ෂය මේ ක්‍රියාවලිය හරි මාර්ගයේ ගෙන ගියත්, ඊට පස්සේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මේ රටේ විදුලි බල නිෂ්පාදනය සම්පූර්ණයෙන්ම කඩාකප්පල් කරලා තිබෙන නිසා අද රටේ ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා කියන එකයි. [බාධා කිරීම්] ජල විදුලි ඒකකයක නිෂ්පාදන වියදම රුපියල් දෙකයි ශත තිහයි. තාප විදුලි බලාගාරවල විදුලි ඒකකයක් නිෂ්පාදනය කරන්න රුපියල් 8ත්, 14ත් අතර මුදලක් යනවා.

එහෙම නම් කරුණාකරලා කියන්න, මොකද මේ විදුලි ඒකකයක් රුපියල් විස්සට, විසිපහට, තිහට විකුණන්නේ කියලා.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
ගරු කථානායකතුමනි, මම දේශපාලනය කථා කරන්න කැමැති නැහැ. නමුත් එතුමාට උත්තරයක් දෙන්න ඕනෑ. [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ඇමතිතුමා කියන එක අහ ගන්න.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
එක්සත් ජාතික පක්ෂ පාලන යුගයේදී, 1988 දී විදුලිබල මණ්ඩලයේ දිගු කාලීන සැලැස්ම අනුව පෙනී ගියා, ජල විදුලියෙන් පමණක් විදුලි පද්ධතිය කර ගෙන යන්න බැරි බව. විශේෂයෙන්ම ගම් නියම් ගම්වලට විදුලි බලය යැම නිසාත්, ජනතාවගේ විදුලි අවශ්‍යතා වැඩි වීම නිසාත් ගල් අඟුරු බලාගාර සහ වියදම් අඩු වෙනත් තාප විදුලි බලාගාර හදන්න යෝජනා වුණා. නමුත් ඒ යෝජනා එක්සත් ජාතික පක්ෂ රජය සමයේ ක්‍රියාත්මක කළේ නැහැ. කළ එකම යෝජනාව, සමනළවැව යෝජනා ක්‍රමයයි. ඉංජිනේරුවන්ගේ අදහස්වලට විරුද්ධව ඒක කළා. ඒ සඳහා වියදම් කරපු මුදල් ඔක්කෝම- රුපියල් බිලියන 16ක් - අද අපතේ ගිහින් තිබෙනවා, එතැන විශාල ජල කාන්දුවක් සිදු වෙමින් තිබෙන නිසා. එදා ඒ නිසි අවස්ථාවේදී ඒ අවශ්‍ය පියවර ගත්තේ නැහැ. ඒ වාගේම මම කියන්න ඕනෑ, මහවැලි ව්‍යාපාරය හැරුණු කොට,- [බාධා කිරීමක්]

---

*** පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
1994 ඉඳලා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මොකක්ද කරලා තිබෙන්නේ?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ අහපු ප්‍රශ්නයට ඇමතිතුමා පිළිතුරක් දෙනවා නේ. ඒකඅහගෙන ඉන්න. ඒ කාල වකවානුව ගැන අහගෙන ඉන්න. ඇමතිතුමා පිළිතුරු දෙනවා නේ. ඊට පස්සේ ඔබතුමා කථා කරන්න.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
ගරු කථානායකතුමනි, මහවැලි ව්‍යාපාරයට කරපු අධික වියදම් නිසා විදුලි බිල දහතුන් ගුණයකින් ඉහළ ගියා. විදුලි බිල දහතුන් ගුණයකින් ඉහළ ගියා, මහවැලි ව්‍යාපාරයට කරපු අධික ආයෝජනය නිසා. ඒක තමයි ඇත්ත.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මහවැලි ව්‍යාපාරය වැරදි දෙයක්ද?

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
ඒක තමයි ඇත්ත. ඒ වාගේම 2001-2004 කාලයේ ඇති කරපු තාප බලාගාර නිසා අද මේ අර්බුද ඇති වෙලා තිබෙනවා. ඕනෑ නම් මම කියවන්නම් ඒ ලැයිස්තුව. ගරු කථානායකතුමනි, තාප බලාගාරවලින් අද අප විදුලිය මිලට ගන්නේ ඒකකයක් රුපියල් දහ අටට. විකුණන්නේ දහතුනට. ඒකයි මේ ප්‍රශ්න ඇති වෙලා තිබෙන්නේ. ඉතින් කොහොමද මේක කර ගෙන යන්නේ? [බාධා කිරීමක්]

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා (ක්‍රීඩා අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே - விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Mahindananda Aluthgamage - Minister of Sports )

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඇමතිතුමෙක් ඉන්නවා පිළිතුරු දෙන්න. තමුන්නාන්සේ වාඩි වන්න.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
මේකට දේශපාලනය අදින්න එපා. මේක ජාතික ප්‍රශ්නයක්. මෙතැන ඉන්න හැමෝම ඒ ගැන වග කියන්න ඕනෑ. අපි සියලු දෙනාම එකමුතු වෙලා මේ අර්බුදයෙන් ගොඩ යන්න බලනවා මිසක් දේශපාලනය අදින්න එපා. එහෙම ඇද්දොත් උත්තර තිබෙනවා අපට කියන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එක්සත් ජාතික පක්ෂයේ නමින්-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් හරි. අතුරු ප්‍රශ්න තුන ඉවරයි. ඇමතිතුමා උත්තර දුන්නා.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
දේශපාලනය අදින්න එපා. [බාධා කිරීම්] ගරු ජාතික සංවිධායකතුමා, දැන්වත් ජාතික මට්ටමින් මනස පවත්වාගෙන යන්න.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
බොරුවට සිල් අරගෙන වැඩක් නැහැ. ඇත්ත කථා කරන්න.

## ඌව ප්‍රාග්ධන සමුපකාර සමිතිය: නිලධාරින්
ஊவா மூலதன கூட்டுறவுச் சங்கம்: உத்தியோகத்தர்கள்
UVA CAPITAL CO-OPERATIVE SOCIETY : OFFICRES

0900/'10

3. **ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M.Ranjith Madduma Bandara)
සමුපකාර හා අභ්‍යන්තර වෙළෙඳ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ඌව ප්‍රාග්ධන සමුපකාර සමිතියේ (ඌව ප්‍රාග්ධන සමුපකාර බැංකුව) අධ්‍යක්ෂ මණ්ඩලය සමුපකාර පනතට අනුව පත් කර තිබේද;

(ii) එම අධ්‍යක්ෂ මණ්ඩලය පත් කිරීමේදී නීත්‍යානුකූලව කාරක සභා හා මහා සභා රැස්වීම් පවත්වා තිබේද;

(iii) මෙම සමුපකාර සමිතියේ මහ සභා රැස්වීම් පැවති ස්ථානය සහ දිනය කවරේද;

(iv) මෙම සමුපකාර සමිතියේ සිටින සාමාජිකයින් සංඛ්‍යාව කොපමණද;

(v) ඔවුන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඌව ප්‍රාග්ධන සමුපකාර සමිතියේ වත්මන් සභාපතිවරයාගේ හා අධ්‍යක්ෂ මණ්ඩලයේ නම් කවරේද;

(ii) එහි සාමාන්‍යාධිකාරිවරයාගේ සහ විධායක නිලධාරින්ගේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මෙම සමුපකාර සමිති බැංකුවේ හිටපු සභාපතිවරයා හා වත්මන් සභාපතිවරයා සහෝදරයන් බවත්;

(ii) මෙහි සාමාන්‍යාධිකාරිවරිය හිටපු සභාපතිවරයාගේ භාර්යාව බවත්;

(iii) මෙහි සිදු වී ඇති දූෂණ හා වංචා පිළිබඳ විගණන වාර්තාවක් ඉදිරිපත් කර ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඈ) ඉහත (ඇ) (iii) හි සඳහන් විගණන වාර්තාව අනුව නීත්‍යනුකූල ක්‍රියාමාර්ගයක් ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

கூட்டுறவு, உள்நாட்டு வர்த்தக அமைச்சரைக் கேட்ட வினா :

(அ) (i) ஊவா மூலதன கூட்டுறவுச் சங்கத்தின் (ஊவா மூலதன கூட்டுறவு வங்கி) பணிப்பாளர் சபை கூட்டுறவுச் சட்டத்துக்கமைய நியமிக்கப்பட் டுள்ளதா என்பதையும்;

(ii) இப்பணிப்பாளர் சபை நியமிக்கப்படுகையில் சட்ட பூர்வமாக செயற்குழுக் கூட்டங்களும் பொதுச் சபைக் கூட்டங்களும் நடத்தப்பட்டிருந்ததா என்பதையும்;

(iii) இக்கூட்டுறவுச் சங்கத்தின் பொதுச் சபைக் கூட்டம் நடத்தப்பட்ட இடமும் திகதியும் யாது என்பதையும்;

(iv) இக்கூட்டுறவுச் சங்கத்திலிருக்கும் உறுப்பினர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(v) இவர்களின் பெயர் மற்றும் முகவரிகள் யாவை என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) ஊவா மூலதன கூட்டுறவுச் சங்கத்தின் தற்போதைய தலைவர் மற்றும் பணிப்பாளர் சபையின் பெயர்கள் யாவை என்பதையும்;

(ii) இதன் பொது முகாமையாளரினதும் நிறைவேற்று உத்தியோகத்தர்களினதும் பெயர்கள் யாவை என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) (i) இக்கூட்டுறவுச் சங்க வங்கியின் முன்னாள் தலைவர் மற்றும் தற்போதைய தலைவர் ஆகியோர் சகோதரர்களௌன்பதையும்;

(ii) இதன் பொது முகாமையாளர் முன்னாள் தலைவரின் மனைவி என்பதையும்;

(iii) இங்கு நடைபெற்றுள்ள ஊழல்கள் மற்றும் மோசடிகள் தொடர்பாக கணக்காய்வு அறிக்கை யொன்று சமர்ப்பிக்கப்பட்டுள்ளதென்பதையும்

அவர் ஏற்றுக்கொள்வாரா?

(ஈ) மேலே (இ) (iii) இல் குறிப்பிடப்பட்ட கணக்காய்வு அறிக்கையின்படி சட்டபூர்வமான நடவடிக்கை மேற் கொள்ளப்படுமா என்பதை அவர் குறிப்பிடுவாரா?

(உ) இன்றேல், ஏன்?

asked the Minister of Co-operatives and Internal Trade:

(a) Will he inform this House-

(i) whether the board of directors of Uva Capital Co -operative Society (Uva Capital Co-operative Bank) has been elected in compliance with the Co-operatives Act ;

(ii) whether the committee meeting and the general meeting have been held legally, in electing that board of directors ;

(iii) the venue of the general meeting of this Co-operative society and the date on which it was held ;

(iv) the membership of this Co-operative Society ; and

(v) their names and addresses?

(b) Will he state-

(i) the names of the current Chairman and the board of directors of Uva Capital Co-operative Society ; and

(ii) the names of the General Manager and the Executive Officers of it?

(c) Will he admit that-

(i) the former Chairman and the current Chairman of this Co-operative Society Bank are brothers ;

(ii) the General Manager of this bank is the wife of the former Chairman ; and

(iii) an audit report has been submitted regarding the fraud and corruption that have taken place in this bank?

(d) Will he state whether any legal action will be taken according to the audit report mentioned in (c) (iii) above?

(e) If not, why?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

(අ) (i) සමුපකාර පනත හා සමිතියේ මහා සභාවෙන් අනුමත අතුරු ව්‍යවස්ථාවට අනුව අධ්‍යක්ෂ මණ්ඩලය පත් කර තිබේ.

(ii) ඔව්.

(iii) ස්ථානය: වැල්ලවාය සමිති කාර්යාලය

දිනය: 2010.07.28

(iv) සාමාජිකයන් ගණන 20,000

(v) ඇමුණුම් I හි දක්වා ඇත. ඇමුණුම් I **සභාගත*** කරමි.

(ආ) (i)

| | |
|---|---|
| සභාපති | - ජේ.ඒ. අජන්ත මහතා |
| උප සභාපති | - එස්.ඒ. අශෝක ප්‍රභාත් මහතා |
| අධ්‍යක්ෂ | - එස්.පී.පී.කේ.ඒ. අරුණ මහතා |
| අධ්‍යක්ෂ | - ආර්. අනිල් දර්ශණ මහතා |
| අධ්‍යක්ෂ | - කේ.පී. නිශාන්ත දමයන්ත මහතා |
| අධ්‍යක්ෂ | - ඩබ්ලිව්.එම්. ධනුෂා ප්‍රියදර්ශනී මිය |
| අධ්‍යක්ෂ | - ඒ. රත්නා මිය |

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

(ii) සාමාන්‍යාධිකාරි - පී.එස්. දිසානායක මිය

විධායක නිලධාරින්:

ණය කළමනාකරු - එච්.එම්. චමින්ද හේරත් මහතා

ව්‍යාපෘති නිලධාරි - දුලංජලී රත්නායක මිය

අභ්‍යන්තර විගණකවරු - ඒ.ඩී. ගමගේ මහතා

අභ්‍යන්තර විගණකවරු - එස්.ජේ. ප්‍රනාන්දු මහතා

(ඇ) (i) නැත.

(ii) හිටපු සභාපතිවරයකුගේ භාර්යාව ය.

(iii) ඔව්.

(ඈ) ඔව්. ඒ පිළිබඳව කාරක සභාවේදී ගරු මන්ත්‍රීතුමා සමඟ සාකච්ඡා කළා. දැනටමත් ඌව පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග ඇමුණුම IIහි දක්වා ඇත. ඇමුණුම II **සභාගත*** කරමි.

(ඉ) අදාළ නොවේ.

***සභාමේසය මත තබන ලද ඇමුණුම:***

*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு:*

*Annex tabled:*

ඇමුණුම II

1. ඌව පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් මෙම සමිතියේ වාර්ෂික විගණනයක් සිදු කරන අතර ඒ තුළින් නිරීක්ෂණය කරන ලද ඌනතා පිළිබඳව සමිති දැනුවත් කර ඇත.
2. විගණනයේ දී අනාවරණය වූ කරුණු කෙරෙහි අවධානය යොමු කර සමිතියේ ආරම්භයේ සිට 2009.06.30 දින දක්වා කාලය ආවරණය වන පරිදි පනතේ 40(1) පරීක්ෂණයක් ද සිදු කර ඇත.
3. 46(1) පරීක්ෂණයේදී අනාවරණය වූ ඇමුණුම් අංක 1හි සඳහන් චෝදනා හා පිළිතුරු පිළිබඳව 2011.02.22 වැනි දින බණ්ඩාරවෙල නගර ශාලාවේදී පනතේ 18(1) වගන්තිය යටතේ දෙපාර්තමේන්තුව මඟින් මහා සභාවක් කැඳවා දැනුවත් කර ඇත.
4. එම මහා සභාවේදී ඇතැම් චෝදනා පිළිගත් අතර සමහර චෝදනා ප්‍රතික්ෂේප කර ඇති අතර පනතේ 48(1) වගන්තිය අනුව අධ්‍යක්ෂ මණ්ඩලය ඉවත් කිරීම සමිතිය ප්‍රතික්ෂේප කර ඇත.
5. මේ පිළිබඳව ඉදිරි කටයුතු සඳහා විධිමත් පරීක්ෂණයක් කිරීම සඳහා සමුපකාර සංවර්ධන කොමසාරිස් හා රෙජිස්ට්‍රාර් වෙතින් ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර එවන ලෙස අංක 6/1/5/60 හා 2011.01.03 දාතමින් දන්වා ඇති අතර දකුණු පළාත හා නැගෙනහිර පළාතේ නිලධාරීන් නම් කර එවා ඇත.
6. විධිමත් පරීක්ෂණ නිම කර එහි නිර්දේශ අනුව ඉදිරි කටයුතු කිරීමට නියමිතය.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M.Ranjith Madduma Bandara)

ගරු කථානායකතුමනි, මම අතුරු ප්‍රශ්නයක් අහනවා. පොදු දේපළ පනත යටතේ මේ තිබෙන වැරදිවලට නඩු පවරන්න පුළුවන්. එසේ කිරීමට ඔබතුමා කටයුතු කරන්නේද?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ඔව්. සමුපකාර පනත අනුව යම්කිසි ක්‍රියා පිළිවෙතක් තිබෙනවා, මේ සම්බන්ධයෙන් තීන්දු, තීරණ ගන්න. ඔබතුමාගේ ඉල්ලීම පරිදි ඒ සම්බන්ධ ක්‍රියාමාර්ග ගන්න කාරක සභා අවස්ථාවේදී මම ඌව පළාත් සභා කොමසාරිස්තුමාට නියෝග කර තිබෙනවා. ඒ ක්‍රියාමාර්ග ගත්තායින් පසුව තමයි අපට මේ සම්බන්ධයෙන් තීන්දුවක් ගන්න වෙන්නේ, පොදු දේපළ පනත යටතේ ක්‍රියා කරනවාද නැද්ද කියා.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M.Ranjith Madduma Bandara)

මේ සඳහා කොච්චර කාලයක් ගත වෙනවාද?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

අපි මේ සඳහා මාස තුනක කාලයක් දීලා තිබෙනවා.

## අඩු උපත් බර සහිත දරුවන්: ක්‍රියාමාර්ග
## குறைந்த எடையுடன் பிறக்கும் பிள்ளைகள்: நடவடிக்கை
## LOW BIRTH-WEIGHT CHILDREN : MEASURES TAKEN

1017/'10

6. **ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වර්ෂ 2010 අවසන් වන විට ශ්‍රී ලංකාවේ වාර්තා වූ "අඩු උපත් බර" නමැති මන්දපෝෂණ තත්ත්වය සහිත දරුවන්ගේ ප්‍රතිශතය කොපමණද;

(ii) අඩු උපත් බර සහිත දරුවන්ගේ ප්‍රතිශතය අඩු කිරීම සඳහා රජය ගන්නා වූ ක්‍රියාමාර්ග කවරේද;

(iii) එම ක්‍රියාමාර්ග ඉහත මන්දපෝෂණ තත්ත්වය අඩු කිරීම සඳහා ප්‍රමාණවත්වේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2010 ஆம் ஆண்டின் நிறைவின் போது இலங்கையில் அறிக்கையிடப்பட்ட குறைந்த எடையுடன் பிறந்த பிள்ளைகளின் சதவீதம் யாதென்பதையும்;

(ii) குறைந்த எடையுடன் பிறக்கும் பிள்ளைகளின் சதவீதத்தைக் குறைப்பதற்காக அரசாங்கம் மேற்கொள்ளும் நடவடிக்கைகள் யாவையென்பதையும்;

(iii) மேற்படி நடவடிக்கைகள் போஷாக்கின்மை நிலைமையைக் குறைப்பதற்கு போதுமானதா என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

ask the Minister of Health :

(a) Will he inform this House-

(i) the percentage of children with low birth-weight reported in Sri Lanka, by the end of the year 2010;

(ii) the measures taken by the Government to minimize the percentage of children with low birth-weight; and

(iii) whether those measures are sufficient to minimize the aforesaid malnutrition condition?

(b) If not, why ?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க )
(The Hon. Lalith Dissanayake)
ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) සියයට 16.6යි.

(ii) අඩු බර සහිත දරුවන් ලැබීමට බලපාන ප්‍රධාන සාධකයක් වනුයේ ගර්භිණීභාවයට ප්‍රථම අඩු ශරීර ස්කන්ධ දර්ශකයක් තිබීමයි. එය අඩු කිරීම සඳහා පහත සඳහන් ක්‍රියා මාර්ග ගෙන ඇත.

නිසි ශරීර ස්කන්ධ දර්ශකයක් පවත්වා ගැනීම සඳහා පාසල් හා යොවුන් සෞඛ්‍ය වැඩසටහන් මඟින් නිසි ක්‍රියාමාර්ග ගැනීම;

ගර්භිණී සමයේදී මවගේ පෝෂණය පිළිබඳ නිසි උපදෙස් ලබා දීම;

ගර්භිණී සමයේදී සෑම සායනික පැමිණීමකදීම මවගේ බර වැඩි වීම නිසි පරිදි පවත්වාගෙන යන්නේ දැයි සොයා බැලීම හා අවදානම ඇති මවුවරුන් සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග ගැනීම;

සෑම ගර්භිණී මවකටම මාතෘ සායනයේදී ත්‍රිපෝෂ පැකට් 2 බැගින් මාසිකව ලබා දීම;

අඩු උපත් බර සහිත දරුවන් ලැබීමේ අවදානමක් සහිත මවුවරුන්ගේ එම තත්ත්වය පාලනය සඳහා නිසි පියවර ගැනීම.

(iii) ඔව්.

(ආ) පැන නොනඟී.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මේකයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, සෞඛ්‍ය අමාත්‍යාංශයත්, යුනිසෙෆ් ආයතනයත්, ලෝක ආහාර වැඩසටහනත් 2009 වසරේ පෝෂණ සහ ආහාර සුරක්ෂිතභාවය පිළිබඳව සමීක්ෂණයක් කළා. ඒ සමීක්ෂණයට අනුව ගර්භිණී මවුවරුන්ට මේ පෝෂණ මල්ල ලබා දීමේදී මුළු ලංකාවෙන්ම ආවරණය වෙලා තිබෙන්නේ ගර්භණී මවුවරුන්ගෙන් සියයට 23යි. විශේෂයෙන්ම ජනාධිපතිතුමාගේ මහින්ද චින්තන වැඩසටහන පිළිබඳව සඳහන් පොතේ 8 වැනි පිටුවේ මේ පෝෂණ මල්ල ලබා දීමට -ගර්භණී මවුවරුන්ට පෝෂණ සලාකය සමස්තයක් හැටියට ලබා දීම කියන එක-පොරොන්දු වෙලා තිබෙනවා. සමස්ත ගර්භණී මවුවරුන්ටම මේ පෝෂණ මල්ල ලබා දෙන්න ඔබතුමන්ලා කටයුතු කරන්නේ කවදාද?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු කථානායකතුමනි, දැනට මෙම ගර්භණී මවුවරුන් සඳහා පෝෂණ වැඩසටහන් අර මම කලින් කිව්ව ආකාරයට ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල හරහා සමස්ත රට පුරා ක්‍රියාත්මක වෙනවා. ඒ වැඩ පිළිවෙළ ගර්භණී මවුවරුන් සඳහා තමයි ක්‍රියාත්මක වෙන්නේ. ඒක තමයි අපේ වැඩසටහන. විවිධ අමාත්‍යාංශ යටතේත් -සමෘද්ධි ව්‍යාපාරය යටතේත්- ප්‍රාදේශීය මට්ටමින් ඒ මවුවරුන්ගේ කටයුතු සඳහා යම් යම් ක්‍රියාකාරකම් සිදු වෙනවා. ඒ කටයුතුත් වෙන අතරේ, සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් මවුවරුන්ගේ පෝෂණය සඳහා මේ වැඩ පිළිවෙළ අපි ක්‍රියාත්මක කරනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, සමා වෙන්න මම අහපු ප්‍රශ්නයට නොවෙයි ඔබතුමා උත්තර දුන්නේ.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ඔබතුමා මේ අහලා තිබෙන ප්‍රශ්නය අනුව අපේ සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ක්‍රියාත්මක වෙන වැඩසටහන ඒක තමයි ගරු කථානායකතුමනි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි-

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
වෙනත් අමාත්‍යාංශයකින් ක්‍රියාත්මක වෙන වැඩසටහන් ගැන මට කියන්න බැහැ. ඔබතුමා ප්‍රශ්නය වශයෙන් අහලා තිබෙන්නේ, "අඩු උපත් බර දරුවන්ගේ ප්‍රතිශතය අඩු කිරීම සඳහා රජය ගන්නා වූ ක්‍රියා මාර්ග කවරේද?" කියලායි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ, මම අහන්නේ අතුරු ප්‍රශ්නයක්.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
රජය හැටියට අපි ගන්නා ක්‍රියාමාර්ගය මම පැහැදිලි කළා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔබතුමා දෙවැනි අතුරු ප්‍රශ්නයත් අහන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ, දෙවැනි අතුරු ප්‍රශ්නය නොවෙයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
නැත්තේ මොකද? දැන් ඔය උත්තර දුන්නේ පළමුවෙනි අතුරු ප්‍රශ්නයට.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නයට මට උත්තරය හම්බ වුණේ නැහැ.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
රජය ගන්නා ක්‍රියාමාර්ගය දැන් මම පැහැදිලි කළා ගරු කථානායකතුමනි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පළමුවෙනි අතුරු ප්‍රශ්නයට උත්තර දුන්නා. දැන් දෙවැනි එකත් අහන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
කමක් නැහැ, ගරු කථානායකතුමනි. හොඳයි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මේකයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, දැන් අඩු උපත් බර දරුවන්ගේ ප්‍රතිශතයන් දිහා ජාත්‍යන්තර මට්ටමින් බැලුවාම ඉතාලියේ එය සියයට 6යි. ඕස්ට්‍රේලියාවේ සියයට 6.2යි. නවසීලන්තයේ 6.4යි. ජපානයේ 8.6යි. ඇමෙරිකාවේ 7.8යි. මහා බ්‍රිතාන්‍යයේ 7.6යි.

ඔබතුමාගේ පිළිතුර ප්‍රකාරව ශ්‍රී ලංකාවේ එය සියයට 16.6යි. පසු ගිය වසර 10 තුළම එම ප්‍රතිශතය එකම මට්ටමකයි තිබුණේ. විශේෂයෙන්ම මේ ප්‍රශ්නයට රජයේ අවධානය යොමු කරලා එම ප්‍රතිශතය අවම කරන්න අරගෙන තිබෙන අලුත් ක්‍රියා මාර්ග මොනවාද?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු කථානායකතුමනි, මෙම දර්ශකයන් එකම තත්ත්වයේ තිබුණේ නැහැ. 1988 වර්ෂයේදී සියයට 23ක්ව තිබුණු එක ක්‍රමයෙන් අඩු කරලා දැන් සියයට 16.7 වෙලා තිබෙනවා. එතකොට එහි යම් අඩු වීමක් තිබෙනවා. ඒ වාගේම ඊ ළඟ කාරණය තමයි, දැනට මේ සඳහා ශ්‍රී ලංකාවේ ජාතික පෝෂණ ප්‍රතිපත්තියක් සකස් කර තිබීම. මේ මාසය පෝෂණ මාසයයි. ඒ සඳහා විශේෂිත වූ වැඩ පිළිවෙළක් මේ පෝෂණ මාසයේ ක්‍රියාත්මක කරලා තිබෙනවා. විශේෂයෙන්ම ඒ සඳහා පදනම් කර ගෙන තිබෙන්නේ නුවරඑළිය දිස්ත්‍රික්කයයි. මොකද, තොරතුරු වාර්තා අනුව නුවරඑළිය දිස්ත්‍රික්කයේ තමයි වතු ආශ්‍රිතව විශාල වශයෙන් මන්ද පෝෂණය තිබෙන්නේ. ඒ සඳහා විශේෂිත වූ වැඩ පිළිවෙළක් අප අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කරලා තිබෙනවා. ඒ වැඩ පිළිවෙළේ ප්‍රතිලාභ තිබෙනවා. මොකද, මේක ක්ෂණිකව කළ හැකි දෙයක් නොවෙයි. ඒ තත්ත්වය අඩු කරලා තිබෙනවා. අතිගරු ජනාධිපතිතුමාගේ සභාපතිත්වයෙන් යුක්තව සෑම අංශයකම අය ඇතුළත් වන පරිදි ජාතික පෝෂණ මණ්ඩලයක් පිහිටුවා තිබෙනවා. ඒ වාගේම අමාත්‍යාංශය විසින් ක්‍රියාකාරී මට්ටමේ ආයතනයක් සංවිධානය කරලා තිබෙනවා. ඒ සඳහා තමයි ඒවා සියල්ලම ක්‍රියාත්මක කරලා තිබෙන්නේ. මේ අභියෝග ජය ගැනීම සඳහා සියලු අංශ ක්‍රියාත්මක විය යුතුයි. මොකද, මවගේ අඩු බරතාවය නිසා එයින් තව ප්‍රතිඵල ඇති වෙනවා. ඊ ළඟට ඇති වන ප්‍රතිඵල තමයි අඩු බර දරුවන් බිහි වීම, නියමිත උසින් අඩු දරුවන් බිහි වන තත්ත්වයන් ඇති වීම. ඒ නිසා ප්‍රධාන වශයෙන්ම මවගේ පෝෂණ තත්ත්වය රැක ගත යුතුයි. මේ සඳහා අවශ්‍ය සියලු සම්පත් තිබෙන්නටත් පුළුවන්. සමහර විට අපේ තිබෙන සම්පත් ප්‍රයෝජනයට නොගැනීමක් සිද්ධ වෙනවා. ඊ ළඟට වතු අංශය ගත්තාම අදාළ සෞඛ්‍ය කාරණාවලට යොමු නොවන තත්ත්වයක් තිබෙනවා. ගරු කථානායකතුමනි, බොහෝ විට උදෑසන ආහාර වේල ගන්න කිව්වාම ඒක හරියට ගන්නා ප්‍රමාණය කොච්චර අඩුද? එම නිසා ඒ කටයුතු කාරණාවලට මේ සමාජයේ දායකත්වය අවශ්‍ය වෙනවා. ඒ නිසා මෙන්න මේ දැනුවත් කිරීම තමයි වැදගත් වෙන්නේ. ඒක ඒ ආකාරයෙන් ක්‍රියාත්මක වෙනවා. ඉහළ තිබුණු දර්ශකයන් මේ වන විට අඩු තත්ත්වයට ගෙනැල්ලා තිබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මම ගරු නියෝජ්‍ය ඇමතිතුමාට යොමු කරනවා. ඔබතුමාගේම අමාත්‍යාංශයේ මැදිහත් වීමෙන් යුනිසෙෆ් ආයතනයත්, ලෝක ආහාර වැඩසටහනත්, සෞඛ්‍ය අමාත්‍යාංශයත් ගර්භිණී මව්වරුන් පිළිබඳව සමීක්ෂණයක් කරලා තිබෙනවා. එයින් ඉස්මතු වුණු ප්‍රධානතම කාරණය තමයි ගර්භිණී මව්වරුන්ට ලබා දෙනවාය කියපු පෝෂණ සලාකයෙන් ආවරණය වෙන්නේ මුළු රටේම ගර්භිණී මව් පරපුරෙන් සියයට 23ක් බව. ඉතිරි සියයට 77 ආවරණය කරන්න ගන්නා ක්‍රියා මාර්ගය මොකක්ද?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ ප්‍රශ්නයට පිළිතුරු ලැබුණා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, ඒකට පිළිතුරු ලැබුණේ නැහැ.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු කථානායකතුමනි, ගර්භිණී මව්වරුන් පෝෂණය කිරීම දිවයිනේ සියලුම ප්‍රාදේශීය සෞඛ්‍ය මධ්‍යස්ථාන හරහා, සියලුම මව්වරුන් වෙනුවෙන් ක්‍රියාත්මක වෙනවා. එතුමාට ලැබී තිබෙන තොරතුරු, එතුමාගේ තර්කය මොකක්ද කියන්න. මම දන්නේ නැහැ. අපේ සෞඛ්‍ය ප්‍රතිපත්තිය අනුව පැහැදිලිව ප්‍රාදේශීය මට්ටමෙන්, ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල හරහා තමයි ඒක සිද්ධ වෙන්නේ. අදාළ මව්වරුන් පිළිබඳ විස්තර පවුල් සෞඛ්‍ය සේවිකාවන් හරහා වාර්තා වෙනවා. ඒ අනුව ඔවුන්ගේ තොරතුරු, දර්ශකයන් ළමයා ප්‍රසූත කිරීමෙන් පසුවත් පවත්වා ගෙන යනවා. ඊ ළඟට ළමයාගේ වයස අවුරුදු 5 සිට 15 දක්වාත් පසු විපරමක් සිද්ධ වෙනවා. ඒ නිසා මේ කටයුතු වග කීමකින් සෞඛ්‍ය අමාත්‍යාංශය හරහා ඉටු වෙනවාය කියන එකයි මම කියන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
බොහොම ස්තුතියි. ප්‍රශ්න අංක 7-0333/'10-(1), ගරු රවි කරුණානායක මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

**ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා (පළාත් පාලන හා පළාත් සභා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க - உள்ளூராட்சி, மாகாண சபைகள் பிரதி அமைச்சர்)
(The Hon. Indika Bandaranayake - Deputy Minister of Local Government and Provincial Councils)
ගරු කථානායකතුමනි, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ඌව ප්‍රාග්ධන සමූපකාර සමිතියට අනුබද්ධ බැංකුව: ළමා ඉතිරි කිරීම් ගිණුම් සහ ලබා දුන් ණය

## ஊவா மூலதன கூட்டுறவுச் சங்கத்துடன் இணைந்த வங்கி: சிறுவர் சேமிப்புக் கணக்கு மற்றும் வழங்கிய கடன்கள்

BANK AFFILIATED TO UVA CAPITAL CO-OPERATIVE SOCIETY: CHILDREN'S SAVINGS ACCOUNTS AND LOANS GRANTED

0902/'10

9. **ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M.Ranjith Madduma Bandara)

සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) ඌව ප්‍රාග්ධන සමූපකාර සමිතියට අනුබද්ධ බැංකුවේ ආරම්භ කර ඇති ළමා ඉතිරි කිරීම් ගිණුම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගිණුම් හිමියන්ගේ නම් කවරේද;

(iii) මෙම බැංකුවේ තැන්පත් කරන මුදල්වලින් බැංකුවේ නිලධාරීන්ට හා වෙනත් පුද්ගලයින්ට ණය මුදල් ලබා දී තිබේද;

(iv) එසේ නම්, ණය ලබා දී ඇති අයගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එලෙස ලබා ගත් ණය මුදල් ආපසු ගෙවීම පැහැර හැර ඇති බවත්;

(ii) ගෙවීම් පැහැර හැර ඇති අය සම්බන්ධව එම බැංකුව මඟින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) එම ණය ගෙවීම් පැහැර හැර ඇති අයගේ නම් කවරේද;

(ii) ඔවුන් සම්බන්ධයෙන් ගනු ලබන නීතිමය පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

கூட்டுறவு, உள்நாட்டு வர்த்தக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ஊவா மூலதன கூட்டுறவுச் சங்கத்துடன் இணைந்த வங்கியில் ஆரம்பிக்கப்படவுள்ள சிறுவர் சேமிப்புக் கணக்குகளின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) இக்கணக்குகளின் உரிமையாளர்களின் பெயர்கள் யாவையென்பதையும்;

(iii) இவ்வங்கியில் வைப்பிலிடும் நிதியிலிருந்து வங்கி உத்தியோகத்தர்களுக்கும் வேறு நபர்களுக்கும் கடன்கள் வழங்கப்பட்டுள்ளதா என்பதையும்;

(iv) அவ்வாறாயின், கடன் வழங்கப்பட்டுள்ளவர்களின் பெயர், முகவரி ஆகியவை யாவையென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) இவ்வாறு பெறப்பட்ட கடனைத் திருப்பிச் செலுத்தத் தவறியுள்ளனரென்பதையும்;

(ii) திருப்பிச் செலுத்தத் தவறியவர்கள் தொடர்பாக வங்கியினால் எதுவித நடவடிக்கையும் மேற்கொள்ளப்படவில்லை என்பதையும்

அவர் அறிவாரா?

(இ) (i) இக்கடன்களைத் திருப்பிச் செலுத்தத் தவறியுள்ளவர்களின் பெயர்கள் யாவை என்பதையும்;

(ii) இவர்கள் தொடர்பாக மேற்கொள்ளப்படும் சட்ட நடவடிக்கை யாதென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Co-operatives and Internal Trade:

(a) Will he inform this House-

(i) the number of children's savings accounts that have been opened at the bank affiliated to the Uva Captial Co-operative Society;

(ii) the names of those account holders;

(iii) whether loans have been granted to the officers of the bank and other persons, with the money deposited at this bank; and

(iv) if so, the names and addresses of those who have been granted loans?

(b) Is he aware that-

(i) loans obtained in this manner have been defaulted on; and

(ii) no action has been taken by that bank regarding those who have defaulted on loans?

(c) Will he state-

(i) the names of those who have defaulted on loans; and

(ii) the legal measures that will be taken against them?

(d) If not, why?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

(අ) (i) 1855කි.

(ii) ඇමුණුම Iහි දක්වා ඇත.

(iii) ඔව්.

(iv) ඇමුණුම් IIහි දක්වා ඇත.

(ආ) (i) හා (ii) - ණය පැහැර හැර ඇති ණයකරුවන් සිටී. ඒ සම්බන්ධව ක්‍රියාමාර්ග ගනිමින් සිටී.

(ඇ) (i) ඇමුණුම් IIIහි දක්වා ඇත.

ඇමුණුම් **සභාගත*** කරමි.

(ii) 1972 අංක 05 දරන සමූපකාර සමිති පනතේ 58 වගන්තිය යටතේ ණයකරුවන්ගෙන් ණය මුදල් අය කිරීමට කටයුතු කරනු ඇත.

පහත සඳහන් අධ්‍යක්ෂ මණ්ඩලයට එරෙහිව චෝදනා පත්‍ර නිකුත් කර ඇත.

ජේ.ඒ. අජන්ත මහතා - උප සභාපති

---

*** පුස්තකාලයේ තබා ඇත.**
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ජානක තිස්සකුට්ටිආරච්චි මහතා - හිටපු සභාපති

සී.පී.කේ. මාර්ක්ස් මහතා - අධ්‍යක්ෂ

එන්.ඒ. අශෝක ප්‍රභාත් මහතා - අධ්‍යක්ෂ

ඔවුන්ගෙන් නිදහසට කරුණු ලබා ගෙන ඇති අතර එම කරුණු පනතේ විධාන අනුව මහ සභාවට ඉදිරිපත් කරන ලදී. එම මහ සභාවට චූදිතයන් ඉදිරිපත් කර ඇති නිදහසට කරුණු පිළිගෙන ඇත.

එබැවින් අදාළ චෝදනා පත්‍ර හා ඒ පිළිබඳ එවා ඇති පිළිතුරු පිළිබඳව නැවත පරීක්ෂා කර බලා වාර්තා කිරීමට ඌව පළාතෙන් පිටස්තර සමුපකාර නිලධාරියෙකු දැන් පත් කර ඇත. ඒ අනුව ලැබෙන නිරීක්ෂණ මත ඉදිරි කටයුතු කරමි.

(ඇ) අදාළ නොවේ.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M.Ranjith Madduma Bandara)

ගරු ඇමතිතුමනි, දැන් මේකේ මුදල් තැන්පත් කරපු අයට ආපහු මුදල් ලබා දෙන්නේ නැති, ඉල්ලුවාට දෙන්නේ නැති ප්‍රශ්නයක් තිබෙනවා. ඒකට ගන්න පුළුවන් ක්‍රියාමාර්ගය මොකක්ද?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

මේ වාගේ සමිති කිහිපයක් ලංකාවේ තිබෙනවා. ඒ සම්බන්ධව පනත අනුව අපි කටයුතු කරලා ඔවුන්ගේ මුදල් ආපසු ලබා දෙනවා. ඒක ප්‍රශ්නයක් වෙන්නේ නැහැ.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M.Ranjith Madduma Bandara)

එවැනි දේවල් තිබෙනවා නම් කොහාට ද ඉදිරිපත් කරන්නට ඕනෑ?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

අපට පැමිණිලි කරන්න කියන්න. හැබැයි මේක ගැන සම්පූර්ණ පරීක්ෂණයක් කරනවා. ඒ වාගේ ගෙවීම් කර නැත්නම් අපට වහාම පැමිණිලි කරන්න. අප සොයා බලා ඒ -

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M.Ranjith Madduma Bandara)

විශාල ප්‍රමාණයක් තිබෙනවා, මුදල් තැන්පත් කරලා. ඒ මුදල් අයුතු විධියට පරිහරණය කරන නිසා බැංකුවේ මුදල් නැහැ. ඒ තැන්පත්කරුවන්ට මුදල් දෙන්නේ නැහැ.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ඔබතුමා ඉදිරිපත් කරන්න සලස්වන්න. අප ඒ ගැන කටයුතු කරන්නම්.

## මන්දපෝෂණය නිසා කුරුවන දරුවන්: ක්‍රියාමාර්ග
### போஷாக்கின்மையால் குள்ளமாகும் சிறுவர்கள் : நடவடிக்கை
### DWARFISM DUE TO MALNUTRITION IN CHILDREN : MEASURES TAKEN

1018/'10

12. **ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වර්ෂ 2010 අවසන් වන විට කුරුවීම හෙවත් මිටිවීම යන මන්දපෝෂණ තත්ත්වයට ගොදුරු වී ඇති ශ්‍රී ලංකාවේ ළදරු ප්‍රතිශතය කොපමණද?

(ii) එම මන්දපෝෂණ තත්ත්වය අඩු කිරීමට රජය ගන්නා වූ ක්‍රියාමාර්ග කවරේද;

(iii) එම ක්‍රියාමාර්ග මිටිවීමේ මන්දපෝෂණ තත්ත්වය තුරන් කිරීමට තරම් ප්‍රමාණවත් වන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2010 ஆம் ஆண்டின் இறுதியளவில் உயரக் குறைவாதல் அதாவது குள்ளமாதல் எனும் போஷாக்கின்மை நிலைமைக்கு ஆளாகியுள்ள சிறுவர் சதவீதம் யாதென்பதையும்;

(ii) இப்போஷாக்கின்மையைக் குறைப்பதற்காக அரசாங்கம் மேற்கொள்ளும் நடவடிக்கைகள் யாவையென்பதையும்;

(iii) மேற்படி நடவடிக்கைகள் குள்ளமாகின்ற போஷாக்கின்மை நிலைமையைக் இல்லாதொழிப் பதற்கு போதுமானதா என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Will he inform this House-

(i) the percentage of Sri Lanka infants that have become victims of the malnutrition condition known as dwarfism or stunting by the end of the year 2010;

(ii) the measures taken by the government to minimize that malnutrition condition; and

(iii) whether those measures are sufficient to eradicate the malnutrition condition of stunting ?

(b) If not, why?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු කථානායකතුමනි, ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා මෙම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ළමා ජනගහනයෙන් සියයට17.3.

(ii) මේ හා සමාන ප්‍රශ්නයක් ඔබතුමා කලින් ඇහුවා. ඒ වැඩසටහන මුළු දිවයින පුරාමයි ක්‍රියාත්මක වන්නේ. සෑම අලුත උපන් දරුවකුටම උපතේදී විශාල වැඩ කොටසක් ක්‍රියාත්මක වනවා. මේ සියල්ල කියවන්න අවශ්‍ය ද? මා මේ ඇමුණුම සභාගත කරන්න ද?

ඔබතුමා (අ) (ii) ප්‍රශ්නයෙන් අසා තිබෙන්නේ, එම මන්දපෝෂණ තත්ත්වය අඩු කිරීමට රජය ගන්නාවූ ක්‍රියාමාර්ග කවරේද කියායි. ගරු කථානායකතුමනි, මේ ඇමුණුමෙහි විස්තර විශාල ප්‍රමාණයක් තිබෙනවා. මේ ඇමුණුම සභාගත කරන්න ද? සම්පූර්ණයෙන්ම කියවන්න ඕනෑ ද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
කියවන්න.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ඒ අනුව මුළු දිවයින පුරා ක්‍රියාත්මක වන වැඩසටහන්.

1. සෑම අලුත උපන් දරුවකුටම උපතේදී ළදරු ළමා වර්ධන සටහන් පතක් ලබා දීම තුළින් ළදරු ළමා සෞඛ්‍යයට අදාළ පණිවුඩ සහ පෝෂණ තත්ත්වය ඇගයීම ආරම්භ කිරීම.

2. උපතේ සිට මාස 06 දක්වා මව්කිරි පමණක් ලබා දීමට උපදෙස් ලබා දීම.

3. මව්කිරි ලබා දීම අවුරුදු 2 දක්වා පවත්වා ගෙන යාමට උපදෙස් ලබා දීම සහ ක්‍රියාමාර්ග ගැනීම පිළිබඳ විශේෂිත පුහුණුවක් ලබා දීම.

4. ළදරුවන්ගේ සහ ළමුන්ගේ වර්ධන තත්ත්වය ක්‍රමානුකූලව ඇගයීම හා ප්‍රවර්ධනය.

5. ළදරුවන්ට හා ළමුන්ට අවශ්‍ය අමතර ආහාර ලබා දීම පිළිබඳ නව සංකල්ප හඳුන්වා දීම.

6. ඒකාබද්ධ පෝෂණ වැඩසටහන (ජීවන චක්‍රයේ විවිධ අවස්ථාවන් අරමුණු කර ගත් පෝෂණ වැඩසටහන්)

   * යොවුන් වියේදී, විවාහයට පෙර කාන්තාවන්ගේ, ගැබිණි මවගේ සහ කිරිදෙන මවගේ පෝෂණය නංවාලීම තුළින් අඩු බර උපත් අවම කිරීම.

   * ළදරුවන්ගේ හා පෙර පාසල් දරුවන්ගේ පෝෂණ තත්ත්වය නංවාලීම තුළින් මන්දපෝෂණය අවම කිරීම.

7. අවුරුදු 5ට අඩු වයස් කාණ්ඩවල දරුවන්ගේ පෝෂණ ඌනතා හඳුනා ගැනීම සහ පහත සඳහන් විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

   * ත්‍රිපෝෂ ලබා දීම, ක්ෂුද්‍ර පෝෂක ලබා දීම.

   * විටමින් A අධිමාත්‍රා ලබා දීම.

   * පාසල් ළමුන් සඳහා යකඩ සහ ෆෝලික් අම්ලය පෙති ලබා දීම.

8. උග්‍ර තීව්‍ර මන්දපෝෂණය වැඩි දිස්ත්‍රික්ක හඳුනා ගෙන පෝෂණ පුනරුත්ථාපන වැඩසටහන් දිස්ත්‍රික්ක තුළ ක්‍රියාත්මක කිරීම (උතුරු නැගෙනහිර සියලුම දිස්ත්‍රික්ක සහ හම්බන්තොට, මොණරාගල,බදුල්ල, නුවරඑළිය)

   ගරු මන්ත්‍රීතුමනි, මේ තත්ත්වය තිබෙන්නේ ලංකාවේ හැම තැනකම නොවෙයි. සමහර දිස්ත්‍රික්ක ගත්තාම ඒ දිස්ත්‍රික්කවල තමයි මේ තත්ත්වය තිබෙන්නේ. නුවරඑළිය වාගේ දිස්ත්‍රික්ක ගත්තාම මේ තත්ත්වය ටිකක් වැඩිපුර තිබෙනවා.

   * උග්‍ර තීව්‍ර මන්දපෝෂණය සහිත ළමුන් සඳහා ඖෂධීය ආහාර (BP 100, Plumply nut, F100, F75) ලබා දීම.

   * මධ්‍යස්ථ තීව්‍ර මන්දපෝෂණය සහිත ළමුන් සඳහා පරිපූරක ආහාර (ත්‍රිපෝෂ,කෝන්, සෝයා පිටි, අධිපෝෂිත ආහාර) ලබා දීම.

   * උග්‍ර තීව්‍ර මන්දපෝෂණය සහිත රෝගී දරුවන් සඳහා රෝහල් තුළ විශේෂ ප්‍රතිකාර ලබා දීම.

9. පෝෂණය දියුණු කිරීම සඳහා ප්‍රජා සහභාගිත්වය පිළිබඳ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

10. පෝෂණය ඇතුළත්ව මුල් ළමා විය සංවර්ධනය පිළිබඳ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

11. ළමා වියේ පෝෂණය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා තාක්ෂණික සහාය ලබා දීම.

(iii) ඔව්.

(ආ) පැන නොනඟී.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි. විශේෂයෙන්ම මිටි වීම හෙවත් කුරු වීම කියන තත්ත්වයට කියන්නේ දිගු කාලීන මන්ද පෝෂණය කියලායි. ඒ කියන්නේ වයසට නිසි උස නොමැති වීමයි. මේ ප්‍රශ්නය ඉලක්ක කර ගත්, මේ ප්‍රශ්නයට අදාළ වැඩසටහනක් සෞඛ්‍ය අමාත්‍යාංශය තුළ තිබෙනවාද කියන එකයි මා අහන්නේ.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திஸாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු කථානායකතුමනි, මේක එක කරුණක් විතරයි. ප්‍රධාන වශයෙන්ම මවගේ බර අඩු වීමේ ප්‍රතිඵලයක් වශයෙන් තමයි මේ තත්ත්වය ඇති වන්නේ. මවගේ උසට සරිලන බර නැති වූ ගමන් බිහි කරන දරුවාට ඒක බලපානවා. බිහි කරන දරුවාට මුල් මාස හයේ මව් කිරි දෙන්න ඕනෑ. ඊළඟට අවුරුදු දෙකක් තුළ මව් කිරි සහ ආහාර ද්‍රව්‍ය දෙන්න ඕනෑ. ළමයින් ඉන්න පියවරු දන්නවා මෙහි තිබෙන වටිනාකම. ඒ වැඩසටහන තමයි මේ ක්‍රියාත්මක වන්නේ. යකඩ ඌනතාව අඩු කෙනාටද, එහෙම නැත්නම් උසට අඩු බර නැති කෙනාටද වශයෙන් නොවෙයි. එහෙම වෙන වෙනම වැඩ සටහන් නොව, මේ පෝෂණ වැඩසටහන, මේ ජාතික වැඩසටහන ක්‍රියාත්මක වන්නේ පොදුවේ මේ සියල්ල ආවරණය වන පරිදියි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මගේ දෙවන අතුරු ප්‍රශ්නය මේකයි ගරු කථානායකතුමනි. විශේෂයෙන්ම කුරු වීම හෙවත් මිටි වීම කියන ප්‍රශ්නයට විසඳුමක් සපයන්නට නම් අදාළ දරුවන් ඉලක්කගත කර ප්‍රෝටීන් බහුල ආහාර, ඒ කියන්නේ මස්, මාළු, කිරි, බිත්තර යනාදි ආහාර වර්ග ලබා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක වන්න ඕනෑ. නමුත් අද පවතින මිල අධික තත්ත්වය තුළ, විශේෂයෙන්ම අද පවතින ජීවන බර තුළ මේ ප්‍රශ්නයට මුහුණ දෙන ඒ දරු පරපුර අයිති පවුල්වලට ප්‍රෝටීන් බහුල ආහාර ලබා දීම සඳහා විශේෂ සහනයක් ලබා දෙන්න කටයුතු කරනවාද කියා අපේ ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් මා අහන්න කැමැතියි.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திஸாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු කථානායකතුමනි, දිස්ත්‍රික්ක වශයෙන් ගත්තාම නුවරඑළිය දිස්ත්‍රික්කයේ තමයි මේ තත්ත්වය විශාල වශයෙන් පවතින්නේ. පෝෂණ මාසය තුළ මේ වැඩසටහන ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක කරන්නේත් නුවරඑළියේ. උග්‍ර තීව්‍ර මන්ද පෝෂණය කියන කාරණය ගනිමු. උග්‍ර තීව්‍ර මන්ද පෝෂණය සහිත ළමුන් හඳුනා ගෙන එම ළමුන් සඳහා ඖෂධීය ආහාර ලබා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක වෙනවා. වෛද්‍යවරුන්ගේ, ලෝක සෞඛ්‍ය සංවිධානයේ සහ සියලු දෙනාගේ උපදෙස් අනුව තමයි මේ පෝෂණ වැඩසටහන ක්‍රියාත්මක කරන්නේ. ඒකට බිත්තර දෙනවාද, වෙනත් දේවල් දෙනවාද අහනවා. ප්‍රධාන වශයෙන්ම සෞඛ්‍ය උපදෙස් අනුව තමයි ඒ වැඩසටහන ක්‍රියාත්මක වන්නේ. ඒ වැඩසටහන තමයි ජාතික මට්ටමෙන් ක්‍රියාත්මක වන්නේ. දරුවන්ගේ රෝගී තත්ත්වයන් වෙන වෙනම හඳුනා ගෙන ඔවුන්ට විශේෂිත වූ වැඩසටහනක් තමයි මේ ජාතික පෝෂණ වැඩසටහන තුළ තිබෙන්නේ. ඒකයි මා කලින් කිව්වේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය. ජාතික පෝෂණ වැඩසටහන සඳහා කොපමණ මුදලක් වෙන් කරලා තිබෙනවාද?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු කථානායකතුමනි, අහලා තිබෙන ප්‍රශ්නයට එය අදාළ වන්නේ නැහැ. වෙනත් ප්‍රශ්නයක් විධියට ඇහුවොත් මට එයට උත්තර දෙන්න පුළුවන්. [බාධා කිරීමක්]

## ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සමඟ ගිවිසුම් අත්සන් කළ ක්‍රීඩකයන්: ගෙවීම්
### இலங்கை கிரிக்கெட் சபையுடன் ஒப்பந்தத்தில் கைச்சாத்திட்டுள்ள வீரர்கள் : கொடுப்பனவு
### CONTRACTS SIGNED BY CRICKETERS WITH SRI LANKA CRICKET : PAYMENTS

0427/'10

13. **ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට ජාත්‍යන්තර කමිටුවක් තිබේද;

(ii) එසේ නම්, එම කමිටුවේ සිටින සාමාජිකයින්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2010 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සමඟ ගිවිසුම් අත්සන් කළ ක්‍රිකට් ක්‍රීඩකයන්ගේ නම් කවරේද;

(ii) ඉහත එක් එක් ක්‍රිකට් ක්‍රීඩකයාට ලබා දුන් මූල්‍යමය පැකේජය වෙන් වෙන් වශයෙක් කොපමණද;

(iii) 2005 සිට 2009 දක්වා කාල සීමාව තුළ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් ගෙවීම් කරන ලද ක්‍රිකට් ක්‍රීඩකයන්ගේ නම් කවරේද;

(iv) එම එක් එක් ක්‍රීඩකයා සඳහා ලබා දුන් මූල්‍යමය පැකේජය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

விளையாட்டுத்துறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை கிரிக்கெட் சபைக்கு சர்வதேசக் குழு ஒன்று உண்டா என்பதையும்;

(ii) அவ்வாறாயின் அக்குழுவின் உறுப்பினர்களின் பெயர்களையும்

அவர் அறியத்தருவாரா?

(ஆ) (i) 2010 ஆம் வருடத்திற்காக இலங்கை கிரிக்கெட் சபையுடன் ஒப்பந்தத்தில் கைச்சாத்திட்டுள்ள கிரிக்கெட் வீரர்களின் பெயர்களையும்;

(ii) மேற்குறிப்பிடப்பட்டுள்ள வீரர்களுக்கு வழங்கப்பட்டுள்ள நிதி பொதியினை தலா அடிப்படையில் வெவ்வேறாகவும்;

(iii) 2005 முதல் 2009 வரையான காலப்பகுதியில் இலங்கை கிரிக்கெட் சபையினால் கொடுப்பனவு செலுத்தப்பட்ட கிரிக்கெட் வீரர்களின் பெயர்களையும்;

(iv) அவர்கள் ஒவ்வொருவருக்கும் வழங்கப்பட்ட நிதிப் பொதியினை வெவ்வேறாகவும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Sports :

(a) Will he inform this House-

(i) whether the Sri Lanka Cricket has an international committee; and

(ii) if so, the names of the members of that committee ?

(b) Will he state-

(i) the names of cricketers who had signed contracts with Sri Lanka Cricket for the year 2010;

(ii) the financial package given to aforesaid cricketers on per head basis separately;

(iii) the names of the cricketers who were paid by the Sri Lankan Cricket during the period from 2005 to 2009; and

(iv) the financial packages given to each of them separately?

(c) If not, why?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage )

(අ) (i) නැත.

(ii) අදාළ නොවේ.

(ආ) (i) ඇමුණුම Iහි දක්වා ඇත.

(ii) ඇමුණුම Iහි දක්වා ඇත.

(iii) ඇමුණුමIIහි දක්වා ඇත.

(iv) ඇමුණුම IIහි දක්වා ඇත.

ඇමුණුම් **සභාගත*** කරමි.

(ඇ) පැන නොනඟී.

***සභාමේසය මත තබන ලද ඇමුණුම්:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*
*Annexes tabled:*

ඇමුණුම I

2010 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සමග ගිවිසුම් අත්සන් කළ ක්‍රිකට් ක්‍රීඩකයන්ගේ නම් සහ එක් එක් ක්‍රිකට් ක්‍රීඩකයා සඳහා ලබාදුන් මූල්‍යමය පැකේජය.

| | ක්‍රීඩකයන්ගේ නම් | ඇමරිකන් ඩොලර් | රු.ශත |
|---|---|---|---|
| 01 | එම්.ජයවර්ධන | 120,750 | |
| 02 | කුමාර් සංගක්කාර | 120,750 | |
| 03 | එම්.මුරලිදරන් | 120,750 | |
| 04 | සනත් ජයසූරිය | 44,000 | |
| 05 | සී.වාස් | 71,500 | |
| 06 | තිලාන් සමරවීර | 120,750 | |
| 07 | ටී.එම් ඩිල්ෂාන් | 120,750 | |
| 08 | නුවන් කුලසේකර | 82,688 | |
| 09 | ප්‍රසන්න ජයවර්ධන | 49,613 | |
| 10 | ෆර්විස් මහරූෆ් | 47,250 | |
| 11 | අජන්ත මෙන්ඩිස් | 49,613 | |
| 12 | චාමර කපුගෙදර | 49,613 | |
| 13 | ලසිත් මාලිංග | 120,750 | |
| 14 | මලින්ද වර්ණපුර | 47,250 | |
| 15 | තිලාන් තුෂාර | 49,613 | |
| 16 | ටී.කන්ඩම්බි | 49,613 | |
| 17 | දිල්හාර ප්‍රනාන්දු | 33,075 | |
| 18 | උපුල් තරංග | 49,613 | |
| 19 | ජෙහාන් මුබාරක් | 31,500 | |
| 20 | ඇන්ජලෝ මැතිව්ස් | 66,150 | |
| 21 | මහේල උඩවත්ත | 21,000 | |
| 22 | මාලිංග බණ්ඩාර | 21,000 | |
| 23 | චාමර සිල්වා | 21,000 | |
| 24 | රංගන හේරත් | 49,613 | |
| 25 | ධම්මික ප්‍රසාද් | 21,000 | |
| 26 | සී.වෙලගෙදර | 33,075 | |
| 27 | කෞෂාල් සිල්වා | 21,000 | |
| 28 | සුරංග ලක්මාල් | 21,000 | |
| 29 | ටී.පරණවිතාන | 33,075 | |
| 30 | එම්.පුෂ්පකුමාර | 21,000 | |
| 31 | මයිකල් වැන්ඩෝට් | 13,125 | |
| 32 | ගිහාන් රූපසිංහ | 15,750 | |
| 33 | සංජීව වීරකෝන් | 10,500 | |
| 34 | ඉසුරු උදාන | 10,500 | |
| 35 | චමින්ද විදානපතිරන | 10,500 | |
| 36 | දිනේෂ් දර්ශණප්‍රිය | 10,500 | |
| 37 | මිලින්ද සිරිවර්ධන | 10,500 | |
| 38 | දිමුත් කරුණාරත්න | | 60,000 |
| 39 | සචිත්‍ර සේනානායක | | 60,000 |
| 40 | නුවන් ප්‍රදීප් | | 60,000 |
| 41 | තිසර පෙරේරා | | 60,000 |
| 42 | ලහිරු තිරිමාන්න | | 60,000 |
| 43 | ශාලිකා කරුණානායක | | 60,000 |
| 44 | අෂාන් ප්‍රියන්ජන | | 60,000 |
| 45 | ජීවන් මෙන්ඩිස් | | 60,000 |
| 46 | සූරාජ් මොහොමඩ් | | 60,000 |
| 47 | කාංචන ගුණවර්ධන | | 60,000 |
| 48 | නදිර නාවෙල | | 60,000 |
| 49 | සචිත් පතිරණ | | 60,000 |
| 50 | එස්.ප්‍රසන්න | | 60,000 |
| 51 | රනේෂ් පෙරේරා | | 60,000 |
| 52 | මදුර ලක්මාල් | | 60,000 |
| 53 | සූජීව ද සිල්වා | | 60,000 |
| 54 | තරංග ලක්ෂිත | | 60,000 |
| 55 | කුෂාල් පෙරේරා | | 40,000 |
| 56 | ඇන්ජලෝ පෙරේරා | | 40,000 |
| 57 | විමල් සී පෙරේරා | | 40,000 |
| 58 | උමේෂ් කරුණාරත්න | | 40,000 |
| 59 | චතුරංග ද සිල්වා | | 40,000 |
| 60 | දිනේෂ් චන්දිමාල් | 22,050 | |
| 61 | දිල්ශාන් මුණවීර | | 40,000 |
| 62 | මාධව වර්ණපුර | | 40,000 |
| 63 | රොශේන් සිල්වා | | 40,000 |
| 64 | සචින්ද්‍ර ගුණතිලක | | 40,000 |
| 65 | ලහිරු ගමගේ | | 40,000 |
| 66 | මාලිංග පුෂ්පකුමාර | | 40,000 |
| 67 | ඉෂාන් ජයරත්න | | 40,000 |
| 68 | ප්‍රභාත් ප්‍රියංකර | | 40,000 |
| 69 | නවීන් කවිකාර | | 40,000 |
| 70 | දිල්හාර ලොකුහෙට්ටිගේ | | 100,000 |
| 71 | කවිෂාල් වීරරත්න | | 100,000 |
| 72 | කවිෂාල් ලොකුආරච්චි | | 100,000 |
| 73 | චින්තක ජයසිංහ | | 100,000 |
| 74 | ඉන්දික සේරම් | | 100,000 |
| 75 | ගයාත් විජේකෝන් | | 100,000 |
| 76 | ජීවන්ත කුලතුංග | | 100,000 |
| 77 | හසන්ත ප්‍රනාන්දු | | 100,000 |
| 78 | නුවන් සොයිසා | | 100,000 |
| 79 | ලහිරු තිරිමාන්න | 17,500 | |
| 80 | සූරාජ් රන්දිව් | 22,050 | |
| 81 | කවිශාල් සිල්වා | 17,500 | |
| 82 | කෝසල කුලසේකර | 12,500 | |
| 83 | එම් පුෂ්පකුමාර | 12,500 | |
| 84 | දිනේෂ් දර්ශණප්‍රිය | 7,500 | |
| 85 | සී.විදාණපතිරණ | 7,500 | |
| 86 | අශාන් ප්‍රියංජන | 7,500 | |
| 87 | ජානක ගුණරත්න | 7,500 | |
| 88 | කේ.ලොකුආරච්චි | 7,500 | |
| 89 | දිනුක් හෙට්ටිආරච්චි | 12,500 | |
| 90 | යොහාන් ද සිල්වා | | 40,000 |
| 91 | ශිත් අල්විස් | | 40,000 |
| 92 | අමල් ඇතුලත් මුදලි | | 40,000 |
| 93 | සමීර ද සොයිසා | | 40,000 |
| 94 | එස්.ගංගොඩවිල | | 40,000 |
| 95 | සමින්ද එරංග | | 40,000 |
| 96 | තිලංක ප්‍රේමරත්න | | 40,000 |
| 97 | ධනුෂ්ක ගුණතිලක | | 40,000 |

| | | | |
|---|---|---|---|
| 98 | හාණුක රාජපක්ෂ | | 40,000 |
| 99 | ශාලික කරුණානායක | | 40,000 |
| 100 | සජිත පතිරණ | | 40,000 |
| 101 | රනේෂ් පෙරේරා | | 40,000 |
| 102 | කුෂාන් ජනිත් පෙරේරා | | 40,000 |
| 103 | ඇන්ජලෝ පෙරේරා | | 40,000 |
| 104 | රොශාන් සිල්වා | | 40,000 |
| 105 | සොහාන් බොරලැස්ස | | 40,000 |
| 106 | සචිත්‍ර සේරසිංහ | | 40,000 |
| 107 | දිල්රුවන් පෙරේරා | | 40,000 |
| 108 | කාංචන ගුණවර්ධන | | 40,000 |
| 109 | ටී.එම් සම්පත් | | 40,000 |
| 110 | ශානුක දිසානායක | | 40,000 |
| 111 | අකලංක ගණේගම | | 40,000 |
| 112 | රොමේෂ් බුද්ධික | | 40,000 |
| 113 | කිත්රුවන් විතාණගේ | | 40,000 |
| 114 | චතුර පීරිස් | | 40,000 |
| 115 | චරිත ජයම්පති | | 40,000 |
| 116 | විමංග පෙරේරා | | 40,000 |
| 117 | තවීන් කවිකාර | | 40,000 |
| 118 | උමේෂ් කරුණාරත්න | | 40,000 |
| 119 | අමිල ප්‍රසාද් | | 40,000 |
| 120 | චින්තක පෙරේරා | | 40,000 |
| 121 | අරෝෂ ජනෝදා | | 40,000 |
| 122 | ගිහාන්ද සිල්වා | | 40,000 |
| 123 | සූරංග ලක්මාල් | | 40,000 |
| 124 | සමිත ද මෙල් | | 40,000 |
| 125 | දිල්ශාන් මුණවීර | | 40,000 |
| 126 | හැන්ස් ප්‍රනාන්දු | | 40,000 |

ඇමුණුම II

2005 සිට 2009 දක්වා කාලසීමාව තුළ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් ගෙවීම් කරන ක්‍රිකට් ක්‍රීඩකයන්ගේ නම් සහ එක් එක් ක්‍රිකට් ක්‍රීඩකයා සඳහා ලබාදුන් මූල්‍යමය පැකේජය.

| ක්‍රීඩකයන්ගේ නම් | | 2005 ඇමරිකන් ඩොලර් | 2006 ඇමරිකන් ඩොලර් | 2007 ඇමරිකන් ඩොලර් | 2008 ඇමරිකන් ඩොලර් | 2009 ඇමරිකන් ඩොලර් |
|---|---|---|---|---|---|---|
| 01 | එම්.ජයවර්ධන | 60,000 | 60,000 | 100,000 | 100,000 | 115,000 |
| 02 | කුමාර් සංගක්කාර | 60,000 | 60,000 | 100,000 | 100,000 | 115,000 |
| 03 | එම්.මුරලිදරන් | 60,000 | 60,000 | 100,000 | 100,000 | 115,000 |
| 04 | සනත් ජයසූරිය | 60,000 | 60,000 | 100,000 | 100,000 | 115,000 |
| 05 | සී.වාස් | 60,000 | 60,000 | 100,000 | 100,000 | 115,000 |
| 06 | තිලාන් සමරවීර | 25,000 | 15,000 | - | 60,000 | 78,750 |
| 07 | ටී.එම් ඩිල්ෂාන් | 25,000 | 30,000 | 35,000 | 60,000 | 78,750 |
| 08 | නුවන් කුලසේකර | - | 5,000 | 25,000 | 45,000 | 63,000 |
| 09 | ප්‍රසන්න ජයවර්ධන | - | 5,000 | 35,000 | 45,000 | 47,250 |
| 10 | ෆර්වීස් මහරූෆ් | - | 15,000 | 35,000 | 45,000 | 47,250 |
| 11 | අජන්ත මෙන්ඩිස් | - | - | - | - | 47,250 |
| 12 | චාමර කපුගෙදර | - | 5,000 | 25,000 | 45,000 | 47,250 |
| 13 | ලසිත් මාලිංග | 15,000 | 15,000 | 45,000 | 60,000 | 47,250 |
| 14 | මලින්ත වර්ණපුර | - | - | - | 30,000 | 47,250 |
| 15 | තිලින තුෂාර | - | - | - | - | 31,500 |
| 16 | ටී.කන්ඩම්බි | - | - | - | - | 31,500 |
| 17 | දිල්හාර ප්‍රනාන්දු | - | - | 25,000 | 45,000 | 31,500 |
| 18 | උපුල් තරංග | - | 15,000 | 45,000 | 45,000 | 31,500 |
| 19 | ජෙහාන් මුබාරක් | - | 5,000 | - | 30,000 | 31,500 |
| 20 | ඇන්ජලෝ මැතිව්ස් | - | - | - | - | 31,500 |
| 21 | මාලිංග බණ්ඩාර | - | 15,000 | 25,000 | 45,000 | - |
| 22 | චාමර සිල්වා | - | - | 25,000 | 45,000 | - |
| 23 | රංගන හේරත් | 15,000 | 15,000 | - | 45,000 | - |
| 24 | ධම්මික ප්‍රසාද් | - | 5,000 | - | - | - |
| 25 | මිචෙල් වැන්ඩෝට් | - | 5,000 | - | 45,000 | - |
| 26 | සංජීව වීරකෝන් | - | 5,000 | - | - | - |
| 27 | කව්ෂාල් ලොකුආරච්චි | - | 5,000 | - | - | - |
| 28 | අකලංක ගණේගම | - | 5,000 | - | - | - |
| 29 | එම්.අතපත්තු | 60,000 | 60,000 | 100,000 | - | - |
| 30 | උපුල් චන්දන | 25,000 | 15,000 | 25,000 | - | - |
| 31 | රසල් ආර්නල්ඩ් | - | 15,000 | 25,000 | - | - |
| 32 | රුවිර පෙරේරා | - | 15,000 | - | - | - |
| 33 | ඉෂාර අමරසිංහ | - | | - | 30,000 | - |

ගරු මන්ත්‍රීතුමනි, පළමුවැනි ලැයිස්තුවේ තිබෙනවා නම් 126ක්. නම් සහ ඔවුන්ගේ ගිවිසුම්ගත මුදල් ප්‍රමාණයන් තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නම් ලැයිස්තුවට අනුව වැඩිම එක සහ අඩුම එක කියන්න.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
සාමාන්‍යයෙන් අපි වැඩියෙන්ම ගෙවලා තිබෙන්නේ ඇමෙරිකානු ඩොලර් 1,20,000යි. අඩුවෙන්ම ඇමෙරිකානු ඩොලර් 10,000 දක්වා ගෙවලා තිබෙනවා. මේ ඇමුණුමෙහි සම්පූර්ණ උත්තරය තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමනි, සම්පූර්ණ උත්තරය ඒකද?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
සියල්ල තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය. ගරු ඇමතිතුමනි, අද "Daily Mirror" පුවත් පතේ Sports Page එකේ ඉදිරියෙන්ම තිබෙන්නේ "SLC Disaster Fund to settle a catastrophe?" කියලා. ඒ කියන්නේ මොකක්ද? ශ්‍රී ලංකා ක්‍රිකට් පාලක මණ්ඩලයේ 320ක් වැඩ කරන ඒ සේවකයන්ට ගෙවන්න අද ශත පහක්වත් නැති ලු. ඇමතිතුමා ඔබතුමා-

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු මන්ත්‍රීතුමනි, එය මේ ප්‍රශ්නයට අදාළ නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අදාළ නැති වෙන්න බැහැ. මම ප්‍රශ්නයෙන් Cricket Board එක ගැනයි අහලා තිබෙන්නේ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඒක අදාළ නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අදාළ නොවන්නේ කොහොමද?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
අදාළ නොවන්නේ ගිවිසුම් පිළිබඳවයි ඔබතුමා අහලා තිබෙන්නේ. මම ඒකට උත්තර දීලා තිබෙනවා. ඔබතුමා වෙන ප්‍රශ්නයක් විධියට ඇහුවොත් මම ඒකට උත්තර දෙන්නම්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඇමතිතුමනි, මම ප්‍රශ්නය අහනවා. ඇමතිතුමාට උදව් කරන්න කෙටියෙන් ඇහුවමත් ප්‍රශ්නයක් ඇති වෙනවා. 164 දෙනෙකුට ගිවිසුම් ගත කරලා තිබෙනවා. මේ අයට සල්ලි ගෙවන්න තිබෙනවා. ඒ සල්ලි එකතු කරන්න තිබෙන්නේ ක්‍රිකට් පාලක මණ්ඩලයෙන්. පාලක මණ්ඩලයේ 320ක් වැඩ කරනවා. ඒ 320ට පඩි ගෙවන්න බැරි නම් කොහොමද 164 දෙනෙකුට මේ සල්ලි ගෙවන්න පුළුවන් වන්නේ?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු මන්ත්‍රීතුමනි, අපට කිසිම මූල්‍ය අර්බුදයක් නැහැ. පත්තරේ තිබෙන දැන්වීම සම්බන්ධයෙන් අපේ කිසිම බැඳීමක් නැහැ. ක්‍රිකට් පාලක මණ්ඩලයේ සේවකයන්ට අද වන කොට කිසිම වැටුප් අඩු වීමක්, කිසිම දෙයක් වෙලා නැහැ. ගැටලුවක් නැහැ. අපට පඩි ගෙවීමේ හැකියාව තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා මේක සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කරනවා?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කරනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
බොහොම හොඳයි. ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. ඇමතිතුමනි, මෑතකදී ලෝක කුසලාන ක්‍රිකට් තරගය වෙනුවෙන් ලංකාවේ match 20ක් විතර පැවැත්වුවා. ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් පාලක මණ්ඩලයට කොතරම් ලාභයක් උපයන්නට හරි අලාභයක් විඳ ගන්නට හරි සිදු වුණාද කියලා කියන්න පුළුවන්ද?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු මන්ත්‍රීතුමනි, ඒක මෙහෙම කියන්න බැහැ. ඔබතුමා ඒක ගැන ප්‍රශ්නයක් ඇහුවොත් උත්තර දෙන්නට පුළුවන්. මොකද, ඒක විශාල වශයෙන් ගණන් හිලවු හදලා පිළිතුරු දිය යුතු එකක්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමනි, මට දළ වශයෙන් කියන්න පුළුවන්ද?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔබතුමා එය ප්‍රශ්නයක් හැටියට ඇහුවොත් මට පිළිතුරු දෙන්නට පුළුවන්. එහෙම නැතිව පිළිතුරු දෙන්න අමාරුයි ගරු මන්ත්‍රීතුමනි. මොකද, ලෝක කුසලාන ක්‍රිකට් තරගයක් පැවැත්වීම වගේ එකක් සඳහා වැය වුණු මුදල් පිළිබඳ ගණන් හිලවු ගැන ඔබතුමාට මෙහෙම ආවාට ගියාට උත්තර දෙන්න මට බැහැ. ඔබතුමා එය ප්‍රශ්නයක් හැටියට ඇහුවොත් අනිවාර්යයෙන්ම මට ඒ පිළිබඳව උත්තර දෙන්නට පුළුවන්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, එහෙම නම් මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මෙයයි. අපේ ක්‍රිකට් ක්‍රීඩකයන් ලොව විශිෂ්ට නමක් ලබා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් යම් රටවල් අපේ අයගේ ශක්තිය නැති කරන්න match fixing වැනි දේවල් ගැන කථා කර තිබෙනවා. නමුත් ඊට පසුව, එවැනි වටිනාකමක් තිබෙන -

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු මන්ත්‍රීතුමනි, මට ඔබතුමා කියන දේ ඇහෙන්නේ නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඇහෙන්නේ නැහැ, ගරු කථානායකතුමනි. ඇමතිතුමා කියන දේ ඇහෙන්නෙත් නැහැ. ඔබතුමාටත් ඇහෙන්නේ නැහැ. [බාධා කිරීමක්]

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කාර්මික දෝෂයක්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කාර්මික දෝෂයක් තිබෙනවාද කියා සොයා බලන්න.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු මන්ත්‍රීතුමනි, පොඩ්ඩක් "මයික්" එකට ළං වෙලා කථා කරන්න. එතකොට ඇහෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඇහෙනවා අඩුයි. [බාධා කිරීම්] හා, හොඳයි. දැන් බලන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ලංකාවේ විශේෂ ගණයේ පුද්ගලයන් කියා තිබෙනවා, මේ match fixing ගැන. ඔබතුමා ඇමතිවරයා වශයෙන් කරුණාකර අපට කියන්න පුළුවන්ද හෙළිදරව් වෙලා තිබෙන කරුණු මොනවාද කියලා? මොකද, මේක වැදගත්, වටිනාකමක් තිබෙන දෙයක්. අපට කුසලානය දිනා ගන්න උදවු කරපු පුද්ගලයන් මෙයට ඉදිරිපත් වෙලා තිබෙනවා. ඔබතුමා ඇමතිවරයා වශයෙන් ඒ සම්බන්ධයෙන් අපට හෙළිදරව් කිරීමක් කරන්න පුළුවන්ද? මොකක්ද මේ තිබෙන ප්‍රශ්නය? කවුද මේක යටපත් කරන්නේ?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඒ ප්‍රශ්නය නඟපු එක ගැන මා ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වනවා. ඔබතුමාගේම පක්ෂයේ ඔබතුමාට මනාප නොදීපු කෙනෙක් තමයි ඒ ප්‍රශ්නය පැන නැඟුවේ. කොළඹ දිස්ත්‍රික්කයේ ඔබතුමාගේ පක්ෂයේ ඔබතුමාට මනාප නොදීපු කෙනෙක්. ඔබතුමාට විරුද්ධව වැඩ කරපු කෙනෙක් තමයි ඒ ප්‍රකාශය කළේ. ඒ නිසා ඔබතුමා ඒ ගැන අහපු එක හොඳයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මේක මනාප ප්‍රශ්නයක් නොවෙයි නේ. මේ රටේ ක්‍රිකට් පිළිබඳ ප්‍රශ්නයක්.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඒක තමයි. ක්‍රිකට් ප්‍රශ්නයක් තමයි. කියපු කෙනා ගැනයි අපි කිව්වේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ක්‍රිකට් ගැන උත්තර දෙන්න.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔබතුමා විශේෂයෙන් ඒක ඇහුවේ ඒ නිසා යි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම ක්‍රිකට් ගැන ඇහුවාම ඔබතුමා පාපන්දු උත්තරයක් දෙන්නට ඕනෑ නැහැ නේ. ක්‍රිකට් ගැන උත්තර දෙන්න.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔබතුමා බොහොම උනන්දුවෙන් ඇහුවේ ක්‍රිකට්වලට වැඩියේ මනාප ප්‍රශ්නය ඔළුවේ තිබුණු නිසා නේ. හොඳයි, මා ඒකට උත්තරය දෙන්නම්. බොහොම ස්තුතියි, ඔබතුමා ඒ ප්‍රශ්නය ඇහුවාට.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ, නැහැ, එහෙම කිසිම ප්‍රශ්නයක්නැහැ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
නැත්නම් සාමාන්‍යයෙන් තමන්ගේම පක්ෂයේ කෙනෙක් එහෙම කරන්නේ නැහැ නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා මුරලි වෙන්න හදන්න එපා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු මන්ත්‍රීතුමනි, මා ඔබතුමාට කෙටියෙන් උත්තර දෙන්නම්. හෂාන් තිලකරත්න කියන බස්නාහිර පළාත් සභාවේ එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරයා තමයි මේ ප්‍රකාශය කළේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නම්, ගම් විස්තර ඇහුවේ නැහැ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔබතුමා ඇහුවාම මම කියන්න එපා යැ, කවුද කියලා. හෂාන් තිලකරත්න මන්ත්‍රීවරයා තමයි මේ ප්‍රකාශය මුලින්ම එක්තරා රූපවාහිනී නාලිකාවකට කර තිබුණේ. එතුමා මේ ප්‍රකාශය කළාට පසුව අපි එතුමාට දැනුම් දුන්නා, ඒ පිළිබඳව අපට දැනුවත් වෙන්න ඒ ගැන වහාම හෙළි කරන්නය කියලා. නමුත් එතුමා මේ සම්බන්ධයෙන් කිසිම හෙළිදරව්වක් කළේ නැහැ. ඊට පසුව මා පොලිස්පතිතුමාට පැමිණිල්ලක් කළා, මේ පිළිබඳව රටේ බරපතළ මතයක් ඇති වන නිසා එතුමාගෙන් අහලා අපට මේ පිළිබඳව වාර්තාවක් දෙන්න කියලා. පොලීසියට දෙවතාවක් එතුමාව කැඳෙව්වා. ඒ දෙවතාවේදීම එතුමා උත්තර දුන්නේ නැහැ. ඊට පස්සේ එතුමා කිව්වා, පොලිස් ආරක්ෂාව දුන්නොත් කියනවාය කියලා. අපි එතුමාට ලිපියක් යැව්වා, පොලිස් ආරක්ෂාව දෙනවා, කියන්න කියලා. දැන් එතුමා දුරකථනයට උත්තර දෙන්න එන්නේ නැහැ. එතුමාගේ බිරිඳයි දුරකථනයට answer කරන්නේ. ICC එකේ නිලධාරීන් පෙරේදා ලංකාවට ආවා. ICC එකේ නිලධාරීන් එතුමාව හම්බ වෙන්න ඉල්ලීමක් කළා. එතුමාගේ බිරිඳ දුරකථනයෙන් එතුමාව සම්බන්ධ කරන්නේ නැහැ. දැන් ඒ පළාත් සභා මන්ත්‍රීවරයා ආ ගිය අතක් නැහැ. අපි එක්සත් ජාතික පක්ෂයෙන් ඉල්ලීමක් කරනවා, එතුමා කොහේ හෝ ඉන්නවා නම් සොයා දෙන්නය කියලා. එතුමා ආ ගිය අතක් නැහැ. මා විශේෂයෙන් අපේ විපක්ෂ නායකතුමාගෙනුත් ඉල්ලීමක් කරනවා, අපට එතුමා සොයා දෙන්නය කියලා. එතුමා missing.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. අපි ප්‍රශ්න අංක 14ට යනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
හෂාන් තිලකරත්න කියන්නේ ලංකාවේ ක්‍රිකට් නායකයෙක්.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Ranil Wickremasinghe - Leader of the Opposition)
29 වනදා එතුමාගේ ගෙදර පිරිත් කියනවා. අපි ඇමතිතුමාටත් එයට ආරාධනා කරනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
හෂාන් තිලකරත්න කියන්නේ මේ රටේ විශේෂ ගණයේ ක්‍රිකට් නායකයෙක්. එතුමා හාස්‍යයට ලක් කරන්න එපා. අපි අහලා බලලා කියන්නම්. ඔබතුමන්ලාගේ පොරොන්දු කෝ? රුපියල් 2,500කින් පඩි වැඩි කරනවාය කිව්වා. ජීවන වියදම අඩු කරනවාය කිව්වා. [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒක මේකට අදාළ නැහැ.

## අඩු බර දරුවන්ගේ මන්ද පෝෂණ තත්ත්වය: ක්‍රියාමාර්ග
நிறை குறைந்த குழந்தைகளின் போஷாக்கின்மைநிலை: நடவடிக்கை
MALNUTRITION IN UNDERWEIGHT CHILDREN : MEASURES TAKEN

1019/'10

15.**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වර්ෂ 2010 අවසන් වන විට ශ්‍රී ලංකාවේ වාර්තා වූ අඩු බර දරුවන් නමැති මන්ද පෝෂණ තත්ත්වය ඇති දරුවන්ගේ ප්‍රතිශතය කොපමණද;

(ii) අඩු බර දරුවන්ගේ ප්‍රතිශතය අඩු කිරීමට රජය ගන්නා වූ ක්‍රියාමාර්ග කවරේද;

(iii) එම ක්‍රියාමාර්ග ඉහත මන්ද පෝෂණ තත්ත්වය අඩු කිරීමට ප්‍රමාණවත්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2010 ஆம் ஆண்டு இறுதியில் இலங்கையில் அறிக்கையிடப்பட்ட குறைந்த நிறை கொண்ட குழந்தைகளின் சதவீதம் எவ்வளவென்பதையும்;

(ii) குறைந்த நிறை கொண்ட குழந்தைகளின் சதவீதத்தை குறைப்பதற்கு அரசாங்கம் எடுக்கும் நடவடிக்கைகள் யாவையென்பதையும்;

(iii) இந்நடவடிக்கைகள் மேற்கூறப்பட்ட போஷாக்கின்மை நிலைமையினை குறைப்பதற்கு போதுமானதா என்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Will he inform this House-

(i) of the percentage of underweight children reported in Sri Lanka, by the end of the year 2010;

(ii) of the measures taken by the Government to minimize the percentage of underweight children;

(iii) whether those measures are sufficient to minimize the aforesaid malnutrition condition ?

(b) If not, why?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) i. ළමා ජනගහනයෙන් සියයට 21.1යි.

ii. ඇමුණුම බලන්න. ඇමුණුම **සභාගත*** කරමි. මුළු දිවයින පුරා ක්‍රියාත්මක වන වැඩසටහන් මා කලින් ඉදිරිපත් කළා. මෙය ජාතික පෝෂණ වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන වැඩසටහනක්. ඒ කරුණුමයි මෙම ප්‍රශ්නයටත් ඉදිරිපත් කරන්න තිබෙන්නේ.

iii. ඔව්.

(ආ) පැන නොනඟී.

***සභාමේසය මත තබන ලද ඇමුණුම:**
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*
*Annex tabled:*

**මුලු දිවයින පුරා ක්‍රියාත්මක වන වැඩසටහන්**

1. සෑම අලුත උපන් දරුවෙකුටම උපතේදී ළදරු ළමා වර්ධන සටහන් පතක් ලබා දීම තුළින් ළදරු ළමා සෞඛ්‍යයට අදාළ පණිවිඩ සහ පෝෂණ තත්ත්වය ඇගයීම ආරම්භ කිරීම.

2. උපතේ සිට මාස 06 දක්වා මව් කිරි පමණක් ලබා දීමට උපදෙස් ලබා දීම.

3. මව් කිරි ලබා දීම අවුරුදු 2 දක්වා පවත්වා ගෙන යාමට උපදෙස් ලබා දීම සහ ක්‍රියාමාර්ග ගැනීම පිළිබඳ විශේෂිත පුහුණුවක් ලබා දීම.

4. ළදරුවන්ගේ සහ ළමුන්ගේ වර්ධන තත්ත්වය ක්‍රමානුකූලව ඇගයීම හා ප්‍රවර්ධන.

5. ළදරුවන්ට හා ළමුන්ට අවශ්‍ය අමතර ආහාර ලබා දීම පිළිබඳ නව සංකල්ප හඳුන්වා දීම.

6. ඒකාබද්ධ පෝෂණ වැඩසටහන (ජීවන චක්‍රයේ විවිධ අවස්ථාවන් අරමුණු කර ගත් පෝෂණ වැඩසටහන්)

 - යෞවුන් වියේදී, විවාහයට පෙර කාන්තාවගේ, ගැබිනි මවගේ සහ කිරි දෙන මවගේ පෝෂණය නංවාලීම තුළින් අඩු බර උපත් අවම කිරීම.

 - ළදරුවන්ගේ හා පෙර පාසල් දරුවන්ගේ පෝෂණ තත්ත්වය නංවාලීම තුළින් මන්ද පෝෂණය අවම කිරීම.

7. අවුරුදු 5ට අඩු වයස් කාණ්ඩවල දරුවන්ගේ පෝෂණ ඌනතාව හඳුනා ගැනීම සහ පහත සඳහන් විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

 - ත්‍රිපෝෂ ලබා දීම, ක්ෂුද්‍ර පෝෂක ලබා දීම
 - විටමින් A අධිමාත්‍රා ලබා දීම
 - පාසල් ළමුන් සඳහා යකඩ සහ ෆෝලික් අම්ලය පෙති ලබා දීම.

8. උග්‍ර තීව්‍ර මන්ද පෝෂණය වැඩි දිස්ත්‍රික්ක හඳුනා ගෙන පෝෂණ පුනරුත්ථාපන වැඩසටහන් දිස්ත්‍රික්ක තුළ ක්‍රියාත්මක කිරීම (උතුරු නැගෙනහිර සියලුම දිස්ත්‍රික්ක සහ හම්බන්තොට, මොණරාගල, බදුල්ල, නුවරඑළිය)

 - උග්‍ර තීව්‍ර මන්ද පෝෂණය සහිත ළමුන් සඳහා ඖෂධීය ආහාර (BP 100, Plumpy nut, F100, F75) ලබා දීම.

 - මධ්‍යස්ථ තීව්‍ර මන්දපෝෂණය සහිත ළමුන් සඳහා පරිපූරක ආහාර (ත්‍රිපෝෂ, කෝන් සෝයා පිටි, අධිපෝෂිත ආහාර) ලබා දීම.

 - උග්‍ර තීව්‍ර මන්ද පෝෂණය සහිත රෝගී දරුවන් සඳහා රෝහල් තුළ විශේෂ ප්‍රතිකාර ලබා දීම.

9. පෝෂණය දියුණු කිරීම සඳහා ප්‍රජා සහභාගිත්වය පිළිබඳ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

10. පෝෂණය ඇතුළත්ව මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

11. ළමාවියේ පෝෂණය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා තාක්ෂණික සහාය ලබා දීම.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මේකයි. ඇත්ත වශයෙන්ම අඩු බර දරුවන්ගේ ප්‍රතිශතයේ අඩු වීමක් සිදු වෙලා තිබෙනවා. ඒක අපට සතුටු විය හැකි කාරණාවක්. නමුත් අපි ලෝකයත් එක්ක සංසන්දනය කළොත් ආසියා පැසිෆික් රටවල්වල ප්‍රතිශතය සියයට අටයි. කාර්මික රටවල්වල සියයට හතයි. ලතින් ඇමෙරිකානු රටවල්වල සියයට දහයයි. මැදපෙරදිග අප්‍රිකානු රටවල්වල සියයට එකොළහයි. ඒ වාගේම අඩුවෙන් සංවර්ධිත රටවල්වල -less-developed countries- සියයට පහළොවයි සියයට දාහතයි අතර ප්‍රතිශතයක් තිබෙන්නේ. නමුත් අපේ රටේ ප්‍රතිශතය ඔබතුමා සඳහන් කරපු ආකාරයට සියයට විසිඑකයි දශම හයයි. මේ සම්බන්ධයෙන් ඔය එකම උත්තරය හැම විටම කියවනවාට වඩා මේ ප්‍රතිශතය අවම කර ගන්නට සෞඛ්‍ය අමාත්‍යාංශය හරහා ක්‍රියාත්මක වන අලුත් වැඩසටහන මොකක්ද කියලා මා අහන්න කැමැතියි. අලුත් වැඩසටහන මොකක්ද?

**ගරු ලලිත් දිසානායක මහතා**
( மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු කථානායකතුමනි, දැන් මෙතුමා ඒ දර්ශකයන් ඉදිරිපත් කළා. එහිදී පැහැදිලිව කියන්න ඕනෑ, මුළු දිවයින පුරාම මේක ව්‍යාප්ත වීමක් නැහැ කියන එක. දිස්ත්‍රික්ක අනුව ගත්තාම යම් යම් දිස්ත්‍රික්කවල මේ තත්ත්වය තිබෙනවා. විශේෂයෙන් නුවරඑළිය දිස්ත්‍රික්කයේ තමයි සියයට හතළිහයි දශම අටක් තිබෙන්නේ. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඒ වාගේම බදුල්ල දිස්ත්‍රික්කයේ මේ තත්ත්වය තිබෙනවා. ඒ සඳහා ජාතික පෝෂණ ප්‍රතිපත්තිය තමයි අපි ක්‍රියාත්මක කරන්නේ. ඒ නිසා වෙන වෙනම ක්‍රියාමාර්ග ගන්න බැහැ. මොකද, සෞඛ්‍ය වැඩසටහන්වලදී ඒ අදාළ කොට්ඨාස ඉලක්ක කර ගෙන තමයි මේ වැඩසටහන ක්‍රියාත්මක කරන්නේ. ඒක එක් එක් කෙනාට වෙනස් වෙන්නේ නැහැ. මන්ද පෝෂණ තත්ත්වයන් ගත්තාම නීරක්තිය වෙන්න පුළුවන්; වයසට සරිලන උස අඩුකම, බර අඩුකම වෙන්න පුළුවන්; මිටි බව වෙන්න පුළුවන්. ඒ සඳහා ක්‍රියාත්මක වන වැඩ පිළිවෙළ වෙනස් වෙන්නේ නැහැ. ජාතික පෝෂණ වැඩසටහනක් තිබෙනවා. ඒ වැඩසටහන අපි ක්‍රියාත්මක කරනවා. මා හිතන විධියට ඒක කඩිනම් කිරීම සඳහා අතිගරු ජනාධිපතිතුමාත් සම්බන්ධ වුණු අමාත්‍යාංශ සම්බන්ධීකරණ වැඩසටහන් ක්‍රියාත්මක වෙනවා. එහෙම නැතිව වෙනස් වෙනස් වැඩසටහන් ක්‍රියාත්මක වන්නේ නැහැ. මේක තමයි තිබෙන ජාතික වැඩසටහන.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඊ ළඟ අතුරු ප්‍රශ්නය. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ රෝග නිවාරණ වැඩසටහන හරහා තමයි විශේෂයෙන්ම ඔබතුමා සඳහන් කරපු වැඩසටහන් ක්‍රියාත්මක වෙන්නේ. ඒවා ග්‍රාමීය මට්ටමේ, නාගරික මට්ටමේ ක්‍රියාත්මක කරන්නේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන්ලායි. වර්තමානයේ තිබෙන රෙගුලාසිවලට අනුව එක් පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියක් යටතට එනවා පුද්ගලයින් 3,000ක්. ඇත්ත වශයෙන්ම මේක විශාල කොට්ඨාසයක් නිසා කාර්ය බහුලයි. මා ඔබතුමාගෙන් අහන්න කැමැතියි, එක් පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියකට ලබා දෙන මේ ප්‍රමාණය 1,000කට අඩු කරලා වඩාත් විධිමත් සෞඛ්‍ය නිවාරණ වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න ඔබතුමාගේ සැලැස්මක් තිබෙනවාද කියා.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු කථානායකතුමනි, අග්නිදිග ආසියානු කලාපයේ හොඳම පවුල් සෞඛ්‍ය සේවිකාව හැටියටත්, ලෝකයේ හොඳම සෞඛ්‍ය සේවකයන් හතර දෙනා අතරටත් පත් වුණේ අපේ පවුල් සෞඛ්‍ය සේවිකාවක්. අපි ඒ ගැන සතුටු වනවා. මොකද, ලෝකයේම හතරවෙනි තැනත්, අග්නිදිග ආසියානු කලාපයේ පළමුවැනි තැනත් ඇය දිනා ගත්තා. එතුමිය අපේ ගරු අමාත්‍යතුමාගේ ගම් ප්‍රදේශයේයි.

ඊ ළඟ දේ තමයි, දැනටමත් පවුල් සෞඛ්‍ය සේවිකාවන් දහසක් බඳවා ගන්න අපේ ගරු ඇමතිතුමන් කටයුතු කර තිබීම. එයින් පන්සියයක් දැනට පුහුණු වෙනවා. මෙතුමන්ලාට කර ගන්න බැරි වුණ දේ අපේ අතිගරු ජනාධිපතිතුමා කරලා, දැන් නැඟෙනහිර ප්‍රදේශයත් නිදහස් කර ගෙන තිබෙනවා. ඒ ප්‍රදේශය සඳහාත් අවශ්‍ය පවුල් සෞඛ්‍ය සේවිකාවන් බඳවා ගැනීමට කටයුතු කර තිබෙනවා. මේක එක පාරට වැඩි කරන්න බැහැ. ක්‍රමානුකූලව කරන්නට ඕනෑ. මොන ක්‍රමයෙන් කළත්, යම් යම් අඩු පාඩුකම් තිබුණත් අද මේ පවුල් සෞඛ්‍ය සේවිකාව -සේවිකාව කියන්න හොඳ නැහැ- පවුල් සෞඛ්‍ය නිලධාරිතුමිය ඉතාම විශිෂ්ට වූ වැඩ කොටසක් ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල හරහා ක්‍රියාත්මක කරනවා. ඊ ළඟට ජාතික පෝෂණ මාසය වෙනුවෙන් මේ මාසය මුල් කර ගෙන අපි "පෝෂණය සැම වෙත - වගකීම ඔබ අත" කියන වැඩසටහන ක්‍රියාත්මක කරනවා. එහිදීත් අපි ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල හරහා පළාත් සහ දිස්ත්‍රික් මට්ටමින් විශාල වැඩ කොටසක් ක්‍රියාත්මක කරන්නට බලාපොරොත්තු වෙනවා. ඒ වැඩසටහන් ක්‍රියාත්මක වන විට මේ අඩු පෝෂණ තත්ත්වයන්, ඒ කියන්නේ ඉහළ දර්ශකයන් තව අඩු කර ගන්නට පුළුවන්කම ලැබෙනවා. ගරු මන්ත්‍රීතුමා, ඒ වාගේම ක්ෂයවීම වාගේ දේවල් ගත්තොත්, තමුන්නාන්සේගේ පැත්තෙන් ගත්තත් බර අඩු වීම, ක්ෂයවීම වාගේ දේවල් දේශපාලන පැත්තෙනුත් සිදු වනවා. ජාතික සංවිධායකකමට තමුන්නාන්සේලාගේ කෙනෙක් පත් කර ගන්න බැරි වුණා. [බාධා කිරීමක්] ඊ ළඟට තමුන්නාන්සේලා විකල්ප කෘත්‍යාධිකාරි මණ්ඩලයක් දාලා තිබෙනවා. අපි දකිනවා, තමුන්නාන්සේගේ බර විපක්ෂය හැටියට අඩු වෙලා තිබෙන බව.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තුන්වෙනි අතුරු ප්‍රශ්නය අහනවාද?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
අප්‍රේල් මාසයේ 12 වෙනිදා -නොනගත දවසේදී- නායකයා හැටියට ප්‍රකාශයක් කරනවා කියලා කිව්වා. ඒ නිසා පක්ෂය තුළ මන්ත්‍රීතුමාගේ බර අඩු වීම ගැන යම් කිසි-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔය ඇති. පිළිතුර ප්‍රමාණවත්.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
නීරක්තිය, බර අඩු වීම, ක්ෂයවීම ගැන මන්ත්‍රීතුමා යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළොත් හොඳයි කියා හිතනවා. මන්ත්‍රීතුමා පක්ෂය තුළ බර වැඩි කර ගන්න උත්සාහයක් කළා. නමුත් විපක්ෂ නායකතුමා -වයසෙන් වැඩි නිසාද දන්නේ නැහැ- එතුමාගේ බර වැඩි කර ගත්තා. [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් අපි දෙවැනි වටයට යනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ, නැහැ. කරුණාකරලා මට අතුරු ප්‍රශ්නය අහන්න අවසර දෙන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අතුරු ප්‍රශ්න තුනම ඇහුවේ නැද්ද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මේ සභාව විහිළුවට, හාස්‍යයට ලක් කරන්න එපා. මම දෙවෙනි අතුරු ප්‍රශ්නයට ඇහුවේ බොහොම සරල ප්‍රශ්නයක්. සෞඛ්‍ය කොට්ඨාසයක් කියන්නේ-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් ඒක විස්තර කරන්න දෙයක් නැහැ. තමුන්නාන්සේ තුන්වෙනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම ඇහුව ප්‍රශ්නයට උත්තරය දුන්නේ නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ කියන දේ තමයි උත්තරය.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
සෞඛ්‍ය වෛද්‍ය කොට්ඨාස ගැන අහනවා නම් වෙනම ප්‍රශ්නයක් අහන්න. එතකොට මම උත්තරය දෙන්නම්. මම පැහැදිලි කිරීමක් කළේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තුන්වෙනි අතුරු ප්‍රශ්නය අහනවාද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම අහන්නම්. අපේ ගරු නියෝජ්‍ය සෞඛ්‍ය ඇමතිතුමනි, බොහොම ස්තුතියි. ඔබතුමා සඳහන් කළා ආසියාවේ හොඳම පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනිය අපේ රටෙන් තේරුණු බව.ඊට අමතරව ලෝකයේ හොඳම සෞඛ්‍ය සේවකයින් හතර දෙනාටත් ඇය ඇතුළත් වුණා. ඇයගේ නම ලලිතා පද්මිණී. ජනාධිපතිතුමාත් ඔබතුමන්ලාත් ඇයට තිළිණයක් හැටියට යම් ගෞරව නාමයක් ප්‍රදානය කළා. නමුත් මේ වන විටත් ඇයට තමන්ගේම නිවසක් නැහැ. මා අහන්න කැමැතියි, අපේ රටට මේ තරම් ගරුත්වයක් ගෙනැත් දුන් අරලගංවිල ප්‍රදේශයේ ජීවත් වන ලලිතා පද්මිණී මහත්මියට අඩු ගණනේ නිවසක්වත් හදලා දෙන්න කටයුතු කරනවාද කියා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ අහන්න ඕනෑ ප්‍රශ්නය නොවෙයි අහන්නේ. අතුරු ප්‍රශ්න අහන ක්‍රමයක් තිබෙනවා. තමන්ට ඕනෑ ඕනෑ විධියට ප්‍රශ්න අහන්න බැහැ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, එතුමා ලබා දුන් උත්තරය සම්බන්ධව ප්‍රශ්නයක් තමයි මා ඇහුවේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මේ ප්‍රශ්නයට අදාළත් නැහැ; දීපු පිළිතුරුවලට අදාළත් නැහැ. ඒ නිසා ඒ ප්‍රශ්නය ඉවරයි. එහෙම ඕනෑ ඕනෑ ඒවා අහන්න බැහැ. ස්ථාවර නියෝග තිබෙනවා. ඉතාමත්ම හොඳම දේ තමයි තමුන්නාන්සේව උපදේශක කාරක සභාවට කැඳවා මේ විස්තර දෙන එක.

**ගරු විමල් වීරවංශ මහතා (ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு விமல் வீரவங்ச - நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொது வசதிகள் அமைச்சர்)
(The Hon. Wimal Weerawansa - Minister of Construction, Engineering Services, Housing and Common Amenities)
ගරු කථානායකතුමනි, මේ පිළිබඳව දැනටමත් ජනාධිපතිතුමා අපට උපදෙස් දීලා තිබෙනවා, එතුමිය වෙනුවෙන් නිවාසයක් ලබා දීම සඳහා අවශ්‍ය කටයුතු කරන්නය කියා. ජනාධිපතිතුමා දැනට සති දෙක තුනකට කලින් අපිට එහෙම දන්වා තිබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. දෙවන වටය.

## මාතර කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන පාසල්: ගුරු ඌනතා
## மாத்தறை கோட்டக்கல்வி அலுவலகம் நிருவகிக்கும் பாடசாலைகள்: ஆசிரியர் பற்றாக்குறை
## SCHOOLS ADMINISTERED BY MATARA DIVISIONAL EDUCATION OFFICE : TEACHER SHORTAGE

0816/’10

2. **ගරු ජෝන් අමරතුංග මහතා (ගරු බුද්ධික පතිරණ මහතා වෙනුවට)**
(மாண்புமிகு ஜோன் அமரதுங்க - மாண்புமிகு புத்திக பதிரண சார்பாக)
(The Hon. John Amaratunga on behalf of the Hon. Buddhika Pathirana)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, මාතර කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, මාතර කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම්, ලිපිනයන් හා දුරකථන අංක කවරේද;

(iii) එම පාසල්වලින් සිසුන් සියයට අඩු පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් කවරේද;

(v) සිසුන් සියයට අඩු පාසල්වලින් දැනට වසා දැමීමට තීරණය කර ඇති පාසල් සංඛ්‍යාව සහ ඒවායේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම කොට්ඨාසයේ ගුරු අතිරික්තයක් ඇති පාසල් තිබේද;

(ii) ගුරු අතිරික්තයක් පවතින විෂයයන් කවරේද;

(iii) එම පාසල්වල නම්, ලිපිනයන් හා දුරකථන අංක කවරේද;

(iv) ගුරු ඌනතා පවතින පාසල්වල නම් කවරේද;

(v) ගුරු ඌනතාවයන් පවතින විෂයයන් කවරේද;

(vi) එම ගුරු ඌනතා පවතින පාසල් සඳහා ගුරුවරුන් ලබාදීමට කටයුතු කරන්නේද;

(vii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மாத்தறை மாவட்டத்தின் மாத்தறை வலயக் கல்வி காரியாலயத்திற்குரிய மாத்தறை கோட்டக்கல்வி அலுவலகத்தினால் நிருவகிக்கப்படுகின்ற அரசாங்க பாடசாலைகளின் எண்ணிக்கை எத்தனை யென்பதையும்;

(ii) இப்பாடசாலைகளின் பெயர்கள், முகவரிகள் மற்றும் தொலைபேசி இலக்கங்கள் யாவையென்பதையும்;

(iii) இப்பாடசாலைகளில் நூறு மாணவர்களுக்குக் குறைவாக உள்ள பாடசாலைகளின் எண்ணிக்கை எத்தனையென்பதையும்;

(iv) அப்பாடசாலைகளின் பெயர்கள் யாவையென்ப தையும்;

(v) நூறு மாணவர்களுக்குக் குறைவாக உள்ள பாடசாலைகளில் மூடுவதற்காக தற்போது தீர்மானிக்கப்பட்டுள்ள பாடசாலைகளின் எண்ணிக்கை மற்றும் அவற்றின் பெயர்கள் யாவையென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) இக்கோட்டத்தில் ஆசிரியர் மிகை நிலவுகின்ற பாடசாலைகள் உள்ளனவா என்பதையும்;

(ii) ஆசிரியர் மிகை நிலவுகின்ற பாடங்கள் யாவையென்பதையும்;

(iii) இப்பாடசாலைகளின் பெயர்கள், முகவரிகள் மற்றும் தொலைபேசி இலக்கங்கள் யாவையென்பதையும்;

(iv) ஆசிரியர் பற்றாக்குறை நிலவுகின்ற பாடசாலை களின் பெயர்கள் யாவையென்பதையும்;

(v) ஆசிரியர் பற்றாக்குறை நிலவுகின்ற பாடங்கள் யாவையென்பதையும்;

(vi) இவ்வாசிரியர் பற்றாக்குறை நிலவுகின்ற பாடசாலைகளுக்கு ஆசிரியர்களைப் பெற்றுக் கொடுப்பதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(vii) ஆமெனில், இதற்காக எவ்வளவு காலம் எடுக்குமென்பதையும்

அவர் இச்சபைக்குக் குறிப்பிடுவாரா?

(இ) இன்றேல் ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House of -

(i) the number of schools administered by the Matara Divisional Education Office of the Matara Zonal Educational Office in the Matara District ?

(ii) the names, addresses and telephone numbers of those schools;

(iii) the number of schools in which the total number of students is less than one hundred ;

(iv) the names of those schools; and

(v) the number of schools that have been identified to be closed down out of the schools in which the total number of students is less than one hundred and their names ?

(b) Will he state in this House -

(i) whether there are schools in which there are excess teachers in this Division;

(ii) the subjects for which there are excess teachers;

(iii) the names, addresses and telephone umbers of those schools;

(iv) the names of the schools in which there is a shortage of teachers;

(v) the subjects for which there is a shortage of teachers;

(vi) whether action will be taken to provide teachers to those schools in which there is a shortage of teachers; and

(vii) if so, the period of time taken for it ?

(c) If not, why?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා (අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா - கல்வி பிரதி அமைச்சர்)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa - Deputy Minister of Education)

ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) රජයේ පාසල් - 43

(ii) පාසල්වල නම් හා ලිපිනයන් ඇමුණුම 1 හි දක්වා ඇත. (දුරකථන අංක දුරකථන නාමාවලියෙන් ලබා ගත හැක.)

(iii) පාසල් සංඛ්‍යාව - 09

(iv) * මාර/ තල්පාවිල ගැමුණු ක. වි.

* මාර/ ඩඩ්ලි සේනානායක ක. වි.

* මාර/ නාවිමන උතුර ක. වි.

* මාර/ පොල්හේන ක. වි.

* මාර/ රුවන් ඇල්ල ක. වි.

* මාර/ වටගෙදර ශ්‍රී අත්තදස්සී ක. වි.

* මාර/ උනෙල්ල ජයන්ති ක. වි.

* මාර/ දීයගහ නැඟෙනහිර ක. වි.

* මාර/ නූපෙ ශ්‍රී මේධානන්ද ක. වි.

(v) ඉන් කිසිවක් වසා දැමීමට අධ්‍යාපන අමාත්‍යාංශය දැනට තීරණය කර නැත.

(ආ) (i) ඔව්.

(ii) ප්‍රාථමික, ඉංග්‍රීසි, විද්‍යා, ගණිත

(iii) පාසල්වල නම් හා ලිපිනයන් ඇමුණුම 2 හි දක්වා ඇත.

(iv) * මාර/ තල්පාවිල ම.ම.වි.

* මාර/ මහමායා බා.ම.වි.

* මාර/ මාතර ම.ම.වි

* මාර/ සාන්ත තෝමස් පිරිමි වි.

(v) නැටුම්, චිත්‍ර, සංගීත, ප්‍රාථමික, විද්‍යා, ගණිත, ඉංග්‍රීසි

(vi) කලාප අධ්‍යාපන කාර්යාලය මඟින් කළමනාකරණය කරනු ඇත.

(vii) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

**ඇමුණුම 1**

මාතර අධ්‍යාපන කොට්ඨාසයේ රජයේ පාසල් ලේඛනය

| | පාසලේ නම | ලිපිනය |
|---|---|---|
| 1 | වටගෙදර ශ්‍රී අත්තදස්සී ක.වි. | වටගෙදර, නාදුගල, මාතර |
| 2 | තල්පාවිල ගැමුණු ක.වි. | කැකණදුර |
| 3 | ඩඩ්ලි සේනානායක ක.වි. | ඉසදීන් නගරය, මාතර |
| 4 | උනැල්ල ජයන්ති වි. | උනෙල්ල, පාලටුව |
| 5 | නාවිමන උතුර ක.වි. | නාවිමන, මාතර |
| 6 | දීයගහ නැගෙනහිර ක.වි. | දීයගහ, මාතර |
| 7 | පොල්හේන ම.වි. | පොල්හේන, මාතර |
| 8 | නූපෙ ශ්‍රී මේධානන්ද ක.වි. | මාතර |
| 9 | රුවන් ඇල්ල ක.වි. | නාවිමන |
| 10 | නාවිමන මහාරාජා ම.වි. | නාවිමන, මාතර |
| 11 | අංගුන්නබදුල්ල ක.වි. | වැල්ලේතොට, පාලටුව |
| 12 | තුඩාව ම.වි. | තුඩාව, මාතර |
| 13 | ගොඩගම අනගාරික ධර්මපාල වි. | ගොඩගම, මාතර |
| 14 | මොටාගෙදර ක.වි. | කැකණදුර, මාතර |
| 15 | වැවහමන්දුව වනිගසේකර ම.වි. | වැවහමන්දුව, මාතර |
| 16 | මොටාගෙදර බණ්ඩාරනායක ම.වි. | කැකණදුර |
| 17 | අත්තුඩාව ම.වි. | පාලටුව |
| 18 | දරුල් උලූම් ම.වි. | බතුතා පාර, මාතර |
| 19 | නාඉම්බල බණ්ඩත්තර ම.වි. | නාඉඹල, තිහගොඩ |
| 20 | කැකණදුර විජයබා ක.වි. | කැකණදුර |
| 21 | ඩී.එස්. සේනානායක ක.වි. | ගබඩාවීදිය, මාතර |
| 22 | හිත්තටිය ධර්මරාජ ම.වි. | මාතර |
| 23 | උයන්වත්ත ආදර්ශ ප්‍රා.වි. | මාතර |
| 24 | නිල්වලා ආදර්ශ ක.වි. | පල්ලිමුල්ල, මාතර |
| 25 | දීයගහ බටහිර ම.වි. | නාවිමන, මාතර |
| 26 | රෝහණ ම.වි. | මැද්දවත්ත, මාතර |
| 27 | නාදුගල ම.වි. | නාදුගල, මාතර |
| 28 | ඉල්මා විද්‍යාලය | කොටුවේගොඩ, මාතර |
| 29 | කොකාවල ම.ම.වි. | කැකණදුර |
| 30 | තල්පාවිල ම.ම.වි. | දෙවිනුවර |
| 31 | මහානාම ම.වි. | වල්ගම, මාතර |
| 32 | මහාමායා බාලිකා වි. | වෙරළ පාර, මාතර |
| 33 | තල්පාවිල මිහිදු ආදර්ශ වි. | දෙවිනුවර |
| 34 | වෙහෙරගම්පිටිය ඔිල්කට් ආදර්ශ වි. | වෙහෙරගම්පිටිය, මාතර |
| 35 | කොටුව ජනාධිපති ම.වි. | කොටුවේගොඩ, මාතර |
| 36 | පාලටුව ගුණරත්න ම.ම.වි. | පාලටුව, මාතර |
| 37 | පඹුරණ සාරිපුත්‍ර ම.වි. | පඹුරණ, මාතර |
| 38 | ශාන්ත සේවියර් වි. | කොටුවේගොඩ, මාතර |
| 39 | ශාන්ත තෝමස් බාලිකා වි. | වල්පල, මාතර |
| 40 | මාතර ම.ම.වි. | රාහුල පාර, මාතර |
| 41 | ශාන්තු තෝමස් බාලක වි. | කුමාරතුංග මාවත, මාතර |
| 42 | රාහුල වි. | අකුරැස්ස පාර, මාතර |
| 43 | සුජාතා වි. | රාහුල පාර, මාතර |

**ඇමුණුම 2**

මාතර අධ්‍යාපන කොට්ඨාසයේ ගුරු අතිරික්ත පවතින පාසල් ලේඛනය

| | පාසලේ නම | ලිපිනය |
|---|---|---|
| 1 | තල්පාවිල ගැමුණු ක.වි. | කැකණදුර |
| 2 | ඩඩ්ලි සේනානායක ක.වි. | ඉසදීන් නගරය, මාතර |
| 3 | උනැල්ල ජයන්ති වි. | උනෙල්ල, පාලටුව |
| 4 | නාවිමන උතුර ක.වි. | නාවිමන, මාතර |
| 5 | දීයගහ නැගෙනහිර ක.වි. | දීයගහ, මාතර |
| 6 | පොල්හේන ම.වි. | පොල්හේන, මාතර |
| 7 | නූපෙ ශ්‍රී මේධානන්ද ක.වි. | මාතර |
| 8 | රුවන් ඇල්ල ක.වි. | නාවිමන |
| 9 | නාවිමන මහාරාජා ම.වි. | නාවිමන, මාතර |
| 10 | ආගුන්නබදුල්ල ක.වි. | වැල්ලේතොට, පාලටුව |
| 11 | තුඩාව ම.වි. | තුඩාව, මාතර |
| 12 | ගොඩගම අනගාරික ධර්මපාල වි. | ගොඩගම, මාතර |
| 13 | මොටාගෙදර ක.වි. | කැකණදුර, මාතර |
| 14 | වැවහමන්දුව වනිගසේකර ම.වි. | වැවහමන්දුව, මාතර |
| 15 | මොටාගෙදර බණ්ඩාරනායක ම.වි. | කැකණදුර |
| 16 | දරුල් උලූම් ම.වි. | බතුතා පාර, මාතර |
| 17 | නාඉම්බල බණ්ඩත්තර ම.වි. | නාඉඹල, තිහගොඩ |
| 18 | කැකණදුර විජයබා ක.වි. | කැකණදුර |
| 19 | හිත්තටිය ධර්මරාජ ම.වි. | මාතර |
| 20 | උයන්වත්ත ආදර්ශ ප්‍රා.වි. | මාතර |
| 21 | දීයගහ බටහිර ම.වි. | නාවිමන, මාතර |
| 22 | නාදුගල ම.වි. | නාදුගල, මාතර |
| 23 | ඉල්මා විද්‍යාලය | කොටුවේගොඩ, මාතර |
| 24 | කොකාවෙල ම.ම.වි. | කැකණදුර |
| 25 | මහානාම ම.වි. | වල්ගම, මාතර |
| 26 | තල්පාවිල මිහිදු ආදර්ශ වි. | දෙවිනුවර |
| 27 | වෙහෙරගම්පිටිය ඔිල්කට් ආදර්ශ වි. | වෙහෙරගම්පිටිය, මාතර |
| 28 | පාලටුව ගුණරත්න ම.ම.වි. | පාලටුව, මාතර |
| 29 | පඹුරණ සාරිපුත්‍ර ම.වි. | පඹුරණ, මාතර |
| 30 | ශාන්ත ස(ර්)වේශස් වි. | කොටුවේගොඩ, මාතර |
| 31 | ශාන්ත තෝමස් බාලිකා වි. | වල්පල, මාතර |
| 32 | රාහුල වි. | අකුරැස්ස පාර, මාතර |
| 33 | සුජාතා වි. | රාහුල පාර, මාතර |

## ඒ.එච්.එම්. මහ්රූෆ් මහතා : විශ්‍රාම වැටුප
## திரு. ஏ.எச்.எம். மஹ்ருப் : ஓய்வூதியம்
MR. A.H.M. MAHROOF : PENSION

0978/'10

**4. ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා (ගරු එම්.ටී. හසන් අලි මහතා වෙනුවට)**

(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் - மாண்புமிகு எம்.ரீ. ஹஸன் அலி சார்பாக)

(The Hon. Alhaj A.H.M. Azwer on behalf of the Hon. M.T. Hasen Ali)

පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) කොළඹ මහ නගර සභාවේ සහකාර වැද්දුම්කරු තනතුර දරමින් සිටියදී, වර්ෂ 2008-11-20 දින විශ්‍රාම ගිය ඒ. එච්. එම්. මහ්රූෆ් මහතාට විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ලබාදෙන ප්‍රදානයන් සහ විශ්‍රාම වැටුප් ගණනය කිරීමේදී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් (HRC/2505/05 හා 2007-06-14 දින) ලබා දී ඇති නියෝග අනුව, වර්ෂ 1989-4-27 දින සිට සහකාර වැද්දුම්කරු තනතුරේ ස්ථිර සේවකයෙකු ලෙස හා 1989 සිට පුහුණු I පන්තියේ II ශ්‍රේණියේ වැද්දුම්කරු තනතුරට උසස්වීම් ලද අයෙකු ලෙස සැලකිය යුතු බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) එසේ නම්, එම කරුණු සලකමින් මහ්රූෆ් මහතාගේ විශ්‍රාම වැටුප සහ ඊට අදාළව හිමි විය යුතු සියලු දීමනා සකසා නොපමාව ලබාදීමට පියවර ගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

உள்ளூராட்சி, மாகாண சபைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) கொழும்பு மாநகர சபையின் உதவி உருக்கி ஒட்டுநர் பதவியை வகித்துக்கொண்டிருந்த போது 2008.11.20 ஆம் திகதி ஓய்வுபெற்ற திரு. ஏ.எச்.எம். மஹ்ருபுக்கு ஓய்வூதியப் பிரமாணங்களின் அடிப்படையில் வழங்கப்படும் கொடைகள் மற்றும் ஓய்வூதியத்தைக் கணிப்பிடுகையில், இலங்கை மனித உரிமைகள் ஆணைக்குழுவினால் (H R C / 2 5 0 5 / 0 5ஆம் 2007/06/14ஆம் திகதி) வழங்கப்பட்டுள்ள கட்டளைக்கமைய, 1989/4/27 திகதி தொடக்கம் உதவி உருக்கி ஒட்டுநர் பதவியில் நிரந்தர ஊழியராகவும் 1989 தொடக்கம் பயிற்சி I வகுப்பில் தரம் II உருக்கி ஒட்டுநர் பதவிக்கு உயர்வு பெற்றவராகவும் கருதப்பட வேண்டுமென்பதை அவர் ஏற்றுக்கொள்வாரா?

(ஆ) ஆமெனின், இந்த விடயங்களை கருத்திற்கொண்டு திரு. மஹ்ருபின் ஓய்வூதியம் மற்றும் அதற்கு ஏற்புடையதாக கிடைக்கவேண்டிய அனைத்து கொடுப்பனவுகளை தயாரித்து தாமதமின்றி வழங்குவதற்கு நடவடிக்கை எடுப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Local Government and Provincial Councils:

(a) Will he admit that in computing the grants and pension provided under the minutes on pensions to Mr. A.H.M. Mahroof who retired on 20.11.2008 while holding the post of Assistant Fitter at the Colombo Municipal Council, he should be under instructions of the Human Rights Commission (over HRC/2505/05) dated 14.06.2007) considered as a permanent employee in the capacity of Assistant Fitter with effect from 27.04.1989 and as a person who was promoted to the post of Fitter of Trained Class 1 Grade II with effect from 1989?

(b) If so, will he state whether steps will be taken to adjust Mr. Mahroof's pension and all other allowances that he is entitled to with relevant to the pension and provide them to him without delay, by considering the above mentioned matters?

(c) If not, why ?

**ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා**
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)

ගරු කථානායකතුමනි, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) නැත.

(ආ) මහරූෆ් මහතාට හිමි නැවත සේවයේ පිහිටවූ 1999.06.29 දින සිට සියලු හිඟ වැටුප් සහ දීමනා ගෙවා ඇත.

(ඇ) පැන නොනඟී.

## ආයුර්වේද රෝහල් : ඖෂධ හිඟය
## ஆயுர்வேத மருத்துவ நிலையங்கள்: மருந்துத் தட்டுப்பாடு
## AYURVEDIC HOSPITALS : DRUG SHORTAGE

1012/'10

5. **ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා (ගරු ශාන්ත බණ්ඩාර මහතා වෙනුවට)**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் - மாண்புமிகு சாந்த பண்டார சார்பாக)
(The Hon. Alhaj A.H.M. Azwer on behalf of the Hon. Shantha Bandara)

දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ලංකාවේ දැනට තිබෙන ආයුර්වේද රෝහල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතුරින් කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ඇති ආයුර්වේද රෝහල් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත අ(i) හි සඳහන් ප්‍රධාන ආයුර්වේද රෝහල්වලට අමතරව පළාත් පාලන ආයතන යටතේ පාලනය වන හෝ නොවන ග්‍රාමීය මට්ටමේ ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථාන ඇති බවත්;

(ii) එම මධ්‍යස්ථානවලට අවශ්‍ය ඖෂධ වර්ග ප්‍රමාණවත්ව නොලැබෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) ප්‍රමාණවත් තරම් ඖෂධ නොලැබෙන ආයුර්වේද මධ්‍යස්ථානවලට ඖෂධ ලබා දීම සඳහා මධ්‍යම රජයේ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මඟින් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

சுதேச மருத்துவத்துறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் தற்சமயம் காணப்படும் ஆயுர்வேத வைத்தியசாலைகளின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(ii) இவற்றில் குருநாகல் மாவட்டத்தில் உள்ள ஆயுர்வேத வைத்தியசாலைகள் யாவையென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) மேற்கூறப்பட்ட (அ)(i) இல் குறிப்பிடப்பட்டுள்ள பிரதான ஆயுர்வேத வைத்தியசாலைகளுக்கு மேலதிகமாக உள்ளூராட்சி மன்றங்களின் கீழ் நிர்வகிப்படும் அல்லது அவற்றால் நிர்வகிக்கப்படாத கிராமிய மட்டத்திலான ஆயுர்வேத மருத்துவ நிலையங்கள் உள்ளனவென்பதையும்;

(ii) மேற்படி நிலையங்களுக்குத் தேவையான மருந்து வகைகள் போதுமான அளவில் கிடைப்பதில்லை என்பதையும்

அவர் அறிவாரா?

(இ) போதுமான அளவில் மருந்துவகைகள் கிடைக்காத ஆயுர்வேத மருத்துவ நிலையங்களுக்கு மருந்துகளை பெற்றுக்கொடுப்பதற்கு மத்திய அரசாங்கத்தின் சுதேச மருத்துவ அமைச்சின் ஊடாக வேலைத்திட்டமொன்றை நடைமுறைப் படுத்துவதற்குத் தேவையான நடவடிக்கைகளை எடுப்பாரா என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Indigenous Medicine:

(a) Will he state-

(i) the number of Ayurvedic hospitals situated in Sri Lanka at present;

(ii) the number of Ayurvedic hospitals situated in the Kurunegala district out of those hospitals ?

(b) Is he aware that-

(i) there are Ayurvedic Medical Centres at rural level which are administered or not administered by local government authorities in addition to the main Ayurvedic hospitals mentioned in the a (i) above; and

(ii) the aforesaid medical centres do not receive sufficient amounts of necessary drugs ?

(c) Will he state whether necessary steps will be taken to implement a programme under the Ministry of Indigenous Medicine of the Central Government in order to provide drugs to the Ayurvedic Medical Centres which do not receive sufficient amounts of drugs ?

(d) If not, why?

**ගරු සී.පී.ඩී. බණ්ඩාරනායක මහතා)**
(மாண்புமிகு சீ.பீ.டி. பண்டாரநாயக்க)
(The Hon. C.P.D. Bandaranaike)

ගරු කථානායකතුමනි, දේශීය වෛද්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ආයුර්වේද රෝහල් සංඛ්‍යාව 64කි.

(ii) ඔව්.

කුරුණෑගල පළාත් ආයුර්වේද රෝහල

ග්‍රාමීය රෝහල්

1. නාරම්මල ආයුර්වේද රෝහල
2. දොඩංගස්ලන්ද ආයුර්වේද රෝහල
3. මුරුතැන්ගේ ආයුර්වේද රෝහල
4. නැදලගමුව ආයුර්වේද රෝහල
5. වාරියපොල ආයුර්වේද රෝහල
6. අඹන්පොල ආයුර්වේද රෝහල

(ආ) (i) **මධ්‍යම බෙහෙත් ශාලා (පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවට අයත්)**

| | | |
|---|---|---|
| වැල්ලව | කුඹුක්ගැටේ | මීගලෑව |
| මුතුගල | මීතැන්වල | නිකවැරටිය |
| යගම්වෙල | කිරන්දව | කීළවලාන |
| වල්පිටගම | කොබෙයිගනේ | මහපිටිය |
| රම්බඩගල්ල | ඉන්ගරදවුල | කුළියාපිටිය |
| බළල්ල | රාජාංගනය | තම්බුව |
| වෙල්පල්ල | කොස්ගොල්ල | හොරොම්බුව |
| වඳුරස්සේගම | මහරච්චිමුල්ල | ගල්ගමුව |
| බෝයගොඩ | තඹරෝඹුව | |

**නිදහස් ආයුර්වේද මධ්‍යඹ බෙහෙත් ශාලා (පළාත් පාලන ආයතනවලට අයත්)**

කුළියාපිටිය නගර සභාව

පන්නල ප්‍රාදේශීය සභාව

ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව

බිංගිරිය ප්‍රාදේශීය සභාව

අලව්ව ප්‍රාදේශීය සභාව

උඩුබද්දාව ප්‍රාදේශීය සභාව

පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව

මාවතගම ප්‍රදේශීය සභාව

(ii) ඔව්.

(ඇ) ඔව්.

දේශීය වෛද්‍ය අමාත්‍යාංශය වෙත දිවයිනේ සියලුම පළාත් පාලන ආයතනවල ඇති නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලා සඳහා ඖෂධ ලබා දීමට භාණ්ඩාගාරයෙන් සීමිත මුදලක් වෙන් කරනු ලැබේ. ඒ අනුව 2011 වසර සඳහා රු. මිලියන 47ක් වෙන් කර දී ඇති අතර, මිලියන 2.7ක මුදලක් දැනටමත් වයඹ පළාත් සභාවට අයත් නිදහස් බෙහෙත් ශාලා සඳහා ඖෂධ ලබා දීමට වෙන් කර ඇත. ඉදිරියේදී මෙම මුදල් ප්‍රමාණය තවත් වැඩි කර දීමට අදහස් කරනු ලැබේ.

නිදහස් බෙහෙත් ශාලා සඳහා අවශ්‍ය සියලුම ඖෂධ අවශ්‍යතාවයන් සම්පූර්ණ කිරීමට මෙම ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන නිසා මේ පිළිබඳව දැනට පළාත් පාලන අමාත්‍යාංශය සමඟද සාකච්ඡා කර ඇති අතර, ඉදිරියේදී මෙම ප්‍රතිපාදන ප්‍රමාණය වැඩි කර දීමට වැඩ පිළිවෙලක් දැනට සකස් කරමින් පවතී.

කෙසේ වෙතත් මෙම කාර්යය සම්පූර්ණයෙන්ම සාර්ථකව ක්‍රියාත්මක කිරීමට අදාළ පළාත් පාලන ආයතනවල හා පළාත් සභාවේ දායකත්වයද අවශ්‍ය බව සඳහන් කරනු කැමැත්තෙමි.

(ඈ) අදාළ නොවේ.

## දික්වැල්ල කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන පාසල් : ගුරු ඌනතා
## திக்வெல்ல கோட்டக்கல்வி அலுவலகம் நிருவகிக்கும் பாடசாலைகள்: ஆசிரியர் பற்றாக்குறை
## SCHOOLS ADMINISTERED BY DIKWELLA DIVISIONAL EDUCATION OFFICE : TEACHER SHORTAGE

0817/’10

8. **ගරු ජෝන් අමරතුංග මහතා (ගරු බුද්ධික පතිරණ මහතා වෙනුවට)**
(மாண்புமிகு ஜோன் அமரதுங்க - மாண்புமிகு புத்திக பதிரண சார்பாக)
(The Hon. John Amaratunga on behalf of the Hon. Buddhika Pathirana)

අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, මාතර කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, දික්වැල්ල කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම්, ලිපිනයන් හා දුරකථන අංක කවරේද;

(iii) එම පාසල්වලින් සිසුන් සියයට අඩු පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) සිසුන් සියයට අඩු පාසල්වලින් දැනට වසා දැමීමට තීරණය කර ඇති පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම කොට්ඨාසයේ ගුරු අතිරික්තයක් ඇති පාසල් තිබේද;

(ii) එම පාසල්වල නම්, ලිපිනයන් හා දුරකථන අංක කවරේද;

(iii) ගුරු ඌනතා පවතින පාසල්වල නම් කවරේද;

(iv) ගුරු ඌනතාවයන් පවතින විෂයයන් කවරේද;

(v) එම ගුරු ඌනතා පවතින පාසල් සඳහා ගුරුවරුන් ලබාදීමට කටයුතු කරන්නේද;

(vi) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மாத்தறை மாவட்டத்தின் மாத்தறை வலயக் கல்வி காரியாலயத்திற்குரிய திக்வெல்ல கோட்டக்கல்வி அலுவலகத்தினால் நிருவகிக்கப்படுகின்ற அரசாங்க பாடசாலைகளின் எண்ணிக்கை எத்தனை யென்பதையும்;

(ii) இப்பாடசாலைகளின் பெயர்கள், முகவரிகள் மற்றும் தொலைபேசி இலக்கங்கள் யாவை யென்பதையும்;

(iii) இப்பாடசாலைகளில் நூறு மாணவர்களுக்குக் குறைவாக உள்ள பாடசாலைகளின் எண்ணிக்கை எத்தனையென்பதையும்;

(iv) நூறு மாணவர்களுக்குக் குறைவாக உள்ள பாடசாலைகளில் மூடுவதற்காக தற்போது தீர்மானிக்கப்பட்டுள்ள பாடசாலைகளின் பெயர்கள் யாவையென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) இக்கோட்டத்தில் ஆசிரியர் மிகை நிலவுகின்ற பாடசாலைகள் உள்ளனவா என்பதையும்;

(ii) இப்பாடசாலைகளின் பெயர்கள், முகவரிகள் மற்றும் தொலைபேசி இலக்கங்கள் யாவை யென்பதையும்;

(iii) ஆசிரியர் பற்றாக்குறை நிலவுகின்ற பாடசாலை களின் பெயர்கள் யாவையென்பதையும்;

(iv) ஆசிரியர் பற்றாக்குறை நிலவுகின்ற பாடங்கள் யாவையென்பதையும்;

(v) இவ்வாசிரியர் பற்றாக்குறை நிலவுகின்ற பாடசாலைகளுக்கு ஆசிரியர்களைப் பெற்றுக் கொடுப்பதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(vi) ஆமெனில், இதற்காக எவ்வளவு காலம் எடுக்குமென்பதையும்

அவர் இச்சபைக்குக் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House of -

(i) the number of schools administered by the Dikwella Divisional Education Office of the Matara Zonal Educational Office in the Matara District ;

(ii) the names, addresses and telephone numbers of those schools;

(iii) the number of schools in which the total number of students is less than one hundred out of the schools mentioned above ; and

(iv) the names of schools that have been identified to be closed down out of the schools in which the total number of students is less than one hundred?

(b) Will he state in this House -

(i) whether there are schools in which there are excess teachers in this Division;

(ii) the names, addresses and telephone numbers of those schools;

(iii) the names of the schools in which there is a shortage of teachers;

(iv) the subjects for which there is a shortage of teachers;

(v) whether action will be taken to provide teachers to those schools in which there is a shortage of teachers; and

(vi) if so, the period of time taken for it ?

(c) If not, why?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) රජයේ පාසල් - 25

(ii) පාසල්වල නම් හා ලිපිනයන් ඇමුණුම 1හි දැක්වේ. (දුරකථන අංක දුරකථන නාමාවලියෙන් ලබා ගත හැක.)

(iii) පාසල් සංඛ්‍යාව - 07

(iv) ඉන් කිසිවක් වසා දැමීමට අධ්‍යාපන අමාත්‍යාංශය දැනට තීරණය කර නැත.

(ආ) (i) ඔව්.

(ii) පාසල්වල නම් හා ලිපිනයන් ඇමුණුම 2හි දැක්වේ.

(iii) * මාර/ මින්හත් ජාතික පාසල

* මාර/ ගොඩඋඩ නවෝද්‍යා ම.වි.

* මාර/ කුමාරතුංග මුණිදාස ම.වි.

* මාර/ විජිත ම.ම.වි.

(iv) නැටුම්, චිත්‍ර, සංගීත, ප්‍රාථමික, විද්‍යා, ගණිත, ඉංග්‍රීසි

(v) කලාප අධ්‍යාපන කාර්යාලය මඟින් කළමනාකරණය කරනු ඇත.

(vi) අදාළ නොවේ.

(v) අදාළ නොවේ.

ඇමුණුම - 01

දික්වැල්ල අධ්‍යාපන කොට්ඨාසයේ රජයේ පාසල් ලේඛනය

| | පාසලේ නම | ලිපිනය |
|---|---|---|
| 1 | ඉහළගොඩ ක.වි. | ඉහළගොඩ, ඌරුගමුව |
| 2 | පාතේගම දකුණ සිරිසුමන ක.වි. | කෝට්ටගොඩ |
| 3 | අලුත්ගොඩ වි. | දික්වැල්ල |
| 4 | තලහිටියාගොඩ වි. | රත්මලේ |
| 5 | මාලියැද්ද විජය වි. | දික්වැල්ල |
| 6 | බෝදරකන්ද රතනජෝති වි. | ඌරුගමුව |
| 7 | මීගස්දෙණිය ක.වි. | ඌරුගමුව |
| 8 | අරන්කහදෙණිය ක.වි. | ඌරුගමුව |
| 9 | දොඩම්පහළ ක.වි. | දික්වැල්ල |
| 10 | දන්දෙණිය ක.වි. | රත්මලේ |
| 11 | වෙහැල්ල ක.වි. | ඌරුගමුව |
| 12 | දික්වැල්ල මෙතෝදිස්ත ක.වි. | දික්වැල්ල |
| 13 | දෙමටපිටිය ම.වි. | වලස්ගල |
| 14 | අකුරුබැඹිල ක.වි. | දික්වැල්ල |
| 15 | බෙලිදෙනිය ම.වි. | කෝට්ටගොඩ |
| 16 | ඌරුගමුව මෙතෝදිස්ත වි. | ඌරුගමුව |
| 17 | බතීගම ම.වි. | දික්වැල්ල |
| 18 | මුරුතගස්පිටිය ක.වි. | ඌරුගමුව |
| 19 | බඹරැන්ද සද්ධර්මරාජ ම.වි. | රත්මලේ |
| 20 | රදම්පොළ ශ්‍රී සුමංගල ම.ම.වි. | රදම්පොළ |
| 21 | දික්වැල්ල උතුර ම.වි. | දික්වැල්ල |
| 22 | මින්හත් ජාතික පාසල | සන්දිස් පාර, දික්වැල්ල |
| 23 | ගොඩඋඩ නාවෝදා ම.වි. | කෝට්ටගොඩ |
| 24 | කුමාරතුංග මුනිදාස ම.වි. | දික්වැල්ල |
| 25 | විජිත ම.ම.වි. | දික්වැල්ල |

ඇමුණුම - 02

දික්වැල්ල අධ්‍යාපන කොට්ඨාසයේ ගුරු අතිරික්ත පවතින පාසල් ලේඛනය

| | පාසලේ නම | ලිපිනය |
|---|---|---|
| 1 | පාතේගම දකුණ සිරිසුමන ක.වි. | කෝට්ටගොඩ |
| 2 | අලුත්ගොඩ වි. | දික්වැල්ල |
| 3 | තලහිටියාගොඩ වි. | රත්මලේ |
| 4 | මාලියැද්ද විජය වි. | දික්වැල්ල |
| 5 | බෝදරකන්ද රතනජෝති වි. | ඌරුගමුව |
| 6 | මීගස්දෙණිය ක.වි. | ඌරුගමුව |
| 7 | අරන්කහදෙණිය ක.වි. | ඌරුගමුව |
| 8 | දොඩම්පහළ ක.වි. | දික්වැල්ල |
| 9 | දන්දෙණිය ක.වි. | රත්මලේ |
| 10 | දික්වැල්ල මෙතෝදිස්ත ක.වි. | දික්වැල්ල |
| 11 | දෙමටපිටිය ම.වි. | වලස්ගල |
| 12 | බතීගම ම.වි. | දික්වැල්ල |
| 13 | බඹරැන්ද සද්ධර්මරාජ ම.වි. | රත්මලේ |
| 14 | රදම්පොළ ශ්‍රී සුමංගල ම.ම.වි. | රදම්පොළ |
| 15 | දික්වැල්ල උතුර ම.වි. | දික්වැල්ල |

## ගෘහ සේවිකා රිසානා නෆීක් මෙනෙවිය : විදේශ ගමන් ලියවිලි
## வீட்டுப் பணிப்பெண் செல்வி றிசானா நபீக்: வெளிநாட்டுப் பயண ஆவணங்கள்
## HOUSEMAID MISS RIZANA NAFEEK : FOREIGN TRAVEL DOCUMENTS

0980/'10

**10.** **ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා (ගරු එම්.ටී. හසන් අලි මහතා වෙනුවට)**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் - மாண்புமிகு எம்.ரீ. ஹஸன் அலி சார்பாக)
(The Hon. Alhaj A.H.M. Azwer on behalf of the Hon. M.T. Hasen Ali)

විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) ශ්‍රී ලංකාවේ සිට සෞදි අරාබියාවේ ගෘහ සේවිකාවක් ලෙස සේවයට ගිය, රිසානා නෆීක් මෙනෙවියට එරට අධිකරණය මඟින් මරණ දඬුවම් නියම කොට ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) රිසානා නෆීක් මෙනෙවිය ශ්‍රී ලංකාවේ සිට ගෘහ සේවිකාවක් ලෙස පිටත්ව ගිය දිනය, ඇයගේ ගමන් බලපත්‍ර අංකය, එහි සඳහන් උපන් දිනය සහ එය නිකුත් කළ දිනය කවරේද;

(ii) ඇයගේ ශ්‍රී ලංකා ගමන් බලපත්‍ර අයදුම්පත සහතික කරන ලද සාම විනිසුරුවරයාගේ නම සහ ලිපිනය කවරේද;

(iii) රිසානා මෙනෙවියගේ උප්පැන්න සහතිකයේ සඳහන් උපන් දිනය, ලියාපදිංචි අංකය හා දිනය සහ ලියාපදිංචි බල ප්‍රදේශය කවරේද;

(iv) ඇයගේ ජාතික හැඳුනුම්පතේ සඳහන් උපන් දිනය හා ජාතික හැඳුනුම්පතේ අංකය කවරේද;

(v) රිසානා මෙනෙවියට විදේශගත වීමට සහායවූ විදේශ රැකියා නියෝජිත ආයතනයේ නම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ඇයට සෞදි අරාබියාවේ අධිකරණය විසින් මරණ දඬුවම නියම කළ දිනය හා අභියාචනාධිකරණයේ තීන්දුව ප්‍රකාශ කළ දිනය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

வெளிநாட்டு வேலைவாய்ப்பு ஊக்குவிப்பு, நலனோம்புகை அமைச்சரைக் கேட்ட வினா:

(அ) இலங்கையிலிருந்து சவூதி அரேபியாவுக்கு வீட்டுப் பணிப்பெண்ணாகச் சென்ற செல்வி றிசானா நபீக்குக்கு அந்நாட்டு நீதிமன்றம் மரண தண்டனை விதித்துள்ளது என்பதை அவர் அறிவாரா?

(ஆ) (i) செல்வி றிசானா நபீக், இலங்கையிலிருந்து, வீட்டுப் பணிப்பெண்ணாக புறப்பட்டுச் சென்ற திகதி, கடவுச்சீட்டு இலக்கம், அதில் குறிப்பிடப்பட்டுள்ள பிறந்த திகதி, மற்றும் அது வழங்கப்பட்ட திகதி என்பன யாவை என்பதையும்;

(ii) அவருடைய இலங்கை கடவுச்சீட்டு விண்ணப்பப் படிவத்தை அத்தாட்சிப் படுத்திய சமாதான நீதவானின் பெயர் மற்றும் விலாசம் என்பற்றையும்;

(iii) செல்வி றிசானாவின் பிறப்புச் சான்றிதழில் குறிப்பிடப்பட்டுள்ள பிறந்த திகதி, பதிவு இலக்கம்,

மற்றும் திகதி அத்துடன் பதிவு செய்யப்பட்டுள்ள ஆளுகைப் பிரதேசம் என்பன யாவை என்பதையும்;

(iv) அவருடைய தேசிய அடையாள அட்டையில் குறிப்பிடப்பட்டுள்ள பிறந்த திகதி மற்றும் தேசிய அடையாள அட்டை இலக்கம் யாது என்பதையும்;

(v) செல்வி றிசானாவின் வெளிநாடு செல்வதற்கு உதவிய, வெளிநாட்டு வேலைவாய்ப்பு முகவர் நிறுவனத்தின் பெயர் யாது என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) அவருக்கு சவூதி அரேபிய நீதிமன்றம் மரண தண்டனை விதித்த திகதி மற்றும் மேன்முறையீட்டு நீதிமன்றம் தீர்ப்பினை அறிவித்த திகதி யாதென்பதை அவர் அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Foreign Employment Promotion and Welfare:

(a) Is he aware that the judiciary of Saudi Arabia has imposed death sentence on Miss Rizana Nafeek who went to Saudi Arabia from Sri Lanka as a housemaid ?

(b) Will he state-

(i) the date on which Miss Rizana Nafeek left Sri Lanka as a housemaid, the number of her passport, the date of birth mentioned in it and the date on which it was issued;

(ii) the name and the address of the justice of the peace who attested her application for the Sri Lankan passport;

(iii) the date of birth, the registration number, the date of registration and the area of registration mentioned in the birth certificate of Miss Rizana;

(iv) the date of birth as mentioned in her National Identity Card and the number of the National Identity Card; and

(v) the name of the foreign employment agency that helped Miss Rizana to go abroad?

(c) Will he inform the date on which the death sentence was imposed on her by the Saudi Arabian judiciary and the date on which the ruling of the Court of Appeal was announced ?

(d) If not, why ?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබ සාධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර <u>**සභාගත**</u>* කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) ඔව්.

(ආ) (i) ශ්‍රී ලංකාවේ සිට ගෘහ සේවිකාවක් ලෙස,

පිටත්ව ගිය දිනය - 2005.04.05

ගමන් බලපත්‍ර අංකය - N0331835

එහි සඳහන් උපන් දිනය - 1982.02.02

එය නිකුත් කළ දිනය - නොදනී.

(ii) නම - වජුර්ඩීන් නමැත්තෙක් (අංක DIG/CID/53/21/2010 (5351) හා 2010.10.27 දිනැති අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු වාර්තාවට අනුව)

ලිපිනය - නොදනී.

(iii) උප්පැන්න සහතිකයේ,

උපන් දිනය - 1988.02.24

ලියාපදිංචි අංකය, දිනය

හා ලියාපදිංචි බල

ප්‍රදේශය - නොදනී

(iv) ජාතික හැඳුනුම්පතේ,

උපන් දිනය හා ජාතික හැඳුනුම්පතේ අංකය - නොදනී.

(v) ඕමාර් ට්‍රැවල්ස් - බලපත්‍ර අංක 2042

(ඇ) 2007.06.16

(ඈ) අදාළ නොවේ.

## මන්දපෝෂණයෙන් පෙළෙන අවුරුදු 15ට අඩු දරුවන්: ක්‍රියාමාර්ග

## போஷாக்கின்மையால் பாதிக்கப்பட்டுள்ள 15 வயதுக்குக் குறைந்த சிறுவர்கள்: நடவடிக்கை

## MALNUTRITION IN CHILDREN UNDER 15 YEARS OF AGE : MEASURES TAKEN

1013/’10

11. **ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා (ගරු ශාන්ත බණ්ඩාර මහතා වෙනුවට)**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் - மாண்புமிகு சாந்த பண்டார சார்பாக)
(The Hon. Alhaj A.H.M. Azwer on behalf of the Hon. Shantha Bandara)

සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) අප රට තුළ සිටින වයස අවුරුදු 15ට අඩු දරුවන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම දරුවන් අතරින් මන්දපෝෂණයෙන් පෙළෙන දරුවන් සංඛ්‍යාව කොපමණද;

(iii) මන්දපෝෂණ තත්ත්වය නිසා 2009 වර්ෂය තුළ ඉහත වයස් කාණ්ඩයේ දරුවන් මියගොස් ඇති බවට වාර්තා වී තිබේද;

(iv) එසේ නම්, එම තත්ත්වය වළක්වාලීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) எமது நாட்டிலுள்ள 15 வயதுக்கு குறைவான சிறுவர்களின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி சிறுவர்களில் போஷாக்கின்மையால் பாதிக்கப்பட்டுள்ள சிறுவர்களின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

(iii) போஷாக்கின்மை காரணமாக 2009 ஆம் ஆண்டில் மேற்படி வயதுப் பிரிவைச் சேர்ந்த சிறுவர்கள் உயிரிழந்திருப்பதாக அறிக்கையிடப்பட்டுள்ளதா என்பதையும்;

(iv) ஆமெனில், இந்நிலைமையை தடுப்பதற்காக எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் எவை என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Will he state -

(i) the number of children in our country who are under 15 years of age;

(ii) the number of children who suffer from malnutrition out of the aforesaid number of children;

(iii) whether it has been reported that children in the aforesaid age group have died due to malnutrition in the year 2009; and

(iv) if so, the measures that have been taken to prevent that situation?

(b) If not, why?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **<u>සභාගත</u>*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
**Answer tabled:*

(අ) (i) මිලියන 5.43

(ii) ඇමුණුම I බලන්න.

(iii) 2008 වසරේදී මරණ 3ක් වාර්තා වී ඇත.

(iv) ඇමුණුම 2 බලන්න.

(ආ) පැන නොනඟී.

**ඇමුණුම 1**

**උසට සරිලන බර නොමැති (කෘෂ බව)**
**පවුල් සෞඛ්‍ය කාර්යාංශය සතු වාර්තා අනුව - 2010**

| | |
|---|---|
| පාසලේ 1වන ශ්‍රේණියේ දරුවන් | 13.39% |
| පාසලේ 4වන ශ්‍රේණියේ දරුවන් | 13.36% |
| පාසලේ 7වන ශ්‍රේණියේ දරුවන් | 22.92% |
| පාසලේ 10වන ශ්‍රේණියේ දරුවන් | 17.18% |

**ජන විද්‍යාත්මක හා සෞඛ්‍ය සමීක්ෂණය අනුව (DHS) 2006 - 2007ට අනුව**

| පෝෂණ ඌණතා දර්ශකය | වයස අවුරුදු 5ට අඩු ළමා ජනගහණයේ ප්‍රතිශතය |
|---|---|
| අඩු බර සහිත (වයසට සරිලන බර නොමැති) දරුවන් ප්‍රතිශතය | 21.1% |
| කෘෂ බව සහිත (උසට සරිලන බර නොමැති) දරුවන් ප්‍රතිශතය | 14.7% |
| මිටි බව සහිත (වයසට නිසි උස නැති) දරුවන් ප්‍රතිශතය | 17.3% |
| යකඩ ඌණතාවය ඇතුළත්ව මන්ද පෝෂණයෙන් පෙළෙන දරුවන් ප්‍රතිශතය | 25.4% |

**අවුරුදු 12 - 13 වයස් කාණ්ඩවල දරුවන්ගේ පෝෂණ ඌනතා දර්ශක වෛද්‍ය පර්යේෂණ ආයතනයේ සංගණනයට අනුව - 2010**

| | |
|---|---|
| කෘෂ බව (උසට සරිලන බර නොමැති) | 30% |
| මිටි බව (වයසට නිසි උස නැති) | 30% |
| නීරක්තිය | 22% |

**ඇමුණුම 2**

**පාසල් දරුවන්ගේ මන්දපෝෂණ තත්ත්වය වළක්වා ගැනීමට ගෙන ඇති පියවර:**

- වර්ෂයකට වතාවක් සෑම පාසලකටම පාසල් වෛද්‍ය පරීක්ෂණයක් පවත්වා මන්දපෝෂණය හා අනෙකුත් සෞඛ්‍ය ගැටලු ඇති දරුවන් හඳුනා ගැනීම, ඔවුන්ට අවශ්‍ය උපදෙස් ලබා දීම හා ප්‍රතිකාර අවශ්‍ය නම් අදාළ අංශ සඳහා යොමු කිරීම.
- සෑම පාසලකටම 7, 10 ශ්‍රේණි සඳහා යකඩ, විටමින් හා පණු ප්‍රතිකාර ලබා දීමෙන් නීරක්තිය වළක්වා ගැනීමට කටයුතු කිරීම.
- ළමුන් 100කට අඩු පාසල්වල සියලුම දරුවන්ටත් ළමුන් 200ට අඩු පාසල්වල 1,2,3 ශ්‍රේණි සඳහාත් අධ්‍යාපන අමාත්‍යාංශය හා සෞඛ්‍ය අමාත්‍යාංශය මැදිහත් වීමෙන් දිවා ආහාර වේල වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- පෝෂණ මාසය, (මැයි/ජූනි) වැඩසටහනේ අංගයක් ලෙස යොවුන් වියේ දරුවන්ගේ පෝෂණ අවශ්‍යතා ඇගයීම හා ඔවුන්ගේ පෝෂණය සාක්ෂාත් කර ගැනීම සඳහා කටයුතු කිරීම.
- පාසල් ආපනශාලා තුළ සෞඛ්‍යවත් ආහාර පමණක් අලෙවි කිරීම සඳහා ප්‍රතිපත්තිමය තීරණ ගැනීම.
- උසට සරිලන බර පවත්වා ගැනීම සඳහා දැනුම හා කුසලතා ලබා දීම සඳහා පෝෂණ අධ්‍යාපනය, බර ප්‍රස්තාර සටහන් පාසල්වලට ලබා දීම.
- දරුවන්ගේ සෞඛ්‍ය වර්ධන සටහන් පතේ නව යොවුන් වර්ධන සටහන් ප්‍රස්තාර ඇතුළත් කිරීම මඟින් එම වයස් කාණ්ඩවල උසට සරිලන බර ප්‍රශස්ත මට්ටමෙන් පවත්වා ගැනීම දිරිමත් කිරීම.

## දික්වැල්ල කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන පාසල්: යටිතල පහසුකම්

### திக்வெல்ல கோட்டக் கல்விக் காரியாலயம் நிருவகிக்கின்ற பாடசாலைகள்:உட்கட்டமைப்பு வசதிகள்

SCHOOLS ADMINISTERED BY DIKWELLA DIVISIONAL EDUCATION OFFICE : INFRASTRUCTURE FACILITIES

0818/’10

14. **ගරු ජෝන් අමරතුංග මහතා (ගරු බුද්ධික පතිරණ මහතා වෙනුවට)**
(மாண்புமிகு ஜோன் அமரதுங்க - மாண்புமிகு புத்திக பதிரண சார்பாக )
(The Hon. John Amaratunga on behalf of the Hon. Buddhika Pathirana)

අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) මාතර දිස්ත්‍රික්කයේ, මාතර කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, දික්වැල්ල කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල යටිතල පහසුකම් සහ පොදු අවශ්‍යතාවයන්ගේ ඌනතාවයන් පවතින බව එතුමා දන්නේද?

(ආ) එම පාසල් පද්ධතිය තුළ ඇති,

(i) විදුලිය නොමැති පාසල් සංඛ්‍යාව;

(ii) පුස්තකාල සහ විද්‍යාගාර පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව;

(iii) ගුරු නිවාස සංඛ්‍යාව;

(iv) විදුලිය නොමැති ගුරු නිවාස සංඛ්‍යාව;

(v) ලී බඩු අවශ්‍යතා ඇති පාසල් සංඛ්‍යාව;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නේද?

(ඇ) (i) ඉහත අඩුපාඩු සහිත පාසල්වල නම්, ලිපිනයන් සහ දුරකථන අංක කවරේද;

(ii) එම අඩුපාඩු සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර දීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගත වන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) மாத்தறை மாவட்டத்தின் மாத்தறை வலயக் கல்விக் காரியாலயத்தின் கீழ் வரும் திக்வெல்ல கோட்டக் கல்விக் காரியாலயத்தினால் நிருவகிக்கப்படுகின்ற பாடசாலைகளில் உட்கட்டமைப்பு வசதிகள் மற்றும் பொதுத் தேவைகளில் பற்றாக்குறை காணப்படுகின்றதென்பதை அவர் அறிவாரா?

(ஆ) மேற்படி பாடசாலை முறைமையினுள் உள்ள,

(i) மின்சார வசதியில்லாத பாடசாலைகளின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

(ii) நூல்நிலையம் மற்றும் விஞ்ஞான ஆய்வுகூட வசதிகளில்லாத பாடசாலைகளின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

(iii) ஆசிரிய இல்லங்களின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

(iv) மின்சார வசதியில்லாத ஆசிரிய இல்லங்களின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

(v) தளபாடம் தேவையாகவுள்ள பாடசாலைகளின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) (i) மேற்படி குறைபாடுகள் நிலவுகின்ற பாடசாலைகளின் பெயர்கள், முகவரிகள், தொலைபேசி இலக்கங்கள் யாவை என்பதையும்;

(ii) மேற்படி பாடசாலைகளில் நிலவுகின்ற குறைபாடுகளை நிவர்த்தி செய்வதற்கு தேவையான நிதி ஒதுக்கீட்டினை மேற்கொள்வதற்கு அவர் நடவடிக்கையெடுப்பாரா என்பதையும்;

(iii) ஆமெனில், இதற்கு எவ்வளவு காலம் எடுக்குமென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Is he aware that there is a shortage of infrastructure facilities and common amenities in the Government schools administered by the Dikwella Divisional Education Office of the Matara Zonal Educational Office in the Matara District ?

(b) Will he state in relation to the above schools-

(i) the number of schools without electricity;

(ii) the number of schools without library and laboratory facilities;

(iii) the number of teachers' quarters;

(iv) the number of teachers' quarters without electricity; and

(v) the number of schools with furniture requirements ?

(c) Will he state-

(i) the names, addresses and telephone numbers of schools with the aforesaid shortages;

(ii) whether arrangements will be made to allocate the required funds to fulfil the shortcomings in the aforesaid schools; and

(iii) if so, the period of time taken for it?

(d) If not, why?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ගරු කථානායකතුමනි, ගරු අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත***කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

( අ) ඌණතාවන් සමනය කිරීමට කටයුතු කරමින් පවතී.

(ආ) (i) විදුලිය නොමැති පාසල් නැත.

(ii) පුස්තකාල සහ විද්‍යාගාර ශිෂ්‍ය සංඛ්‍යාව අනුව තීරණය වේ. සමහර පාසල්වල පංති කාමරය තුළ කුඩා පුස්තකාල ඇත.

(iii) ගුරු නිවාස සංඛ්‍යාව - 02

(iv) විදුලිය නොමැති ගුරු නිවාස නැත.

(v) ලී භාණ්ඩ අවශ්‍යතා ශිෂ්‍ය සංඛ්‍යාව අනුව ලබා දේ.

(ඇ) (i) සඳහන් කරමි. ඇමුණුම බලන්න. දුරකථන අංක දුරකථන නාමාවලියෙන් ලබා ගත හැක.

(ii) වාර්ෂිකව ලැබෙන ප්‍රතිපාදන මත පළාත් සභාව මඟින් කළමනාකරණය කරනු ලැබේ.

(iii) මූල්‍ය පහසුකම් ලැබෙන ආකාරය අනුව කාලය තීරණය වේ.

(ඈ) අදාළ නොවේ.

ඇමුණුම +

මාතර අධ්‍යාපන කලාපයේ දික්වැල්ල කොට්ඨාස අධ්‍යාපන කලාපය

| අනු අංකය | පාසලේ නම සහ ලිපිනය | විදුලිබලය | පුස්තකාල | විද්‍යාගාර | ගුරු නිවාස | ලීබඩු අවශ්‍යතා |
|---|---|---|---|---|---|---|
| 01 | මාර/ගොඩඋඩ ම.වි. ගොඩඋඩ, කෝට්ටගොඩ | ඇත | ඇත | ඇත | නැත | නැත |
| 02 | මාර/බෙලිදෙනිය ම.වි. බෙලිදෙනිය, කෝට්ටගොඩ | ඇත | ඇත | ඇත | නැත | නැත |
| 03 | මාර/පාතේගම දකුණ සිරිසුමන ක.වි. කෝට්ටගොඩ දික්වැල්ල | ඇත | නැත | නැත | නැත | ඇත |
| 04 | මාර/මාලියැද්ද විජය ක.වි. මාලියැද්ද දික්වැල්ල | ඇත | නැත | නැත | නැත | ඇත |
| 05 | මාර/රදම්පල ශ්‍රී සුමංගල ම.ම.වි. රදම්පල, ඌරුගමුව | ඇත | ඇත | ඇත | නැත | ඇත |
| 06 | මාර/මුරුතගස්පිටිය ම.වි. මුරුතගස්පිටිය ඌරුගමුව | ඇත | ඇත | ඇත | නැත | ඇත |
| 07 | මාර/අරංකහදෙනිය ක.වි. අරංකහදෙනිය ඌරුගමුව | ඇත | නැත | නැත | නැත | ඇත |
| 08 | මාර/දන්දෙනිය ක.වි. දන්දෙනිය රත්මලේ | ඇත | නැත | නැත | නැත | ඇත |
| 09 | මාර/බෝදරකන්ද රතනජෝති ක.වි. බෝදරකන්ද ඌරුගමුව | ඇත | නැත | නැත | නැත | ඇත |
| 10 | මාර/මීගස්දෙනිය ක.වි. මීගස්දෙනිය ඌරුගමුව | ඇත | නැත | නැත | නැත | ඇත |
| 11 | මාර/වෙහැල්ල ක.වි. වෙහැල්ල ඌරුගමුව | ඇත | නැත | නැත | නැත | ඇත |
| 12 | මාර/ඉහලගොඩ ක.වි. ඉහළගොඩ ඌරුගමුව | ඇත | නැත | නැත | නැත | ඇත |
| 13 | මාර/ඌරුගමුව මෙතෝදිස්ත ක.වි. ඌරුගමුව | ඇත | නැත | නැත | නැත | ඇත |
| 14 | මාර/විජිත ම.ම.වි මහුවෙල පාර, දික්වැල්ල | ඇත | ඇත | ඇත | ඇත | නැත |
| 15 | මාර/දික්වැල්ල උතුර ම.වි. බෙලිඅත්ත පාර දික්වැල්ල | ඇත | ඇත | ඇත | නැත | ඇත |
| 16 | මාර/කුමාරතුංග මුනිදාස ම.වි. දෙමටපිටිය දික්වැල්ල | ඇත | ඇත | ඇත | නැත | ඇත |
| 17 | මාර/දෙමටපිටිය ම.වි. රත්මලේ | ඇත | නැත | නැත | නැත | ඇත |
| 18 | මාර/බඹරැන්ද සද්ධර්මරාජ ම.වි. බතිගම දික්වැල්ල | ඇත | නැත | නැත | නැත | ඇත |
| 19 | මාර/බතීගම ම.වි. බතිගම දික්වැල්ල | ඇත | ඇත | ඇත | නැත | ඇත |
| 20 | මාර/අකුරුබැබිල ක.වි. තලහිටියාගොඩ රත්මලේ | ඇත | නැත | නැත | නැත | ඇත |
| 21 | මාර/තලහිටියාගොඩ පරාක්‍රම ක.වි දොඩම්පහල, දික්වැල්ල | ඇත | නැත | නැත | නැත | නැත |
| 22 | මාර/දොඩම්පහල ක.වි. අලුත්ගොඩ, දික්වැල්ල | ඇත | නැත | නැත | නැත | නැත |
| 23 | මාර/අලුත්ගොඩ ක.වි. මහවෙල පාර දික්වැල්ල | ඇත | නැත | නැත | නැත | ඇත |
| 24 | මාර/දික්වැල්ල මෙතෝදිස්ත ක.වි. - මහවෙල පාර දික්වැල්ල | ඇත | නැත | නැත | නැත | ඇත |
| 25 | මාර/මින්හාජ් ම.වි. සැන්ඩිස් පාර දික්වැල්ල | ඇත | ඇත | ඇත | ඇත | ඇත |

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ස්ථාවර නියෝග 23(2) යටතේ ප්‍රශ්නය, ගරු අනුර දිසානායක මහතා.

# පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

## විදේශ කටයුතු අමාත්‍යතුමා සහ ඉන්දියානු නියෝජිතයන් විසින් නිකුත් කරන ලද ඒකාබද්ධ නිවේදනය
### வெளிநாட்டலுவல்கள் அமைச்சர் மற்றும் இந்திய பிரதிநிதிகள் விடுத்த கூட்டறிக்கை
### JOINT STATEMENT MADE BY MINISTER OF EXTERNAL AFFAIRS AND REPRESENTATIVES OF INDIA

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 23(2) යටතේ මෙම ප්‍රකාශය කිරීමට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වනවා.

ගරු කථානායකතුමනි, 2011 මැයි මාසයේ 15 සිට 17 දින දක්වා ඉන්දියාවේ සංචාරයක නිරත වූ ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා සහ ඉන්දියානු නියෝජිතයන් විසින් නිකුත් කරන ලද ඒකාබද්ධ නිවේදනය පිළිබඳව මෙම ගරු සභාවේ අවධානය යොමු කරවීමට මම අපේක්ෂා කරනවා. මෙම ඒකාබද්ධ නිවේදනය තුළ ශ්‍රී ලංකාවේ ක්ෂේත්‍ර ගණනාවක් මත ඉන්දියාව සිය ආධිපත්‍ය පටවා තිබෙන බව පැහැදිලියි. ඒ නිසාම මෙම නිවේදනය හරහා අපේ රටේ ස්වෛරී භාවය පිළිබඳව ඉතා බරපතළ ප්‍රශ්න මතු වී තිබෙනවා. ඒ පිළිබඳ විශේෂ අවධානය යොමු කරන ලෙස මෙම ගරු සභාවෙන් මා ඉල්ලා සිටිනවා.

මෙම ඒකාබද්ධ නිවේදනයට අනුව ඉන්දියාව අප රටේ ආර්ථික ක්ෂේත්‍රයට ප්‍රබල මැදිහත් වීමක් සිදු කිරීමට අපේක්ෂා කරනවා. ඒ වාගේම ඒ සඳහා ශ්‍රී ලංකාවේ ආණ්ඩුවේ අනුමැතිය පළ වී තිබෙනවා. ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර විදුලිබල පද්ධතිවල අන්තර් සබඳතාවක් ඇති කිරීම සහ සාම්පූර් විදුලිබල ව්‍යාපෘතිය මඟින් අපේ රටේ බලශක්ති ක්ෂේත්‍රයට ඇති වන බලපෑම පිළිබඳව ඉතා ගැඹුරු සාකච්ඡාවක් කළ යුතුව තිබෙනවා. නමුත් ශ්‍රී ලංකා ආණ්ඩුව මෙම ඒකාබද්ධ නිවේදනයට අත්සන් තබන්නේ එවැනි පුළුල් සංවාදයකින් තොරවයි. බලශක්ති ක්ෂේත්‍රය මෙන්ම විදුලි සංදේශ ක්ෂේත්‍රයටද අත පෙවීම සඳහාත් එහි ආධිපත්‍ය ලබා ගැනීම සඳහාත් ඉන්දියාවට ඉඩ විවර වී තිබෙනවා. වරාය, දුම්රිය, ධීවර යන ක්ෂේත්‍රවලට ඉන්දියාවට අවශ්‍ය ලෙස මැදිහත් වීමට ඉඩ ලැබීම නිසා අප රටට, ආර්ථික වශයෙන් බලවත් අවදානමක් ඇති වී තිබෙනවා. ඒ වාගේම අපේ රටේ ආර්ථිකයට බරපතළ ලෙස හානිකර "සීපා" ගිවිසුම කෙරෙහිත් මෙම නිවේදනය අවධානය යොමු කර තිබෙනවා.

මෙම ඒකාබද්ධ නිවේදනයට අනුව කන්කසන්තුරේ වරාය හා පලාලි ගුවන් තොටුපොළ කටයුතු ඉන්දියාවට භාර දීම ආර්ථික වශයෙන් මෙන්ම ආරක්ෂක ක්ෂේත්‍රය තුළ ද බරපතළ ප්‍රශ්න ඇති කරන බව පැහැදිලියි. මෙවැනි ආරක්ෂක මර්මස්ථානවලට ඉන්දියාව මැදිහත් වීම අපේ රටේ ජාතික ආරක්ෂාවට බරපතළ තර්ජනයක් එල්ල කරන බව මා මෙම ගරු සභාවේ අවධානයට යොමු කරනවා.

ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා ව්‍යවස්ථාවේ වෙනස්කම් කිරීමට ද, රටේ නෛතික ප්‍රතිසංස්කරණ කිරීමට ද ඉන්දියාව සමඟ එකඟ වී තිබෙනවා. මෙසේ ව්‍යවස්ථාමය කරුණු හා නෛතික කරුණුවල දී ද, ආණ්ඩුව විවිධ දේශපාලන පක්ෂ සමඟ කරන සාකච්ඡාවලදී ද ඉන්දියාවේ අවශ්‍යතාවට අනුව කටයුතු කිරීම නිසා දේශපාලන ක්ෂේත්‍රය තුළ ස්වෛරීත්වය අපේ රටට අහිමි වී

[ගරු අනුර දිසානායක මහතා]

තිබෙනවා. මේ අනුව ආණ්ඩුව ඉන්දියාවේ වුවමනාවට යටත් වී ඇති බව පෙනෙනවා. එවැනි ව්‍යවස්ථාමය වෙනසකට ආ යුත්තේ රටේ ජනතාව සමඟ මිස වෙනත් කවර හෝ රාජ්‍යයක් සමඟ ඇති කර ගන්නා එකඟතාවකින් නොවේ.

ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර දේශපාලන කරුණු ගණනාවක් පිළිබඳව ඉන්දියාව සිදු කර ඇති අදහස් දැක්වීමත්, ඒ සඳහා ලංකාව පෙන්වා ඇති අවනතභාවයත්, මිත්‍ර රටවල් දෙකක් අතර සිදු වන රාජ්‍ය තාන්ත්‍රික ගනුදෙනුවල සීමාවන් ඉක්මවා යැමක් බව පැහැදිලිව පෙනෙනවා. මේ තුළ ආණ්ඩුව රටේ දේශපාලන ස්වෛරීත්වය පිළිබඳව තමන් සතු වගකීම පැහැර හැර ඇති බවට මා මේ ගරු සභාවේ අවධානය යොමු කර සිටිනවා.

මෙම නිවේදනයේ සමස්ත අඩංගුව පෙන්වා තිබෙන්නේ ආර්ථික, දේශපාලන සහ ආරක්ෂක ක්ෂේත්‍රවලදී ඉන්දියානු ආණ්ඩුව සිය වුවමනාවන්ට අනුව ශ්‍රී ලංකාව මෙහෙයවමින් සිටින බවයි. ශ්‍රී ලංකා ආණ්ඩුවේ නියෝජිතයන් එවැන්නකට එකඟ වීම හා ඒකාබද්ධ නිවේදනය තුළ ඒවා සඳහන් කිරීම නිසා රටක් ලෙස අපේ රටේ ස්වෛරීභාවය අනතුරට ලක් වී තිබෙනවා. අප රටේ ආර්ථිකය, දේශපාලනය හා ජාතික ආරක්ෂාව වෙනත් කිසිවකුගේ ආධිපත්‍යවාදී වුවමනාවන් වෙනුවෙන් බිලි දීම මේ ගරු සභාවේ කිසිවකු අනුමත කරනු ඇතැයි මම විශ්වාස කරන්නේ නැහැ. එසේම ශ්‍රී ලංකා විදේශ කටයුතු අමාත්‍යවරයා හා නියෝජිත පිරිසගේ මෙම ඉන්දියානු සංචාරයේ පරමාර්ථය වූයේ එක්සත් ජාතීන්ගේ මහ ලේකම්වරයා විසින් පත් කළ කමිටුවේ වාර්තාවට එරෙහිව ලංකාවට සහනයක් ලබා ගැනීම වුවත් හාස්‍යයට කරුණ වන්නේ ඒ පිළිබඳව කිසිදු සඳහනක් එම නිවේදනයේ අඩංගු නොවීමයි. ඒ වෙනුවට සිදුව ඇත්තේ ඉන්දියාව විසින් එක්සත් ජාතීන්ගේ මහ ලේකම්වරයා විසින් පත් කළ කමිටුවේ වාර්තාවට ශ්‍රී ලංකාව අනියමින් යටත් කිරීමයි. එසේම මෙය ඒකාබද්ධ නිවේදනයක් වුවද සැබැවින්ම මෙහිදී සිදුව තිබෙන්නේ, ඉන්දියානු රජය අප වෙත බල කර සිටි ආර්ථික, දේශපාලන හා ආරක්ෂක වුවමනාවන් සම්පිණ්ඩනය කොට සකස් කළ "ඉන්දියානු පැකේජයක්" අප වෙත පැටවීමයි. ශ්‍රී ලංකා නියෝජිත පිරිස එම යෝජනාවට යටත් වී තිබෙනවා. එබැවින් ජාතික වශයෙන් අතිශයින් වැදගත් මෙම ඉන්දු- ශ්‍රී ලංකා ඒකාබද්ධ නිවේදනයට අදාළ පහත ප්‍රශ්න පිළිබඳව මෙම ගරු සභාව දැනුවත් කිරීමට ආණ්ඩුව පියවර ගනු ඇතැයි අපේක්ෂා කරනවා.

01. ගරු විදේශ කටයුතු අමාත්‍යතුමාගේ ඉන්දියානු සංචාරය සිදු කෙරුණේ ඉන්දියාව කරන ලද ආරාධනයක් මතද, එසේ නැති නම් ශ්‍රී ලංකා රජයේ වුවමනාව මතද?

02. මෙම සංචාරය සිදු වූයේ ශ්‍රී ලංකා රජයේ වුවමනාවක් මත නම්, මෙම සංචාරය තුළ ඉටු කර ගැනීමට අපේක්ෂා කළ අරමුණු මොනවාද?

03. එම අරමුණු, මෙම ඒකාබද්ධ ප්‍රකාශය හෙවත් ඉන්දියානු පැකේජය තුළ ඉටු වී ඇතැයි හෝ නියෝජනය වී ඇතැයි හෝ ආණ්ඩුව සෑහීමකට පත් වනවාද?

04. මෙම ඒකාබද්ධ ප්‍රකාශයට පදනම් කර ගනු ලැබුවේ 2010 ජූනි මස 09 වන දා ජනාධිපතිවරයාගේ සහභාගිත්වයෙන් අත්සන් කළ අවබෝධතා ගිවිසුම හා 2011 මාර්තු 28-29 නව දිල්ලියේදී අත්සන් කළ අවබෝධතා ගිවිසුමය. ඒවා සභාගත කරන්නේද?

05. මෙම ප්‍රකාශයේ අඩංගු කරුණු ක්‍රියාත්මක කිරීම සඳහා විස්තීරණ කාල රාමුවක් සකස් කර තිබේද?

එසේ නම් එය මෙම ගරු සභාවට ඉදිරිපත් කිරීමට ආණ්ඩුව කටයුතු කරන්නේද?

ඉහත සඳහන් කරුණු පිළිබඳව මෙම ගරු සභාව දැනුවත් කිරීමට ආණ්ඩුව කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කරනවා. ඒ වාගේම ශ්‍රී ලංකාවේ ආර්ථිකය, දේශපාලනය හා ආරක්ෂාව විදෙස් රටක ආධිපත්‍යයට යටත් කිරීමේ ක්‍රියාමාර්ගයන්ට එකඟ වීමේ විපාක පිළිබඳව දැඩි අවධානය යොමු කරන මෙන් මේ ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා. ස්තුතියි ගරු කථානායකතුමනි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, විදේශ කටයුතු අමාත්‍යතුමාත්, විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමාත් රටින් බැහැරව සිටින නිසා මා ගරු අනුර දිසානායක මැතිතුමාගෙන් විශේෂයෙන් ඉල්ලීමක් කළා, විදේශ කටයුතු ඇමතිතුමා ශ්‍රී ලංකාවට පැමිණි විට මේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න කියලා. එතුමා එයට එකඟ වුණේ නැහැ. ඒ අනුව අද එතුමා ප්‍රශ්නය නඟලා තිබෙනවා. විදේශ කටයුතු අමාත්‍යතුමා ශ්‍රී ලංකාවට පැමිණීමෙන් පසු මේ සභාවට පැමිණෙන පළමු වැනි දවසේදී මේ ප්‍රශ්නයට විස්තරාත්මක පිළිතුරක් දෙනවා ඇති.

විදේශ කටයුතු අමාත්‍යතුමාගේ ඉන්දියානු සංචාරය සිදු කෙරුණේ ශ්‍රී ලංකාවේ ඉල්ලීමක් පරිදි බව ප්‍රකාශ කරන්න කැමැතියි. ඒ වාගේම මේ සංචාරය සිදු වූයේ ශ්‍රී ලංකාවට එරෙහිව පදනම් විරහිත අසත්‍ය කරුණු ගොනු කර ගනිමින් ඉදිරිපත් කරන ලද දරුස්මාන් වාර්තාව පිළිබඳ අප රජයේ අදහස් කියා පාන්නයි. ඒ මන්ත්‍රීතුමා අහන දෙවැනි ප්‍රශ්නයට පැහැදිලි පිළිතුර එයයි. ඉතිරි විස්තරාත්මක පිළිතුරු ගරු අමාත්‍යතුමා විසින් ලබා දෙනවා ඇති.

ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර තිබෙන මිත්‍රත්වය වාගේම අපේ රටේ නිදහස, ස්වාධීනත්වය, ස්වෛරීත්වය ආරක්ෂා කරලීමට ගරු ජනාධිපතිතුමා ඉටු කර ඇති මෙහෙයද මේ අවස්ථාවේ අපි යළිත් සඳහන් කරන්න කැමැතියි. වැරදි අර්ථ නිරූපණ ඇති කර ගනිමින් තමන් දකින ක්ෂේත්‍රයෙන් පමණක් ප්‍රශ්න ඉදිරිපත් කිරීමට ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමෙකුට පුළුවන්. ඒ නිසා ඒ ඉදිරිපත් කර තිබෙන ඔවුන්ගේ නිර්මාණවලට පිළිතුරු ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා පැමිණීමෙන් පසු ලබා දෙනවා ඇති. ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර තිබෙන මිත්‍රත්වය කිසි ලෙසකින් හෝ පලුදු කිරීමේ උත්සාහයක නිරත වීමට මෙම කරුණු උපයෝගී කර ගැනීමේ ක්‍රියාමාර්ගවලට අවතීර්ණය නොවන ලෙසද ගරු සභාවෙන් මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා.

## හෘදය රෝග සැත්කම් පහසුකම් වැඩි කිරීම: සෞඛ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## இருதய நோய்ச் சத்திரசிகிச்சை வசதிகளை அதிகரித்தல்: சுகாதார அமைச்சரினது கூற்று
## INCREASE OF HEART SURGERY FACILITIES: STATEMENT BY MINISTER OF HEALTH

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා (සෞඛ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன - சுகாதார அமைச்சர்)
(The Hon. Maithripala Sirisena - Minister of Health)

ගරු කථානායකතුමනි, මා මේ ප්‍රකාශය කරන්නේ 2011 මැයි 05 වැනි දා ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා විසින් ස්ථාවර නියෝග 23(2) යටතේ මතු කරන ලද ප්‍රශ්නයට පිළිතුරක් වශයෙනුයි.

දැනට රජයේ රෝහල්වල එනම්, කරාපිටිය ශික්ෂණ රෝහල, මහනුවර මහ රෝහල, ශ්‍රී ලංකා ජාතික රෝහල, රිජ්වේ ආර්යා

ළමා රෝහල, ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල යන රෝහල්වල හෘද සැත්කම් සිදු කරනු ලබයි. මීට අමතරව පෞද්ගලික රෝහල් කිහිපයකද (ආසිරි රෝහල, ඩර්ඩන්ස් රෝහල, නවලෝක රෝහල, ලංකා හොස්පිටල් ලිමිටඞ් ආදියෙහි) හෘද සැත්කම් සිදු කරනු ලබයි. හෘද උරස් ශල්‍ය විශේෂඥ වෛද්‍යවරුන් ඇත්තේ සීමිත සංඛ්‍යාවකි. එමෙන්ම හෘද සැත්කම් සඳහා ඉතා අධික වියදමක් දැරීමට රජයට සිදුවේ. එම තත්ත්වය තුළ වුවද රජය විශාල වියදමක් දරමින් මහජනතාවට උපරිම සේවය ලබා දීමට අවශ්‍ය කටයුතු යොදා තිබේ. කෙසේ වුවද ඉහත කී රජයේ රෝහල්වල සිදු කරනු ලබන ශල්‍යකර්ම ප්‍රමාණය ප්‍රමාණවත් නොවන බව පෙනී යන බැවින් මේ සඳහා පිළියමක් වශයෙන් ජනාධිපති අරමුදලින් විශාල මුදල් ප්‍රමාණයක් පෞද්ගලික රෝහල් හරහා එකී හදිසි ශල්‍යකර්ම සිදු කර ගැනීම සඳහා ජනතාවට ලබා දෙයි. මීට අමතරව ශල්‍යකර්ම බලාපොරොත්තුවෙන් පොරොත්තු ලේඛනවල සිටින සංඛ්‍යාව අවම කර ගැනීම සඳහා කරාපිටිය ශික්ෂණ රෝහලේත්, මහනුවර ශික්ෂණ රෝහලේත් රාජකාරි වේලාවෙන් පරිබාහිරව ශල්‍යකර්ම සිදු කිරීමටත්, ඒ සඳහා ජනාධිපති අරමුදලින් වියදම් දැරීමටත් කටයුතු කර තිබේ.

දැනට පවතින සීමිත සම්පත් උපයෝගී කර ගෙන සාමාන්‍ය රාජකාරි වේලාව තුළ උපරිම හෘද සැත්කම් ප්‍රමාණයක් සිදු කිරීමට කටයුතු කරනු ලබන අතර, රාජකාරි වේලාවෙන් පරිබාහිරව රජයේ රෝහල්වලම මෙම ශල්‍යකර්ම සිදු කිරීම සඳහා අදාළ පහසුකම් සපයා ඇති අතර, ඒ තුළින්ද රෝගීන්ගේ අවශ්‍යතා උපරිම පරිදි ඉටු කිරීමට කටයුතු කර ඇත.

හෘද රෝග තත්ත්වයන්ට පමණක් නොව සමස්ත සෞඛ්‍ය ක්ෂේත්‍රයම යහපත් මට්ටමෙන් පවත්වා ගැනීම සඳහා ජාතික සැලැස්මකට අනුව සැලසුම් සහගතව මානව සම්පත් සංවර්ධනය හා භෞතික සම්පත් සංවර්ධනය සිදු කිරීමට රජය කටයුතු කරයි. දිවයිනේ තෝරා ගත් රෝහල් කිහිපයකද හෘද සැත්කම් කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් ඉදිරියේදී ලබා දීමට අපේක්ෂා කෙරේ.

කරාපිටිය ශික්ෂණ රෝහලේ උරස් ශල්‍ය ඒකකය තුළ ජාතික මට්ටමින් සිදු කරන සැත්කම් වැඩි ප්‍රමාණයක් (සියයට 26ක්) සිදු කරන අතර, 2010 වසර තුළ එවැනි සැත්කම්1043ක් සිදු කර ඇත. මහනුවර මහ රෝහලේ සැත්කම් 762ක්ද, රිජ්වේ ආර්යා ළමා රෝහලේ සැත්කම් 682ක් ද, ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ සැත්කම් 228ක්ද සිදු කර තිබේ. 2010 වසර තුළ ජාතික රෝහලේ සිදු කර ඇති හෘද සැත්කම් සංඛ්‍යාව 1302කි.

දැනට පවතින සීමිත සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම සඳහා කරාපිටිය ශික්ෂණ රෝහලේ හෘද ශල්‍යාගාරයේ අලුත්වැඩියා කිරීමේ කටයුතු සිදු කරන අතර, ඒ තුළින් දැනට කරනු ලබන සේවාවන්ට වඩා වැඩි මට්ටමක සේවාවක් ලබා දීමට අදහස් කෙරේ. මේ කාලය තුළ අත්‍යවශ්‍ය හදිසි ශල්‍යකර්ම බාධාවකින් තොරව ඉටු කර ගැනීම සඳහා රෝහලේ වෙනත් ශල්‍යාගාරයක් යොදා ගැනීමට පහසුකම් සපයා ඇත. මෙම අලුත්වැඩියාවන් ජූනි මස අග භාගයේ අවසන් කිරීමට නියමිතය. ශල්‍යාගාරය අලුත්වැඩියා කිරීමෙන් පසු දැනට වඩා වැඩි කාර්යභාරයක් ඉටු කිරීම අපේක්ෂා කෙරේ.

අලුත්වැඩියා කටයුතු නිසා සිදු කිරීමට නොහැකි වන හදිසි සැත්කම් සඳහා දැනටමත් කරාපිටිය රෝහලේ වෙනත් ශල්‍යාගාරයක අදාළ පහසුකම් සපයා දීමට කටයුතු කර ඇත. කෙසේ වෙතත්, රජයේ රෝහල්වලට අමතරව පෞද්ගලික අංශයෙන් ශල්‍යකර්ම සිදු කිරීම සඳහා ජනාධිපති අරමුදලින් ආධාර ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. ඒ අතරම අලුත්වැඩියාවන් සම්පූර්ණ කළ විගස කරාපිටිය රෝහලේ ප්‍රමාද වූ සැත්කම්වලට ප්‍රමුඛත්වයක් දීමට කටයුතු කරනු ඇත. ස්තුතියි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ප්‍රධාන කටයුතු ආරම්භයේ පනත් කෙටුම්පත් සහ යෝජනා. අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ගරු කථානායකතුමනි, මම ලියවිල්ලක් ඉදිරිපත් කළා හදිසි කාරණාවක් පිළිබඳව. [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

දැන් මට එතුමා කියපු දේත් ඇහුණේ නැහැ. තමුන්නාන්සේලා කියපු දේත් ඇහුණේ නැහැ. පොඩ්ඩක් අහගෙන ඉන්නකෝ. ඊට පස්සේ මම උත්තරයක් දෙන්නම්. ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමනි, මොකටද තමුන්නාන්සේ නැඟිට්ටේ?

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග අංක 17 යටතේ- [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

17 යටතේ?

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

රටේ පවතින බැරෑරුම් ප්‍රශ්නයක් පිළිබඳව ස්ථාවර නියෝග අංක 17 යටතේ ඔබතුමාගේ අවධානය යොමු කරලා ඒ පිළිබඳව විසඳුමක් ලබා ගන්න මට අවස්ථාවක් ලබා දෙන්න කියන එක තමයි මම මේ තේරුම් කරන්න හදන්නේ. [බාධා කිරීම්] මට විනාඩියක් දෙන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ස්ථාවර නියෝග 17 යටතේ තමුන්නාන්සේ දැන් මතු කරන ප්‍රශ්නය,- [බාධා කිරීම්]

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ගරු කථානායකතුමනි, මම ඉදිරිපත් කරන කාරණය පළමුවෙන් තමුන්නාන්සේට පැහැදිලි කර දෙන්නම්. ඊට පස්සේ තමුන්නාන්සේ කැමැති තීරණයක් ගන්න. මේ පාර්ලිමේන්තුවේ අප රැස් වන්නේ රටේ මහජනතාවගේ දැවෙන ප්‍රශ්නවලට කඩිනම් විසඳුම් බලාපොරොත්තුවෙන්. එකී බලාපොරොත්තු මත මහජනතාව විසින් ඔවුන්ගේ පරමාධිපත්‍ය බලය මන්ත්‍රීවරුන් වෙත පවරා එමඟින්,- [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු මන්ත්‍රීතුමා, ස්ථාවර නියෝග 17 යටතේ ඔබතුමාගේ ඔය ප්‍රකාශය ඉදිරිපත් කරන්න මාගේ අවසරය ලබා දිය යුතුව

[ගරු කථානායකතුමා]

තිබෙනවා. එයට මාගේ අවසරය ලබා දුන්නේ නැහැ. ඒ නිසා ඒ ටික හැන්සාඩගත වන්නේ නැහැ. ඒකට හේතුව, මේ ප්‍රශ්නය උසාවිය ඉදිරියේ තිබෙන එකක්. ඒ වාගේම සභාව කල් තැබීමේ අවස්ථාවේ යෝජනාවක් දීලා තිබෙනවා.[බාධා කිරීම්]

ඔබතුමාට පුළුවන් පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේදී මේ පිළිබඳව කථා කරලා, සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් මඟින් මේ පිළිබඳව සාකච්ඡා කරන්න වෙනත් දිනයක් ඉල්ලා ගන්න. [බාධා කිරීම්] දැන් එයට අවසර ලැබෙන්නේ නැහැ. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට [බාධා කිරීම්] මේකට අවසර ලැබෙන්නේ නැහැ. [බාධා කිරීම්]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
Point of Order එකක් තිබෙනවා. [බාධා කිරීම්] මේක උසාවිය ඉදිරියේ තිබෙන ප්‍රශ්නයක්. ඒ නිසා ඒ පිළිබඳව සාකච්ඡා කරන්නට ඉඩ දිය නොහැක.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
According to Standing Order No. 17 - [*Interruption.*] This is like the devil quoting scriptures. The Hon. John Amaratunga has no right to raise this Question until he gives a written notice to the Chair, which has not been done - [*Interruption.*] Sir, I am on a point of Order. How did they bring placards into the House? You must hold an inquiry immediately. Sir, if they behave disorderly, you have the right to name them. I would again request, Sir, that you hold an immediate inquiry as to how they brought these foreign materials into this House. ගරු කථානායකතුමනි, ඒ ගොල්ලන් විදේශීය බලවේගයන්ට කත් අදිනවා මෙතැන ඉඳගෙන.[බාධා කිරීම්]

***[මේ අවස්ථාවේදී එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු සභා ගර්භය මැදට පැමිණ විරෝධය පළ කරන්නට වූහ.]***
*[இச்சந்தர்ப்பத்தில் ஐக்கிய தேசியக் கட்சி உறுப்பினர்கள் சபாமண்டபத்தின் மத்திக்கு வந்து எதிர்ப்பை வெளிக்காட்டினர்]*
*[At this stage, the Members of the United National Party walked into the Well of the House and protested.]*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හරි. මම ඔක්කොම පත්‍රිකා දැක්කා. දැන් ඕවා අකුළා ගන්න. [බාධා කිරීම්]හොඳයි, තමුන්නාන්සේ යන්නකෝ ආසනයට. දැන් අපි කාරණයට යනවා. ප්‍රධාන කටයුතු ආරම්භයේදී පනත් කෙටුම්පත් සහ යෝජනා.[බාධා කිරීම්] ගරු අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා. [බාධා කිරීම්] අංක 1 යෝජනාව.

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
## BILLS PRESENTED

### නාවික හමුදා (සංශෝධන) පනත් කෙටුම්පත
### கடற்படை (திருத்தம்) சட்டமூலம்
### NAVY (AMENDMENT) BILL

"(358 වන අධිකාරය වූ) නාවික හමුදා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි"

***පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍ය ගරු දි.මු. ජයරත්න මහතා විසිනි.***
***2011 ජූනි මස 07වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද නියෝග කරන ලදී.***
*பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமான மாண்புமிகு டீ.எம்.ஜயரத்ன அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*
*2011 ஜூன் 07, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*
*Presented by the Hon. Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs; to be read a Second time upon Tuesday, 07th June, 2011 and to be printed.*

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ සභානායකතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2010.07.09 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලා අ. භා. 1.00 සිට අ. භා. 7.30 දක්වා විය යුතු ය. අ. භා. 4.30 ට ස්ථාවර නියෝග 7(5) ක්‍රියාත්මක විය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තුන්වැනි යෝජනාව. ගරු කරු ජයසූරිය මන්ත්‍රීතුමා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, එම යෝජනාව ඉදිරිපත් කිරීමට අයිතියක් නැහැ. මේක ප්‍රෝඩාවක්. - [*Interruption.*] Sir, I rise to a point of Order. [බාධා කිරීම්] මට point of Order එකක් පැහැදිලි කරන්න තිබෙනවා. මේ යෝජනාව ඉදිරිපත් කරන්න එතුමාට අයිතියක් නැහැ. [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
සියලුම දෙනා නැඟී සිටින නිසා කිසිවෙකු යෝජනා ඉදිරිපත් කරන බවක් මට පෙනෙන්නේ නැහැ. ඊ ළඟ යෝජනාව ඉදිරිපත්

කිරීම, ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මන්ත්‍රීතුමා. [බාධා කිරීම්] එතුමා ඉදිරිපත් කරන්නේත් නැහැ. [බාධා කිරීම්]

ඊළඟට, ප්‍රධාන කටයුතු. අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1, පළිබෝධ නාශක පාලනය කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත දෙවන වර කියවීම. [බාධා කිරීම්]

## පළිබෝධ නාශක පාලනය කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත
## பீடைகொல்லிகளைக் கட்டுப்படுத்தல் (திருத்தம்) சட்டமூலம்
## CONTROL OF PESTICIDES (AMENDMENT) BILL

***දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
*Order for Second Reading read.*

[අ. භා. 2.25]

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා (කෘෂිකර්ම අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன - கமத்தொழில் அமைச்சர்)
(The Hon. Mahinda Yapa Abeywardena - Minister of Agriculture)
ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා. [ඝෝෂා කිරීම්]

ගරු කථානායකතුමනි, මෙයින් බලාපොරොත්තු වන්නේ, 1980 අංක 33 දරන පළිබෝධ නාශක පාලනය කිරීමේ පනතේ 24 (1) වගන්තියට සංශෝධන ඉදිරිපත් කිරීමයි. 1994 අංක 6 දරන පනතින් සංශෝධිත, 1980 අංක 33 දරන පළිබෝධ නාශක පාලනය කිරීමේ පනත මඟින් ශ්‍රී ලංකාව තුළ පළිබෝධ නාශක භාවිතය හා - [ඝෝෂා කිරීම්] Sir, I propose that the Vote on the Second Reading be taken. - *[Uproar].*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ඡන්දය විමසන ලෙස ඉල්ලා සිටිනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පළිබෝධ නාශක පාලනය කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත, දෙවන වර කියවීම; සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය.:***
***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." --[ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා]***
*தீர்மானிக்கப்பட்டது.*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக" [மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன]*
*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Mahinda Yapa Abeywardena]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[කථානායකතුමා මූලාසනාරූඪ විය.]***
*குழுவில் ஆராயப்பட்டது.*
*[ சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*
*Considered in Committee.*
[MR. SPEAKER in the Chair.]

***1 සිට 3 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*1 ஆம் வாசகத்திலிருந்து 3 ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 1 to 3 ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
***පනත් කෙටුම්පත, සංශෝධන රහිතව වාර්තා කරන ලදී.***
*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் திருத்தமின்றி அறிக்கை செய்யப்பட்டது.*
*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported without Amendments.*

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
I move,
"That the Bill be now read the Third time."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන්වන වර කියවා සම්මත කරන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் மூன்றாம் முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill, accordingly read the Third time, and passed.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් යෝජනාව- [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් ඔය මන්ත්‍රීතුමන්ලාට එළියට යන්න ඕනෑ වෙලාද? [බාධා කිරීම්]

**ගරු කරු ජයසූරිය මහතා**
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)
ගරු කථානායකතුමනි, - [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමන්ලා කරුණාකරලා වාඩි වෙන්න. [බාධා කිරීම්]

**ගරු කරු ජයසූරිය මහතා**
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)
මගේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්න- [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එහෙම බැහැ නේ. තමුන්නාන්සේලා- [බාධා කිරීම්] කියන ඒවා ඇහෙන්නේ නැහැ නේ. [බාධා කිරීම්] එහෙම බැහැ නේ. පාර්ලිමේන්තුවේ වැඩ කර ගෙන යන්න ඕනෑ නේ. [බාධා කිරීම්]

**ගරු කරු ජයසූරිය මහතා**
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)
එදා පොරොන්දුත් වෙලා- [බාධා කිරීම්] මට කථා කරන්න අවස්ථාව ලබා දෙන්න. මට කථා කරන්න මිනිත්තු පහක් දෙන්න. නැත්නම් මට රටට කියන්න වෙනවා,-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් අවස්ථාව නැහැ.

**ගරු කරු ජයසූරිය මහතා**
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)
තමුන්නාන්සේගෙන් එහෙම දෙයක් බලාපොරොත්තු වුණේ නැහැ. ඒක වැරැදියි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් ඒකට අවස්ථාවක් නැහැ නේ.

**ගරු කරු ජයසූරිය මහතා**
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)
එහෙම කරන්න එපා. මේක පහදලා දෙන්න මට අවස්ථාවක් දෙන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් ඒකට අවස්ථාව නැහැ. [බාධා කිරීම්] තමුන්නාන්සේට කිව්ව වෙලාවේ ඒක ඉදිරිපත් කළේ නැහැ.

**ගරු කරු ජයසූරිය මහතා**
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)
ඉදිරිපත්- [බාධා කිරීම්] මට mike එක දුන්නෙත් නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
නම කිව්වා නේ. [බාධා කිරීම්] එහෙම නම් ඡන්දයක් විමසුවොත්- [බාධා කිරීම්] දැන් බැහැ. දැන් කරන්න දෙයක් නැහැ. මම ඒක හෙට ගන්නම්. හෙට න්‍යාය පත්‍රයට. [බාධා කිරීම්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එහෙම නම් හෙට උදේ ගන්නවාද?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඉදිරිපත් කරලා ඡන්දය විමසමු. [බාධා කිරීම්] හොඳයි දැන් ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමාගේ යෝජනාවට සවන් දෙන්න. [බාධා කිරීම්] තමුන්නාන්සේලා නිශ්ශබ්ද වෙන්න. [බාධා කිරීම්] තමුන්නාන්සේලා කරුණාකරලා වාඩි වෙනවාද? [බාධා කිරීම්] හරි. තමුන්නාන්සේලා වාඩි වෙන්න. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා, තමුන්නාන්සේගේ යෝජනාව ඉදිරිපත් කරන්න.

## ක්‍රීඩාවේ සංවර්ධනයට පවතින බාධාවන් ඉවත් කිරීම
### விளையாட்டு அபிவிருத்திக்கு நிலவும் இடையூறுகளை நீக்குதல்
### REMOVAL OF OBSTACLES IMPEDING SPORT DEVELOPMENT

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ලොව ඕනෑම රටක් ක්‍රීඩාව සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කරන්නේ එහි ඓතිහාසික පදනම නිසා පමණක් නොව නීරෝගී ශ්‍රම සම්පතක් වෙනුවෙන් එහි ඇති දායකත්වය අත්හළ නොහැකි නිසාය. ශ්‍රී ලංකාවේද කලින් කලට ක්‍රීඩාව කෙරෙහි අඩු වැඩි වශයෙන් බර තැබීම් කර ඇති අතර ජාත්‍යන්තර මට්ටමේ ජයග්‍රහණයන්ටද හිමිකම් ලබා තිබේ. එහෙත් කනගාටුදායක ලෙස වර්තමානයේ ශ්‍රී ලංකාවේ විශේෂයෙන් ක්‍රිකට් ක්‍රීඩාවේත් අනෙකුත් ක්‍රීඩා ක්ෂේත්‍රයන්හිත් අර්බුදකාරි තත්ත්වයන් උද්ගත වී ඇති බව සියලු දෙනාට පැහැදිලිය. එය ක්‍රීඩාව කෙරෙහි ජනතාවගේ උනන්දුව හීන කරවනවා පමණක් නොව ක්‍රීඩාවේදී රටක් ලෙස ශ්‍රී ලංකාව අත් පත් කර ගෙන තිබූ කීර්තිය පලුදු කරන්නක්ද වේ. එබැවින් මෙම තත්ත්වය වහා වෙනස් කර ක්‍රීඩාව නඟා සිටුවීමටත් එහි සංවර්ධනයට බාධාකාරි ලෙස පවතින තත්ත්වයන් වෙනස් කිරීමටත් වහා මැදිහත් විය යුතු යැයි මෙම ගරු සභාවට යෝජනා කරමි."

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම ක්‍රීඩාවට වඩාත් යෝග්‍ය වයස, තරුණ වයස. ඒ වයසේදී උසස් පෙළ සමත් වී විශ්වවිද්‍යාලවලට සුදුසුකම් ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට අද මොකක්ද කරලා තිබෙන්නේ? යම් අමාත්‍යවරයෙකුගේ තිබෙන

උන්නතිකාමී වුවමනාව, යම් අමාත්‍යවරයෙකුගේ තිබෙන වදකයකු බවට හැසිරීමේ හිංසනකාරී වුවමනාව, ශිෂ්‍යයන් තාඩන පීඩනවලට ලක් කිරීමේ මානසිකත්වය විසින් මොකද කරලා තිබෙන්නේ? ඒ ශිෂ්‍ය ශිෂ්‍යාවන් යම් යම් කඳවුරුවලට ගාල් කරන තත්ත්වයක් අද ඇති වී තිබෙනවා. එය ඔවුන්ගේ ක්‍රීඩාවන් වර්ධනයට සැලකිය යුතු බලපෑමක් කරනවා ගරු කථානායකතුමනි. විශේෂයෙන්ම ක්‍රීඩාවේදී අතිශයින්ම වැදගත්, මානසික නිදහස. මානසිකව හොඳ නිදහසකින් හිටියොත් තමයි ඔවුන්ට පුළුවන්කම තිබෙන්නේ තමන්ගේ ඒ ක්ෂේත්‍රයන් වර්ධනය කර ගන්නට.

ගරු කථානායකතුමනි, හමුදා කඳවුරකට ශිෂ්‍ය ශිෂ්‍යාවන් ගාල් කර හමුදාවේ අණසකට සීරුවෙන් හිටපන්, මේ වෙලාවට නැඟිටපන්, පහසුවෙන් හිටපන් කියා ඒ දෙන නියෝගයන් අනුව, ඒ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ මානසික තත්ත්වය සිරගත කර, යම් තාඩන පීඩනකාරී මානසික තත්ත්වයක් ඒ ශිෂ්‍යයන් තුළ ඇති කර ක්‍රීඩාවේ වර්ධනයක් අපේක්ෂා කරන්නට පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. එම නිසා ක්‍රීඩාවේ වර්ධනය කෙරෙහි අප සැලකිය යුතු අවධානයක් යොමු කරන වෙලාවේ අප මේ ගැන කල්පනා කළ යුතුව තිබෙනවා. පසු ගිය උසස් පෙළ විභාගයෙන් ඉතා ඉහළින්ම සමත් වුණු ශිෂ්‍යයෝ ගැන බලන්න. සමහර ශිෂ්‍යයෝ A සාමාර්ථ තුන අර ගෙන තිබෙනවා. ඔවුන්ගේ ඉතාමත් වැදගත් බලාපොරොත්තුවක් බවට පත් වී තිබුණේ තමන් හොඳ පුරවැසියකු හැටියට හොඳ අධ්‍යාපනයක් ලැබූ පුද්ගලයකු හැටියට මේ සමාජයට එන්නයි. ඒකට ඔවුන් තෘතීයික අධ්‍යාපනය සඳහා තෝරා ගත්තේ විශ්වවිද්‍යාලය යි. හැබැයි විශ්වවිද්‍යාලය තෝරා ගත් ඒ දරුවන්ට අද හමුදා කඳවුරුවල ලගින්නට සිදු වී තබෙනවා. ඒ දරුවන්ගේ ක්‍රීඩා කෞශල්‍යයටත්, ඒ දරුවන්ගේ ඉදිරි අනාගතයටත්- [බාධා කිරීමක්] ක්‍රීඩා. සැලකිය යුතු බලපෑමක් කරනවාය කියා අප විශ්වාස කරනවා ගරු කථානායකතුමනි. එම නිසා මේ අර ගෙන තිබෙන ඉතාමත් වැරදි තීරණය, හමුදා කඳවුරුවලට ගාල් කර මේ ඇති කරන මානසිකත්වය ගැන අප සඳහන් කරන්නට ඕනෑ. විශේෂයෙන් දෙමළ තරුණ තරුණියන් මේ කඳවුරුවලට ඇතුළු වෙමින් සිටිනවා. දෙමළ තරුණ තරුණියන්ට අපේ හමුදාව කෙරෙහි තිබෙන්නේ හොඳ චිත්‍රයක් නොවෙයි. ඒක හරිද වැරදිද කියන එක වෙනම විවාදයක්. නමුත් ඔවුන් තුළ තිබෙන්නේ යම් වැරදිකාරී චිත්‍රයක්. දෙමළ තරුණ තරුණියන් ගැන බලන විට, තමන්ගේ අයියා රැඳවුම් කඳවුරේ තියනකොට නංගී පුහුණුවට හමුදා කඳවුරට දානවා. සාධාරණ ද ඒක? ඒ තරුණ තරුණියන්ට ක්‍රීඩාවක් කළ හැකි ද? එම නිසා ක්‍රීඩාව කෙරෙහි-[බාධා කිරීම්] ක්‍රීඩාව. ඒ දරුවන්ගේ මානසිකත්වය නිදහසේ තබා ගැනීම අතිශය වැදගත් කාරණයක්. මානසිකත්වය පමණක් නොවෙයි. ක්‍රීඩා ක්ෂේත්‍රයේ පරිපාලනය ද අතිශය වැදගත්. අද මොකක් ද අපේ රටේ ක්‍රීඩාවේ පරිපාලනයට වෙලා තිබෙන්නේ ගරු කථානායකතුමනි.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
Sir, I rise to a point of Order.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
Point of Order එකක්. ගරු මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු කථානායකතුමනි, මයික් එක නැහැ. ගරු කථානායකතුමනි, එතුමා අපේ අමාත්‍යාංශය සම්බන්ධයෙන් කල් තැබීමේ යෝජනාවක් ඉදිරිපත් කර තිබෙන්නේ. නමුත් එතුමා මේ අවස්ථාවේදී කථා කරන්නේ ඊට සම්පූර්ණයෙන්ම වෙනස් වූ විශ්වවිද්‍යාල මාතෘකාවක්. [බාධා කිරීම්] නැහැ. මට හොඳට තේරෙනවා. එම විවාදය නිසා මෙතැනට අමාත්‍යාංශයේ නිලධාරින් ගෙන්වලා, ඔක්කොම ගෙන්වලා තිබෙනවා. මා එහෙනම් උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරින් මෙතැනට ගෙන්වන්න ද? ගරු කථානායකතුමනි, මේ මන්ත්‍රීතුමා සම්පූර්ණ වෙනස් මාතෘකාවක් කතා කරන්නේ. [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මේ කල්තැබීමේ යෝජනාව මොකක්ද? [බාධා කිරීම්] හරි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
එවැනි ගාල් කිරීම් අප මුළුමනින්ම හෙළා දකිනවා. ඒ වෙනුවට එම දරු දැරියන්ට නිදහසේ අධ්‍යාපනය හදාරන්නට තිබෙන හැකියාවත්, තමන්ගේ කුසලතාවන් වර්ධනය කරන්නට පුළුවන් මානසිකත්වයත්, වටපිටාවත් නිර්මාණය කළ යුතුයි. ඒ වාගේම ඒ සඳහා අතිශය වැදගත් ක්‍රීඩා පරිපාලනය. ක්‍රීඩා පරිපාලනය හරි ලෙස නැතුව ඒ දරුවන්ගේ ක්‍රීඩා කුසලතාවන් නැංවීමට හැකියාවක් ලැබෙන්නේ නැහැ. අපේ රටේ ක්‍රීඩා ඇමතිවරු ගණනාවක් ඉඳලා තිබෙනවා. අපේ වර්තමාන ක්‍රීඩා ඇමතිතුමාත් දැන් මෙතැන ඉන්නවා. පුවත්පත් හරහා විවිධ වාග් ප්‍රහාර, ප්‍රකාශ මා දැක්කා. දැන් අපට අවශ්‍ය වන්නේ ප්‍රකාශ නොවෙයි. හැබැයි ඔබතුමා බොහොම පරිස්සමින් ප්‍රකාශ කරනවා. සී.බී. ඇමතිතුමා වාගේ "අවුට්" වන්නේ නැහැ. [බාධා කිරීමක්] ඔව්. "නොකවුට්". එම නිසා ක්‍රිකට්ටුවේ රැඳී ඉන්න ඔබ සමත් වෙන ප්‍රමාණයට ගැලපෙන පරිදි ප්‍රකාශ කරන්න ඔබතුමා සූක්ෂ්ම වී තිබෙනවා. ගරු සී.බී. රත්නායක ඇමතිතුමාට ඒ සූක්ෂ්ම භාවය ආරක්ෂා කර ගන්නට බැරි වුණා. එතුමා අවංක වුණා. ඔබතුමා තරම් සූක්ෂ්ම වුණේ නැහැ. එතුමා එතුමාගේ හදේ නැඟුණු ඇත්ත වැකි ප්‍රකාශයට පත් කරන්නට පටන් ගත්තා. එහි ප්‍රධාන වැකිය තමයි, ලංකාවේ ක්‍රීඩා බෝඩ් එක පොලිසියටත් වඩා හපන් කිව්වා. [බාධා කිරීමක්] ක්‍රිකට් බෝඩ් එක; ක්‍රිකට් පාලනය. ඒක පොලිසියටත් වඩා හපන් කිව්වා. හැබැයි ඒ හපන් කිව්ව ඇමතිතුමාට මාස දෙකක්වත් ක්‍රීඩාවේ හපන්කම් පෙන්වන්නට බැරි වුණා. එතුමාට මොකද කළේ? දොට්ට දැම්මා. එතුමා ඊට පස්සේ ප්‍රයිවට් බස් එකට වැටිලා තිබෙනවා. එතුමා ඒ කාර්ය භාරයේ යමක් කරාවි. අප ඒ ගැන බලාපොරොත්තුවෙන් ඉන්නවා.

දැන් ඇති වී තිබෙන ප්‍රශ්නය, ඉතිහාසය. පළමුකොටම මා ඔබතුමාගෙන් දැන ගන්නට කැමතියි මේ කාරණය.

පසු ගිය අවුරුදු කීපය ඇතුළත පමණක් රුපියල් බිලියන 2.1ක්, ඒ කියන්නේ රුපියල් කෝටි 210ක් වියදම් කරලා තිබෙනවා තමුන්නාන්සේගේ අමාත්‍යාංශයෙන්. රුපියල් කෝටි 210ක්. විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ගේ හමුදා පුහුණුවට වෙන් කරලා තිබෙනවාය කියලා කියන්නේ රුපියල් කෝටි 20යි. ගරු ඇමතිතුමනි, හැබැයි දැන් රුපියල් කෝටි 210ක් වෙන් කරලා තිබෙනවා තමුන්නාන්සේගේ අමාත්‍යාංශයේ වියදම්වලට. ඒ කෝටි 210 වියදම් වුණේ කොහොමද? ගරු කථානායකතුමනි, කෑගල්ල ප්‍රදේශයේ හැදුවා මීටර් 200 ධාවන පථයක් සහිත ක්‍රීඩාංගණයක්. වියදම කීයද? ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවා මටත් වඩා හොඳට ඒ ගැන. වියදම රුපියල් මිලියන 300යි. ලක්ෂ 3,000ක් වියදම් කළා කෑගල්ලේ මීටර් 200 ධාවන පථයක් සහිත ක්‍රීඩාංගණයක් හදන්න. මේ රටේ ජනතාව බදු ගෙවනවා. ඒ සල්ලි එකතු කරලා රුපියල් මිලියන 300කට වඩා වියදම් කරනවා එක ක්‍රීඩාංගණයක් හදන්න. ඒ විතරක් නොවෙයි. හාස්‍යජනකම කරුණ මේකයි ගරු කථානායකතුමනි. පිළියන්දල ප්‍රදේශයේ පිහිනුම් තටාකයක් හදන්න රුපියල් මිලියන 80ක් -රුපියල් ලක්ෂ

[ගරු අනුර දිසානායක මහතා]

800ක්- වියදම් කරලා තිබෙනවා. ගරු කථානායකතුමනි, පිහිනුම් තටාකයක් හදන්න රුපියල් ලක්ෂ 800ක් වියදම් කරනවා. ගරු ඇමතිතුමනි, ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා ඒවා පිළිබඳව පරීක්ෂණයක් පවත්වන්න කියලා. ඒවා මේ රටේ ජනතාවගේ මුදල්. ඒවායෙන් කිසි ප්‍රතිඵලදායක තත්ත්වයක් ඇති වී නැහැ. ඒ මුදල් සම්භාරය වැඩියි. අධ්‍යාපන අමාත්‍යාංශයෙන් පිහිනුම් තටාක හදලා තිබෙනවා. ඔය තරම් ලොකු මුදලක් වියදම් කරලා තිබුණේ නැහැ. හැබැයි රුපියල් ලක්ෂ 800ක් වියදම් කරලා තිබෙනවා පිහිනුම් තටාකයක් හදන්න. එයින් මහා යටිමඩි ගැහිලි තිබෙනවා. ඒ නිසා ක්‍රීඩා අමාත්‍යාංශයේ මහා පරිමාණ වංචා, දූෂණ, නාස්ති සිදු වී තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා ඒවා ගැන පරීක්ෂණ කළ යුතුව තිබෙනවා.

ගරු ඇමතිතුමනි, ඒ වාගේම ඔබතුමා දන්නවා ඉදිරි ක්‍රීඩා කටයුතු සඳහා අපේ TV අයිතිය -රූපවාහිනී අයිතිය- අප විකුණන බව. මීට කලින් සංචාරක ඉන්දීය ක්‍රිකට් කණ්ඩායම ආවා අපේ රටට. ඒ තරගාවලියට එක් දින තරග පහයි, T20 තරග එකයි. ඒ තරගාවලියේ TV අයිතිය ලබා ගැනීම සඳහා සමාගමක් විසින් ලියවිල්ලක් අත් සන් කරනු ලැබුවා. ගරු කථානායකතුමනි, මා ගාව තිබෙනවා එම ලියවිල්ල. එහි එකඟ වෙනවා ඇමෙරිකන් ඩොලර් මිලියන 7.55කට එම තරගාවලියේ TV අයිතිය -එම තරගාවලියේ ප්‍රචාරණ අයිතිය හෙවත් විකාශන අයිතිය- ලබා ගන්න. ඩොලර් මිලියන 7.55ට එකඟ වෙලා අත් සන් කරලා තිබෙන්නේ කවුද? Directorගේ අත් සන තිබෙනවා. ප්‍රධාන ගිණුම් නිලධාරියාගේ අත් සන තිබෙනවා. හැබැයි අවසානයේදී ඒ අයිතිය දුන්නේ කීයටද? ඩොලර් මිලියන 6ට. ඩොලර් මිලියන 7.55ට එකඟ වී තිබුණු එක අවසානයේදී විකුණනු ලැබුවේ ඩොලර් මිලියන 6කට. ඩොලර් මිලියන 1.55කට සිද්ධ වුණේ මොකක්ද කියලා තමුන්නාන්සේ මේ පාර්ලිමේන්තුවේදී ඉදිරිපත් කරාවිය කියලා මම බලාපොරොත්තු වෙනවා ගරු ඇමතිතුමනි.

ගරු කථානායකතුමනි, ඉදිරියේදී විශේෂයෙන්ම Commonwealth ක්‍රීඩා තරගය තිබෙනවා. ගරු ඇමතිතුමනි, 2018 දී පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල ලබා ගැනීම සඳහා ඔබතුමන්ලා විශාල උත්සාහයක් දරනවා. බ්‍රිස්බේන් නගරයේ පැවැත්වීම සඳහා ඕස්ට්‍රේලියාවත් එම ක්‍රීඩා උළෙල ඉල්ලා සිටිනවා; හම්බන්තොට සූරියවැව නගයේ පැවැත්වීම සඳහා ශ්‍රී ලංකාවත් එම ක්‍රීඩා උළෙල ඉල්ලා සිටිනවා. ඒ නිසා ඔලිම්පික් කමිටුවෙන් අපට මෙය ලබා ගැනීම සඳහා අප ඒ රාජ්‍යයන්ගේ -රටවල- කැමැත්ත ලබා ගන්න ඕනෑ. ඒ කැමැත්ත ලබා ගැනීම සඳහා අප යම් ක්‍රියා දාමයකට අවතීර්ණ වන්න ඕනෑ. ඒ පිළිබඳ වැරැද්දක් නැහැ. ඒ නිසා ලන්සු තැබීම සඳහා යම් ලේඛනයක් සකස් කරලා, වැඩ පිළිවෙළක් සකස් කරලා අපි ඒකට අවතීර්ණ වෙන්න ඕනෑ. Bid book එකක් හදන්න ඕනෑ. තමුන්නාන්සේලා bid book එකක් හදන්න කල්පනා කළා. ඒ පිළිබඳ කමිටුව හැටියට පත් කළේ ගරු ඩිලාන් පෙරේරා ඇමතිතුමායි, ඔලිම්පික් කමිටුවේ සභාපති හේමසිරි ප්‍රනාන්දු මහතායි, ඒ වාගේම අජිත් නිවාඩ් කබ්රාල් මැතිතුමායි, මට මතක විධියට තවත් එක් නිලධාරි මහත්මයකුයි. හතර දෙනකුගෙන් යුත් කමිටුවක් පත් කළා. හතර දෙනකුගෙන් පත් කළාට පස්සේ මේ සඳහා එච්චි, PMP Legacy කියන සමාගම bid book එක සඳහා තමුන්නාන්සේලාට එච්චි එක ටෙන්ඩර් මණ්ඩලයට ඉදිරිපත් කළා. IBCL කියන සමාගමත් ඉදිරිපත් කළා. එහි ලියවිල්ලත් මා ගාව තිබෙනවා. ඒ වාගේම තවත් සමාගමක් ඉදිරිපත් කළා. මේ විධියට සමාගම් තුනක් ඉදිරිපත් කළා. ඒ සමාගම් තුන bid book එක සකස් කිරීම සඳහා තමන්ගේ ටෙන්ඩර් ලියවිලි ඉදිරිපත් කළා. ඒ ටෙන්ඩර් ලියවිලි ඉදිරිපත් කරලා තිබියදී නලින් ආටිගල කියන මහත්මයා-[බාධා කිරීමක්] මා දන්නේ නැහැ නලින් ආටිගල මහත්මයාට මෙකේ තිබෙන සම්බන්ධය මොකක්ද කියලා. PMP Legacy එකෙන් තමුන්නාන්සේලාට ඉදිරිපත් කරපු ඒ ඉල්ලීම සඳහන් ලියවිල්ලේ පැහැදිලි ලෙස සඳහන් කර තිබෙන්නේ මොකක්ද?

මේ ලියවිල්ලේ තුන් වන පිටුවේ පැහැදිලි ලෙස සඳහන් කර තිබෙනවා ගරු කථානායකතුමනි, -

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔව්, මොකක්ද?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
The Standing Orders are very specific that once the Members enter the House, they have to resume their seats. As was said by Erskine May and very well practised in the House of Commons, any Member who wishes to speak and catches the eye of the Speaker first, can speak. It is against the Standing Orders for any Member to stand in the House when he does not speak. And, there is a parade-like demonstration in this House today, which is also against the Standing Orders.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි, බොහොම ස්තුතියි.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, give me one minute. You must ask them to withdraw and hold an inquiry as to how these placards have been brought into the House. It is a very serious matter. It sets a bad precedent. You have to hold an inquiry first into the conduct of the Leader of the Opposition. We thought he defeated President Premadasa. But, it is not so. His brain is like that of a child.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ස්ථාවර නියෝගවල කෙසේ සඳහන් වුවත්, ගරු මන්ත්‍රීතුමන්ලාට ව්‍යායාම සඳහා හිටගෙන සිටීමට අවසර තිබෙනවා. [බාධා කිරීම්] ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කථාව කර ගෙන යන්න. [බාධා කිරීම්] කරුණාකර වාඩි වන්න. මම මගේ ස්ථාවරය කිව්වා. ගරු මන්ත්‍රීතුමා කථාව කර ගෙන යන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මේ ලියවිල්ලේ සඳහන් කරනවා- [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
වාඩි වෙන්න. දැන් ඒක ඉවරයි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මෙසේ තිබියදී මේ සඳහා ටෙන්ඩරයක් ඉදිරිපත් කිරීමට සූදානම් වන සමාගමක් සමඟ යම් රහස් සාකච්ඡාවක් සිද්ධ වුණා. ගරු කථානායකතුමනි, ඒ සමාගමත් සමඟ - [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු අස්වර් මන්ත්‍රීතුමා, දැන් කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මේ අයව මුණ ගැසුණා මේ සමාගම. මේ සමාගමත් මේ සඳහා ඉල්ලුම් කරන සමාගමක්. ඒ සමාගමේ පිරිස -[බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවට ඇහුම් කන් දෙන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ සමාගමේ පිරිස හේමසිරි ප්‍රනාන්දු, සිරි ලියනගම සහ නලින් ආටිගල මහත්වරුන් මුණ ගැසෙනවා. ලියනගම කියලා කියන්නේ ඒ වෙලාවේ අමාත්‍යාංශයේ හිටපු ලේකම්වරයා. මේ සමාගම අමාත්‍යාංශයේ ලේකම්වරයාත්, මේ තාක්ෂණික ඇගයුම් කමිටුවට පත් කර තිබෙන හේමසිරි ප්‍රනාන්දු මහතාත්, ඒ වාගේම නලින් ආටිගල කියන පුද්ගලයාත් මුණ ගැසෙනවා ලන්ඩනයේ දී. ඔවුන් ටෙන්ඩරයක් ඉදිරිපත් කර තිබෙන සමාගමක්. ඊට අමතරව තවත් සමාගම් තිබුණා. එසේ තිබියදී මේ සමාගම විශේෂයෙන් ගිහින් මේ කණ්ඩායම මුණ ගැහෙනවා. මුණ ගැහෙනවා විතරක් නොවෙයි, ගරු කථානායකතුමනි. මෙම ටෙන්ඩරය ලබා ගැනීම සඳහා -බ්‍රිස්බේන් නගරයෙන් ලංකාවට ලබා ගැනීම සඳහා- සකස් කරන ලියවිල්ලේ ආයතනයක් සඳහන් කරන්නට ඕනෑ. ඒ සමාගම විසින් ඉදිරිපත් කරන ලද ලියවිල්ල මා ළඟ තිබෙනවා. එම ලියවිල්ලේ ඒ ආයතන ව්‍යුහය -structure එක- සඳහන් කර තිබෙනවා. මේ සමාගම් තුනම -අනෙකුත් සමාගම් ඇතුළු IBCL කියන සමාගමත්- එම ආයතන ව්‍යුහය හදලා දීලා තිබෙනවා. හැබැයි, මෙම සමාගම ආයතන ව්‍යුහයට විශේෂ වගන්තියක් ඇතුළත් කරනවා. ගරු කථානායකතුමනි, ඒ සමාගමේ Board Chairman කෙනෙක් ඉන්නවා. හැම සමාගමකම Board Chairman කෙනෙක් ඉන්නවා. හැබැයි Board Chairman කවුද කියලා නැහැ. හැබැයි, මේ සමාගම විශේෂයෙන් Board Chairman විධියට නාමල් රාජපක්ෂ කියලා නමක් දමනවා. ආයතන ව්‍යුහයක් ඉදිරිපත් කරනවා විතරක් නොවෙයි, එම ආයතන ව්‍යුහයේ සභාපති ධුරයට පත් කරන්නේ නාමල් කියලා කලින්ම මේ සමාගම තමන්ගේ ලියවිල්ලේ සඳහන් කරලා එවනවා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
කවුද ඔය නාමල් කියන්නේ?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නාමල් රාජපක්ෂ. ඔබතුමා රෙදි හෝදන එක්කෙනා. ඔබතුමා රෙදි හෝදන්නේ, අන්න ඒ එක්කෙනා. [බාධා කිරීම්] ගරු කථානායකතුමනි, එතකොට දැන් මම අහන්නේ -

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මොකක්ද point of Order එක?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
He is referring to an Hon. Member of this House. I ask whether he is referring to the Hon. Namal Rajapaksa, Member of Parliament.? It that is so, it must be expunged. He must withdraw that.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා පටලවා ගත්තා. [බාධා කිරීමක්] ඉතින් ඒක නේ. අහලා, කටින් උත්තරයක් ගත්තා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
කියන්න, කියන්න. කා ගැනද ඔය කියන්නේ? If he is referring to a Member of the House, then that must be expunged. He cannot do that. He is referring to the conduct of a Member, which is not allowed under the Standing Orders.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමා ඉතාමත් ලස්සනට ඒක කිව්වා. තමුන්නාන්සේ ඒක වරද්ද ගත්තා. මන්ත්‍රීතුමාගේ කථාව කර ගෙන යන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, ඒ නිසා [බාධා කිරීම්] ඒ විතරක් නොවෙයි. නලින් ආටිගල කියන මහත්මයා අනෙක් සමාගම්වලට යවපු ඊ-මේල් එකක කොටසක් මා ගාව තිබෙනවා. එහි පැහැදිලි ලෙසම අනෙක් සමාගම්වලට කියනවා, "ඔබ ඉදිරිපත් කරන මිල ගණන් එවන්න" කියලා. කවුද නලින් ආටිගල කියන්නේ? ගරු කථානායකතුමනි, අවසානයේ සිද්ධ වුණු දේ මොකක්ද? ආසියානු ක්‍රීඩා උළෙල තිබුණා චීනයේ. චීනයේ ආසියානු ක්‍රීඩා උළෙල තිබෙන වෙලාවේ හේමසිරි ප්‍රනාන්දු මහත්මයා හිටියේ එහේ. මෙහේ කමිටුව රැස් වෙලා PMP Legacy කියන සමාගමට ලක්ෂ 440කට ටෙන්ඩරය ලබා දෙනවා. මා දන්නේ නැහැ මෙතැනින් පස්සේ සිද්ධ වෙලා තිබෙන්නේ මොකක්ද කියලා. ඒ නිසා ගරු ඇමතිතුමාගෙන් ඒ පිළිබඳව දැන ගන්න කැමැතියි. මුළුමනින්ම විනිවිදභාවයෙන් තොරව, තෝරා ගන්නා ලද

[ගරු අනුර දිසානායක මහතා]

සමාගමකට ඒ ටෙන්ඩරය ලබා දීමේ අරමුණින් මුල සිටම කටයුතු කරන ලද ක්‍රියාදාමයක ප්‍රතිඵලය තමයි PMP Legacy කියන සමාගමට ඒ ටෙන්ඩරය ලබා දීම. ඒ අනුව තමයි තමුන්නාන්සේලා බ්‍රිස්බේන් නගරයෙන් පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල ලබා ගැනීම සඳහා bid book එක සකස් කිරීමටත්, ඒ අනෙකුත් ක්‍රියාමාර්ගවලටත් අවතීර්ණ වෙලා තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, මම ගරු ඇමතිතුමාගෙන් කරුණු කිහිපයක් දැන ගන්න කැමැතියි. අනාගතයේ අපේ රටට එන ක්‍රීඩා තරග පිළිබඳ වාර්තාව මා ගාව තිබෙනවා. ඒ වාර්තාවේ තිබුණා test matches දෙකකට, one-day matches තුනකට 2008 නොවැම්බර්වල සිම්බාබ්වේ ක්‍රිකට් කණ්ඩායම පැමිණෙනවා කියා. ඒ වාගේම India, South Africa ක්‍රිකට් කණ්ඩායම් එනවා. මේ විධියට future plan එක හදලා තිබුණා. ඒ plan එක අනුව විස්තර ටික තිබෙනවා. ඒ plan එක අනුව ඒ ගොල්ලන් එහි වෙළෙඳ වටිනාකම හැදුවා ඩොලර් මිලියන 38යි ගණනකට. ගරු කථානායකතුමනි, ඩොලර් මිලියන 38යි ගණනකට මේ matchesවල rights ටාජ් කියන සමාගමට විකුණන්න මෙතුමන්ලා කටයුතු සකස් කළා. ඩොලර් මිලියන 38කට ඒක හැදුවාට පස්සේ ඒ කාරණය සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට නඩුවක් ගොනු වුණා. ශ්‍රේෂ්ඨාධිකරණයේදී ඉදිරිපත් කළා, "මීට අමතරව තවත් තරග හතක් මේකට ඇතුළත් කරනවා, ඒ තරග හතට අනුව මෙහි ඇත්ත වටිනාකම ඩොලර් මිලියන 63 දක්වා වැඩි කරනවා" කියලා. ඕක නේ කළේ. ඩොලර් මිලියන 38ට තමයි මෙහි වෙළෙඳ පොළ වටිනාකම තීරණය කරලා තිබුණේ. ශ්‍රේෂ්ඨාධිකරණයට ගියාම කිව්වා, ඩොලර් මිලියන 38ට මෙහි වෙළෙඳ පොළ වටිනාකම තීරණය කරන එක වැරැදියි කියලා. වැරැදියි කියලා කිව්වට පස්සේ ක්‍රිකට් පාලක මණ්ඩලයේ නිලධාරි මහත්වරු ශ්‍රේෂ්ඨාධිකරණයේදී එකඟතාවකට පත් වුණා, මේ සැලැස්මේ නැති තවත් ක්‍රීඩා තරග හතක් මේකට ඇතුළත් කරනවා කියලා. ඇතුළත් කරලා කිව්වා ඒ හතත් ආවොත් ඩොලර් මිලියන 63ක් දෙනවා කියලා. ගරු කථානායකතුමනි, ඒ ඇතුළත් කරපු ක්‍රීඩා තරග සංචාර හත කිසිසේත්ම ලංකාවේ අනාගත ක්‍රිකට් ක්‍රීඩා තරග සැලැස්මේ තිබුණේ නැහැ. තිබුණේ නැති තරග හතක් ඇතුළත් කළා නඩුවෙන් එළියට එන්න. මම අහන්න කැමැතියි තමුන්නාන්සේගෙන් ඒ ක්‍රීඩා තරග හතෙන් කීයක් පැවැත්වූවාද කියලා. ගරු කථානායකතුමනි, ඒ ක්‍රීඩා තරග හත පවත්වන්නේ නැත්නම් ඩොලර් මිලියන 38 තමයි හම්බ වෙන්නේ. හැබැයි, ශ්‍රේෂ්ඨාධිකරණයෙන් මග ඇරලා එන්න -එතැනින් මග ඇරලා එන්න- ඩොලර් මිලියන 63කට එකඟ වුණා. හැබැයි, ඩොලර් මිලියන 63කට එකඟ වුණේ අතිරේක ක්‍රීඩා තරග හතක් දාලයි. ඒ සංචාර හත සිද්ධ වුණොත් විතරයි ඩොලර් මිලියන 63ක් ගෙවන්නේ. ඒ සංචාර හත සිද්ධ වන හතක් නොවෙයි. ඒක සිද්ධ නොවුණු නිසා තමුන්නාන්සේලාට හම්බ වුණේ ඩොලර් මිලියන 38යි. මම ක්‍රීඩා ඇමතිතුමාගෙන් දැන ගන්න කැමැතියි, ශ්‍රේෂ්ඨාධිකරණයේදී එකඟතාවකට පත් කරපු ඒ ක්‍රිකට් සංචාර හත -විදෙස් සංචාර හත- පැවැත්වූවාද, නැද්ද කියලා. මා දන්නා පරිදි, තොරතුරු තිබෙන පරිදි ඒ කිසිම තරගයක් පැවැත්වූයේ නැහැ. හැබැයි ඊට අමතරව ඉන්දියාවත් එක්ක අපේ තරගයක් තිබුණා. ගරු කථානායකතුමනි, ඒ තරගයක් තිබියදී ක්‍රිකට් පාලක මණ්ඩලයේ නිලධාරි මහත්වරු එකඟ වෙලා තිබෙන්නේ මොකක්ද? අපි ඉන්දියාවත් එක්ක යම් තරගයක් පවත්වනවා නම් පළමුවැනි කැමැත්ත විකුණන්න අහන්න ඕනෑ ටාජ් කියන සමාගමෙන්. ටාජ් කියන කොම්පැනිය අකැමැති නම් විතරයි අපට වෙන කාටවත් දෙන්න පුළුවන්.

2009 දී ඉන්දියානු තරගාවලියක් ලංකාවට ආවා. ඒ ආපු වෙලාවේ මොකක්ද වුණේ? ටෙන්ඩර් කැඳවා අපට ඕනෑ විධියට මේක අළෙවි කර ගන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ. අපි යටින් එකඟ වෙලා තිබුණේ මොකකටද? අපි යටින් එකඟ වෙලා තිබුණා, ඉන්දියානු තරගයක් ලංකාවේ පවත්වනවා නම් පළමුවන කැමැත්ත විමසන්නේ "ටාජ්" කියන සමාගමෙන් කියලා. "ටාජ්" කියන සමාගම අකැමැති නම් විතරයි, අපට මේ අයිතිය වෙන කාටවත් දෙන්න පුළුවන්කම තිබෙන්නේ. හැබැයි ටාජ් සමාගම මොකද කළේ? ඩොලර් මිලියන 3.1කට ඒක ගත්තා. ගරු කථානායකතුමනි, විවෘත ටෙන්ඩර් කැඳවීමකින් ඩොලර් මිලියන 7කට වඩා වැඩියෙන් අළෙවි කරන්න පුළුවන්කම තිබුණු එකක්, ක්‍රිකට් පාලක මණ්ඩලයේ නිලධාරින් යටින් අත්සන් කර තිබුණු ලියවිල්ලක් නිසා පළමුවන කැමැත්ත ටාජ් සමාගමේ විමසීමට ලක් වුණු නිසා ඩොලර් මිලියන 3.1කට දෙන්න සිද්ධ වුණා. මේකේ ඇත්ත තමයි ගරු කථානායකතුමනි, එළඹෙන අවුරුදු පහ ඇතුළත මේ සංචාරවලට අයිති නැති ඉන්දියානු තරග ලංකාවේ පවත්වනවා නම්, ඒ අවුරුදු පහ ඇතුළත පවත්වන හැම තරගයකින්ම හිටපු ඇමතිවරයාට ගණනක් යන විධියට මේක සකස් කරලා තිබෙන එක. හැම තරගයකින්ම හිටපු ඇමතිවරයාට ගණනක් එනවා. ඇමතිවරයා වශයෙන් ඉන්න කාලයේ විතරක් නොවෙයි, ගියාට පස්සේත් තමන්ට සල්ලි ලැබෙන විධියට මැෂින් එක හදලායි තිබෙන්නේ. [බාධා කිරීමක්] විජයමුණි සොයිසා මැතිතුමා නොවෙයි. එතුමා අහනවා එතුමාද කියලා. මා කිව්වා, එතුමා නොවෙයි කියලා. [බාධා කිරීමක්] ගරු කථානායකතුමනි, ගරු ක්‍රීඩා ඇමතිතුමා මේ පිළිබඳව සොයා බලා, නැවත පරීක්ෂණ කමිටුවක් පත් කරලා, විශේෂයෙන්ම අඩුම තරමේ පසු ගිය වංචා, දූෂණ ගැන නොවෙයි, ඉදිරියේදී -අනාගතයේදී- සල්ලි මැෂිමෙන් තමන්ගේ ගෙදරට සල්ලි ගලා ගෙන එන එක වැළැක්වීම සඳහාවත් තීරණයක් ගත යුතු යයි කියා මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ විතරක් නොවෙයි. ක්‍රීඩා ඇමතිතුමා මේ පිළිබඳව වාර්තාවක් කබ්රාල් කියන මහත්මයාගෙන් ඉල්ලා සිටියා. ඒ කබ්රාල් කියන මහත්මයා වාර්තාවක් දීලා තිබෙනවා. ඒ වාර්තාව ඔබතුමා කියවන්න. වැරැදිකරුවන් කවුද, හවුල් වුණේ කවුද කියා පැහැදිලිව ඒ වාර්තාවේ සඳහන් කරලා තිබෙනවා. එම නිසා ඒ වාර්තාව මත පදනම්ව වැරැදිකරුවන් සහ ඊට හවුල් වුවන් පිළිබඳව ක්‍රියාමාර්ග ගන්න ඕනෑ. හැබැයි ඒ ක්‍රියාමාර්ග ගන්නවා වෙනුවට එහි සමහර නිලධාරින් යම් යම් පුටුවල වාඩි කරවන තත්ත්වයකට තමුන්නාන්සේ අද පත් වෙලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, ගරු කථානායකතුමනි. මේ පිළිබඳව දීර්ඝ ලෙස අපේ අර්ජුන රණතුංග මැතිතුමා කථා කරන නිසා අවසාන වශයෙන් මා මේ කාරණයත් කියන්න ඕනෑ. විශේෂයෙන්ම විවිධ තහනම් උත්තේජක පාවිච්චි කිරීම පිළිබඳව දැන් අපේ ක්‍රීඩකයන්ට චෝදනා නඟා තිබෙනවා. අපේ මංජුල ක්‍රීඩකයාගේ පදක්කම නැවත ලබා ගත්තා. දැන් බර ඉසිලීමේ තරගයේ පදක්කම උරුම කර ගත් චින්තකට ඒ චෝදනාව නඟා තිබෙනවා. ක්‍රීඩා අමාත්‍යාංශයේ වෛද්‍ය ඒකකයක් තිබෙනවා. ක්‍රීඩා අමාත්‍යාංශයට වෛද්‍ය ඒකකයක් තිබියදී, ඒ වෛද්‍ය ඒකකයේ නිසි පරීක්ෂාවකට සහ සෝදිසියකට ලක් නොකොට, ජාතික ක්‍රීඩකයෙක් කුරුණෑගල පැත්තේ ඉන්න හෝමියොපති දොස්තර කෙනකුගෙන් බෙහෙත් ගන්නේ කොහොමද? එම ක්‍රීඩකයා ප්‍රකාශයක් කරලා තිබෙනවා මා දැක්කා, කුරුණෑගල පැත්තේ හෝමියොපති වෛද්‍යවරයකු ඒ බෙහෙත දුන්නාය කියලා. ඒ වෛද්‍යවරයා ලියා පදිංචි වෙලාත් නැහැ; සහතිකයකුත් නැහැ. එතකොට ක්‍රීඩා වෛද්‍ය ඒකකය මොකක්ද කරන්නේ? අද ක්‍රිකට් ක්‍රීඩකයකුටත් ඒ චෝදනාව ඇවිත් තිබෙනවා. අපි ප්‍රාර්ථනා කරනවා, එම ක්‍රිකට් ක්‍රීඩකයා එම චෝදනාවෙන් නිදහස් වේවා කියලා. නමුත් ක්‍රීඩා වෛද්‍ය ඒකකයක වග කීමක් තිබෙනවා. කාලාන්තරයක් තිස්සේ ඒ පුටුවේ වැජඹෙන අධ්‍යක්ෂවරයා මොකක්ද කරන්නේ? ඇමතිවරුන්ගේ කකුල් මිරිකනවා. ඇමතිවරුන්ගේ දරුවන්ගේ කකුල් මිරිකනවා. ඕක තමයි කරකර ඉන්නේ. සතියකට දවස් තුනක් විතර මේ පාර්ලිමේන්තුවේදී එතුමා හම්බ වෙනවා. එතුමා මසාජ් කරනවා. ඒ ගැන ඔබතුමා

දන්නවා. ඕක තමයි කරකර ඉන්නේ. සතියකට දවස් තුනක් මේ පාර්ලිමේන්තුවේ ලොබියේ පැත්තේ කැරකෙනවා. එතුමා ඉන්න ඕනෑ, ක්‍රීඩා අමාත්‍යාංශයේ ක්‍රීඩා ඒකකයේ. එතුමා ඒ වෛද්‍ය ඒකකයේ වැඩ කටයුතු කරන්න ඕනෑ. ඒ වැඩ කටයුතු කරනවා වෙනුවට එතුමා මොකක්ද කරන්නේ? එතුමා වෙනවෙන ජොබ් කරමින් ඉන්නවා. අපේ ක්‍රීඩකයන්ට මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ? අපේ ක්‍රීඩකයන් තමන්ගේ දක්ෂතාවෙන් ලබා ගන්නා ලද පදක්කම් පවා නැවත දීමට සිදු වන තත්ත්වයක් නිර්මාණය වෙලා තිබෙනවා. ඒ පිළිබඳවත් ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරනවා.

SLPL තරගය ජූලි මාසයේ පවත්වන්න ඔබතුමන්ලා සූදානම් කරලා තිබෙනවා. ඒකේ ඇති වුණු ගනු දෙනුව පිළිබඳව වෙනම කථා කරමු. සිංගප්පූරු සමාගම මොකක්ද, ඒ සමාගම ගත්තේ කොහොමද කියා වෙනම කථා කරමු. ඒක කමක් නැහැ කියමු. තමුන්නාන්සේලා කියන්නේ SLPL තරගයකට සහභාගි වන්න පුළුවන් විදෙස් ක්‍රීඩකයන් 4 දෙනාටයි; සංචිතයේ ඉන්න පුළුවන් 15 දෙනාටයි කියලායි. අඩුම තරමේ අපේ ක්‍රීඩකයන් 7 දෙනකුවත් එක තරගයකට ක්‍රීඩා කරනවා. කණ්ඩායම් 7ක් ඉන්නවා. එතකොට අපේ ක්‍රීඩකයන් 49 දෙනකුට අවස්ථාවක් ලැබෙනවා. හොඳයි. අපේ ක්‍රීඩකයන් 49 දෙනකුට අවස්ථාවක් ලැබෙනවා, ඒ ක්‍රීඩා මාලාවට තරග වදින්න. හැබැයි අපි අවස්ථාව ලබා දෙන්න ඕනෑ කාටද? අපේ ජාතික කණ්ඩායමේ ඉන්නවා, 15 දෙනෙක්. ඒ 15 දෙනාට අපි අවස්ථාව දුන්නාය කියමු. 49 දෙනාගෙන් 15 දෙනකු ගියාම අපට තව ඉතුරු වෙලා ඉන්නවා, 34 දෙනෙක්.ඒ 34 ගන්න ඕනෑ අපේ දෙවැනි පෙළ කණ්ඩායමෙනුයි. හැබැයි මේ කාලවකවානුවේ මොකක්ද වෙලා තිබෙන්නේ? දෙවැනි පෙළ හැටියට ඉන්න කණ්ඩායම එංගලන්තයේ සංචාරයක නිරත වෙනවා. අපි ඉතිරි ටික පුරවන්න ඕනෑකම තිබෙන්නේ ඒ කණ්ඩායමේ ක්‍රීඩකයන්ගෙනුයි. ජාතික කණ්ඩායමේ ක්‍රීඩකයන් 15 දෙනෙක් ඒ 49 දෙනාට ඇතුළත් වුණොත් -අවමය 49කට යන්න පුළුවන්- තව 34 දෙනෙක් අපට දෙවැනි පෙළ කණ්ඩායමෙන් ගන්න පුළුවන්. හැබැයි මේ වන කොට ඒ කණ්ඩායම කොහේද ඉන්නේ? [බාධා කිරීමක්] ගරු මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමනි, ජූලි මාසය වන කොට ඔබතුමා ඒ අයව ගෙන්වනවා නම් හොඳයි. ඔබතුමා ගෙන්වනවාය කිව්වාට ගෙන්වාවිද කියලා දන්නේ නැහැනේ?

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ගෙන්වන්න දෙයිද දන්නේ නැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔව්, ගෙන්වන්න දෙයිද දන්නේ නැහැ. ඒක අමතර කරුණක්. මොකද, IPL එකේදීත් ඔබතුමා කිව්වානේ මැයි මාසයේ 05 වැනි දා ගෙන්වනවාය කියලා. ඊට පස්සේ විජේ මල්යා එක්ක ගනු දෙනුවක් ගියා. විජේ මල්යා අපේ රටේ සුප්‍රසිද්ධ කණ්ඩායම් අරගෙන ගිහිල්ලා ත්‍යාග ප්‍රදානය කරන උත්සවයට සම්බන්ධ කර ගත්තා. ක්‍රීඩකයන්ට මැයි 18 දක්වා ඉන්න දුන්නේ ඒකේ ප්‍රතිවිපාක වශයෙන්ද කියලා කියන්න මා දන්නේ නැහැ. මෙතැන වැරදි දෙකක් තිබෙනවා. එකක්, අපට එංගලන්ත සංචාරයක් තිබියදී මේ සංචාරයට කලින් එකඟ වී තිබුණාද කියන කාරණය. ඒක වැරදියි. ඊ ළඟට ලංකාව වෙනුවෙන් ක්‍රිකට් ගහනවා වෙනුවට වෙන වෙන ඒවා වෙනුවෙන් ක්‍රිකට් ගහන එක හරිද කියන කාරණය. ඒක පිළිබඳ වෙනම ප්‍රශ්නයක් තිබෙනවා. නමුත් ඇමතිතුමා ඒ වෙලාවේ නිවැරදි තීරණයක් ගත්තා. අපේ ක්‍රීඩකයන් මැයි මාසයේ 05 වැනි දා ලංකාවට ගෙන්වනවාය කියලා එකඟතාවකට ආවා. ඒ එකඟතාවත් බිඳුණා. ඒ නිසා ජූනි මාසයේ ගෙන්වනවාය කියලා කිව්වාට අපේ ඒ කණ්ඩායම නැවත ගෙන්වන්න පුළුවන් වේවිද කියන සැකයක් තිබෙනවා. ඒ ගැන මා දන්නේ නැහැ. ඔබතුමා ගෙන්වනවා නම් ගොඩක් හොඳයි. අපට ඒ අවස්ථාව ලැබෙන්න ඕනෑ.

ඒ විතරක් නොවෙයි. ඇමතිතුමාට මා තව කාරණයක් මතක් කරන්න කැමැතියි. එනම් මේ ක්‍රිකට් තරගාවලියම පවත්වන්නේ කොළඹ බෙත්තාරාම ක්‍රීඩාංගණයේ. බෙත්තාරාම ක්‍රීඩාංගණයේ මේක පවත්වනවා නම් මොකටද අපි පල්ලෙකැලේ ක්‍රීඩාංගණයක් හැදුවේ? මොකටද සූරියවැව එකක් හැදුවේ? මේ ඔක්කෝම ක්‍රිකට් තරග ටික පවත්වන්නේ කොළඹ නගරයේ විතරයි. ඒක අන්තර් පළාත් ක්‍රීඩා තරගයක් නම්, අන්තර් පළාත් වශයෙන් මේක පිබිදීමකට ලක් කරන්න ඕනෑ නම්, ක්‍රීඩාව කෙරෙහි අන්තර් පළාත්වල සාමාන්‍ය ජනතාවගේ අවධානය යොමු කරන්න ඕනෑ නම් ඒක පළාත් මට්ටමට යන්න ඕනෑ. අඩුම තරමින් මධ්‍යම පළාතේ අය තරග වදින වෙලාවේ -ඔබතුමාත් මධ්‍යම පළාතේ- ඒක ගෙන යන්න පුළුවන් පල්ලේකැලේ ක්‍රීඩාංගණයට. දකුණු පළාතේ අය ක්‍රිකට් ගහන වෙලාවේ ඒක ගෙනයන්න පුළුවන් සූරියවැවට. ඌව පළාතට එකක් තිබෙනවා නම් ඒ ආසන්නයේ තිබෙන දඹුල්ලට ගෙන එන්න පුළුවන්. එතකොට තමයි -[බාධා කිරීමක්] ඔව්. පැල්වත්තේ හදපු දවසක ගේන්න පුළුවන්. හරි, හරි. ඒ ඔක්කෝම කරන්න පුළුවන්. තමුන්නාන්සේ ඒ විධියට කර ගත්තා නම් මේ අන්තර් පළාත් ක්‍රීඩා තරගයේ ඇත්ත ප්‍රතිඵලයක් එනවා. හැබැයි මේකට කොළඹ කේන්ද්‍රගත කර ගෙන තිබෙන්නේ සූදුවක් සඳහා විතරක් නම් තරග ඔට්ටු තැබීම, තරග සඳහා සූදුවක් හැටියට පමණක් නම් කොළඹ කොහේ හරි club එකක් අස්සේ පැවැත්වුවාට කමක් නැහැ. හැබැයි මේක අපේ රටේ ජාතික ක්‍රීඩාවේ වර්ධනය සඳහා පවත්වන තරගාවලියක් නම් පළාත් වශයෙන් මෙය විසිරිය යුතුව තිබෙනවා. පළාත් වශයෙන් විසිරුණොත් තමයි ඒ පළාතේ ජනතාවට යම් උද්දීපනයක් එන්නේ; ඒ සඳහා යම් හැඟීමක් ඇති වෙන්නේ; පළාත වෙනුවෙන් යම් ප්‍රමාණයකට ඔල්වරසන් හඬ නැඟෙන්නේ. මා දන්නා තරමින් අපේ රටේ ක්‍රීඩකයන් පළාත් වශයෙන් බෙදෙන්නෙත් නැහැ ඇත්තටම. ගොඩක් ඉන්නේ බස්නාහිර පළාතේ. බස්නාහිර පළාතේ ක්‍රීඩකයෝ වයඹ පළාතට තරග වදින්න ඕනෑ, වයඹ කියලා. [බාධා කිරීමක්] එහෙම නොවෙයි නම් හොඳයි. මධ්‍යම පළාතේ ක්‍රීඩකයෝ කිහිප දෙනෙක් ඉන්නවා. හැබැයි අපට ගන්න වෙන්නේ කොළඹින්ම තමයි. ඒ නිසා අන්තර් පළාත් ක්‍රීඩා තරගයක් අපට ඕනෑ. එය ඉදිරියට යන්න තිබුණා. හැබැයි දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? අන්තර් පළාත් තරග නියමිතව තිබුණා. නමුත් ඒ තරග පැවැත්වෙනවාද කියලා ඇමතිතුමාගෙන් දැන ගන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, අපේ රටට කීර්තියක් ගෙනාපු ක්‍රීඩා සම්බන්ධයෙන් අද වන කොට පරිපාලනයේ විශාල ගැටලු ගණනාවක් මතු වෙලා තිබෙනවා. මා විශේෂයෙන් අපේක්ෂා කරනවා ගරු ක්‍රීඩා ඇමතිතුමාට තමන් දරන ස්ථාවරයෙන්, තමන් දරන වග කීමෙන්, තමන්ගේ වුවමනාවෙන් නිදහසේ කටයුතු කරන්න පුළුවන් ඉඩක් හදන්න ඕනෑය කියා. අවාසනාවකට එහෙම නැහැ ගරු ඇමතිතුමනි. මා දන්නවා. [බාධා කිරීමක්] තිබෙනවා නම් හොඳයි. ප්‍රශ්නයක් නැහැ. ඔබතුමාට ඔබතුමා දකින දැක්ම අනුව අවශ්‍ය විටක කටයුතු කරන්න පුළුවන්. ඒ විධියට කටයුතු කරන්න ඇමතිතුමාට ශක්තිය ලැබේවා කියලා ප්‍රාර්ථනා කරමින් මම නතර වෙනවා ගරු කථානායකතුමනි. බොහොම ස්තුතියි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
බොහොම ස්තුතියි. ඒ යෝජනාව ස්ථිර කරන්නේ ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ගරු කථානායකතුමනි, මේ යෝජනාවෙන් බොහොම පැහැදිලිව පෙනුණේ ක්‍රිකට් පාලක මණ්ඩලයේ තිබුණු දූෂණ වාගේම මේ රටේ ක්‍රිකට් ක්‍රීඩාව විනාශයට පත් කිරීමට තුඩු දුන් කරුණු පිළිබඳවයි. දැන් මේ අපි කථා කරන්නේ ඒ පිළිබඳවයි. ගරු කථානායකතුමනි, ක්‍රිකට් ගහන්නේ තරුණයෝ; ක්‍රිකට් ගහන්නේ විශ්වවිද්‍යාලයට ඇතුළත් වෙන තරුණයෝ; විශ්වවිද්‍යාලයෙන් පිට වෙන තරුණයෝ. මේ ඊයේ පෙරේදා තමුන්නාන්සේලා පටන් ගත්ත පුහුණුව පිළිබඳව අද විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයෝ-[බාධා කිරීමක්] ඔව්, ඔව්. ඔක්කෝම තරුණයෝ. විශ්වවිද්‍යාලයේත් තරුණයෝ ඉන්නවා. ඒ අයත් ඇතුළුව තමයි. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ බොහොම පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා මේ රටේ ජනතාවගේ පරමාධිපත්‍ය සහ නිදහස පිළිබඳව. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව පුරවැසියෙකුට කැමැති දෙයක් කරන්න, කියන්න, ලියන්න නිදහස තිබෙනවා. බලහත්කාරයෙන් යම් කෙනකුව යම් ක්‍රියාදාමයකට යොමු කරනවා නම් එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමක් වනවා. එපමණක් නොවෙයි, විශ්වවිද්‍යාල පනතේ ඇතැම් විධිවිධාන පවා මේ ක්‍රියාදාමය තුළින් අද තමුන්නාන්සේලා උල්ලංඝනය කරලා තිබෙනවා කියන එක මම මේ සභාවේදී සඳහන් කරන්න ඕනෑ.

ඊයේ පෙරේදා බොහොම පැහැදිලිව ඉංග්‍රීසි ප්‍රවෘත්ති පත්‍රයක ප්‍රවෘත්තියක් සඳහන් වුණා. I quote “The Island” of Tuesday, 24th May, 2011:

“Military training for university students a violation of their freedom of conscience”

The Centre for Human Rights says so.

මේක මානව හිමිකම් උල්ලංඝනය කිරීමක් කියන එක බොහොම පැහැදිලිවම මේ ස්වේච්ඡා සංවිධානය සහ ජාත්‍යන්තර සංවිධාන සඳහන් කරලා තිබෙනවා. බලහත්කාරයෙන්, අකැමැත්තෙන්, දෙමවුපියන්ගේ කැමැත්තක් නැතිව දරුවන් අරගෙන ගිහින් සුමාන තුනකට හිර කර ගෙන මේ පුහුණුව දීම පිළිබඳව අද විශ්වවිද්‍යාලයට ඇතුළු වෙන්න බලා ගෙන මුළු රටේම ඉන්න ශිෂ්‍යයන්ගේ දෙමවුපියන් ඇතුළු ඒ පවුල්වල සියලු දෙනාම විරුද්ධත්වය ප්‍රකාශ කරනවා. ශිෂ්‍යයන්ට බැහැ මේ කාර්යය කරන්න. විශ්වවිද්‍යාලයට ඇතුළු වන ශිෂ්‍යයෝ මේවාට විරුද්ධ වන්න ගියොත් ඔවුන්ට උපාධිය ගන්න තිබෙන අවස්ථාවත් නැති වනවා. [බාධා කිරීම්] මෙය අනිවාර්ය කිරීම හේතු කොට ගෙන අද මේ රටේ විශාල ප්‍රශ්නයක් පැන නැඟලා තිබෙනවා. ඒ නිසා තමයි අපි මේ ප්‍රශ්නය අද ගෙනෙන්න හැදුවේ. අපි මේ ප්‍රශ්නය ගෙනෙන්න හැදුවේ තමුන්නාන්සේලාට මඩ ගහන්න නොවෙයි, මේ පිළිබඳව මේ රටේ ජනතාවගේ අදහස මොකක්ද, කල්පනාව මොකක්ද කියන එක මේ සභාවට ඉදිරිපත් කරන්නයි.

පාර්ලිමේන්තුව තිබෙන්නේ, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ජනතා පරමාධිපත්‍ය භාර දීලා තිබෙන්නේ අවශ්‍ය දේ ප්‍රකාශ කරලා රජය දැනුවත් කිරීමටයි. ඒකට අපට අවස්ථාවක් ලැබෙන්නේ නැහැ. ඒ ගැන අපි කනගාටු වනවා. පාර්ලිමේන්තුව පවත්වන්නේ අදයි හෙටයි පමණයි. අපි දන්නවා හෙට තිබෙන්නේ මීට අදාළ විෂයයන් නොවෙයි. ඒ නිසා අපි අද මේ කරුණු ප්‍රකාශ කරන්න උත්සාහ කළා. නමුත් අපට අවසරය ලැබුණේ නැහැ. අපි ඒක ගැන කනගාටු වනවා. විශේෂයෙන්ම ඒ ගැන මේ උත්තරීතර සභාවේ අපි අද සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වුණා.

මේ වන විට විශ්වවිද්‍යාලවලට තේරුණු සිසු සිසුවියන් රජය විසින් බලහත්කාරයෙන් යුද හමුදා කඳවුරුවලට යවා "නායකත්ව පුහුණු වැඩ සටහන" යන නමින් වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීමට උත්සාහයක් ගෙන තිබෙනවා. මේ ගැන සුප්‍රීම් උසාවියට පෙත්සම් 07ක් ඉදිරිපත් කරලා තිබුණා. මේවා හැකි ඉක්මනින් විභාග කරන්න කියලා ඉල්ලීමක් කෙරුවා. ඒ පෙත්සම් අහලා ඒ පිළිබඳව තීරණයක් ගන්නතුරු මේ පුහුණු කිරීම සතියකින් ප්‍රමාද කරන්න කියලා ඉල්ලීමක් කළා. රජය ඇහුම් කන් දුන්නේ නැහැ. [බාධා කිරීම්] මේ ප්‍රශ්න ගැන අපි කියන්න ඕනෑ. [බාධා කිරීම්] මේ ගැන සඳහන් කිරීම අපේ යුතුකමක්. එක්සත් ජාතික පක්ෂය වන අපි මෙයට අපේ දැඩි විරෝධතාව දක්වන අතර, මෙකී මිලිටරි පුහුණුව වහාම නවතා දමා සිසු සිසුවියන්ගේ කැමැත්ත අනුව ඔවුන්ට අවශ්‍ය නම් නායකත්ව පුහුණුවක් විශ්වවිද්‍යාලය තුළින් ලබා දීමට කටයුතු කරන ලෙස දන්වා සිටිනවා. මේ අවස්ථාවේ තමයි අපට ඒ ඉල්ලීම කරන්න සිද්ධ වන්නේ.

ස්ථාවර නියෝග අනුව, මන්ත්‍රීවරුන් විසි දෙනකු නැඟිටලා ඉල්ලීමක් කළේ මේ ප්‍රශ්නය පිළිබඳව මේ රජයට කරුණු ඉදිරිපත් කරන්නයි. නමුත් ඒ අවස්ථාව ලැබුණේ නැහැ. මේ පුහුණුව සඳහා සිසුන් යොමු කිරීම මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමක් වන අතර විශ්වවිද්‍යාල පනත උල්ලංඝනය කිරීමක්ද වනවා. මෙයින් සිසුන්ගේත්, දෙමවුපියන්ගේත්, මේ රටේ මහ ජනතාවගේත් මූලික අයිතිවාසිකම් කඩ වන බවට අවධාරණය කර සිටිනවා. ගරු කථානායකතුමනි, ඒ නිසා මේ පුහුණු කිරීමේ කටයුතු නවත්වන හැටියට අපි ජනාධිපතිතුමාගෙනුත්, ආරක්ෂක ලේකම්තුමාගෙනුත්, උසස් අධ්‍යාපන ඇමතිතුමාගෙනුත් ඉල්ලීමක් කරනවා. මේක වහාම නවත්වන්න.

මේ පිළිබඳව උසාවියේ පෙත්සම් හතක් තිබෙනවා. ඒ පෙත්සම් හතේ තීන්දුව ආවාට පස්සේ මේක කරනවාද නැද්ද කියන එක ප්‍රකාශයට පත් කරන්න. අපි මේ ගැන කනගාටු වනවා. මේ වාගේ ප්‍රශ්න කවදාවත් තිබුණේ නැහැ. ලෝකයේ සමහර රටවල මේ වාගේ පුහුණුවීම් තිබෙනවා. ඒ පුහුණුවීම් තිබෙන්නේ විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ට පමණක් නොව යම්කිසි වයස් සීමාවක් තුළ සිටින තරුණයන්ටයි. ලංකාවේ තමයි විශ්වවිද්‍යාලවලට ඇතුළත් වන ශිෂ්‍යයන්ට මේ විධියට බලහත්කාරයෙන් හමුදා පුහුණුව -මිලිටරි පුහුණුව- ලබා දෙන්න කටයුතු කරන්නේ. ඒ අය කුඩු කරලා ඒ අයගේ නිදහස නැති කර දමලා මෙහෙම කටයුතු කිරීම ගැන අප කනගාටු වනවා. මේක නවත්වන්න තවමත් වෙලාව තිබෙනවා. අදත් පුළුවන්. මේක මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් කියන එක මතක් කරමින් මා නිහඬ වනවා.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා (ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த - பெற்றோலியக் கைத்தொழில்கள் அமைச்சர்)
(The Hon. A.D. Susil Premajayantha - Minister of Petroleum Industries)

ගරු කථානායකතුමනි, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා විසින් ක්‍රීඩා අමාත්‍යාංශයට අදාළව අද මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන කල් තැබීමේ යෝජනාව විවාදයට ගැනෙන මේ අවස්ථාවේදී මම විපක්ෂ නායකතුමාට ස්තුතිවන්ත වනවා, තමන්ගේ පක්ෂය විනයානුකූල කර ගැනීමේ කටයුත්තක නිරත වෙමින්, සිය පක්ෂයේ සියලුම මන්ත්‍රීවරුන් එතුමාගේ නියෝගය අනුව සීරුවෙන් සිට ගෙන සිටීම සඳහා පුරුදු පුහුණු කිරීමේ ව්‍යායාමයක් ආරම්භ කිරීම ගැන.

ගරු කථානායකතුමනි, ඒකත් ක්‍රීඩාවට අදාළයි. පැය කිහිපයක් සිට ගෙන සිටීම. හැබැයි, අවාසනාවකට මිනිත්තු කිහිපයයි හිට ගෙන හිටියේ. විපක්ෂයේ අර්ජුන රණතුංග මැතිතුමා වැනි ක්‍රිකට් ක්‍රීඩකයින්ට එහෙම ඉඳලා පුරුදුයි. තමුන්නාන්සේලාට එවැනි පුහුණුවක් දෙන්න කටයුතු කිරීම ගැන අපි ස්තුතිවන්ත වනවා, විශේෂයෙන්ම මේ ක්‍රීඩාව පිළිබඳ කල්

තැබීමේ යෝජනාව විවාදයට ගැනෙන මේ අවස්ථාවේදී. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. මා එතැනට එනවා. අපේ ජෝන් අමරතුංග විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාත් ගරු විපක්ෂ නායකතුමාගේ විනයානුකූල නියෝගය මත ව්‍යායාමක් හැටියට සැහෙන වෙලාවක් හිටගෙන හිටියා. ඒකට අපේ සජිත් ප්‍රේමදාස නියෝජ්‍ය නායකතුමාත් අනෙක් සියලු මන්ත්‍රීතුමන්ලාත් ඒකට අවනත වුණා. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමනි, -[බාධා කිරීමක්] තමුන්නාන්සේ පොඩ්ඩක් අහගෙන ඉන්න. ගරු ජෝන් අමරතුංග හිටපු ඇමතිතුමාට අමතක වෙලා තිබෙනවා. 1988, 89 යුගයේදී මේ රටේ තරුණ තරුණියන් 40,000ක් ටයර් සෑයවල් උඩ යවපු ආකාරය. ඒ තරුණයන් වෙනුවෙන් පෙනී හිටපු නීතිඥයෝ හය දෙනෙක් ඝාතනය කළා. [බාධා කිරීමක්] අහගන්න. සාක්ෂිත් එක්ක කියන්නම්. [බාධා කිරීමක්]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඇයි, 71දී?

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
තමුන්නාන්සේ විවාදයට සහභාගි වෙලා කථා කරන්න. මගේ කාලය කන්න එපා. 1971 දී විද්‍යාලංකාර සහ විද්‍යෝදය විශ්වවිද්‍යාලය දෙකේදී 15,000ක පිරිසක් මාස ගණනාවක් පුනරුත්ථාපනය කළා. එහෙම පුනරුත්ථාපනය කළ අය මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඇමතිවරු වුණාය කියන එකත් තමුන්නාන්සේට මතක් කර දෙනවා. එහෙම වුණේ 1971 ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ යුගයේදී. මේවා දන්නේ නැත්නම් කට වහගන්න. 1988, 89 දී තරුණයන් වෙනුවෙන් අපි අධිකරණයේ පෙනී සිටියා. අද මේ අය කථා කරනවා, හදිසි නීති රෙගුලාසි ඇතුළු ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ගැන. ඔය දෙක යටතේ තමයි එදා නඩු දැම්මේ. මතක තියා ගන්න, මුලින්ම ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ගෙනාවේ එල්ටීටීඊ සංවිධානයට එරෙහිව නොවෙයි. එදා මේ රටේ තරුණ නැඟී සිටීමට එරෙහිව මුලින්ම තමුන්නාන්සේලාගේ එදා තිබුණු ආණ්ඩුව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ගෙනාවා. ගරු කථානායකතුමනි, එදා ක්‍රියාත්මක කරපු හදිසි නීති රෙගුලාසි යටතේ, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ ඇප ගන්න ඕනෑ වුණා නම් Defence Secretaryගේ නියෝගය ගන්න ඕනෑ.

ආරක්ෂක ලේකම්ගේ අනුමැතියකින් තොරව ඇප අයදුම් පතක් මහාධිකරණයට ඉදිරිපත් කරන්න පුළුවන්කමක් එදා තිබුණේ නැහැ. අහගන්න, එදා මරපු නීතිඥයන්ගේ නම්. විජේදාස ලියනාරච්චි, චරිත ලංකාපුර, කාංචන අභයපාල. හය දෙනකුගෙන් තුන් දෙනකුගේ නම් පමණයි, ඒ. එදා තවත් නීතිඥයෝ විශාල පිරිසක් රට හැර ගියා. හදිසි නීති රෙගුලාසි, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ගැන අද තමුන්නාන්සේලා කථා කරනවා. එදා කොහේද හිටියේ? මතක තියා ගන්න. එදා විශ්වවිද්‍යාලයේ -දේශීය වෛද්‍ය විද්‍යාලයේ- ශිෂ්‍යයන් 125 දෙනෙක් එක මාංචුවේ දාලා කොළඹ මහාධිකරණයට ගෙනාවා. මමයි ඒ නඩුවට පෙනී සිටියේ, ඇප ගන්න. ඒ අත් දැකීම් අපට තිබෙනවා.

ගරු කථානායකතුමනි, මම තව සිද්ධියක් කියන්නම්. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ තුන්වන වසරේ ඉගෙන ගත්ත ශිෂ්‍යයෙක් 1988 -1989 කාලයේ සිංහල අවුරුද්දට නිවාඩුවට කුරුණෑගල, කොටපොළ තමන්ගේ ගම් ප්‍රදේශයට ගියා. හමුදා මුර පොළේදී අල්ලා අත් අඩංගුවට ගත්තා. ඒ ශිෂ්‍යයා අත් අඩංගුවේ තියා ගෙන ගෙදර ගෙනිහිල්ලා මවට පෙන්වලා, ගල්කටස් තුවක්කුවක් හඳුන්වා දුන්නා. හඳුන්වලා දීලා ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ, ගිනි අවියක් ළඟ තබා ගැනීම සම්බන්ධයෙන් නඩු පැවරුවා. -මා මිත්‍ර නීතිඥ මහත්තයා දන්නවා, නඩුව මොකක්ද කියලා.- ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සහකාර පොලිස් අධිකාරිවරයකුට වඩා ඉහළ නිලධාරියෙකුට කරන ලද ස්වේච්ඡා ප්‍රකාශයක් අධිකරණයේදී ඔහුට එරෙහිව පාවිච්චි කරන්න පුළුවන්. It is admissible. එතැනදී අපි යනවා, අතුරු සාක්ෂි විභාගයකට. එය ස්වේච්ඡා ප්‍රකාශයක් නොවෙයි කියලා අතුරු සාක්ෂි විභාගයේදී ඔප්පු කරන්න පුළුවන් වුණොත් එතැනදී එම ප්‍රකාශය ඉවත් කරන්න පුළුවන්. ඒ විධියට තමයි එදා අපි නඩු දිනුවේ. ඒ යුගයේදීම එල්ටීටීඊ ත්‍රස්තවාදීන් හැටියට සැක කරන අයත් තව විශාල පිරිසක් අධිකරණයට ගෙනැත් තිබුණා. ඒවා මේ ගොල්ලන්ට අමතකයි. එදා ඒ විධියට තමයි හදිසි නීතිය යටතේත්, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේත් මේ රටේ තරුණ තරුණියන් වෙනුවෙන් ක්‍රියා කළේ. මම කලින් සඳහන් කළ ශිෂ්‍යයා වෙනුවෙන් මම පෙනී සිටියා. මවගේ සාක්ෂි ඉදිරිපත් කළා. මම ඔහුව නිදහස් කර ගත්තා. ගරු කථානායකතුමනි, ඒ ශිෂ්‍යයාගේ නැගණිය ඊ ළඟ අවුරුද්දේ විශ්වවිද්‍යාලයට තේරුණා. කොළඹ විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි පාඨමාලාවට තෝරා ගෙන සිටියා. හැබැයි අවාසනාවකට ගරු කථානායකතුමනි, අයියා අත් අඩංගුවට ගත්තාට පස්සේ නංගිව දකින්න ලැබුණේ එදා කුරුණෑගල, කොටපොළ පොලිස් බල ප්‍රදේශයේ ටයර් සෑයක් උඩ. මේ එදා එතුමන්ලා ක්‍රියාත්මක කරපු වැඩ පිළිවෙළ! හතළිස් දාහක් තරුණයෝ ටයර් සෑයවල් උඩ යවපු අය තමයි ගරු කථානායකතුමනි, අද ලජ්ජා නැතුව බෝර්ඩ් එල්ලා ගෙන ඉන්නේ. මේ රටේ ජනතාව මේක දන්නවා. මේ විවාදය මේ පාසල් දරුවෝ බලා ගෙන ඉන්නවා.

බදුල්ල ප්‍රදේශයේ මන්ත්‍රීතුමෙක් අද බොහොම වේගයෙන් කථා කරනවා මම දැක්කා. තමුන්නාන්සේට මතක ඇති, එදා බදුල්ලේ මොකක්ද වුණේ කියලා. ඒ පාසල් ශිෂ්‍යයෝ දොට්ට බස්සලා, පෙළපාළි යන කොට පොලීසියෙන් වෙඩි තියලා, පාසල් ශිෂ්‍යයෝ මැරුණේ නැද්ද? ඇඹිලිපිටියේ සමූහ ශිෂ්‍ය ඝාතනයේ තරුණයෝ 32ක් එදා ඇඹිලිපිටියේ, සූරියකන්දේ වළ දැමුවේ නැද්ද? ඒවා මේ රටේ අධිකරණ ඉතිහාසයේ වාර්තාගත වෙලා නැද්ද? කොළඹ මහාධිකරණයේ -එදා එය තිබුණේ තුන්මුල්ලේ, දැන් තිබෙන්නේ අලුත්කඩේ.-

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
තමුන්නාන්සේ අනුමත කරනවාද, මේ ශිෂ්‍ය පුහුණුව? ඒක කියන්න කෝ.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
මම අනුමත කරනවා, පුහුණුව. පුහුණුව අනුමත කරනවා. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්නකෝ කට පියා ගෙන. [බාධා කිරීමක්] ගරු කථානායකතුමනි, මේ දරුවන්ට නායකත්ව පුහුණුවක් අවශ්‍යයි. මම ශිෂ්‍ය භටයෙක්. මම දියතලාවේ කඳවුරුවලට දෙවතාවක් ගිහින් තිබෙනවා. මොකක්ද, ඒ පුහුණුව? ප්‍රථමාධාර, PT, squad drill, සංස්කෘතික අංග. අපි ඉතාම උනන්දුවෙන්, ඕනෑකමෙන් ගියේ. හැබැයි පාසලේ හැම ශිෂ්‍යයකුටම විශ්වවිද්‍යාලයට යන්න කලින් මේ අවස්ථාව ලැබෙන්නේ නැහැ. මොකක්ද, එහි තිබෙන වරද? ප්‍රථමාධාර ඉගෙන ගන්න එක, ශාරීරික අභ්‍යාස ඉගෙන ගන්න එක, අනුන්ගේ මතවලට යම් ආකාරයකට ගරු කරන ආකාරය සාකච්ඡා කිරීම, ගැටලු නිරාකරණය -conflict resolution-, නවීන ලෝකයේ දැනුම ලබා දීම යනාදිය ගැන ප්‍රශ්නයක් නැහැ. [බාධා කිරීමක්] ඒක අපි දන්නේ නැහැ. විජිත හේරත් මන්ත්‍රීතුමනි, මම කිව්වේ තරුණයෝ හතළිස්දාහක් ටයර් සෑය උඩ ඇරලා මෙතුමන්ලාට බෝඩ් එල්ලා ගෙන ඉන්න අයිතියක් නැහැයි කියන

[ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා]

එකයි. ගරු මන්ත්‍රීතුමා, ගිහිල්ලා බලන්න මහාධිකරණයේ ඉතිහාසයේ නඩු වාර්තා අරගෙන. තමුන්නාන්සේලා අහිංසක තරුණයෝ ධර්ම චක්‍රයේ ඇරපු හැටි මතක් කර බලන්න. බොරුවට ගල් කටස් එකක් දාලා අයියා වූදිතයෙක් කර නඩුව දාලා නංගිව ටයර් සෑය උඩ ඇරියා තමුන්නාන්සේලා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
හැත්තෑ එකේ දී කළේත් ඒක නේ.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
හැත්තෑ එකේ දී එහෙම කළේ නැහැ. හැත්තෑ එකේ දී 15,000ක් පුනරුත්ථාපනය කළා. හැත්තෑ එකේ දී පුනරුත්ථාපනය වුණු අය මේ පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරු හැටියට ඇවිත් හිටියා. හැත්තෑ එකේ දී එහෙම තරුණයෝ මැරුවේ නැහැ. නමුත් තමුන්නාන්සේලා ඒ විධියටයි කටයුතු කළේ. මේ ශිෂ්‍යයෝ පුහුණු වීම තුළින් ක්‍රීඩාව, විනය, අන්‍යයන්ගේ මත ගරු කිරීම, තර්කනය යනාදිය පිළිබඳව ඉගෙන ගන්නවා. දැන් විශ්වවිද්‍යාල ශිෂ්‍යයෝ එක විෂය ධාරාවක් හදාරලා යන්නේ; විද්‍යාව, ගණිතය, වාණිජ, කලා කියන විෂය ධාරාවලින් එකක් හදාරලා යන්නේ. මේ සියලු දෙනා එකට එකතු වෙලා එකම පරිශ්‍රයකට ඇවිල්ලා මෙම කටයුතු කිරීමේදී වෙනස් වූ සංස්කෘතීන් - different cultures - අධ්‍යයනය කරනවා. ඒ හැම දෙනාම වෙනස් වූ සංස්කෘතීන් ඉගෙන ගන්නවා. මුස්ලිම් දරුවෝ, ද්‍රවිඩ දරුවෝ, සිංහල දරුවෝ එකම ස්ථානයක තමන්ගේ අදහස් හුවමාරු කර ගන්නවා. මොකක්ද ඒකේ තිබෙන වරද? මේක තමයි -

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
කැමැති අයට ඒකට ඉඩ දෙන්න. ඇයි බලහත්කාරකමෙන් කරන්නේ?

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
බලහත්කාරයක් නැහැ. [බාධා කිරීමක්] නැහැ, නැහැ. කරුණාකර වාඩි වෙන්න. ගරු කථානායකතුමනි, මෙන්න මෙතැනයි ප්‍රශ්නය තිබෙන්නේ. සමාජයක් විනයානුකූල වෙන්න ඕනෑ. සමාජයක විවෘතභාවයක් තිබෙන්න ඕනෑ. දරුවන් විශ්වවිද්‍යාලයට යන්නේ විශ්ව දැනුම ලබා ගන්න. Note එක කට පාඩම් කරලා පාස් වෙන්න නොවෙයි. පර්යේෂණ කරන්න ඕනෑ. පර්යේෂණ නිබන්ධයන් ලියන්න ඕනෑ. මේ හේතුව නිසා තමයි විශ්වවිද්‍යාලයෙන් පිට වන උපාධිධාරීන්ට අද රැකියා වෙළෙඳ පොළේ ඉල්ලුම අඩු වෙලා තිබෙන්නේ. අද පිට රට විශ්වවිද්‍යාලයකට ගිහිල්ලා එන ශිෂ්‍යයෙක් ගැන බලන්න. මම තමුන්නාන්සේට දෙන්නම් එක්තරා විශ්වවිද්‍යාලයක ශිෂ්‍යයන්ට පළමුවැනි වසරේ දී තිබෙන assignment එක. මේක ඉංග්‍රීසියෙන් තිබෙන්නේ. මම ඕනෑ නම් එය කියවන්නම්:

"Think about racially mixed families. What are some of the problems they would encounter? What are some of the benefits that would be conferred being in such a family?

Create a list of weaknesses and strengths you envision in racially mixed families. After creating your own list, go to the following link and learn some aspects of mixed families that you may not have conceptualized before."

[බාධා කිරීමක්] නැහැ, නැහැ. ඉන්න, ඉන්න. මම කියා ගෙන ආවේ මෙතැන ඕක කරනවාය කියලා නොවෙයි. පොඩ්ඩක් ඉන්න මන්ත්‍රීතුමා. මම පෙන්වලා දුන්නේ ඒ විශ්වවිද්‍යාලවල පළමුවැනි වසරේ සිසුන්ට assignment එක හැටියට දී තිබෙන ඒවා. කොච්චරක් referenceවලට යන්න ඕනෑද? Internet එකට යන්න ඕනෑ. මේ දැනුම ලබා ගන්න ඕනෑ. ඊට පස්සේ ඒක තමන් conceptualize කර envision කර මේක ඉදිරිපත් කරන්න ඕනෑ. බලන්න, පළමුවැනි වසරේ ඉඳලා දරුවා එතැනට ගෙනි යනවා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
හමුදා කඳවුරක පවත්වන්නේ.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
නැහැ, නැහැ. කඳවුරේ ඕක කරන්නේ නැහැ. තමුන්නාන්සේ ඒකත් පටලවා ගත්තා නේ. මම කිව්වේ කඳවුරේ ඕක කරනවාය කියන එක නොවෙයි නේ. දරුවෝ එතැනට ගෙනි යන්න. කලා විෂය ධාරාව හදාරන අය, විද්‍යා විෂය ධාරාව හදාරන අය, වාණිජ විෂය ධාරාව හදාරන අය, නීති විෂය ධාරාව හදාරන අය සියලු දෙනා එකම ස්ථානයක අදහස් හුවමාරු කර ගෙන සහෝදරත්වයෙන්, අන්‍යෝන්‍ය සංස්කෘතීන් හඳුනා ගෙන යන එක වරදක්ද? සිංහල දරුවෝ මුස්ලිම් සංස්කෘතිය හඳුනා ගන්න ඕනෑ? මුස්ලිම් දරුවෝ සිංහල සංස්කෘතිය හඳුනා ගන්න ඕනෑ. අපි පාසලේ ඉඳලා මේක උගන්වනවා. හැබැයි විශ්වවිද්‍යාලයට යන කොට මේ සියලු දරුවන්ට පරිපූර්ණ වෙච්ච මේ දැනුම ලබා ගැනීමට -උකහා ගැනීමට- මහින්ද චින්තනයේ සඳහන් කර තිබෙන ඒ විශ්වීය ලෝකයට මේ දරුවන් රැගෙන යාමේ වැඩ පිළිවෙළටයි මේ අපි අනුගත වෙලා තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, ක්‍රීඩා විෂය වුණත් මෙහිදී කෙරෙනවා. දැන් බලන්නකෝ අපි ශිෂ්‍ය භටයෝ හැටියට කඳවුරුවලට ගියාම නායකත්ව පුහුණුව, ප්‍රථමාධාර කටයුතු, සංස්කෘතිකාංග, PT - Physical Training- මේ ඔක්කොම දේවල් කළා. ඒවායේ ප්‍රතිඵල හැටියට තමයි මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා තිබෙන්නේ. නිකම්ම ආවේ නැහැ. පාසල් යන කාලයේ ඉඳලා ශිෂ්‍ය භටයෝ හැටියට අපි නායකත්වය පුහුණු වුණා. අපි ස්වේච්ඡා සංවිධානවල හිටියා. ගමේ සංවිධානයේ හිටියා. එහෙනම් දරුවන්ව ඒ ලෝකයට විවෘත කරන්න අවශ්‍ය මහ පෙන්වීම එවැනි පුහුණුවක් තුළින් ලබා දෙනවා. එතැනට ගියාම ශක්තිමත් දරුවෝ පිරිසක් බිහි වෙනවා. විශ්වවිද්‍යාල අධ්‍යාපනය ආරම්භ කරලා අවසන් වෙන්නේ මහින්ද චින්තනයේ සඳහන් විශ්වීය උපාධිධරයෙක්, විශ්ව දැනුමක් තිබෙන උපාධිධරයෙක් මේ සමාජයට පමණක් නොවෙයි ලෝකයටම බිහි කරලායි. ඒ නිසා මේකට අකුල් හෙළන්න එපා. තමුන්නාන්සේලාගේ අදහස්, යෝජනා තිබෙනවා නම් ඉදිරිපත් කරන්න. ඕනෑ නම් ඉදිරි කාලය තුළදී වඩාත් සංවිධානාත්මකව අපට මේවා කරන්න පුළුවන්. විද්‍යා පීඨ 18ක් තිබෙනවා. ගුරු අභ්‍යාස විද්‍යාල 8ක් තිබෙනවා. ඒ 26හි 10,000ක් නොවෙයි 12,000කට වුණත් එක වර නේවාසික පුහුණුව දෙන්න පුළුවන්. ඉදිරි කාලය තුළ දී ඉඩ පහසුකම් ලබා ගෙන ඒවා කරන්න පුළුවන්කම තිබෙනවා. තමුන්නාන්සේලාට අන්න ඒ වාගේ යෝජනා ඉදිරිපත් කරන්න පුළුවන්. ගරු කථානායකතුමනි, ඒ නිසා මේ යෝජනාව සම්බන්ධයෙන් මා ඉතා පැහැදිලිව කියනවා, මෙන්න මෙය. අපේ ක්‍රීඩා අමාත්‍යතුමා එතුමාගේ අමාත්‍යාංශයේ කටයුතු සම්බන්ධයෙන්, ක්‍රිකට් ක්‍රීඩාව සම්බන්ධයෙන් පිළිතුරු දේවි. හැබැයි, මා එකක් කියන්න ඕනෑ. පසු ගිය ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලියේදී ගරු ක්‍රීඩා ඇමතිතුමාත්, එතුමාගේ අමාත්‍යාංශයත් විශිෂ්ට කාර්ය භාරයක් සිදු කළාය කියන එක අපි කියන්න ඕනෑ. අපි බොම්බායට ගියා. අපි එහි ගියේ ඇමතිවරුන් හැටියට නොවෙයි. සිංහ කොඩිය තිබෙන ටී ෂර්ට් ඇඳ ගෙනයි අපි

එහි ගියේ. එහි ගිහින් අපි ඒ තරගය නැරඹුවා. ඒ කවුරුවත් දැන ගෙන සිටියේ නැහැ, අපේ තනතුරු, නිල නාම මොනවාද කියා. හැබැයි, මේ රටේ ක්‍රීඩා ප්‍රේක්ෂකයන්ට, ක්‍රීඩකයන්ට අපි ඉතාම ස්තුතිවන්ත වෙන්න ඕනෑ. සංසන්දනාත්මකව බැලුවාම ඊට වඩා හොඳ තත්ත්වයක් අපේ ක්‍රීඩාගාර තුළ අපි දැක්කා. ඒවායේ පහසුකම් අපි දැක්කා. ඒවා ඉතාම හොඳ මට්ටමක තිබුණා. ක්‍රිකට් ක්‍රීඩාව ජාත්‍යන්තර මට්ටමට ගෙන ඒමේ තවත් අදියරක් හැටියට ක්‍රීඩාංගණ සංවර්ධනය කරලා, ඒවා ඒ තත්ත්වයට ගෙන යාම පිළිබඳව අපි ක්‍රීඩා ඇමතිතුමාට අපේ ස්තුතිය පුද කරනවා. අපේ ක්‍රිකට් ක්‍රීඩකයන් බැලුවාම විවිධ චෝදනා එන්න පුළුවන්; අභූත චෝදනා එන්න පුළුවන්. අපි ඒවාට අභියෝගාත්මකව මුහුණ දෙන්න ඕනෑ. රටක් හැටියට අපි ජාත්‍යන්තරයට මුහණ දෙනවා නම් ක්‍රීඩාව ගැනත් මුහුණ දෙන්න සූදානම් වෙන්න ඕනෑ. මුහුණ දෙන්න පුළුවන්. ඒ නිසා අපේ ක්‍රීඩා අමාත්‍යතුමාට එතුමාගේ නිලධාරින් සමඟ ඒ කටයුත්ත කිරීම සඳහා ශක්තිය, ධෛර්යය ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

මීළඟට ගරු අජිත් පී. පෙරේරා මහතා. ඊට පෙර ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சந்திம வீரக்கொடி] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY] *took the Chair.*

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ ක්‍රීඩාවේ තත්ත්වය බින්දුවටම බැහැලා තිබෙන වෙලාවක, මේ රටේ ක්‍රීඩා පරිපාලනය බින්දුවටම බැහැලා තිබෙන වෙලාවක තමයි වර්තමාන ක්‍රීඩා ඇමතිතුමාට මේ වගකීම භාර වෙන්නේ. ගරු ඇමතිතුමනි, ඔබතුමාට වග කීමක් නැහැ, ඔබතුමා පත් වෙලා බොහොම ටික දවසයි. හැබැයි ජනතාවගේ නියෝජිතයන් කරුණු දක්වන මේ ගෞරවනීය පාර්ලිමේන්තුවේ ඔබතුමාට මේ තිබෙන අති මහත් වගකීම - ඒ ජනතාව විසින් පවරා දී තිබෙන වගකීම- ප්‍රඥාවන්තව, කල්පනාකාරීව ඉෂ්ට කරාවිය කියා මේ රටේ ජනතාව බලාපොරොත්තු වෙනවා. අනාගතය ගොඩ නඟා ගන්න පුළුවන් වෙන්නේ ඉතිහාසයේ පාඩම් තුළිනුයි. අපිත් ක්‍රීඩා කර තිබෙන, මේ රටේ තිබෙන ජනප්‍රියම ක්‍රීඩාව තමයි ක්‍රිකට් කියන්නේ. මේ රටේ ක්‍රිකට් ක්‍රීඩාව සම්පූර්ණයෙන්ම දේශපාලනීකරණයට ලක් කරලා 2005 ඉඳලා අද දක්වාම අතුරු පාලන කමිටු පත් කරලා, ස්ථිර අතුරු පාලන කමිටු කියා අලුත්ම සංකල්පයක් හඳුන්වා දුන්නා. ජයන්ත ධර්මදාස, අර්ජුන රණතුංග, නිසිබලධාරි එස්. ලියනගම, වර්තමානයේ සිටින ඩී.එස්. ද සිල්වා දක්වා මේ සියලුම දෙනා කවුරු පත් කළත්, කොහොම පත් කළත්, පත් වුණේ කවුරු වුණත් ඒවා වැරදි පත්වීම් බව කියන්න ඕනෑ. ක්‍රීඩා සමාජවල සාමාජිකයන් අතරින්, ක්‍රීඩා සමාජවල සාමාජිකයන්ගේ ඡන්දයෙන්, ප්‍රජාතන්ත්‍රවාදීව මේ රටේ සෑම ක්‍රීඩාවක් සඳහාම බලධාරි ආයතන බිහි වෙන්න ඕනෑය කියන කාරණය ගැන වාදයක් විවාදයක් තිබෙන්න බැහැ. ඒ ගැන ඒක මතිකයක් තිබෙන්න ඕනෑ. හැබැයි ක්‍රිකට් ක්‍රීඩාව වටා එකතු වෙලා තිබෙන අති මහත් මුදල් කන්දරාවත් එක්ක, ක්‍රිකට් ක්‍රීඩාව වටා එකතු වෙලා තිබෙන සුවිශේෂ දේශපාලන බලයත් එක්ක ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යුහයකට ක්‍රියාත්මක වෙන්න, ප්‍රජාතන්ත්‍රවාදීව ක්‍රිකට් ක්‍රීඩාව පාලනය වෙන්නට වර්තමාන රජයට උනන්දුවක් නැහැ කියන කාරණය කියන්න අවශ්‍යයි.

ගරු ක්‍රීඩා ඇමතිතුමනි, ඔබතුමාට ක්‍රීඩා ඇමතිවරයා හැටියට ස්වාධීන තීරණයකට එළඹෙන්න පුළුවන්. මේ රටේ ක්‍රිකට් ක්‍රීඩාව පිළිබඳ, ඒ අනාගත දැක්ම පිළිබඳ ගෞරවණීයව ඉතිහාසයට එකතු වෙන්න පුළුවන්, ක්‍රීඩකයන්ට ක්‍රීඩා සමාජවලට තමන්ගේ ඡන්දයෙන් මේ රටේ ක්‍රිකට් ක්‍රීඩාව පාලනය කරන්න පුළුවන් වාතාවරණයක් සලස්වලා දීම තුළින්. රජය විධියට ඒ සඳහා අවශ්‍ය පහසුකම් සපයන්න පුළුවන්. ඒත් ක්‍රීඩාව පාලනයට රජය මැදිහත් වෙන එක ක්‍රීඩා නීතියට පටහැනියි. ඒ නිසා හැකි ඉක්මනින් ක්‍රිකට් ක්‍රීඩාව සඳහා ක්‍රීඩකයන්ගේ, ක්‍රීඩා සමාජවල අයගේ ඡන්දයෙන් පාලක මණ්ඩලය තෝරා පත් කර ගැනීමට හැකියාව ලැබේවායි කියලා මා ප්‍රාර්ථනා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ අනිකුත් ක්‍රීඩා සම්බන්ධව ගත්තොත්, ඉතිහාසයට එකතු වන නරකම කාල පරිච්ඡේදයයි මේ ගත වන්නේ කියලා අපට කියන්න පුළුවන්. 1994 ඉඳලා අද වෙනකම් -ඉතාම සීමිත කාලයක්, අවුරුදු දෙකක කාලයක් ඇරෙන්න- මේ රටේ ක්‍රීඩාව පාලනය කළේ වර්තමාන සන්ධාන පාලනයයි. අද වෙන කොට ආසියානු ක්‍රීඩා උළෙලක අපේ පදක්කම් ප්‍රමාණය බින්දුවයි. අපි ආඩම්බරකාරකමට පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙලේදී එකම එක රන් පදක්කමක් දිනුවා. අද වෙන කොට ලජ්ජා සහගත විධියට අපට ඒ පදක්කමත් අහිමි වෙලා තිබෙනවා. ක්‍රීඩකයන්ට නිසි උපදෙස් දෙන, ක්‍රීඩකයන්ගේ වෛද්‍යමය කාරණා පිළිබඳ නිසි පාලනයක් සහිත ප්‍රතිපත්තියක් සහ ආයතන නැහැය කියන එකයි මේකෙන් පෙනෙන්නේ. ඒ විතරක් නොවෙයි, ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාව හැරුණාම මලල ක්‍රීඩාව වුණත්, බොක්සිං ක්‍රීඩාව වුණත්, බර ඉසිලීම වුණත්, පාපන්දු ක්‍රීඩාව වුණත්, රගර් ක්‍රීඩාව වුණත්, අන් සෑම ක්‍රීඩාවක්මත් අද වළ පල්ලට ගිහින් තිබෙනවා. මීට අවුරුදු 50කට කලින් තිබුණු තත්ත්වයවත් අද නැහැ. අද අපේ රටේ ක්‍රීඩකයන්ට ක්‍රිකට් ක්‍රීඩාව හැරෙන්න අන් කිසි ක්‍රීඩාවක් දියුණු කර ගැනීමට හැකියාවක් ලැබිලා නැහැ. මේ කනගාටුදායක තත්ත්වයෙන් මිදෙන්න අවශ්‍යයි. අප අපේ රට ඇතුළේ ගම් මට්ටමේ -බිම් මට්ටමේ- පාසල් මට්ටමේ ක්‍රීඩාව දියුණු කරලා, පහළ ඉඳලා ඉහළට දක්ෂතා සහිත තරුණ තරුණියෝ හඳුනා ගෙන ජාත්‍යන්තර මට්ටමට අරගෙන එන ක්‍රියාදාමයක් වෙනුවට නාස්තිකාර වැඩ පිළිවෙළකට රජය යොමු වෙමින් තිබෙනවා.

2018 පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල ලංකාවේ තියන්න ආණ්ඩුව යෝජනා කරලා තිබෙනවා. ඒකට අපේ කිසි විරෝධයක් නැහැ. හැබැයි පොඩි ප්‍රශ්නයක් තිබෙනවා. ඒ ප්‍රශ්නය මොකක්ද? මේ පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා තරගාවලියෙන් පස්සේ එහි දී ඉදි කරන -ගොඩ නඟන- ස්ථිර ක්‍රීඩාංගණ, ගොඩනැඟිලි එක දිගට භාවිතා කරන්න අවශ්‍ය කරන බිම් මට්ටමේ වාතාවරණය ඒ ප්‍රදේශය තුළ ගොඩ නැඟිලා නැහැ. මේ වාගේ සීමිත කාලයකදී ඒක ගොඩ නඟන්නත් පුළුවන්කමක් නැහැ. ඒ වාගේම රට ඇතුළේ ක්‍රීඩාවේ තත්ත්වය ඉතාම පල්ලෙහාට ගිහිල්ලා තියෙද්දි අතිශය වැදගත් -ඔලිම්පික් උළෙලට පමණක් දෙවැනි වන- පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල පවත්වන්න ගන්න තීරණය මුදල් නාස්ති කිරීමක් කියලායි කියන්නේ. ඒ මුදල රටේ ක්‍රීඩාවේ දියුණුව වෙනුවෙන් ආයෝජනය කරන එක ආණ්ඩුවේ වග කීමක් වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දවසේ මේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය අනුව එක එක අලුත් ක්‍රීඩාවන් පටන් අරගෙන තිබෙනවා. ඒ අලුත්ම ක්‍රීඩාව මේකයි. මේ රටේ විශ්වවිද්‍යාලවලට තෝරා ගන්න තිබුණේ උසස් පෙළ ප්‍රතිඵල මතයි. ජාත්‍යන්තර විශ්වවිද්‍යාලවලට යන්න බැරි දුප්පත් පවුල්වල දරුවෝ, මධ්‍යම පාන්තික දරුවෝ මේ රටේ විශ්වවිද්‍යාලවලට ගිහිල්ලා තමන්ගේ

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

ජීවිතය ගොඩ නඟා ගත්තා. අපටත් ඒ මහා අවස්ථාව ලැබුණා. අද අපි ඉන්නේ ඒ අවස්ථාවේ ඒ ප්‍රයෝජනය මතයි. මේ රටට නිදහස් අධ්‍යාපනය හඳුන්වලා දීලා මේ රටේ දුප්පත් මිනිසුන්ට දුප්පත්කමින් එළියට එන්න, ශක්තිමත් වෙන්න අවස්ථාව සලසලා දීපු පක්ෂය හැටියට එක්සත් ජාතික පක්ෂයට අයිතියක් තිබෙනවා මේ ගැන කථා කරන්න. නිදහස් අධ්‍යාපනය ගැන කථා කරන්න එක්සත් ජාතික පක්ෂයට අයිතියක් නැත්නම් ඒ අයිතිය තිබෙන්නේ කාටද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවස්ථාවේ අපේ ගරු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා කථා කළා. එතුමා මේ විෂය නිර්දේශය ගැන, මේ කියන හමුදා කඳවුරුවල දෙන පුහුණුව ගැන මොනවා දන්නවාද කියන්න මම දන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ විෂය නිර්දේශය මගේ ළඟ තිබෙනවා. මේ විෂය නිර්දේශය ඇතුළත් පොතේ පළමුවැනි පිටුවේ ඉන්නේ අධ්‍යාපනඥයෙක් නොවෙයි; අඩු ගණනේ මේ රටේ ගරු ජනාධිපතිතුමා නොවෙයි; උසස් අධ්‍යාපන අමාත්‍ය එස්.බී. දිසානායක මැතිතුමා නොවෙයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළමුවැනි පිටුවේ ඉන්නේ අපේ ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමායි.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
( மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මොකක්ද ඔය කොළේ?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
( மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඔබතුමා පුදුම වෙයි. මම මේක දෙන්නම්.

"නායකත්ව හැකියාව හා ධනාත්මක ආකල්ප වර්ධනය පිළිබඳ පාඨමාලාව, සංක්ෂිප්ත විෂය නිදේශය, විස්තරාත්මක විෂය නිර්දේශය, පුහුණු කාලසටහන."

මේවා අතේ තියා ගෙනයි අපි කථා කරන්නේ. අරමුණ පැහැදිලියි. [බාධා කිරීමක්] අරමුණ පැහැදිලියි, ගරු වාසුදේව නානායක්කාර ඇමතිතුමනි. අපේ ජීවිත කාලයට වඩා දේශපාලනය කළ ඔබතුමාගේ ඉතිහාසය තුළ ඔබතුමා දන්නවා ඇති, මොකාටද මේ එන්න හදන්නේ කියලා. මේ රටේ සංවේදීම කොටස වන තරුණයෝ -විශ්වවිද්‍යාල ශිෂ්‍යයෝ- තමයි ප්‍රශ්නයකදී පළමුවෙන්ම එළියට බහින කොටස. ඉන් පස්සේ තමයි කම්කරු පන්තිය, අනෙකුත් පන්ති එළියට එන්නේ. විශ්වවිද්‍යාල ශිෂ්‍යයෝ -මේ සංවේදී කොටස- මොට කරලා, තර්ජනය කරලා, බිය ගන්වලා හමුදා නිල ඇඳුමට, පොලිස් නිල ඇඳුමට යටපත් කරන, මොළ ශුද්ධ කරන ව්‍යායාමයේ පළමුවැනි පියවරයි වාසුදේව නානායක්කාර ඇමතිතුමනි මේ සිද්ධ වන්නේ. මේකේ අන්තර්ගත කාරණා කිහිපයක් මම කියන්නම්. මේක තේරුම් ගන්න. මේ කියන අනර්ඝ නායකත්ව සහ ධනාත්මක පුහුණුව ලැබෙන්නේ කොහොමද කියලා මේකේ තිබෙනවා.

ආත්ම විශ්වාස වර්ධන පාඨමාලාව යටතේ පළමු වෙන්ම තිබෙනවා, උමඟ. ඒ කියන්නේ උමඟක් තුළින් රිංගීම. ඊළඟට මංකි ලැඩර්. බාලිකාවන් සඳහා හරස් දඬු 03යි. ඊළඟට අතුර. අනිවාර්යයෙන්ම අතුරේ යන්නට ඕනෑ. ඊළඟට අහස් ඉණි මඟ, එල්ලූ ටයරය. ඊළඟට තිබෙනවා වැදගත්ම එක, කැට් වෝක්. අර විලාසිතා නිරූපණයේ දී ඒ යන ගමන ගැහැණු පිරිමි දෙගොල්ලන්ම යන්න ඕනෑ. එතකොට ආත්ම විශ්වාසය වර්ධනය වනවාලු.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
( மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
වෘත්තීය පුහුණුවත් තිබෙනවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
( மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
නැහැ, තිබෙන දේවල් මම කියන්නම්. අපි ඔක්කොම කියමු.

ඒ වාගේම, අඩි 06 තාප්පය. ඒ කියන්නේ අඩි 06ක් උස තාප්පයෙන් පනින්නට පුරුදු වන්නට ඕනෑ. තවත් තිබෙනවා, ඇල කඹය. ටයර් කම්බි යෙදුම. [බාධා කිරීමක්] ඇල කඹය; ටාසන් රෝප්. ටාසන් වාගේ පැද්දී, පැද්දී යන්නට ඕනෑ. එතකොට ආත්ම විශ්වාසය වැඩි වනවා. ඊට පස්සේ තිබෙනවා, අවසානය. ඒ කියන්නේ එතකොට ශිෂ්‍යයා අවසානයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේකේ තිබෙනවා පෞරුෂ වර්ධනය සඳහා අවශ්‍ය කරන තවත් වැදගත් කරුණු කිහිපයක්. ලිංගික සම්බන්ධතාවලින් මිදීම, පවුල් සංවිධානය. ජීවිත කාලය තුළ එක දවසක්වත් ගෙදරින් පිටත ගියේ නැති විශේෂයෙන්ම මුස්ලිම් සමාජයේ දැරියන් වාගේම සිංහල, දෙමළ, මුස්ලිම් කියලා භේදයක් නැතිව අම්මලා තාත්තලාගේ සෙවණේ හොඳට හැදුණු ළමයි ඉන්නවා. ගරු වාසුදේව නානායක්කාර ඇමතිතුමනි, සමහර ඇමතිවරු ඉන්නවා, ඒ අයට තමන්ගේ දරුවෝ හදා ගන්නට බැහැ. ඒ අය ක්ලබ් ගානේ ගිහිල්ලා ආරවුල් ඇති කර ගන්නවා. මහජන දේපොළවලට හානි කරනවා. නඩු දම්මවා ගන්නවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ ඇමතිවරුන්ට හිතෙන්නට පුළුවන් මගේ කොල්ලා කඳවුරකට යවලා හමුදා භටයන් ලවා තළලා, පෙළලා හිරිහැර කරලා පාලනය කළා නම් මෙහෙම සණ්ඩු කර ගන්නේ නැහැයි කියලා. තමන්ගේ දරුවෝ හරහා ලෝකය බලන එක දෙමවුපියන්ගේ හැටියක්. හැබැයි, මේ රටේ වැඩිපුර අම්මලා තාත්තලා දරුවෝ හදන්නේ ඒ ක්‍රමයට නොවෙයි. මේ රටේ බහුතරයක් දරුවෝ, බහුතරයක් අම්මලා තාත්තලා තමන්ගේ දූ දරුවෝ හොඳට හදා ගන්නවා. ඒ නිසා හමුදා කඳවුරු ඇතුළේ මේ විධියේ විහිළු සහගත, ප්‍රතිපත්තියක් නැති, දර්ශනයක් නැති, අධ්‍යාපන මූලධර්මවලට පටහැනි මේ තීරණයෙන් වන්නේ හොඳට ඉන්න දරුවෝ විනාශකාරී මාර්ගවලට යොමු වීමයි. එදා විශ්වවිද්‍යාලවලදී අපිත් නවකවදයට ලක් වුණා. හැබැයි අපි කවදාවත් නවකවදය දුන්නේ නැහැ. අපි නවකවදයට විරුද්ධව තර්ක කළා, සටන් කළා, ඒ වෙනුවෙන් විශ්වවිද්‍යාලය ඇතුළේ කැරළි ගැහුවා. විශ්වවිද්‍යාලය ඇතුළේ එදා දුන්න නවකවදය දැන් දෙන්නේ ආණ්ඩුව ගණනේයි. දැන් මේ ලිංගික සම්බන්ධතාවලින් මිදෙන හැටි ඉගැන්වූවාම, පවුල් සංවිධානය ගැන ඉගැන්වූවාම වර්ධනය වනවා, පෞරුෂය! ඒවා උගන්වන්න සුදුසු තැන් තිබෙනවා, සුදුසු ක්‍රම තිබෙනවා. හමුදා කඳවුරු ඇතුළේ හමුදා නිලධාරින්ගෙන් පවුල් සංවිධානය පිළිබඳ ඉගෙන ගන්න තරම් මේ රට පල්ලෙහාට ගිහිල්ලා නැහැ. ඒ වාගේම තව ඉගෙන ගන්න දේවල් මේකේ සඳහන් වෙනවා. නීති විරෝධී රැස්වීම ගැන ඉගෙන ගන්න ඕනෑ. මොකද, නීති විරෝධී රැස්වීමේ දිග පළල කියලා දුන්නාම කණ්ඩායම් විධියට රජයට විරුද්ධව සටන් කිරීම බාල වෙයි, පසු පසට යයි කියලා හිතනවා. මිනිස්සු කැරලි ගහන්නේ එහෙම නොවෙයි. ගම්බදව වුණත්, දුප්පත්කමට වුණත් බොහෝම හොඳින් හිටපු අපේ දරුවන්ව ගෙනිහිල්ලා ටකරන් මඩුවල හිර කරලා දුක් දෙන කොට ඒ ඇති වන වෛරය නිසා අවසානයේ බලාපොරොත්තු වන ප්‍රතිඵලයට වඩා හාත්පසින්ම වෙනස් ප්‍රතිඵලයක් තමයි ඇති වන්නේ. මම එක උදාහරණයක් කියන්නම්. පානදුරේ, කෙහෙල්වත්තේ මුජාහිඩ් කියන මහත්මයාගේ දරුවා -ඔහු මගේ පාක්ෂිකයෙක්, හිතවතෙක්- අපොස උසස් පෙළ "A" සාමාර්ථ 3ක් ගත්ත දැරියක්. ඇය පසු ගිය සතියේ සිකුරාදා සිය දිවි නසා ගන්න ගියා. ජීවිතයේ කිසි දිනක ගෙදරින් එළියට ගිහිල්ලා නැහැ. හමුදා කඳවුර තුළ දෙන මේ

පුහුණුව අනිවාර්ය බව අදාළ ලිපියේ දක්වලා තිබෙනවා. එහි කියනවා, "විශ්වවිද්‍යාලයට ඇතුළු වීම සඳහා මෙම පුහුණුවට සහභාගි වීම අනිවාර්ය වේ" කියලා. අපොස උසස් පෙළ "A" සාමාර්ථ 3ක් තිබෙන ඒ දැරියට විශ්වවිද්‍යාලයට යන්න වෙන්නේ නැහැයි කියන එකයි ඒකෙන් කියන්නේ. තමන්ගේ සංස්කෘතික තත්ත්වයන්ගෙන් එළියට ගිහිල්ලා හමුදා කඳවුරක පුහුණුව ලබන්න ඒ දැරිය කැමැති වුණේ නැහැ. ඒ ඇති වුණු මානසික පීඩනයට සිය දිවි නසා ගන්න උත්සාහ කළත් වාසනාවට ඇය බේරා ගන්න පුළුවන්කම ලැබුණා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒ පුහුණුව දෙන්නේ ගැහැණු පිරිමි මිශ්‍රව නොවෙයි. ගැහැණු ළමයින්ට පුහුණුව දෙන්නේ වෙනම.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගැහැණු වුණත්, පිරිමි වුණත් හමුදා කඳවුරු ඇතුළේ මේවා කරන්න අවශ්‍යද?

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒක වෙනම එකක්.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඒක වෙන එකක් නොවෙයි. ඒක තමයි කාරණය. ඒ පුහුණු වීමට යන කිසි කෙනෙක් තවම නිශ්චිතව විශ්වවිද්‍යාලයට තෝරාගෙන නැහැ. මූලික සුදුසුකම් විතරයි ඒ ශිෂ්‍යයෝ ලබා ගෙන තිබෙන්නේ. ඔවුන් කරන උපාධියට අදාළ විෂයයන් තවම තෝරා ගෙන නැහැ. විශ්වවිද්‍යාලය තෝරා ගෙන නැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔවුන් අනිවාර්යයෙන් විශ්වවිද්‍යාලයට ඇතුළු කර ගන්නවාය කියලා තෝරා ගැනීමක් කරලා නැහැ. මෙම විස්තරාත්මක විෂය නිර්දේශය මම **සභාගත*** කරනවා.

විස්තරාත්මක විෂය නිර්දේශය කියලා හඳුන්වන මේ පාඨමාලාවෙන් නම් මේ රටේ ශිෂ්‍යයන්ගේ පෞරුෂය වර්ධනය වන්නේත් නැහැ, නායකත්වය හැදෙන්නේත් නැහැ කියලා මම කියනවා. ධනාත්මක තත්ත්වයක් වෙනුවට තිබෙන දේත් නැති වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හැබැයි මේ පුහුණුව ලැබෙන්නට ඕනෑ කණ්ඩායමක් සිටිනවා. උසස් අධ්‍යාපන ඇමතිතුමාත් එක්ක මේ දේ තේරුම් ගන්න බැරි තවත් කණ්ඩායමක් මේ පාර්ලිමේන්තුවේත් ඉන්නවා. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට කියලා අන්න ඒ කට්ටියට පුහුණුවක් ලබා දෙන්න පුළුවන් නම් හොඳයි.

***පුස්තකාලයේ තබා ඇත.**
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු නවින් දිසානායක මහතා (රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு நவீன் திஸாநாயக்க - அரசாங்க முகாமைத்துவ மறுசீரமைப்பு அமைச்சர் )
(The Hon. Navin Dissanayake - Minister of Public Management Reforms)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කථා කරන්නට මෙම අවස්ථාව ලැබීම ගැන මම ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම කලුතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී අජිත් පී. පෙරේරා මැතිතුමා බොහොම වේදනාවෙන් කථා කළා. එක අතකට එතුමාට ඒ වේදනාව ඇති වෙලා තිබෙන්නේ කෘත්‍යාධිකාරී මණ්ඩලයට එතුමාව ඇතුළත් කර නැති නිසා කියලායි මම හිතන්නේ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මොකක්ද කිව්වේ? ඒවා බොහොම බාල කථා. වැදගත් විධියට කථා කරන්න.

**ගරු නවින් දිසානායක මහතා**
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
විශේෂයෙන්ම කලුතර දිස්ත්‍රික්කයේ වැඩිම මනාප ලබා ගෙන සිටින මෙතුමා වෙනුවට ලක්ෂ්මන් විජේමාන්න පළාත් සභා මන්ත්‍රීතුමා කෘත්‍යාධිකාරී මණ්ඩලයට ගේනවා. ඉතින් එතුමාගේ ඒ වේදනාව අපට හොඳට තේරෙනවා. මෙතුමා වෙනුවට ලක්ෂ්මන් විජේමාන්න පළාත් සභා මන්ත්‍රීතුමා කෘත්‍යාධිකාරී මණ්ඩලයට ගේනවා. මෙතුමායි, පාලිත තෙවරප්පෙරුම මන්ත්‍රීතුමායි පාර්ලිමේන්තු මන්ත්‍රීවරු. නමුත් පළාත් සභා මන්ත්‍රීවරයා කෘත්‍යාධිකාරී මණ්ඩලයට ගේනවා. ඉතින් ඒ වේදනාව අපට හොඳට තේරෙනවා. කමක් නැහැ අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමනි, ඔබතුමාටත් කාලයක් එයි. පොඩ්ඩක් ඉවසීමෙන් ඉන්න. එක්සත් ජාතික පක්ෂයේ කැපිලි කෙටිලි තිබෙනවා. අපි ඒවා හොඳට දන්නවා. අපි ඒවා විඳපු කට්ටිය. පොඩ්ඩක් ඉවසන්න. තව අවුරුදු හතරකින්, පහකින් ඔබතුමාට ඒ අවස්ථාව ලැබෙයි.

කෙසේ වෙතත් අද අපි ක්‍රීඩා ගැන කථා කරන කොට එක්සත් ජාතික පක්ෂයේ සමහර මන්ත්‍රීවරු නායකත්ව පුහුණුව ගැනත් නොයෙකුත් මතවාද ඉදිරිපත් කළා. විශේෂයෙන්ම මම ඒ ගැනත් වචන ස්වල්පයක් කථා කරන්න කැමැතියි.

අද ලෝකයේ දියුණු සමහර රටවල් විශේෂයෙන්ම National Service කියලා සති තුනක පුහුණුවක් නොවෙයි, අවුරුද්දක් අවුරුදු දෙකක් වැනි පුහුණුවක් දෙනවා. ඒක සිංගප්පූරුවේ වෙනවා. ලී ක්වාන් යූ අගමැතිතුමා 1970 ගණන්වල ඒක ඉදිරිපත් කළා. ඒ, සති තුනක පුහුණුවක් නොවෙයි, අවුරුදු දෙකක අනිවාර්ය පුහුණුවක් ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමනි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
හොඳයිනේ.

**ගරු නවින් දිසානායක මහතා**
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
අනිවාර්යයෙන්ම හොඳයි. [බාධා කිරීමක්] මේක military පුහුණුවක් නොවෙයි. නමුත් සිංගප්පූරුවේ දෙන්නේ military පුහුණුවක්. මතක තබා ගන්න. [බාධා කිරීමක්] ඊශ්‍රායලයේ අවුරුද්දක්, අවුරුදු දෙකක් නොවෙයි, අවුරුදු තුනක යුද පුහුණුවක් කරන්න ඕනෑ, උසස් පෙළ කළාට පසුව. ඒක අනිවාර්යයෙන්ම කළ යුතුයි. ඉතින් සමාජයේ යම් කිසි සමතුලිතතාවක් ඇති

[ගරු නවීන් දිසානායක මහතා]

කරන්න, ජාති, කුල, ආගම්වල තිබෙන ඒ වෙනස්කම් නැති කරන්න මෙවැනි තීරණ ගන්න වෙනවා. ඉතින් එවැනි තීරණයක් තමයි අද අපි අරගෙන තිබෙන්නේ. ඒ තීරණය තුළ යම් කිසි අඩු පාඩුකම් තිබෙන්න පුළුවන්. අපි ඒ අඩු පාඩුකම් ගැන කථා කරමු. පළමුවැනි round එකේ යම් කිසි අඩු පාඩුකම් තිබෙන්න පුළුවන්. නමුත් ලබන වසරේ ආයෙත් මේ පුහුණුව දෙන කොට අපට ඒ අඩු පාඩුකම් ටික අඩු කරන්න පුළුවන්.

මේ වැදගත් අවස්ථාවේ ක්‍රිකට් ක්‍රීඩාව ගැන කථා කරන්න අවශ්‍යයි. ඒ වාගේම ක්‍රිකට් ක්‍රීඩාවට අමතරව මෙම යෝජනාවේ ඉදිරිපත් කරලා තිබෙන පළමුවැනි අංගයට අපි සම්පූර්ණයෙන්ම එකඟ වෙනවා. ක්‍රීඩාව කියන්නේ ජාතික අවශ්‍යතාවක්. ඒ වාගේම ක්‍රිකට් ක්‍රීඩාව ගැන මෙම යෝජනාවේ සඳහන් වෙලා තිබෙනවා. ක්‍රිකට් ක්‍රීඩාව විශේෂයෙන්ම අපේ රටට තිබෙන විශාල සම්පතක් හැටියට අපි දකිනවා. ක්‍රිකට් ක්‍රීඩාව ගැන කථා කරන විට කියන්න ඕනෑ, 1981 දී අපට ජාත්‍යන්තර test වරම් ලැබුණ බව. මගේ පියාට පුළුවන් වුණා ඒ ගැන විශේෂයෙන් නායකත්වය ලබා දෙන්න. ක්‍රිකට් ක්‍රීඩාව ගැන කථා කරන විට එතුමාගේ නම අද නොයෙක් ආකාරයෙන් සඳහන් වනවා. අපේ අර්ජුන රණතුංග මන්ත්‍රීතුමා මේ අවස්ථාවේ මෙතැන ඉන්නවා. 1981 අපට test වරම් ලැබුණාට පසුව අවුරුදු පහක් ගියා අපට ජයග්‍රහණයක් ලබන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාට මතක ඇති, 1986 දී -අවුරුදු පහකට පසුව- ඉන්දියාවත් සමඟ කළ තරගයේදී තමයි ඉතාමත් අමාරුවෙන් පළමුවැනි test තරගය අපි ජයග්‍රහණය කළේ. 1986න් අවුරුදු 10කට පස්සේ අර්ජුන රණතුංග මැතිතුමාගේ නායකත්වය හරහා අපට පුළුවන් වුණා, ක්‍රිකට් ලෝක කුසලානය දිනා ගැනීමට. අපි ඒක කිසිම පැකිළීමකින් තොරව කියන්නේ. 1996 අපට ලෝක කුසලානය ලබා ගන්න අර්ජුන රණතුංග මැතිතුමා විශාල සාධකයක් වුණා. ඒක කියන්න අපට ලජ්ජා වෙන්න කිසිම හේතුවක් නැහැ. එතුමා ඒ කළ කාර්ය භාරය ගැන අපි එතුමාට ස්තුතිවන්ත වනවා. 1996 ලෝක ශූරයන් වුණාට පසුව මගේ පියා ඇතුළු ගොඩක් කට්ටිය ක්‍රිකට් ක්‍රීඩාව නංවන්න විශාල ආයෝජන කළා. අස්ගිරිය ක්‍රීඩාංගණය අලුතෙන් හැදුවා. SSC ක්‍රීඩාංගණය නවීකරණය කළා. අපි 1983 ක්‍රිකට් ලෝක කුසලානයට සහභාගි වුණා; 1987 ක්‍රිකට් ලෝක කුසලානයට සහභාගි වුණා; 1992 ක්‍රිකට් ලෝක කුසලානයට සහභාගි වුණා; නමුත් අපට ජයග්‍රහණය කරන්න බැරි වුණා. ඒ සඳහා අපට 1996 වෙනකම් ඉන්න සිද්ධ වුණා. එතකොට 1996 අපි ජයග්‍රහණය කරන කොට රටේ ජනාධිපති හැටියට කවුද හිටියේ? චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය. අපි එතුමියත් යම් කිසි ප්‍රශංසාවකට ලක් කරන්න ඕනෑ. අපි 1996 දිනුවා කියලා අපි එක්සත් ජාතික පක්ෂය කියලා ගාමිණී දිසානායක මැතිතුමා අමතක කරනවාද? නැහැ. ඒකයි විශේෂයෙන්ම මම කියන්නේ ක්‍රීඩාව කියන්නේ පොදු දෙයක්. මේකේ පක්ෂ, පාට, ආගම් නැහැ. මේ රට එකතු කරන්න පුළුවන් - මාතෘ භූමිය එකතු කරන්න පුළුවන්- සාධකයක් තමයි ක්‍රීඩාව. මම මාගේ ජීවිත කාලය තුළදී බලාපොරොත්තු වනවා, උතුරු නැඟෙනහිරින් විශේෂ ක්‍රීඩක පිරිසක් අපේ ක්‍රිකට් ක්‍රීඩාවට එකතු කරන්න පුළුවන් වෙයි කියලා. ඒකට මා පුන පුනා බලා සිටිනවා. 1996 ඒ දැවැන්ත ජයග්‍රහණය ලබා ගන්න අපට පුළුවන් වුණා.

මේ යෝජනාවෙන් ඉදිරිපත් කරන්නේ ක්‍රිකට් ක්‍රීඩාව විශාල කඩා වැටීමකට ලක් වෙලා තිබෙනවාය කියන එකයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මොනවා කිව්වත් අපි සාධක දිහා බලන්න ඕනෑ. සාධක අනුව මෙහෙම දෙයක් වෙලා නැහැ. ක්‍රිකට් පරිපාලනයේ යම් කිසි අඩු පාඩුකම් තිබෙනවා. මම හිතන්නේ අපි සියලු දෙනාම ඒක පිළිගන්නවා. නමුත් ක්‍රිකට් ක්‍රීඩාව සමස්තයක් වශයෙන් අපේ රටේ ඉතාමත් උසස් තත්ත්වයක තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බලන්න ප්‍රතිඵල. 2003 අපි semi-final එකට ගියා. 2007 අපි final එකට -අවසාන තරගයට- ගියා. 2011 අවසාන තරගයට ගියා. ඕස්ට්‍රේලියාව 2003 ජයග්‍රහණය කළා. 2007 ජයග්‍රහණය කළා. 2011 quarter-final එකට ගියා. එතැනින් පැරදුණා. ඉන්දියාව 2003 final එකට ගියා.

2007 වර්ෂයේදී පළමුවන රවුමේදීම පරාජයට පත් වුණා. 2011 වර්ෂයේ ජයග්‍රහණය කළා. අපි 2003 වර්ෂයේ semi-final එකට ගියා. 2007 වර්ෂයේ final එකට ගියා. 2011 වර්ෂයේ final එකට ගියා. මේ ප්‍රතිඵල අනුව අපේ රටේ ක්‍රිකට් ක්‍රීඩාව කඩා වැටිලාය කියා කියන්නේ කොහොමද? ඒ තර්කය සම්පූර්ණයෙන්ම පුහු තර්කයක්. ගරු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා, ගරු මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමා අප එදා සාමාන්‍ය පුරවැසියන් විධියට තමයි මුම්බායි නුවරට ගියේ. ප්‍රේක්ෂකයන් වශයෙන් අප එදා match එක බලනකොට අපේ හදවතට ලොකු සතුටක් දැනුණා. අපේ කණ්ඩායම, runs 275ක් ගැහුවා. ඉන්දියාව overs තුනකට පස්සේ wicket දෙකයි; runs 18 යි. හතහමාර වන තුරු අප ඉදිරියෙන් හිටියේ. නුවන් කුලසේකර එදා ගම්භීර්ගේ catch එක ගත්තා නම් භාග වෙලාවට අද ඔහොම කථා කරන්නේ නැහැ. එදා ගම්භීර්ගේ catch එක ගත්තා නම් අප ලෝක ශූරයන්. ක්‍රිකට් ක්‍රීඩාව හා අනෙකුත් ක්‍රීඩා වාසනාවත් එක්ක තුලනය වන්නේ. උපක්‍රම හුඟක්දුරට වෙනස් වෙනවා. මා පෞද්ගලිකව පුදුමයට පත් වෙනවා, විශේෂයෙන්ම අපේ දක්ෂ ක්‍රීඩකයන් හතර දෙනෙක් එදා වෙනස් කළ ඒ තීරණය ගැන. ඒක මාගේ පෞද්ගලික අදහසක්. බාගවෙලාවට ගරු අර්ජුන රණතුංග මැතිතුමාත් ඒකට විරුද්ධ වන්නට පුළුවන්. මා දන්නේ නැහැ. මා නීතිඥයකු හා මන්ත්‍රීවරයකු පමණයි. මා ක්‍රිකට් විශේෂඥයකු නොවෙයි. ඒ තීරණය ගත් කට්ටියගෙන් අප අඩු ගණනේ ප්‍රශ්න කරන්නට ඕනෑ, මේ හතර දෙනා ඇයි එදා වෙනස් කළේ කියා. ඒක වෙනම කථාවක්.

ඊළඟට, විශේෂයෙන්ම අප ක්‍රිකට් ක්‍රීඩකයන් ගැන කථා කළ යුතුයි. අප අනිවාර්යයෙන්ම දන්නවා, මේ රටේ සහජ හැකියාවන් තිබෙන ක්‍රිකට් ක්‍රීඩකයන් බිහි වෙලා තිබෙන බව. It is a special quality of our country that we are producing exceptional players. Sometimes, they are called "freaks". For example, Ian Chappell told me that Lasith Malinga is a freak and that he has never seen a person like Lasith Malinga. ලසිත් මාලිංගට විශේෂත්ව පුහුණුවක් දී නැහැ. ඒක ඔහුගේ ඇඟේම තියෙන සහජ හැකියාවක්. ඒ වාගේම ගරු අර්ජුන රණතුංග මැතිතුමාට -හිටපු ක්‍රිකට් නායකතුමාට- තිබුණු නායකත්වය ඒ ඇඟේම තිබුණු නායකත්වයක්. අප ඒක පිළිගන්නට ඕනෑ. මගේ තාත්තා ඒක පිළිගත්තා. ඒ වාගේම මා මේ අවස්ථාවේ විශේෂයෙන්ම අර්ජුන රණතුංග මැතිතුමාට ස්තුතිය ප්‍රකාශ කරන්නට කැමතියි, 1996 වර්ෂයේදී ලෝක කුසලානය දිනා ඒ කුසලානයත් සමඟ මගේ නිවසට ඇවිත් මගේ මව හමු වීම සම්බන්ධයෙන්. විශේෂයෙන් එවා ඉතාමත් ප්‍රබල පොදු පෙරමුණු රජයක් තිබුණු අවස්ථාවක එතුමා නිර්භීතව ඒ තීරණය ගත්තා. මේ ගරු සභාවේදී ඒ ස්තුතිය මම එතුමාට පළ කරන්නට කැමතියි.

ක්‍රිකට් පරිපාලනය සම්බන්ධයෙන් නොයෙකුත් අඩු පාඩුකම් තිබෙන්නට පුළුවන්. තරුණ ඇමතිවරයෙක් ඒ සඳහා පත් කර ඉන්නවා. එතුමාගේ නායකත්වයෙන් අප ඒ අඩුපාඩු හරිගස්සා ගනිමු. ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා Interim Committeesවලින් තමයි මේක දුවන්නේ කියා. එදා සභාපති ධුරයට ගරු අර්ජුන රණතුංග මැතිතුමා තරග කරනකොට එතුමාගේ club එකේ වත් - Sinhalese Sports Club එකේවත්- ඡන්ද එතුමාට ලැබුණේ නැහැ. ඇයි ඒ? මුදල්වලට ඒ ඡන්ද යට වෙලා තිබෙනවා. මෙතැන අලුතෙන් ඡන්දයක් තැබීමෙන් අපට හදවතට එකඟව කියන්නට පුළුවන් ද අවශ්‍ය කට්ටිය පත් වෙනවාය කියා. අපට කියන්නට බැහැ. දැන් අප මේ ගැන කථා

කර ගෙන යනවා. අතිගරු ජනාධිපතිතුමාගේ අවධානය ඒ ගැන යොමු වෙලා තිබෙනවා. අපි අලුත් sports council law එකක් මේ රටට ගෙනෙන්නට අවශ්‍යයි. පුංචි clubsවල නියෝජනයකුත් තිබෙන, ඒ වාගේම මුදල්වලට පමණක් යට නොවෙන, මුදල්වලට ඡන්ද ගන්නට බැරි ක්‍රමයක් අප මේ රටේ ඉස්මතු කරන්නට අවශ්‍යයි. මා පුංචි කොල්ලකු වශයෙන් සිටින විට මා කවදාවත් සිතුවේ නැහැ, ඩී. එස්. ද සිල්වා මහතා මේ රටේ ක්‍රිකට් පාලක සභාවේ සභාපති වෙයි කියා. නමුත් අද ඒක වෙලා තිබෙනවා. ඒක එතුමාගේ වාසනාව. අපගේ ලෝක කුසලාන ක්‍රිකට් තරගය තිබුණු අවස්ථාවේ ICC එකේ සියලු දෙනාම මට පෞද්ගලිකව ප්‍රකාශ කළා, ICC එකේ ක්‍රිකට් කුසලානය මේ රටට ගෙනෙන්න අවශ්‍ය ඒ සංවිධාන ශක්තිය මේ රටට තිබුණු බව. අපේ තිබෙන ශක්තියෙන් අප ඒක කළා.

ඩී.එස්. ද සිල්වා මැතිතුමාට අප ඒ ප්‍රශංසාව පුද කළ යුතුයි. අඩු පාඩුකම් තිබෙනවා වෙන්න පුළුවන්. විශේෂයෙන්ම මම විරුද්ධයි ඒ තනතුරුවල ඉන්න අය ඥාතින් පත් කරනවාට. ඒ වාගේම මම විරුද්ධයි පෞද්ගලික හිතවතුන් පත් කරනවාට. විශේෂයෙන්ම "පොඩි සර්" වැනි අය. එහෙම අය පත් කරනවාටත් මම විරුද්ධයි. අපි මේ කටයුතු professional විධියට කර ගෙන යන්න ඕනෑ. එදා මගේ තාත්තා ඇතුළු පිරිස ඒ කටයුතු කරන කොට එතුමා උඩින් හිටියා. ඉතාම දක්ෂ team එකක් ඊට යටින් හිටියා. නුෂ්කි මොහොමඩ් මැතිතුමන්ලා හිටියා; අබුහුවාද් මැතිතුමන්ලා හිටියා. ඥාතින් හිටියේ නැහැ; හිතවතුන් හිටියේ නැහැ; කේළාම්කාරයන් හිටියේ නැහැ; "පොඩි සර්ලා" හිටියේ නැහැ. ඒකයි මම කියන්නේ. අපේ අඩු පාඩුකම් තිබෙන්න පුළුවන්. අප සියලු දෙනාගේම අඩු පාඩුකම් තිබෙන්න පුළුවන්. නමුත් අප මේ ක්‍රිකට් පරිපාලනය-administrationඑක- ඉතාම professional විධියට කළ යුතුයි කියන එක තමයි මගේ අවංක හැඟීම.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම මේ අවස්ථාවේදී පොදු සාධකයක් බවට පත් වෙලා තිබෙනවා match fixing. ඒ කියන්නේ, මුදල්වලට ක්‍රිකට් ක්‍රීඩාව පාවා දෙන එක. දැන් මේක ක්‍රිකට් ක්‍රීඩාවට පමණක් නොවෙයි සීමා වෙලා තිබෙන්නේ. මේක හැම ක්‍රීඩාවකටම ව්‍යාප්ත වෙලා තිබෙනවා; football වෙන්න පුළුවන්, tennis වෙන්න පුළුවන්-

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
පාර්ලිමේන්තු ඡන්දය වෙන්න පුළුවන්!

**ගරු නවින් දිසානායක මහතා**
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
පාර්ලිමේන්තු ඡන්දය වෙන්න පුළුවන්. ඕනෑම දෙයක් මුදල්වලට යට වෙලා තිබෙනවා. ඒ ගැන කථා දෙකක් නැහැ. මාගේ මිත්‍ර හෂාන් තිලකරත්න මැතිතුමා මේ ගැන චෝදනාවක් ඉදිරිපත් කළා. අපේ ගරු ඇමතිතුමා ඉතා සූක්ෂ්ම විධියට එතුමාගේ දක්ෂකම පාවිච්චි කරලා පැහැදිලිවම ප්‍රකාශ කරලා තිබෙනවා මේ සම්බන්ධයෙන් ඉතා විවෘතව, ඉතා විනිවිදභාවයෙන් යුතුව පරීක්ෂණයක් කරන්න කැමැතියි කියලා. එතුමාට පොලිස් ආරක්ෂාව දෙන්නම් කිව්වා. CID එක හෂාන් තිලකරත්න මහතාගෙන් ප්‍රශ්න කළා. නමුත් දැන් හෂාන් තිලකරත්න මහතා මේ ගැන ප්‍රකාශයක් කරන්නේ නැහැ. කරුණාකර එහෙම වැදගත් ලෙස-

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක් තිබෙනවා.

**ගරු නවින් දිසානායක මහතා**
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
තව විනාඩි දෙකක් විතර මට දෙන්න ගරු නියෝජ්‍ය කථානායකතුමනි. විශේෂයෙන්ම වග කීමෙන් එවැනි ප්‍රකාශයක් කරනවා නම් එතුමා කියන්න ඕනෑ කවුද මේකට සම්බන්ධ පුද්ගලයන් කියලා. අපිත් ඒ ගැන දැන ගන්න කැමැතියි. මේක බරපතළ චෝදනාවක්. විශේෂයෙන්ම අපගේ මාතෘ භූමිය අපකීර්තියට පත් කරන චෝදනාවක්. මුදල්වලට රට පාවා දෙන ක්‍රීඩකයන් ඉන්නවා නම් අපි දැන ගන්න කැමැතියි ඒ කට්ටිය කවුද කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ක්‍රිකට් ක්‍රීඩාව කියන්නේ අපේ රටේ තිබෙන විශාල සම්පතක්. විශාල දක්ෂකම් තිබෙන ක්‍රිකට් ක්‍රීඩකයන් අපට ඉන්නවා. We have inherent talent in our country as far as cricket is concerned. We must nourish this talent; we must bring it forward. We must ensure that Muttiah Muralitharans, Kumar Sangakkaras and Arjuna Ranatungas emerge in this country.

ඒ වාගේම 2018 පැවැත්වෙන පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා තරගාවලිය ගැන මේ අවස්ථාවේදී කථා කළා. ඒ ගැන ප්‍රශ්න ටිකකුත් අපේ අනුර කුමාර දිසානායක මැතිතුමා යොමු කළා. ගරු මන්ත්‍රීතුමනි, මා හිතන හැටියට ඒවාට ඔබතුමාට පිළිතුරු ලැබෙයි. අනිවාර්යයෙන්ම මෙය කළ යුතු දෙයක්. අපට ඒ ශක්තිය තිබෙනවා. මැලේසියාවේ හිටපු අගමැති මහතීර් මොහොමඩ් මැතිතුමා ප්‍රකාශ කරලා තිබෙනවා, රටේ පැවැත්වෙන අතිවිශිෂ්ට ක්‍රීඩා උත්සවයක් හරහා රටේ ආර්ථිකය දියුණු කරන්න පුළුවන් කියලා. ක්‍රියාත්මකභාවයක තිබෙන ආර්ථිකයක් ගොඩ නඟන්න පුළුවන් හොඳ ක්‍රමයක් හැටියට එතුමා ක්‍රීඩා උළෙල දකිනවා. එම නිසා අපේ රටට මේක විශාල බරක් හැටියට මා දකින්නේ නැහැ. 2018 අවුරුද්ද කිව්වාම, අපට තව සෑහෙන කල් තිබෙනවා. මේ සම්බන්ධයෙන් හොඳට budget කරන්න අපට පුළුවන්. අපට පුළුවන් අපේ රට සැබවින්ම දකුණු ආසියාවේ වැදගත් රටක් බව මේ හරහා සෙසු රටවලට පෙන්වන්න. එම නිසා මම ප්‍රාර්ථනා කරනවා මේ ගැනත් අපට ඉතාම ධනාත්මකව ක්‍රියා කරන්න පුළුවන් වේවා කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ක්‍රිකට් ක්‍රීඩාවේ පරිපාලනය පැත්තෙන් අනිවාර්යයෙන්ම අඩු පාඩුකම් තිබෙනවා. දූෂණ තිබෙනවා නම් අප අනිවාර්යයෙන්ම ඒවා සොයා ගත යුතුයි. හොරකම් තිබෙනවා නම් අප ඒවා නැති කළ යුතුයි. අපි විශේෂයෙන්ම විපක්ෂයෙන් සහයෝගය ඉල්ලනවා, තමුන්නාන්සේලා චෝදනා කරන විධියටම අපට සාක්ෂි ඉදිරිපත් කරන්න කියලා. මෙම ගරු සභාවට මාගේ ස්තුතිය පුද කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මීළඟට ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, විනාඩි 10ක් තිබෙනවා ඔබතුමාට.

**ගරු සුජීව සේනසිංහ මහතා**
( மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
බොහොම ස්තුතියි ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපේ ගරු නවින් දිසානායක ඇමතිතුමාගේ කථාවෙන් පස්සේ මට කථා කිරීමට අවස්ථාව ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා. විශේෂයෙන්ම ක්‍රිකට් ක්‍රීඩාව ගැන එතුමා අදහස් ප්‍රකාශ කළා. එහිදී එතුමා එතුමාගේ පියා ක්‍රිකට් ක්‍රීඩාවට කරපු මෙහෙවර ගැන අපට යම්කිසි මතක් කිරීමක් කළා.

[ගරු සුජීව සේනසිංහ මහතා]

එතුමා ඒත් එක්කම ප්‍රකාශ කළා පසු ගිය අවුරුදු කිහිපය තුළ අපි ලබා ගත්තු ජයග්‍රහණ මොනවාද කියලා. මම එතුමාට මතක් කරන්න කැමැතියි, අද ක්‍රීඩාවත් රටේ ආණ්ඩුව වාගේම දූෂණයෙන් ඉහවහා ගිහිල්ලා, පැතිරිලා ගිහිල්ලා කියලා. මේ දූෂණ කොයි ආකාරයෙන් තිබුණත් ඔබතුමා ප්‍රකාශ කළ ආකාරයට ඔබතුමාගේ පියා, අර්ජුන රණතුංග මැතිතුමන්ලා, මහාරාජා ආයතනයේ අධිපති රාජා මහේන්ද්‍රන් මැතිතුමන්ලා අතීතයේදී ක්‍රිකට් ක්‍රීඩාවට කරපු ඒ විශාල සේවාව හේතු කොට ගෙන අද අපේ රටේ ක්‍රිකට් ක්‍රීඩාව පල්ලෙහාට දමන්න බැරි තැනකට පත් වෙලා තිබෙනවා. ඉන්දියාවේ වාගේ අපේ රටේත් අස්සක් මුල්ලක් පාසාම ආගමක් වාගේ ක්‍රිකට් ක්‍රීඩාව තිබෙනවා. කොච්චර දූෂණය තිබ්බත් ක්‍රිකට් ක්‍රීඩාව පල්ලෙහාට ඇදලා දමන්න බැහැ.

මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා අද ක්‍රීඩා අමාත්‍යවරයා වශයෙන් කටයුතු කරනවා. ගරු ඇමතිතුමනි, අපි බලාපොරොත්තු වන්නේ ක්‍රිකට් ක්‍රීඩාවේ ජයග්‍රහණ. ලෝක කුසලානය අපි ජයග්‍රහණය කළාද නැද්ද කියන එක ගැන නොවෙයි අපේ තර්කය තිබෙන්නේ. ඒ ජයග්‍රහණය සම්බන්ධයෙන් විවිධ මත තිබෙන්න පුළුවන්. ඒ ජයග්‍රහණය අපට ලැබෙන්න සලස්වා ගන්න පුළුවන් ක්‍රම තිබුණා වෙන්න පුළුවන්. හැබැයි ඒ ගැන නොවෙයි අපි කථා කරන්නේ. අපි ජයග්‍රහණය වාගේම පරාජයත් භාර ගන්නවා. අපි අවසාන තරගාවලියට සුදුසුකම් ලැබුවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමා මේ අමාත්‍යාංශය භාර අරගෙන ඉතා කෙටි කාලයයි. ඒ කියන්නේ, තිබෙන සියලු චෝදනාවලින් සියයට 10ක්වත් ඔබතුමා භාර ගත යුතු නැහැ. අපි දන්නවා ඔබතුමාට යමක් කරන්න පුළුවන් හැකියාවක් තිබෙන බව. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා අපි ඉදිරිපත් කරන කරුණු හොඳට හිතේ තියා ගෙන ඔබතුමාගේ හැකියාව තුළින් විශාල සේවාවක් මේ ක්‍රීඩා ක්ෂේත්‍රයට කරයි කියලා.

නවින් දිසානායක මැතිතුමා කිව්වා වාගේ දූෂණය හැම තැනම තිබෙනවා. හැබැයි, එතුමා එහෙම ප්‍රකාශ කළාට අද ආණ්ඩුවේ උඩ ඉඳලා සියලු අමාත්‍යාංශ පුරා මේ දූෂණය වැපිරිලා තිබෙනවා. අපි මේවා හරියාකාරව ප්‍රකාශ කළාට ආණ්ඩුවෙන් මේ සම්බන්ධයෙන් ගන්න කිසිම ක්‍රියාමාර්ගයක් නැහැ. ගරු ඇමතිතුමනි, සී.බී. රත්නායක හිටපු ක්‍රීඩා ඇමතිතුමා මේ ගැන කියලා තිබුණා. "Minister Ratnayake described Sri Lanka Cricket as the third most corrupt institution in the country." "Daily Mirror" පත්තරයේ කතුවැකියේ මේ ප්‍රකාශය තිබුණේ. ආණ්ඩුවේම ඇමතිවරයා කියනවා, එතුමාගේ අමාත්‍යාංශය යටතේ තිබෙන ක්‍රිකට් ආයතනය ලංකාවේ පවතින තුන්වන දූෂිතම ස්ථානය කියලා. ඊට අමතරව එතුමා එක, දෙක ස්ථාන වශයෙන් සඳහන් කරන්නේ අධ්‍යාපන ක්ෂේත්‍රය සහ පොලීසියයි. මේ ආකාරයෙන් ඇමතිතුමන්ලාම ප්‍රකාශ කරනවා නම් ඒ ආයතන දූෂිතයි කියලා, ආණ්ඩුවේ ඇමතිතුමන්ලාම පිළිගන්නවා නම් මේ ආයතන මෙච්චර දූෂිතයි කියලා මොකක්ද කරන්නේ? එක්සත් ජාතික පක්ෂය නොවෙයි නේ ආණ්ඩුව කරන්නේ. එහෙම නම් මේ ආණ්ඩුවේ නොහැකියාව, ඊට කලින් හිටපු ඇමතිවරුන්ගේ සොරා කෑම ඉතා පැහැදිලිව ආණ්ඩුව ඇතුළෙන්ම පෙන්නුම් කරනවා. ඒ වාගේම ඔබතුමා කිව්වා ඩී.එස් ද සිල්වා මැතිතුමාගේ,- [*Interruption.*] You should be knowing because you were involved in that. I do not know. You have more experience than I because you have dealt better in that area. I have less experience, not as much as you have. You know in length what the price is because you have taken that price. - [*Interruption.*] I do not know. For your crossing over, there must have been a price. For your crossing over, not having guts to stand firm in the party and stand by the principle which your father believed - [*Interruption.*] I do not know. Probably you know all the prices. I am not aware. So, tell us if there is a price for crossing over. We would like to know. -[*Interruption.*] We do not fall into that category but you do.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඩී.එස්. ද සිල්වා මැතිතුමා ගැන එතුමා අදහස් ප්‍රකාශ කළා. එතුමා කිව්වා පවුලේ කට්ටිය මේ තනතුරුවලට පත් වෙනවාට එතුමා කැමති නැහැ කියලා. හැබැයි මේ තත්ත්වය ආණ්ඩුවේ උඩ ඉඳලා පහළටම දකින්න ලැබෙනවා නේ. අද ආණ්ඩුවේ සියලුම තනතුරු තිබෙන්න එක පවුලකටයි.

**ගරු නවින් දිසානායක මහතා**
( மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
හැබැයි, එතුමන්ලා ජනවරමක් අරගෙන තිබෙනවා නේ.

**ගරු සුජීව සේනසිංහ මහතා**
( மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඔබතුමාගේත් පවුලේ අය ඉන්නවා නේ.

හැබැයි ඔබතුමා පවුල්වාදයට විරුද්ධ නම්, ඔබතුමාගේ ආණ්ඩුවේ ඉහළම ඉන්න අයටත් විරුද්ධ වන්නට ඕනෑ. ඔබතුමාට ශක්තිය තිබෙන්නට ඕනෑ, ජනාධිපතිතුමාට, ඒ වාගේම ආර්ථික සංවර්ධන ඇමතිතුමාට කියන්න, අපි මේ පවුල් ක්‍රමයට කැමැති නැහැ කියලා. හැබැයි, ඔබතුමා එක තැනක විතරක් පවුල් ක්‍රමයට කැමැති නැහැ කියලා අනෙක් තැනදී ඔබතුමා කට වහ ගෙන ඉන්නවා. ඔබතුමා ඒ පවුල්වාදයට අකමැති නම්, ඒ පවුල් වාදයට අකමැතියි කියලා ආණ්ඩුවේ ඉහළ තැනට කියන්න ඔබතුමාට ශක්තිය තිබෙන්නට ඕනෑ. ඒ ශක්තිය ඔබතුමාට නැහැ. හැබැයි, ඔබතුමාගේ තාත්තාට ඒ ශක්තිය තිබුණා. ඔබතුමා ඒ කියපු දේ සම්බන්ධයෙන් මා එකඟ වනවා. ඒ පවුල් ක්‍රමය අනුව තමයි ඩී.එස්.ද සිල්වා මැතිතුමාගේ ඥාති පුත්‍රයාට රුපියල් 5,50,000ක වැටුපක් -ලංකාවේ පළමු වන වතාවට- ලැබෙන්නේ. අනෙක් පුතාට රුපියල් 2,50,000ක වැටුපක් ලැබෙන්නේ. ඒ විතරක් නොවෙයි, ගරු අර්ජුන රණතුංග මන්ත්‍රීතුමාත් දන්නවා ඇති, රුපියල් බිලියන අටක මුදලක් පසුගිය දා පැවැති ලෝක කුසලාන ක්‍රිකට් තරගය සඳහා මේ පිරිස වියදම් කළ බව. කොහෙන්ද මේ සල්ලි? කාගෙන් ගත්තු සල්ලිද? කොහේද ආණ්ඩුවට මේ සම්බන්ධයෙන් වග කීමක් තිබෙන්නේ? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේවා අපි විපක්ෂයෙන් පත් කරපු කමිටු නොවෙයි. එතුමා කිව්වා හරි. තරගයක් තිබුණොත් ඒකට සල්ලි බලයෙන් වෙනත් පුද්ගලයන් පත් වෙන්නට පුළුවන්. හැබැයි මේකේ පාලනය තිබෙන්නේ කාටද? මේ සම්බන්ධයෙන් නීති ක්‍රියාත්මක කරන්න පුළුවන් කාටද? අපට නොවෙයි. ආණ්ඩුවක් වශයෙන් ඔබතුමන්ලාට මේ සම්බන්ධයෙන් පැහැදිලි නීති, අණ පනත් ගෙනෙන්න පුළුවන්; වටිනා කමිටුවක් ඇති කරන්න පුළුවන්. ගරු අර්ජුන රණතුංග මන්ත්‍රීතුමා කාලයක් ඒ කමිටුවේ සභාපති ධුරය දැරුවා. අද වන තුරු එතුමාට විරුද්ධව චෝදනාවක් නැහැ. ගරු නවින් දිසානායක අමාත්‍යතුමනි, එහෙම නම් ඔය ඔබතුමන්ලා සාකච්ඡා කරන කමිටුවට මෙවැනි සොරකම්වලින් තොර පුද්ගලයන් පත් කර ගන්න. ඒ කාලයේ ක්‍රිකට් ක්‍රීඩාව වෙනුවෙන් ඔබතුමාගේ පියා මොනතරම් කටයුතු කළාද කියන එක අපි දන්නවා. ඔබතුමා ගැනත් අපි දන්නවා. ඔබතුමාටත් පුළුවන් ඉදිරියේ දී මේ කටයුතුවලට හවුල් වෙන්න.

මේ ක්‍රීඩාව අද ලංකාවේ දූෂිත ක්‍රීඩාවක් බවට පත් වෙලා තිබෙනවා. අද මේ දූෂණය ඉහ වහා ගිහිල්ලා, මේ දූෂණය අද නවත්වා ගන්න බැරි වෙලා තිබෙන බව මම දන්නවා. ක්‍රිකට් ක්‍රීඩාවේ පමණක් නොවෙයි, අනෙක් ක්‍රීඩාවලත්. ඔබතුමා දන්නවා ඇති, ඔබතුමාගේ පියා එක්සත් ජාතික පක්ෂ රජයේ කටයුතු කළ

කාලයේ මලල ක්‍රීඩාව සම්බන්ධයෙන් කොතරම් දක්ෂයෝ මේ රටේ බිහි කළාද කියලා. අපේ ආණ්ඩු කාලයෙන් පසුව 1994, 1995, 1996 කාලයේත් එවැනි කට්ටිය බිහි වෙලා තිබෙන්න පුළුවන්. හැබැයි මේ අධ්‍යාපනය, මේ පුහුණුව ලබා දුන්නේ කවුද? අද මලල ක්‍රීඩාවේ මොන අංශයෙන්ද අපි ජයග්‍රහණය කරන්නේ? ලෝකය දියුණු වනවාත් සමඟම ඉතා විශාල ප්‍රමාණයක ජයග්‍රහණයක් අපේ ලංකාවට අත් කර ගන්නට තිබුණා, ගරු ඇමතිතුමනි.

මහින්දානන්ද අලුත්ගමගේ අමාත්‍යතුමාට අපි සුදු හුණු ගානවා නොවෙයි. සී.බී. රත්නායක ඇමතිතුමා ක්‍රීඩා ඇමතිවරයා වශයෙන් සිටි කාලයේ හොඳ ක්‍රියා පටිපාටියක් ඉදිරිපත් කළා. හැබැයි, ඉතා කෙටි කාලයකදී එම අමාත්‍යාංශය එතුමාගෙන් ඉවත් කර ගත්තා. ගරු ජනාධිපතිතුමාගෙන්, අදාළ ඇමතිවරුන්ගෙන් අපි ඉල්ලා සිටිනවා, එවැනි පත් කිරීමක් කරනකොට ඒ මන්ත්‍රීවරුන්ට, ඇමතිවරුන්ට ඒ ධුරය දරන්න යම් කාලයක් ලබා දෙන්න කියලා. මාස හයයි දෙන්නේ, musical chairs වාගේ වෙන වෙන අමාත්‍යාංශවලට මාරු කරනවා.

**ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා**
( மாண்புமிகு அருந்திக்க பர்னாந்து )
(The Hon. Arundika Fernando)
ඔබතුමන්ලාගේ කාලයේත් එහෙම නේ.

**ගරු සුජීව සේනසිංහ මහතා**
( மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
අපේ කාලය ගැන නොවෙයි නේ කථා කරන්නේ. ඔබතුමන්ලාගේ කාලය ගැන නේ. මෙතුමාටත් මොකක් හරි දෙන්න. මෙතුමාත් හොඳ දක්ෂ මන්ත්‍රීවරයෙක්. අපි කියන්නේ පත් කරන ඇමතිවරයාට අවුරුදු 3ක්, 4ක්, 5ක්, නැත්නම් අවුරුදු 6ක් දෙන්න. මොකද, එහෙම නැත්නම් වග කීමකුත් නැහැ. අමාත්‍යවරයෙකුට "ඔබතුමාගේ අමාත්‍යාංශය මෙහෙමයි" කියලා අපට කථා කරන්න විධියක් නැහැ. මොකද, එතුමා ඉන්නේ අමාත්‍යාංශයේ මාසයයි, දෙකයි. දක්ෂ මන්ත්‍රීවරුන් කිහිප දෙනෙක් සිටිනවා. වැඩියේ නැහැ. තුන් හතර දෙනෙක් ඉන්නවා. නවින් දිසානායක ඇමතිතුමා, ඒ වාගේම මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමා වාගේ කට්ටිය. අපි බලාපොරොත්තු වනවා, ඔබතුමන්ලා ඔබතුමන්ලාගේ දක්ෂතාවන් තුළින් කෙළින් සිට ගැනීමෙන් ආණ්ඩුවට වුණත්, ජනාධිපතිතුමාට වුණත් කෙළින් කථා කරලා, කෙළින් ක්‍රියා කරන්නට ඕනෑ ශක්තිය ඔබතුමන්ලාට තිබෙයි කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉදිරි අනාගතයේ දී ලංකාවේ ක්‍රීඩාව මේ දූෂණයෙන් ඉවත් කරලා, ලංකාවේ ක්‍රීඩාව මවා ගෙන කන එකක් බවට පත් වෙලා තිබුණු අතීතය ඈත් කරලා කටයුතු කරයි කියලා අපි බලාපොරොත්තු වනවා. යුද්ධයෙන් පසුව ඒ සඳහා අපට හොඳ අවස්ථාවක් ලැබිලා තිබෙනවා. මා ඇමෙරිකාවේ ශිෂ්‍යත්වයක් ලබා ගැනීමේ අවස්ථාවකට සහභාගී වුණා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ලංකාව ගැන අද ඇමෙරිකාව කථා කරනවා. ලංකාව සංචාරකයන්ට පැමිණෙන්ට පුළුවන් රටක් වශයෙන් පිට රටවල්වල අද ලංකාව ගැන කථා කරනවා. ඒ අවස්ථාව උදා කර ගෙන අපි කාලකණ්ණි වින්දනයක් ලබන්නේ නැහැ, ඔබතුමන්ලාගේ ආණ්ඩුව තිබෙන කාලයේ මේ ජයග්‍රහණය ලැබුණාය කියලා. ඉදිරියේදී අපට ආණ්ඩු කරන්න හරි ක්‍රීඩාව වාගේම ඔබතුමන්ලා -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩියක් තිබෙනවා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඉදිරියේදී ඉතා ඉක්මනින්, මා හිතන හැටියට තව අවුරුදු දෙකක්, තුනක් ඇතුළත අස්වර් මන්ත්‍රීතුමන්ලා අපේ පැත්තට එන දවසට, අපේ පැත්තට මාරු වන දවසට සජිත් ප්‍රේමදාස මැතිතුමන්ලාට, අපට මේ රට ආණ්ඩු කරන්න පුළුවන්. බංකොලොත් වෙලා තිබෙන මේ ආර්ථිකය, බංකොලොත් වෙලා තිබෙන ක්‍රීඩාව දක්ෂතා තුළින් යම් කිසි මට්ටමකට නංවන්න ඔබතුමන්ලාට හැකියාව, ශක්තිය ලැබේවායි කියා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා. ඊ ළඟට ගරු එස්.බී. දිසානායක අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

**ගරු එස්.බී. දිසානායක මහතා (උසස් අධ්‍යාපන අමාත්‍යතුමා)**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க - உயர் கல்வி அமைச்சர்)
(The Hon. S.B. Dissanayake - Minister of Higher Education)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාට බොහොම ස්තුතියි, මට මේ පුංචි වෙලාව ලබා දීම ගැන. ඒ වාගේම මගේ සහෝදර ක්‍රීඩා අමාත්‍යතුමාගේ විෂය වෙලාවේ බාහිර දේවල් ගැන කථා කරන්න සිදු වීම ගැන මම කනගාටු වනවා.

අපේ සහෝදර ගරු මන්ත්‍රීතුමා ක්‍රීඩාව ගැන කිව්වා. විමලදාස, සුනිල් ගුණවර්ධන, කෝසල සහබන්ධු සහ ප්‍රේමචන්ද්‍ර යන අය gold medals ලැබුවේ 1977 ආසියානු මළල ක්‍රීඩා තරගයේදීයි. ඊට පස්සේ 1977 සිට 1994 දක්වා එකම එක gold medal එකක්වත් ගන්න බැරි වුණා. ඒක අමතක කරන්න එපා. එකම එක gold medal එකක්වත් ගන්න බැරි වුණා. නැවත ආසියාවේ gold medals 10ක් එක වර ගත්තේ එස්.බී. දිසානායක ක්‍රීඩා ඇමති වශයෙන් සිටිකාලයේදීයි. ඒක අමතක කරන්න එපා. ඒ පොදුජන එක්සත් පෙරමුණු ආණ්ඩුව කාලයේදීයි. ඔබතුමන්ලාගේ දහසය අවුරුදු කාලයේදී gold medal එකක්වත් ගන්න බැරි වුණා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඒ කොයි කාලයේදීද, ඇමතිතුමා?

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
1977 සිට 1994 දක්වා කාලයේදී.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Gold Medal 10ක් ගත්තේ කොයි කාලයේදීද?

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
1996 දී. [බාධා කිරීමක්] අවුරුද්දෙන් නොවෙයි, අවුරුදු දෙකෙන්. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉඳ ගන්න කෝ. ඉඳ ගන්න. අවුරුදු දෙකෙන් සුගත් තිලකරත්නලා, ශ්‍රියානි කුලවංශලා - [බාධා

[ගරු එස්.බී. දිසානායක මහතා]

කිරීමක්] ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ නායකත්ව පුහුණු වැඩසටහන පිළිබඳව මේ ගරු සභාවේ විශාල උද්ඝෝෂණයක් තිබුණාය කියා මට මඟදී ආරංචි වුණා. ඒ ගැන මා ඉතා කනගාටු වනවා. දියුණු ලෝකයේ උසස් අධ්‍යාපනයට එන දරුවන්ට මානසික ඒකාග්‍රතාව හා ශාරීරික යෝග්‍යතාව තබා ගන්න එවැනි වැඩසටහන් කරනවා. අවාසනාවකට ඒක අපේ රටේ කළේ නැහැ. එයට ඔබතුමන්ලා වග කිව යුතු නැහැ. අපේ රටේ මොකක්ද කරන්නේ? ළමයින් විශ්වවිද්‍යාලයට ගියාම අපේ රටේ ජනතා විමුක්ති පෙරමුණ ඉස්සෙල්ලාම කරන්නේ ඒ ළමයින්ගේ ඇඳුම් ටික ගලවන එකයි. ඊට පස්සේ බඩ ගාවනවා. ගැහැණු ළමයින්ව දණ ගාවනවා; ඇඳන් යටට දමනවා. ඔවුන්ට අසූචි පොවනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අනුරාධපුරයේ භික්ෂු ශ්‍රාවක ධර්ම පීඨයට ගිය හාමුදුරුගොල්ලන්ට සති දෙකක් යන තුරු වැසිකිළි ගිහින් සෝදා ගන්න දුන්නේ නැහැ. සමහර විශ්වවිද්‍යාලවල සති දෙකක් යන තුරු ගැහැණු ළමයින්ට යට ඇඳුම් අඳින්න දෙන්නේ නැහැ. මේ මහා අන්ත, නිහීන, තුච්ඡ වධය දීලා මොකක්ද කරන්නේ? මේ දරුවන්ගේ පෞරුෂය බිඳිනවා. මේ දරුවන්ගේ එඩිතරකම බිඳිනවා. මේ දරුවන්ගේ කොන්ද කඩනවා. ඊට පස්සේ මේ දරුවන් එහෙයියන් හැටියට, "කිසි කෙනකුට තරග කරන්න බැහැ. අපි විතරයි තරග කරන්නේ" කියා ජේවීපී කියන එක අහනවා. Library එකට ගිහින් පැය දෙකකට වඩා ඉන්න බැහැයි කිව්වාම මේ ශිෂ්‍යයෝ ඒක අහනවා. වෙන මොනවා කරන්නද? මේ ශිෂ්‍යයන්ගේ කොඳු කඩලා, මනස කඩලා, පෞරුෂත්වය විනාශ කරලා ඉවරයි. ජේවීපී එක "අන්තරය" හරහා ඒ කටයුත්ත මාසයක් කරනවා. මේ දරුවන්ට කියනවා, "කථිකාචාර්යවරුන් එක්ක තනියම කථා කරන්න බැහැ. අපේ එක් කෙනකු එක්ක යන්න"යි කියලා. තනියම ගිහින් කථා කළොත් "නින්ජා" ගහනවා. මුහුණු වසා ගෙන ගිහින් අත පය කැඩෙන තුරු ගහනවා. කිසිම ළමයකුට library එකේ පැය දෙකකට වඩා ඉන්න දෙන්නේ නැහැ.

අද විශ්වවිද්‍යාලවල හුඟක් ඉංග්‍රීසි පාඨමාලා තිබෙනවා. හැබැයි විශ්වවිද්‍යාල ඇතුළේදී ළමයින්ට කිසිම හේතුවකට ඉංග්‍රීසියෙන් කථා කරන්න දෙන්නේ නැහැ. සමහර ආචාර්යවරු ඉන්නවා, CD එකෙන් නිබන්ධන දෙන්නේ. නමුත් ළමයින්ට CD එකෙන්, print form එකකින් එහෙම නැත්නම් type කරලා දෙන්න තහනම්. කොළ තුනකට වඩා ලියන්න තහනම්. කොහේටද මේ දරුවන් අඳින්නේ? මේ දරුවන් පුස්තකාලයෙන් එළියට ගන්නවා. අපි කියන ගුරු දේව, ගුරු මෑණි, ගුරු පියාගෙන් අඳිනවා. ඔවුන්ව හම්බ වෙන්න බැහැ. ඉංග්‍රීසි පන්ති යන්න බැහැ; ඉංග්‍රීසියෙන් කථා කරන්න බැහැ. කොහේටද මේ අඳින්නේ? මහ පාරට! මේ දරුවන් සම්පූර්ණයෙන්ම වහල්ලු වාගේ කියන දේ අහගෙන විශ්වවිද්‍යාලයේ ඉන්නවා. මේකද ශිෂ්‍යයන්ට හදන්න ඕනෑකම තිබෙන්නේ? අවංකවම අපේ දරුවෝ අවුරුදු දෙකක් නැත්නම් තුනක් මහා විශාල මානසික යුද්ධයක් කරනවා. බාහිර ක්‍රියාකාරකම් අත හැරලා, පවුලේ දේවල් අත හැරලා, පන්සල, පල්ලිය, කෝවිල අත හැරලා උදේ ඉඳලා සවස් වෙනකම් පාඩම් කරලා, පාඩම් කරලා ශිෂ්‍යයන් තුන්ලක්ෂ හැටපන්දහසකින් විසිදෙදහ අතරට එනවා. ඒක යුද්ධයක්. ඒක මානසික යුද්ධයක්. කීයද මේ දරුවන්ගේ වයස? අවුරුදු 17යි, 18යි, 19යි. ඒ මහා තරගයට එන දරුවාට මේ විභාගය පාස් වුණාට පස්සේ මානසික ප්‍රශ්න තිබෙනවා. ශාරීරික යෝග්‍යතාව පිළිබඳ ප්‍රශ්න තිබෙනවා. මේ දරුවන් හදිසියකටවත් ඒ අවුරුදු දෙකේ දුවලා නැහැ. මේ අයගේ ශරීර ශක්තිය, දරා ගැනීමේ හැකියාව, නමනීයත්වය කියන මේවා පිළිබඳ ප්‍රශ්න තිබෙනවා. මේ අයට මනසේ යම් යම් ප්‍රශ්න තිබෙනවා. මොවුන්ට ප්‍රශ්නයක් තේරුම් ගන්න බැහැ. රටේ බාහිර දේවල් පිළිබඳ කිසිම අවබෝධයක් නැහැ. මොවුන්ට ගැටලුවක් ආපුවාම මුහුණ දෙන්නේ කොහොමද කියලා දන්නේ නැහැ. එච්චරට ඒ අය තමන්ගේ පොතට, පාඩමට කොටු වෙලා. ඒ දරුවන් අපි මෙතැනට අරගෙන මානසික ප්‍රශ්නයක් ආපුවාම ඒක විසඳා ගන්නේ කොහොමද, සාමූහික ගැටලුවක් ආපුවම ඒක විසඳා ගන්නේ කොහොමද, ශරීර ශක්තිය දරා ගැනීමේ හැකියාව රඳවා ගන්නේ කොහොමද, කාමරය හරියට හදා ගන්නේ කොහොමද, කාමරය පිළිවෙළට තියා ගන්නේ කොහොමද, මනසට මානසික ප්‍රශ්නයක් ආවොත් ඒකට තිබෙන ප්‍රතිකර්ම මොනවාද කියන ඒවා ගැන කථා කරනවා. මේ දරුවෝ එක අන්තයකට ගිහිල්ලා පාඩම් කරන අය. සමහර තරුණයන්ට විශාල රෝග පීඩාදිය තිබෙනවා. සමහර විට ලිංගික ප්‍රශ්න. එහෙම වුණාම මේ දරුවන්ට මොකක්ද කරන්න පුළුවන්? මේවා ගැන කථා කරන්න ඕනෑ. මේකෙදී තුවක්කු දීලා වෙඩි තියන්න දෙන්නේ නැහැ ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ අයට බෝම්බ පත්තු කරන ක්‍රමය උගන්වන්නේ නැහැ. යුද ටැංකිවල දාලා යවන්නේ නැහැ. මට ඔබතුමන්ලා කියන්න, මේ හමුදා කඳවුරු හැරෙන්න ළමයින් 10,000ක් අරගෙන ගිහිල්ලා නවාතැන් අරගෙන පුහුණු කරන්න පුළුවන් වෙන කොහේද කියලා. මේකයි තිබෙන ප්‍රශ්නය. අද අපේ ඔය පුහුණු වන ස්ථානවලින් බූස්සේ හමුදා කඳවුර, කළුතර පොලිස් අභ්‍යාස විද්‍යාලය, ඒ වාගේම රන්දෙනිගල කඳවුර කියන ස්ථානවල පරිපාලන සේවා නිලධාරිනුත් පුහුණුව ලබනවා. CAS passවෙලා ගිය අය එතැන පුහුණු වෙනවා. එකම දේ වන්නේ ඒ අයගෙන් සල්ලි අය කරන එකයි. අපේ දරුවන්ගෙන් සල්ලි අය කරන්නේ නැහැ. කෑම ටිකට විතරක් අපි සල්ලි දෙනවා. පරිපාලන සේවයේ නිලධාරීන්, සැලසුම් සේවා නිලධාරීන්, පශ්චාත් උපාධි කරන වෛද්‍යවරු පුහුණු කරන්නේ කොහේද? කළුතර පොලිස් අභ්‍යාස විද්‍යාලයේ. අද අපේ 900ක් දරුවන් එතැන ඉන්නවා. දෙමළ, මුස්ලිම් දරුවෝ ඉන්නවා. මොකක්ද කරන්නේ? මේ අයට වෙලාවට නැඟිටින්න, එළියට ගිහිල්ලා ව්‍යායාම ටිකක් කරන්න, ප්‍රශ්නයක් ආපුවාම ඒ ප්‍රශ්නයට මුහුණ දෙන හැටි, ලෙඩක් හැදුණොත් ඒකට මුහුණ දෙන හැටි, ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා ලෝකයේ හදලා තිබෙන දියුණු කළමනාකරණ ක්‍රම -මේවා- ගැන කථා කරන්නේ. අපේ දරුවෝ hostelsවලට එනවා. ඔය තැන් තැන්වලින් කනවා. ඒ දරුවන්ට පෝෂණය පිළිබඳ ගැටලුවක් තිබෙනවා. මේ ගැටලුව විසඳා ගන්න විශේෂඥ වෛද්‍යවරු කියනවා මුදල් වියදම් නොකර කරන්න පුළුවන් දේවල් ගැන. හාල්මැස්සෝ ටිකක් හදා ගෙන, වෙරළු ගැට ටිකක් තම්බලා අච්චාරුවක් හදා ගෙන බෝතල්වලට දාලා තමන්ගේ කාමරයේ තියා ගෙන ඒ අයට අවශ්‍ය, අඩු වන ප්‍රෝටීන් ටික, අඩු වන කැලරීස් ටික ගන්න ක්‍රම කියලා දෙනවා. මේවායි කියලා දෙන්නේ මේ දරුවන්ට. ඊට අමතරව යෝගී ව්‍යායාම ටිකක් කියලා දෙනවා. මේ අයට භාවනා කරන්න ටිකක් කියලා දෙනවා. මේක වරදක්ද? අවුරුදු තුනක් මහා යුද්ධයක් කරලා, එහෙම නැත්නම් මහා විභාග පෙරළියකට ගිහිල්ලා මේ පුංචි දරුවන් තරමක් මානසික ආතතියකිනුයි ඉන්නේ.

පළමු වැනි දවසේ ගියාම දෙමාපියන් අපට බොහෝ දේවල් කිව්වා ගරු නියෝජ්‍ය කථානායකතුමනි. "Toilets හොඳ නැහැ" කිව්වා. "ළමයින්ව අරගෙන ගියා අපට බලන්නවත් හම්බ වුණේ නැහැ" කිව්වා. "ළමයින් කෑම ගන්න අව්වේ පෝලිමේ ඉන්න ඕනෑ"ය කිව්වා. අපි සමහර තැන්වලින් දරුවන් එහාට මෙහාට මාරු කරන්න බැලුවා. අද එක දරුවෙක් මාරු වෙන්නේ නැහැ. අද ඒ දෙමාපියන්ගෙන් එක් අයෙක්වත් අපට චෝදනා කරන්නේ නැහැ. ඉතාම හොඳයි කියනවා. මා විස්තර කියන්න කැමැති නැහැ. මේ පාර්ලිමේන්තුවේ වැඩ කරන කෙනකුගේ දරුවෙක් ඉන්නවා බූස්ස කෑම්ප් එකේ. දැන් මට ඇවිල්ලා කිව්වා. ඒ දරුවා අම්මට කථා කරලා කිව්වාලු "අම්මේ ගෙදරට වඩා හොඳයි" කියලා. "කෑමත් හොඳයි. අපිව ආරක්ෂා කරන්න සියලුම ආරක්ෂා කටයුතු තිබෙනවා" කිව්වාලු. "අපි ඉතාම සතුටින් ඉන්නවා" කියලා කිව්වාලු. මේක ඉතාම වැදගත්. මම තමුන්නාන්සේලාට කියන්න කැමැතියි, මේක දිහා අන්තවාදී විධියට බලන්න එපා කියලා. මේ වැඩසටහන ඇඳුම් ගලවලා ලිංගික ක්‍රියා කරලා, දරුවන්ට වධ දෙන එකක් නොවෙයි. මේ වැඩසටහන වෙඩි තියන්න පුරුදු කරන එකක් නොවෙයි. දරුවාගේ මනසේ ඒකාග්‍රතාව තියා ගන්න, ශරීර ශක්තිය තියා ගන්න ආදී වශයෙන් පාඩම් කරන්න අවශ්‍ය මූලික දේවල් මේ වැඩ සටහනින් කරන්නේ. ක්ෂිතිජයෙන් ඉහළට යන මහා විද්‍යාඥයන් බිහි කිරීම තමයි අපේ සිහිනය. මේ වැඩසටහන ඉවර වුණ ගමන් මොකක්ද

කරන්නේ? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ දරුවෝ සති තුනකින් ගෙදරට යනවා. ලංකාවේ මධ්‍යස්ථාන 300කින් ගෙදර ඉඳලා ගිහින් පරිගණක තාක්ෂණය සහ ඉංග්‍රීසි ඉගෙන ගන්න මාස තුනක් දෙනවා. ඒ, ගමේ ගෙදර ඉඳලා යන්න. ඊට පසුව මොකක්ද කරන්නේ? ඉන් පසුව ඉංග්‍රීසි දුර්වල දරුවන් 10,000කට ඇමෙරිකාවේ ඉඳලා දුරස්ථ අධ්‍යාපනය ලැබීම සඳහා ශිෂ්‍යත්ව 10,000ක් දෙනවා. මේක දිග වැඩ පිළිවෙළක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතෙක් අපි මොකද කළේ? මේ රටේ දරුවෝ 22,000ක් විශ්වවිද්‍යාලයට ගන්නවා. ඒ දරුවෝ අර ගෙන, අවුරුදු හතරකට පසුව මොකක්ද කරන්නේ? 10,000ක් එළියට එනවා. ඒ දරුවාට ඒ දරුවා බරක්. ඒ දරුවාට රක්ෂාවක් සොයා ගන්න බැහැ. ඒ දරුවා පවුලට බරක්. ඒ දරුවා පවුලේ බාල සහෝදරවරුන්ට බරක්. ඒ දරුවා රටට බරක්. ඔවුන් රැකියා විරහිත උපාධිධාරි සංගම් හදා ගන්නවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ඉලක්කය, මේ අවුරුද්දේ බඳවා ගන්න කිසිම දරුවෙකුට විශ්වවිද්‍යාලයෙන් එළියට එන කොට ඉංග්‍රීසි ගැටලුවක් වෙන්න බැහැ කියන එක. ඉතා හොඳින් ඉංග්‍රීසි භාෂාව හසුර වන, ඉංග්‍රීසි භාෂාවෙන් හදාරපු දරුවෙක් අපි එළියට දෙනවා. ඒ දරුවාට කිසිම විධියකින් තොරතුරු තාක්ෂණය, පරිගණක තාක්ෂණය පිළිබඳව අඩු පාඩුවක් වෙන්නේ නැහැ. ඉතාම ඉහළ මට්ටමකින් ඒ දරුවා එළියට දානවා. ඒ දරුවන්ට රක්ෂා සොයා ගන්න අමාරු නැහැ. ඊට පසුව ඒ දරුවෝ ඔබතුමන්ලාගේ පිටුපස්සේ එන්නේ නැහැ; මැති ඇමතිවරු පිටුපස්සේ එන්නේ නැහැ; රක්ෂා දෙන්න කියන්නේ නැහැ; රැකියා විරහිත උපාධිධාරි සංගම් හදන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක ලෝකයේ දියුණු අධ්‍යාපන විද්‍යාඥයෝ, ලෝකයේ දියුණු මනෝ විද්‍යාඥයෝ තරුණ වයසේ දරුවන්ව සැබෑ ප්‍රාඥයන් කරන්න, සැබෑ නායකයන් කරන්න, සැබෑ උගතුන්, බුද්ධිමතුන් කරන්න කර ගෙන යන නායකත්ව පුහුණු හා ධනාත්මක චින්තන වැඩසටහනක්. ඒ නිසා මේක තේරුම් ගන්න කියලා අපේ ගරු මන්ත්‍රීවරුන්ට මම කියන්න කැමැතියි. මේ වැඩසටහන හෙට දිනයේ මේ රට භාර ගන්න දරුවා නිවැරදි ලෙස ගොඩ නඟන්න දරන උත්සාහයක්. බොහොම ස්තුතියි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මීළඟට ගරු අර්ජුන රණතුංග මන්ත්‍රීතුමා.

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -[බාධා කිරීමක්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
එහෙම නම් මීළඟට ගරු හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපි සතුටු වෙනවා කාලයකට පසුව නැවත වතාවක් ක්‍රීඩාව ගැන යමක් කථා කරන්නට අවස්ථාවක් ලැබීම ගැන. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ක්‍රීඩාව ගැන ඉතාමත්ම හොඳින්, කිට්ටුවෙන් කටයුතු කළ පක්ෂයක් හැටියටත්, ක්‍රීඩාවට ඇඟිලි ගැසීම් අඩුවෙන්ම කළ පක්ෂයක් හැටියටත් එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් යමක් ප්‍රකාශ කිරීමේ අවස්ථාවක් ලබා දීම ගැන අපි මේ අවස්ථාවේදී ගරු අර්ජුන රණතුංග මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වනවා.

මුලින්ම කියන්නට ඕනෑ අපේ මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා ක්‍රීඩා ඇමති ධුරයට පත් වන අවස්ථාවේදී අපි විශාල සතුටක්, බලාපොරොත්තුවක් ඇති කර ගත්තාය කියලා. නමුත් අදත් එක්ක කල්පනා කරලා බලන කොට, මේ කෙටි ඉතිහාසය තුළ අපට එතරම්ම සතුටු වන්න පුළුවන්ද කියන ප්‍රශ්න රාශියක් පැන නැඟිලා තිබෙනවා. ඒ ප්‍රශ්නවලට මූලිකම හේතුව වුණේ මොකක්ද? සී.බී. රත්නායක මැතිතුමා ගැන ගොඩක් අය කථා කළා. එතුමා ගිය පන්තියට නොවෙයි මම හිතන හැටියට මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා tuition ගියේ. අපෙන් පැනපු ඇමතිතුමාගේ -හිටපු ක්‍රීඩා ඇමතිතුමාගේ- පන්තියට ගියාද කියලා පොඩි ප්‍රශ්නයක් තිබෙනවා. මොකද, අද වන විට අති විශාල ගැටලු රාශියක් නිර්මාණය වෙලා එළියට එන්න පටන් ගෙන තිබෙනවා. ඒ, විශේෂයෙන්ම ක්‍රීඩාංගණ පැත්තෙන් ගත්තාම. ඒ වාගේම ක්‍රිකට් ක්‍රීඩාව ගත්තත්, රගර් ක්‍රීඩාව ගත්තත්, හොකී ක්‍රීඩාව ගත්තත් මේ හැම ක්‍රීඩා ක්ෂේත්‍රයේම නොයෙකුත් විශාල ගැටලු සහගත තත්ත්වයන් ඇති වෙලා තිබෙනවා. රගර් ක්‍රීඩාව එක දේශපාලන නායකත්වයක් භාර අර ගෙන තිබෙනවා. රගර් ක්‍රීඩාවට IRB එකෙන් ලැබුණු සම්පූර්ණ funding එකවත් දැන් ලැබෙන්නේ නැති තත්ත්වයට පත් වෙලා තිබෙනවා. හරි නිලවරණයක් තියා ගන්න බැහැ. නිලවරණයක් තිබෙනවා. නමුත් දේශපාලන බලපෑම් තුළ තමන්ට ඕනෑ කෙනෙක් පත් වෙනවා.

ජාතික කණ්ඩායම තුළ - [බාධා කිරීමක්] ඒ ටික ඉදිරි කාලයේදී ඔබතුමා ස්ථාපිත කර පෙන්වයි කියා අප බලාපොරොත්තු වනවා. අපට ලැබී තිබෙන වාර්තා අනුව IRB එකෙන් දැනට funding එන්නේ නැහැ. Uva Province Rugby Football Union එකේ මම Vice-President. මා ඒ පළාතේ captain. නමුත් තවම අපට ශත පහක මුදලක් ලැබිලා නැහැ. අපට ඒ ගැන කථා කරන්න අයිතියක් තිබෙනවා. ඒ වාගේම ක්‍රිකට් ක්‍රීඩාව හා බද්ධ වුණු අතිවිශාල ප්‍රශ්න රාශියක් තිබෙනවා. දැන් ලෝක කුසලාන තරගාවලිය ඉවර වෙලා. ලෝක කුසලාන තරගයේ match එකක් බලා ගන්න ශ්‍රී ලංකාවේ අහිංසක අසරණ ජනතාව මොන තරම් දුක් වින්දාද කියන එක අප සියලු දෙනාම දන්නා කරුණක්. රුපියල් 100 ටිකට් එක කීයටද ගියේ කියා අපි දන්නවා. අද වන තුරු මේකට වග කියපු කිසි මනුෂ්‍යයෙක් ඔබතුමා ඉදිරිපත් කර තිබෙනවාද කියා අප කනගාටුවෙන් වුණත් මේ අවස්ථාවේදී අහන්න කැමැතියි.

ඉංජිනේරු සංස්ථාවට තමයි සියලු ක්‍රීඩාංගණ සංවර්ධනය කිරීම එහෙම නැත්නම්- [බාධා කිරීමක්] හරි. ඔබතුමා කියලා නැති වෙන්න පුළුවන්. නමුත් නිදසුනක් ලෙස ගත්තොත් මධ්‍යම ඉංජිනේරු කාර්යාංශය හරහා ලක්ෂ 750ක් පමණ වියදම් කොට පොළොන්නරුවේ ක්‍රීඩා සංකීර්ණය හැදුවත් එය ජාතික ක්‍රීඩා උළෙලක් පවත්වන්න සුදුසු ප්‍රමිතියට ගෙනෙන්න තවත් මිලියන 30ක් පමණ වියදම් කරන්න ක්‍රීඩා අමාත්‍යාංශයට සිදු වුණා. මේවා ජනතාවගේ සල්ලි. මුදල් ඇමතිවරුන්ගේ පෞද්ගලික බුදලයක් නොවෙයි. ඇත්ත වශයෙන්ම ඔබතුමන්ලා ලෝක ක්‍රිකට් කුසලාන තරගාවලිය පවත්වන්න සූරියවැව ක්‍රීඩාංගණයක් හැදුවා. පසු ගිය දවසක "ලංකාදීප" පත්තරේ තිබුණා, සූරියවැව ක්‍රීඩාංගණයට ක්‍රිකට් ගහන්න එන තරුණ ක්‍රීඩකයන්ට 4.30න් පසු සූරියවැව ටවුමට එන්න බස් එකක් නැහැ කියා. සූරියවැව ක්‍රීඩාංගණය රුපියල් කෝටි ගණනක් දීලා හැදුවා. නමුත් ගෙදර යන්න බස් එකක් නැහැ. [බාධා කිරීමක්]

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
බස් එකක් දමන්න තමයි හදන්නේ.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)

ඒක තමයි. ඔබතුමා බස් එකක් දමන්න. බස් එකක් දමන්න කියා තමයි ඔබතුමාට කියන්නේ. විපක්ෂයේ අපි දකින අඩු පාඩු පෙන්වා දුන්නාම ඔබතුමන්ලාට ඒවා නිවැරදි කර ගන්න පුළුවන්. ඔබතුමා රුපියල් මිලියන 60ක් පමණ වියදම් කර නාවලපිටියෙත් ක්‍රීඩාංගණයක් හැදුවා. ඒක හැදුවේත් ඔය කියන රජයේ ආයතනයමයි. දැන් මොකද වෙලා තිබෙන්නේ? ඒ ක්‍රීඩාංගණයේ වතුර පිරෙනවා. ප්‍රමිතියක් නැහැ. ඒ ප්‍රතිපාදනවලින් හරි සේවාවක් වුණාද කියා අතිවිශාල ගැටලුවක් තිබෙනවා, ගරු ඇමතිතුමනි. ඒ වාගේම ජනාධිපතිතුමා මුල් ගලක් තැබුවා ටොරින්ටන් ක්‍රීඩා සංකීර්ණයේ, ක්‍රීඩකයන්ගේ පහසුව සඳහා නැවත සංවර්ධනය කරන්න. ඒ මුල් ගල තවම පැළ වනවා. මුදල් ඇමතිතුමාගේ ගමට ගියා ඒ සල්ලි ටිකත් ඊට පස්සේ. ඒ නිසා කිසිම දෙයක් හැදුණේ නැහැ. ඒ වාගේම ඔබතුමන්ලාගේ ඉංජිනේරු සේවා ඇමතිතුමා බොහොම හොඳ දේශප්‍රේමියෙක්. මේ ක්‍රීඩාංගණ සංවර්ධන වැඩ කටයුතු කෙසේ වෙතත් එතුමා බැන් කී මූන්ගේ පස්සෙන් නම් දුවනවා. එතුමාට භාර දීලා තිබෙන වගකීම ඉටු කරන්නේ නැතුව "බැන් කී, බැන් කී" කිය කියා දුව දුව ඉන්නවා. ඔබතුමන්ලා යම්කිසි වැඩ කටයුත්තක් කරන්න භාර දීලා තිබෙනවා නම් එතුමාගේ දායකත්වය එන්න ඕනෑ භාර දීලා තිබෙන වගකීම සම්බන්ධවයි. එතුමා වෙසක් සමරන්න ගියේ ශ්‍රී මහා බෝධියටවත් එහෙම නැත්නම් මහියංගනයටවත් නොවෙයි. එතුමා UN එකට තමයි වෙසක් සිරිය නරඹන්න ගියේ. ලංකාවේ කොහේවත් ගියේ නැහැ. මහා සම්මතයේ භූමි පුත්‍රයා. ඒ ගියේත් ඩෙනිමක් ඇඳලා ලෙදර් ජැකට් එකක් එහෙම දමා ගෙන. නූතන තාක්ෂණය අනුවයි එතුමා එතැනට සම්බන්ධ වුණේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද ක්‍රීඩාවට අත් වෙලා තිබෙන ඉරණම ගැන කියන්න ඕනෑ. මා මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමාට බොහොම කැමැතියි. මේක දැළි පිහියෙන් කිරි කනවා වාගේ වැඩක්. ඔබතුමාට ක්‍රීඩාවට ආසා කරන ජනාධිපති කෙනෙක් ඉන්නවා, දරු පිරිසක් ඉන්නවා. සියලු පිරිස ක්‍රීඩාව ගැන බොහොම ආශාවක් තිබෙනවා.

එහෙත් අද අප දකිනවා ක්‍රීඩාවේ අතිවිශාල කඩා වැටීමක්. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා ඒ ගැන කිව්වා. පත්තරයක අවසාන පිටුව බලන්න බයයි, ඊළඟට තහනම් උත්තේජක අර ගෙන තිබෙන්නේ කවුද කියා පළ වෙලා ඇතියි කියා. අපේ ලංකාවේ නම ඒ තරමටම කෙලෙසෙන තත්ත්වයට පත් වී තිබෙනවා. ඉස්සර ලෝකය අපට ආදරය කළා. ශ්‍රී ලංකාව කියන පුංචි රට, ඉතාමත්ම ආඩම්බර රටක්. "පුංචි රටකින් එන ක්‍රීඩා කණ්ඩායමක්. අපි එතුමන්ලාට සලකන්න ඕනෑ" කියලා මතයක් තිබුණා. නමුත් මේ වාගේ නරක නාම අපේ ඇඟේ ගැවෙන්නට පටන් ගත්තොත් ඒ නම තව වැඩි කාලයක් රඳවා ගන්නට අපට හැකියාවක් නැති වේවිය කියලා මා තුළ ලොකු විශ්වාසයක් තිබෙනවා.

ගරු ඇමතිතුමනි, හොකී ක්‍රීඩාව පිළිබඳව තිබෙන අතිවිශාල ගැටලුව ගැනත් ඔබතුමා දන්නවා. මේ දවස්වල tour එකක් යන්න හදන බව ඔබතුමා දන්නවා ඇති. නමුත් ඒ දරුවන්ගේ tickets ටිකවත් අර ගෙන දෙන්න ක්‍රීඩා අමාත්‍යාංශයට බැහැ. ඒ තරමට මුදල් නැහැ. 2018 පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල ලංකාවේ පවත්වන්නට යනවාය කියනවා. හොකී ක්‍රීඩාවට බැංකොක් යන අයට ticket අර ගෙන දෙන්න අපට බැරි නම් අපි වාගේ ප්‍රශ්න රාශියක් තිබෙන රටක් මෙතරම් මුදල් කන්දරාවක් එක්ක සටන් කරන්නේ කොහොමද? ඒ නිසා ක්‍රීඩාවේ උන්නතිය සඳහා අඩුම ගණනේ ජාතික ලොතරැයි මණ්ඩලය තුළින් ක්‍රීඩාව නංවන ලොතරැයියක් හරි ඇති කරලා ඔබතුමා මේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට international exposure එකක් ලබා දෙන්න කටයුතු කරන්නය කියලා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මේක මගේ යෝජනාවක්.

අපේ රගර් ක්‍රීඩාව බලන්න. මොන තරම් කාලකණ්ණි ඉරණමක් ද අත් වෙලා තිබෙන්නේ? එක රගර් ක්‍රීඩකයෙක් ඉන්නවා, එයා ඒ ක්‍රීඩා කණ්ඩායමට ඇතුළත් වුණේ කොහොමද කියන එක ගැනත් ප්‍රශ්නයක් තිබෙනවා. එතුමාට වඩා හොඳ ක්‍රීඩකයෝ ඕනෑ තරම් ඉන්නවා. ඒක හරිම අසාධාරණයි.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ඊර්ෂ්‍යා කරන්න එපා.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)

ඊර්ෂ්‍යා කරන්නේ නැහැ. ඔබතුමාත් ක්‍රීඩකයෙක්. මමත් ක්‍රීඩකයෙක්. එතුමාගේ ක්‍රීඩා කෞශල්‍යා කොහොමද කියන එක ගැන අපි දන්නවා. ඒ නිසා ඔබතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා- [බාධා කිරීමක්] ඇමතිතුමනි, ඔබතුමාට මේකට උත්තර දෙන්න බැහැයි කියලා මම දන්නවා. මේ ගැන ඔබතුමාට කථා කරන්න බැහැ. මේ අවස්ථාවේ මම ඔබතුමාට අනුකම්පා කරනවා. මොකද, එතුමාට විරුද්ධව ඔබතුමාට යන්න බැහැ. ඔබතුමාට එතැනට යන්න බැහැ. ගරු ඇමතිතුමනි, බලන්න අපි රගර් කණ්ඩායමක් හදලා Five-Nation Tournament එකක් ගැහුවා. ඒ Five-Nation Tournament එකෙන් අපි වැටුණා. දැන් අපි ආයෙත් එළියට විසි වුණා. බලන්න, මේ කණ්ඩායම, කණ්ඩායමක් ලෙස ක්‍රීඩා කළේ මාසයකටත් අඩු කාලයක්. අඩුම ගණනේ එක international match එකක්වත් ගහන්න ලැබුණේ නැහැ. එක පාරට ජපානයට ගිහිල්ලා ගහපුවාම ලකුණු 90කින් කනවා. ඒකට හේතුව මොකක්ද? කණ්ඩායම් හැඟීමෙන් ක්‍රීඩා කරලා නැහැ. සාමාන්‍යයෙන් ක්‍රීඩකයන්ගේත් චිත්ත ධෛර්යය පිළිබඳව ප්‍රශ්න තිබෙනවා. හොඳට ක්‍රීඩා කරන්නේ කවුද, මේ ක්‍රීඩකයා මේ කණ්ඩායමට ඇතුළු වුණේ කොහොමද කියලා ක්‍රීඩකයෝත් දන්නවා.

දැන් බලන්න, උපුල් තරංග කියන ක්‍රීඩකයා ගැන අද පත්‍රයේ පළ වෙලා තිබෙන පුවෘත්තිය. ඒ පිළිබඳව මම ගොඩක් කලකිරුණා. ඔබතුමා හොඳ ක්‍රීඩා ඇමති කෙනෙක්. ඔබතුමා දක්ෂයෙක්. මම ඔබතුමාගේ අඩු පාඩු පෙන්වලා දෙන්නේ ඔබතුමාව තවත් දක්ෂයකු කරවන්නයි. ඔබතුමාගේ අඩු පාඩුකම් පෙන්නුවාම ඒකෙන් යම්කිසි මට්ටමක පන්නරයක් ලබා ගන්න ඔබතුමාට පුළුවන් නම් ඒක තමයි අපි ලබන ලොකුම වින්දනය.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සුගතදාස ක්‍රීඩාංගණය වැඩි දියුණු කිරීමට නැවත වරක් ටෙන්ඩර් කැඳවා තිබෙනවා. මේ ටෙන්ඩර්කරුවන්ගේ සුදුසුකම් ලෙස දක්වා තිබෙන්නේ මහා මාර්ග හදන අයට සහ වාරිමාර්ග හදන අයට පමණක් ඉදිරිපත් වන්නට පුළුවන් කියලායි. මහා ආතහුත කථාවක්. ක්‍රීඩාංගණ හදන අයට නොවෙයි, මහා මාර්ග සහ වාරිමාර්ග හදන ආයතනවලට විතරයි ටෙන්ඩර් දමන්න පුළුවන්. එතකොට මේක කරන්න ක්‍රීඩාංගණ හදන මිනිස්සු වන්න ඕනෑ නැහැ. කොහොමද ඒ දේ වුණේ? ඇමතිතුමනි, මේ කියන්නේ නරක දෙයක් නොවෙයි නේ. අපි මේවා මෙතැන කථා කළේ නැත්නම් කථා කරන්න වෙනත් තැනක් නැහැ. මේ වාගේ ලොකු වගකීම් භාර දෙන කොට ක්‍රීඩාංගණ හදන්න පුළුවන්කම තිබෙන, ක්‍රීඩාංගණ හදන්න දක්ෂතා තිබෙන, ඉතා සාර්ථකත්වයක් ගෙන දෙන්න පුළුවන් ආයතනවලට භාර දෙන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. අර හම්බන්තොට වරාය හදන සිනෝහයිඩ්‍රෝ කොම්පැනියම තමයි සූරියවැව ක්‍රීඩාංගණයත් හැදුවේ කියලා අපි දන්නවා. ඒකට මුදල් ගෙව්වේ කොහොමද, මුදල් ආවේ කොහෙන්ද, ගෙව්වේ කවුද ආදී වශයෙන් මේ පිළිබඳව විශාල ගැටලු රාශියක් තිබෙනවා. කොන්ක්‍රීට් වැඩවලට නම් මේ රජය දක්ෂයි. මේ රජය තරම් කොන්ක්‍රීට් වැඩවලට දක්ෂ

රජයක් නැහැ. හැබැයි, මේ කොන්ක්‍රීට් යන්නේ කොහාටද කියන එක පිළිබඳව අපට අද විශාල ප්‍රශ්නයක් තිබෙනවා. රටේ මේ වාගේ ප්‍රශ්නයකදී ඔබතුමන්ලා මේ විධියට කටයුතු කරන එක ගැන අපි කනගාටු වනවා.

මම දීර්ඝ වශයෙන් කථා කරන්න යන්නේ නැහැ. ගරු ඇමතිතුමනි, ඔබතුමාට මම කැමැතියි. ඔබතුමාගේ ජවය, ඔබතුමාගේ තිබෙන ආවේගය ක්‍රීඩාවට බොහොම හොඳයි කියලා මම පෞද්ගලිකව විශ්වාස කරනවා. ඔබතුමාට කලින් දවසකත් කිව්වා වාගේ මම පුංචි කථාවක් මතක් කරන්න කැමැතියි. එක වතාවක් දුටුගැමුණු රජතුමා රජ වාසල අත හැරලා බඩගින්නේ මහ මඟ යන කොට මහලු තැනැත්තෙක් දැකලා එතුමා දුටුගැමුණු කියලා දන්නේ නැතිව කිරිබත් පිඟානක් පිළිගැන්වූවාලු. මේ පාර්ලිමේන්තුවේ ඉන්න දුටුගැමුණු නොවෙයි, සැබෑ දුටුගැමුණු ගැනයි මම කථා කරන්නේ. ඉතින් මේ සැබෑ දුටුගැමුණු රජතුමා උණු කිරිබත් කාලා පුරුදු නැහැ. එහෙන් මෙහෙන් තැනින් තැනින් කොනහ කොනහා කන්න පටන් ගත්තාලු. එතකොට ඒ මහල්ලා කිව්වාලු, "ඇයි, මෙහෙම කන්නේ? උඹත් නිකම් දුටුගැමුණු යුද්ධ කරනවා වාගේ නේ කන්නේ" කියලා. මහල්ලා දන්නේ නැහැ, මේ දුටුගැමුණු රජතුමා තමයි කථා කරන්නේ කියලා. එතකොට රජතුමා ඇහුවාලු, "එහෙම නම් කොහොමද කන්නේ?" කියලා. එතකොට මහල්ලා කිව්වාලු, "එක පැත්තකින් අර ගෙන කාලා කාලා හරියට සම්පූර්ණ පිඟාන ඉවර කරන්න" කියලා. ඔබතුමාටත් මම ඒ නිදසුන මතක් කර දෙන්න කැමැතියි. එහෙන් මෙහෙන් කොනහ කොනහ කන්න යන්න එපා. එක තැනකින් පටන් ගන්න. මේ තිබෙන සියලු ප්‍රශ්න සම්පූර්ණයෙන් විසඳන්න පුළුවන් වන්න ඔබතුමාට ශක්තිය, ධෛර්ය, වාසනාව ලැබේවා! ලංකා ඉතිහාසයේ හොඳම ක්‍රීඩා ඇමති බවට පත් වන්නට ඔබතුමාට සියලු වරම් ලැබේවා යි කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වනවා. බොහොම ස්තුතියි.

**ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து )
(The Hon. Arundika Fernando)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ක්‍රීඩා අමාත්‍යාංශය සම්බන්ධයෙන් විරුද්ධ පාර්ශ්වය විසින් ඉදිරිපත් කර තිබෙන කල් තැබීමේ යෝජනාව සම්බන්ධයෙන් කරුණු දැක්වීමට අවස්ථාවක් මටත් ලබා දීම පිළිබඳව මම ස්තුතිවන්ත වනවා.

අපේ විරුද්ධ පාර්ශ්වයේ හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමන්ලා ඉතාමත් ද්වේශයෙන් කථා කළ ආකාරය ගැන කල්පනා කරද්දී මම ඉතාම කනගාටු වනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එක්සත් ජාතික පක්ෂයට වෙලා තිබෙන දේ ගැන පුදුම හිතෙනවා. ඩී.එස්. සේනානායකලා, ඩඩ්ලි සේනානායකලා බිහි කරපු එක්සත් ජාතික පක්ෂය අද වැටිලා තිබෙන තත්ත්වය ගැන කල්පනා කරද්දී මට හිතෙන්නේ ඒ.ජේ. රණසිංහලා තමයි අද එහි ඉතුරු වෙලා සිටින්නේ කියලායි. ඒ පක්ෂය ඒ වාගේයි කියලායි මට හිතෙන්නේ. එක්සත් ජාතික පක්ෂය අද නිවට, නියාලු, නින්දිත තත්ත්වයකට වැටිලා තිබෙනවා. ඒක තමයි පෙනෙන්නේ. ඒ කථාවලින් තේරෙන්නෙත් ඒ වාගේයි.

අපි පළාත් සභාවල වැඩ කරපු ඇමතිවරු, මන්ත්‍රීවරු. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි අවුරුදු ගණනාවක් තිස්සේ පළාත් සභාවලට බලය බෙදන්න කථා කරනවා; පළාත් සභා සහ මධ්‍යම රජය අතර සම්බන්ධීකරණය ගැන කථා කරනවා. හැබැයි මේ ක්‍රීඩා ඇමතිවරයා පත් වන තෙක් අපි දැක්කේ නැහැ, ක්‍රීඩා ඇමතිවරු පළාත් සභාවත් සම්බන්ධීකරණය කර ගෙන මේ ක්‍රීඩා අමාත්‍යාංශය ගෙන යන අන්දමක්. නමුත් පසු ගිය කාලයේ පළමුවන වතාවට අපි දැක්කා, මේ ක්‍රීඩා අමාත්‍යාංශයට පළාත් ක්‍රීඩා අමාත්‍යවරුන් කැන්දලා, පළාත් ක්‍රීඩා අමාත්‍යාංශවල ලේකම්වරුන් කැන්දලා නියම සම්බන්ධීකරණයක් ඇති කරලා තිබෙන අන්දම. ඒ වාගේම තමයි ක්‍රීඩා සංගම් පිළිබඳවත්. දේශපාලනඥයන්ට ක්‍රීඩා සංගම්වලට අත පොවන්නට දෙන්නේ නැතුව එතුමා විසින්ම ඒ අධීක්ෂණ කටයුතු කරමින්, සියලුම නිලධාරින් අලුතෙන් පත් කරලා ඒ නිලධාරින් එකතු කර ගෙන ඒ කටයුතු කර ගෙන යනවා. මම හිතන්නේ එතුමා වැඩ භාර ගන්න කොට මෙම අමාත්‍යාංශයේ වැඩ බලන නිලධාරින් හිටියා. දැන් ඒ වැඩ බලන නිලධාරින් අයින් කරලා ඒ අමාත්‍යාංශයේ එක එක ආයතනවලට හරිහමන් නිලධාරින් පත් කරලා අද ක්‍රීඩා අමාත්‍යාංශය යම් කිසි ගමනක් යනවා.

අද විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් කථා කරනවා, ක්‍රීඩාංගණ සෑදීම සම්බන්ධයෙන්. බලන්න ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සුගතදාස ක්‍රීඩාංගණය විතරයි අපට අවුරුදු ගණනාවක් තිස්සේ තිබුණේ. අද වන කොට හැම තැනම අලුතෙන් ක්‍රීඩාංගණ ඇති වෙලා. පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උත්සවය ලංකාවේ පවත්වන්නට ලැබෙනවා නම් ඒක අපේ රටට ලොකු භාග්‍යයක්. අපේ රට ගැන ලෝකය දැන ගත්තේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පොදු රාජ්‍ය මණ්ඩලීය සමුළුව මේ රටේ පැවැත් වූවාට පස්සේයි. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියට පින් සිද්ධ වන්නට ඒ සමුළුව මේ රටේ පවත්වන්න අපට පුළුවන් වුණා. පොදු රාජ්‍ය මණ්ඩලීය සමුළුව මේ රටේ පවත්වන්න අපට පුළුවන් වනවා නම්, පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උත්සවය මේ රටේ පවත්වන්න අපට පුළුවන් වනවා නම්, අවශ්‍ය ඒ මුදල් ටික සොයා ගෙන අපට ඒක කරන්න පුළුවන් නම් ඒක මේ රටට ලොකු ආයෝජනයක්. ඒක මේ රටේ අනාගත පරම්පරාව වෙනුවෙන් ලොකු ආයෝජනයක් ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒක නිසා අපි සුබවාදීව හිතනවා, මුදල් හම්බ වෙලා, අපි ඉල්ලා තිබෙන පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උත්සවය හම්බන්තොට පවත්වන්න පුළුවන් වෙයි කියලා.

ක්‍රීඩා ඇමතිතුමා අද වන කොට පිහිනුම් වාගේ ජාත්‍යන්තර ක්‍රීඩා ගමට ගෙන යන්න වැඩ කටයුතු කරලා තිබෙනවා. හලාවත, කුරුණෑගල වාගේ අපේ ප්‍රදේශවලට මේ පහසුකම් තිබුණේ නැහැ. ක්‍රීඩා ඇමතිතුමාගේ මැදිහත් වීම තුළින් මේ පහසුකම් අද අපේ ගම්වලට ලැබෙන්නට පටන් අරන් තිබෙනවා. හැම තැනම ක්‍රීඩාංගණ ඉදි වනවා. අපි දැකලා තිබෙනවා, සමහරක් ඒවායේ කිසි ප්‍රමිතියක් නැහැ; සම්බන්ධීකරණයක් නැහැ; අධීක්ෂණයක් නැහැ. අද වන කොට සම්බන්ධීකරණයත් සමඟ නියම තත්ත්වයක් යටතේ, නියම අධීක්ෂණයක් යටතේ සියලුම ක්‍රීඩාංගණ ඉදි වීම සිද්ධ වෙමින් පවතිනවා.

ක්‍රීඩා ඇමතිතුමාට අපි ගරු කරනවා. තමුන්නාන්සේට හොඳ විනයක් තිබෙනවා. ක්‍රීඩකයෙක් තහනම් උත්තේජක පාවිච්චි කරනවා නම් ඒ ක්‍රීඩකයා මොන තරම් දක්ෂ වුණත් ඒ ක්‍රීඩකයා පිළිබඳව තමුන්නාන්සේ ගත්තු තීන්දු -මංජු වන්නිආරච්චි ගැන වුණත් තමුන්නාන්සේ ගත්ත තීන්දුව- සම්බන්ධයෙන් අපි තමුන්නාන්සේට හිස නමනවා. කොච්චර දක්ෂතා තිබුණත් වැඩක් නැහැ, රටට අපකීර්තියක් වන, විනයක් නැති ක්‍රියාවලට ක්‍රීඩකයෝ යොමු වනවා නම්. ඒ පිළිබඳව තමුන්නාන්සේ නියමිත වේලාවේදී තීන්දු තීරණ ගන්න ඕනෑ. ඒ ගැන තමුන්නාන්සේ දිහා අපි බලා ගෙන ඉන්නවා.

ක්‍රීඩා සංගම් සම්බන්ධවත් අපි ඒ වාගේම හිතනවා. ක්‍රීඩා සංගම්ලට තමුන්නාන්සේගේ අමාත්‍යාංශය තුළින් උදවු උපකාර කරන්නට ඕනෑ වාගේම ඒ ක්‍රීඩා සංගම් ඇතුළේ තිබෙන විනය සම්බන්ධයෙනුත් බලන්න ඕනෑ. තමුන්නාන්සේ විසින් ඒ අයට නියම විනය පද්ධතියක් සකස් කර දී , ඒ තුළින් ඒවා නියමාකාර ගමනක් ගෙන යාවි කියා මම බලාපොරොත්තු වනවා.

ක්‍රිකට් ක්‍රීඩාව සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයෙන් තීන්දුවක් දීලා තිබෙනවා. මම හිතනවා, තමුන්නාන්සේ ක්‍රිකට් ක්‍රීඩාව සම්බන්ධයෙනුත් නියම ප්‍රජාතන්ත්‍රවාදී විධියට නිසි තත්ත්වයක් ඇති කරයි කියලා.

[ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි හිතනවා කාලයකට පස්සේ ජවසම්පන්න ක්‍රීඩා ඇමතිවරයෙක්, තරුණ ක්‍රීඩා ඇමතිවරයෙක් අපට ලැබී තිබෙනවාය කියලා. කැබිනට් නොවන විදුලිබල ඇමති වෙලා ඉන්න කාලයේ අපි දැක්කා එතුමා වැඩ කරපු ආකාරය. එතුමාට වෙලාවක් කලාවක් තිබුණේ නැහැ. ඉතාමත් හොඳින් වැඩ කරන ඇමතිවරයෙක්. අපි හිතනවා එතුමාට මේ ගමන ගෙන යන්නට පුළුවන් කියලා. ඒ වාගේම, ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු ඒ නිලධාරි මහත්වරුන්ට මේ අලුත් තත්ත්වයත් එක්ක වැඩ කරන මේ ඇමතිවරයාත් එක්ක නියමාකාරයෙන් මේ අමාත්‍යාංශයේ ජනතා සුබවාදී වැඩ පිළිවෙළකට යන්න පුළුවන් වෙයි කියලා මම හිතනවා. එහෙම නැත්නම් ක්‍රීඩකයන්ගේ සුබවාදී වැඩ පිළිවෙළක් එක්ක ජයග්‍රහණ ලබා ගැනීම සඳහා වැඩ පිළිවෙළකට යන්න පුළුවන් වෙයි කියලා මම හිතනවා. අපි කලකිරෙන්නට වුවමනා නැහැ. සුසන්තිකාලා, දර්ශලා, සුගත් තිලකරත්නලාගෙන් පස්සේ -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔබතුමාට ලැබී තිබෙන කාලය අවසානයි.

**ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து )
(The Hon. Arundika Fernando)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මගේ කථාව ඉවර කරනවා. මේ වතාවේ අපට ක්‍රිකට් ලෝක කුසලානය දිනා ගන්න බැරි වුණත් අපි අවසාන මහා තරගයට දෙපාරක්ම ආවා. 1996 දී ලෝක කුසලානය දිනුවා. අපේ අර්ජුන රණතුංග මැතිතුමා මෙතැන ඉන්නවා. එතුමාගේ දක්ෂ නායකත්වය තුළින් අපි දිනුවා. අපි හිතනවා ඒ වාගේ ක්‍රීඩකයන්ගෙන් ඒ වාගේ ක්‍රීඩාවලින් අපට ඉදිරියේදී ජයග්‍රහණ ලබන්න පුළුවන් කියලා. අපි ඒ ගැන සුබවාදීව බලමු කියන එක කියමින් මගේ කථාව අවසාන කරනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please! The Hon. Deputy Chairman of Committees will now take the Chair.

***අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு முருகேசு சந்திரகுமார்] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR] *took the Chair.*

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම විශේෂයෙන්ම අද අනුර දිසානායක මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා, මේ රටේ ක්‍රීඩාව හරහා ඇති වෙලා තිබෙන මේ කාලයට උචිත මාතෘකාවක් ගැන කථා කරන්න මෙම කාලය යොදවා ගැනීම ගැන. අජිත් පෙරේරා මන්ත්‍රීතුමා අතුරු පාලක මණ්ඩලයක් ගැන කථා කළා. එතුමා මේ අවස්ථාවේ මේ සභාවේ නැහැ. නමුත් මට ඉස්සෙල්ලා නවින් දිසානායක අපේ ඇමතිතුමා ඒ ගැන දැනුවත් කළා. මේ අතුරු පාලක කමිටු ආවේ ඇයි කියන එක ගැන පසු ගිය කාලවල මමත් මේ සභාවේ අනන්තවත් කියලා තිබෙනවා. ක්‍රිකට් 1996න් පස්සේ මුදලාලිකරණය වෙච්ච ක්‍රීඩාවක් බවට පත් වුණා. අපේ දිවංගත ගාමිණී දිසානායක මහත්මයා -නවින් දිසානායක මැතිතුමාගේ පියා- මම ගරු කරන මේ රටේ හිටපු ඇමති කෙනෙක්; ගරු කරන ක්‍රිකට් පාලක මණ්ඩලයේ හිටපු සභාපති කෙනෙක්; අපට නැති වෙච්ච සම්පතක්. එතුමා ඉන්න කාලයේ මේ ක්‍රිකට් ක්‍රීඩාව ටෙස්ට් වරම් ලබා ගෙන මෙතරම් දුරට ගෙනෙන්න එතුමා දමපු අඩිතාලම එක්ක තමයි අපි අද මේ ක්‍රීඩාව කරගෙන යන්නේ. නමුත් මම හිතන්නේ නවින් දිසානායක මැතිතුමාට මතක ඇති, අපි පළමුවැනි ටෙස්ට් තරගය ජයග්‍රහණය කරපු වෙලාවේ අවාසනාවකට වාගේ තමුන්නාන්සේගේ පියා ක්‍රීඩකයන්ට මුදල් දෙන්න හැම තැනම හිඟා කෑවාය කියන එක. අපට ඒ මුදල් ලබා දෙන්න එතුමා මොන තරම් මහන්සි වුණාද කියන එක මම තරුණ ක්‍රීඩකයෙක් හැටියට දැක්කා.

1996 ලෝක කුසලාන ජයග්‍රහණයෙන් පස්සේ මේ රටේ ක්‍රිකට් ක්‍රීඩාවට මුදල් එන්න පටන් ගත්තා. මෙන්න මේ වෙලාවේ තමයි මුදලාලි මාෆියාවට ක්‍රිකට් ක්‍රීඩාව හරහා තමන්ට නමක් හදා ගන්න අවශ්‍ය වුණේ. මේ මුදලාලිලා හැම දාම දන්නේ මුදලාලිලා හැටියට ඉන්න විතරයි. නමුත් ක්‍රිකට් ක්‍රීඩාව හරහා මේ ගොල්ලෝ ක්‍රිකට් ක්‍රීඩාවට ඇතුළු වුණාම මේ ගොල්ලන්ගේ නම ජාත්‍යන්තරයේත්, රූපවාහිනිය හරහාත්, මේ රටේත් ජනප්‍රිය වෙන තත්ත්වයකට පත් වුණා. අපේ අජිත් පෙරේරා මන්ත්‍රීතුමා දන්නේ නැහැ, මැතිවරණවලට ගිහිල්ලා, ක්‍රීඩා සමාජවල ඉන්න ඡන්දෙට එන කීප දෙනෙක්ව සතුටු කර ඒ ගොල්ලන්ට මුදල් දී එහෙම නැත්නම් වෙනත් වරප්‍රසාද දී කන්න බොන්න දී තවත් අමුතු අමුතු දේවල් දී ඒ ගොල්ලන්ට ඡන්දය ගහ ගන්න තමයි මේ මුදලාලිලා හිටියේ කියලා. මම නවින් දිසානායක ඇමතිතුමාත් එක්ක සියයට සියයක් එකඟ වනවා. මේ තත්ත්වය නැති කරන්න තමයි චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියගේ කාලයේ පළමුවැනි වතාවට ක්‍රිකට් අතුරු පාලක මණ්ඩලයක් ගෙනාවේ. මේ ක්‍රිකට් අතුරු පාලක මණ්ඩලයෙන් තමයි දැනටත් ක්‍රිකට් බේරිලා තිබෙන්නේ. මේ රටේ ඉන්න මුදලාලි මාෆියාව එක්සත් ජාතික පක්ෂය ඉන්න කාලයේ ඒ ගොල්ලන්ගේ නායකත්වයට දණ නමා ගෙන අඬ අඬා මේ ක්‍රිකට් ආයතනවලට රිංගුවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නැත්නම් පොදු ජන එක්සත් පෙරමුණ කාලයේත් එහෙමයි. මේ මුදලාලිලා දන්නවා හැම වෙලාවේම කාගේ හරි ඇඟේ එල්ලෙන්න. මොන ආණ්ඩුව ආවත් ඒ ගොල්ලෝ ඒ ආණ්ඩුවේ ඉන්නේ. [බාධා කිරීමක්] ඉන්න මම කියන්නම්. මේකට විසඳුම තමයි අතුරු පාලක මණ්ඩලය. අතුරු පාලක මණ්ඩලයකට මම එකඟ වෙන්නේ ඒකයි. නමුත් හරි අතුරු පාලක මණ්ඩලයක් ලබා දිය යුතුයි. අන්න එතැනදී තමයි අපි හැම දාම වරද්දා ගත්තේ. එක මන්ත්‍රීතුමෙක් ඒ ගැන කිව්වා. නවින් දිසානායක ඇමතිතුමනි, මම මාස 11ක් ක්‍රිකට් ආයතනයේ සභාපති වෙලා හිටියා. අද වනතෙක් මට විරුද්ධව කිසිම චෝදනාවක් ඔප්පු කර ගන්න බැහැ. මොකද, හොරකම් කළේ නැති හන්දා; හොරකම් නවත්වපු හන්දා. මට ගෙදර යන්න වුණේත් මම හොරකම් නවත්වපු හන්දා. හිටපු ක්‍රීඩා ඇමතිතුමාගේ මොකද්ද 25 වන සංවත්සරයක බිලක් ගෙවන්නත් මට කිව්වා. මේ වාගේ දේවල් මේ රටේ වුණා. එතැනදී එක්සත් ජාතික පක්ෂයද, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයද, ජනතා විමුක්ති පෙරමුණද කියන එක නොවෙයි වැදගත් වෙන්නේ. වැරදි, අනවශ්‍ය පුද්ගලයන් මේ තානාන්තරවලට යෙද වීම නිසා ක්‍රිකට් ක්‍රීඩාව හැම දාම අයාලේ ගියා. මට මතකයි ඒ ඇමතිතුමා මට කිව්වා, "ජයන්ත ධර්මදාස මහත්මයා හිටියා නම්, තිලංග සුමතිපාල මහත්මයා හිටියා නම් මගේ මේ බිල ගෙවනවා" කියලා. මම කිව්වා, "ඒ ගොල්ල කරන දේ කරන්න නොවෙයි මම ඇවිල්ලා ඉන්නේ, මම ඇවිල්ලා ඉන්නේ හරි දේ කරන්න" කියලා. ඊට මාසයක් යන්න කලින් මට ගෙදර යන්න වුණා. මෙන්න අපේ රටේ තත්ත්වය. ඒ වනකොට මම ආණ්ඩු පක්ෂයේ හිටපු මන්ත්‍රීවරයෙක්. ගරු නියෝජ්‍ය කාරක

සභාපතිතුමනි, මට කනගාටු මේ හොරකම් නවත්වන්න හදපු මට ඒ වෙලාවේදී අපේ ආණ්ඩුවෙන් කිසිම සහයෝගයක් නොලැබුණු එක ගැනයි. ඒකට ප්‍රධාන හේතුව වුණේ

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ඇතුළු සියලු දෙනාම මේ ඇමතිවරුන්ගේ හොරකම්වලට අනුබල දුන්නා මිස ඊට අවශ්‍ය කටයුතු කළේ නැති එකයි.

නවින් දිසානායක ඇමතිතුමා අහපු ප්‍රශ්නයට පිළිතුරක් හැටියට කියන්න ඕනෑ, ක්‍රිකට් අතුරු පාලක මණ්ඩලයක් හදනකොට හොරකම් කරන්නේ නැති, හරියට වැඩ කරන්න පුළුවන්, ක්‍රිකට් ක්‍රීඩාවට ආදරය කරන පුද්ගලයන් පත් කළොත් මේ තත්ත්වයෙන් බේරෙන්න පුළුවන් කියන එක. නමුත් නැවත වරක් නිලවරණයකට ගියොත් වෙන්නේ අර කට්ටියම නැවත වරක් පත් වෙලා, ඒ හොරකම් ඒ විධියටම කරන එකයි. නවින් දිසානායක ඇමතිතුමනි, දඹුල්ලේ ඉන්නවා push bicycle එකෙන් ගිය පුද්ගලයෙක්. අද ඔහු ඉඩම් හිමි ව්‍යාපාරිකරුවෙක්. නුවරත් එවැනි පුද්ගලයෙක් ඉන්නවා. බෙන්ස්වල තමයි යන්නේ. මම ක්‍රිකට් ගහන කාලයේ push bicycle වලින් ගිය අය. ක්‍රිකට් මුදලාලිකරණය වීම හරහා සල්ලි අරගෙන ඒ ගොල්ලන් පෝෂණය වුණ එක තමයි වුණේ. ඒ මිසක් ක්‍රිකට් ක්‍රීඩාව සංවර්ධනය වීමක් වුණේ නැහැ.

ක්‍රිකට් ක්‍රීඩාවේ තත්ත්වය පහත වැටී නැහැ කියලා නවින් දිසානායක ඇමතිතුමා කිව්වා. මම ඒකට එකඟ වෙනවා. ක්‍රිකට්වල තත්ත්වය පහත වැටිලාද නැද්ද කියලා අපි බලන්න ඕනෑ කණිෂ්ඨ කණ්ඩායම්වල -'ඒ' කණ්ඩායම්වල- තත්ත්වය අනුවයි. මම කියන්න සතුටුයි ලෝක කුසලාන තරගයේදී ක්‍රීඩා කරපු ක්‍රීඩකයන් කිහිප දෙනෙක් මම ක්‍රිකට් ගහන කාලයේත් ක්‍රීඩා කළ බව. මම ක්‍රිකට් ක්‍රීඩාවෙන් විශ්‍රාම ගිහින් මේ වනකොට අවුරුදු 10ක් විතර වෙනවා. නමුත් එදා දමපු අඩිතාලම තවමත් දියත් වෙමින් යනවා. නමුත් අවාසනාවකට වාගේ අද පාසල්වල ක්‍රිකට් සංවර්ධනයක් නැහැ. පාසල් ක්‍රිකට් දිහා බලන්නේ නැහැ. මෙවැනි ප්‍රශ්න ගොඩකට අපට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා.

ඒ වාගේම එතුමා විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට කිව්වා, චෝදනා විතරක් ඉදිරිපත් කරන්න එපා කියලා. අපේ නව ක්‍රීඩා ඇමතිතුමාත් සිටින මේ වෙලාවේ මම මේ කරුණු කියන්න ඕනෑ. මම හරිම කැමැති පුද්ගලයෙක් තමයි එතුමා. එතුමා මගේ මිත්‍රයා. මම එතුමා අමාරුවේ දමන්න යන්නේ නැහැ. මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඔබතුමා කර ගෙන යන විධියටම කටයුතු කරන්න කියලා. ඔබතුමාට මතක ඇති, මම අදාළ files කිහිපයක් ඔබතුමාට ගෙනැවිත් දුන් බව. ඊට පෙර, ජනාධිපති විමර්ශන අංශයටත් ඒ හොරකම්, දූෂණ සම්බන්ධ files බාර දීලා තිබෙනවා. නමුත් අද වනතෙක් ඒවාට කිසිම දෙයක් වුණේ නැහැ.

මම 2001 දී පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැටියට ආවා. මම මෙතැනට එන්න ප්‍රධානම හේතුව වුණේ මේ රටේ මහජනතාව මාව තේරුම් අරගෙන මාව මෙතැනට පත් කිරීමයි. කොළඹ දිස්ත්‍රික්කයේ ඇමතිවරු ගණනක් ඉදිද්දී ඒ ගොල්ලන්ටත් ඉහළින් මාව මෙතැනට එව්වේ ක්‍රිකට් ක්‍රීඩාව ආරක්ෂා කරන්නයි. නමුත් අපි ක්‍රීඩාව ආරක්ෂා කරන්න හදනකොට අවාසනාවකට වාගේ හිටපු ඇමතිවරු ඒක ආරක්ෂා කරන්න අවශ්‍ය සහාය ලබා දුන්නේ නැහැ.

හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා ටිකට් ගැන කිව්වා. ලෝක කුසලාන තරගාවලියේ ටිකට් ගැන ලොකු ප්‍රශ්නයක් තිබුණා. මම හිතන හැටියට ඇමතිතුමාත් ඒ ගැන ලොකු ඕනෑකමකින් තීරණ වගයක් ගත්තා. ඔය රුපියල් 100 ටිකට්, රුපියල් 10,000ට හරි, රුපියල් 5,000ට හරි විකුණුවේ ක්‍රිකට් ආයතනය ඇතුළේම ඉඳ ගෙනයි. ක්‍රිකට් ආයතනය අසල එළියේ වාහන නවත්වා ගෙන ටිකට් විකුණනවා. ටිකට් පොත ඉවර වුණාම උඩට දුවලා ආපසු ටිකට් අරගෙන එනවා. මේ රටේ මේ වාගේ දේවල් සිද්ධ වුණා. ඉතින් මේවා නවත්වන්නේ කොහොමද? නවත්වන්න බැහැ. මේවා නවත්වන්න ඕනෑ නම් හරි පුද්ගලයන් ඒ තැන්වලට යවන්න ඕනෑ. ඒකයි මම කියන්නේ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ක්‍රීඩාව විනාශ වෙලා තිබෙන එක ගැන මේ පාර්ලිමේන්තුවේදී කතා කරලා එලක් තිබෙනවාද කියලා. 2001 ඉඳලා පාර්ලිමේන්තුවේදී මේ දූෂිතයන්ව නම් කරලා කතා කරලා තිබෙනවා. අදාළ සියලුම දේවල් කරලා තිබෙනවා. හිටපු ඇමතිවරු කිසිම කෙනෙක් ඒවා ඇහුවේ නැහැ. නමුත් මම බලාපොරොත්තු වෙනවා, මගේ මිත්‍ර - මිත්‍ර කිව්වොත් ගරු ඇමතිතුමනි, ඔබතුමාට ප්‍රශ්නයක් වෙයිද දන්නේත් නැහැ- අපේ අලුත් ක්‍රීඩා ඇමතිතුමා මේ වැඩ කොටස හරියට කළොත්, -

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
දැන් කියලා ඉවරයි නේ.

**ගරු අර්ජුන රණතුංග මහතා**
( மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
මම හිතන හැටියට ජනාධිපතිතුමාත් දන්නවා ඔබතුමාගේයි මගේයි තිබෙන මිත්‍රකම ගැන. ඒක හන්දා ඒක ඒ තරම් ප්‍රශ්නයක් වෙන එකක් නැහැ. ඔබතුමාගෙන් මම ඉල්ලා සිටින්නේ මේ කරන දේවල් හරි විධියට හොයලා බලලා කරන්න කියන එකයි. නැත්නම් ඔබතුමාවත් කඩේ යවන කට්ටියක් තමයි ක්‍රිකට් ආයතනයේ ඉන්නේ.

විශේෂයෙන්ම මම මේ අවස්ථාවේ මතක් කළ යුතුයි අපේ තවත් හිටපු ක්‍රීඩා ඇමතිවරයකු වන ගරු සී.බී. රත්නායක ඇමතිතුමා ගැන. එතුමා ක්‍රීඩා ඇමතිවරයා වශයෙන් පත් වෙලා ඉතා දැඩි ප්‍රකාශයක් කළා. එතුමා ඇත්ත කිව්වා. එතුමා කිව්වා "ක්‍රිකට් ආයතනය මේ රටේ තිබෙන තුන් වැනි දූෂිත ආයතනය" කියලා. මම හිතන්නේ ඒක වැරදියි. මම හිතන්නේ ඒක පළමුවෙනි දූෂිත ආයතනය කියලායි. ඒක දූෂිත ආයතනයක් කියපු හන්දා තමයි එතුමාට ගෙදර යන්න වුණේ. ඇයි එතුමාට ගෙදර යන්න වුණේ? ඒ දූෂිත ආයතනයේ පත්වීම් කරලා තිබෙන්නේ මේ රටේ_

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ඉතින්

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ඒ අය පත් කරලා තිබියදී ඇමතිතුමා කිව්වා නම් ඒ අය දූෂිතයි කියලා එතුමාට ගෙදර යන්න සිද්ධ වෙනවා. ඉතින් එතුමාට ඒ දේ සිද්ධ වුණා. අපි එතුමාට ගරු කරන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි එතුමා පාර්ලිමේන්තුවට ආපු වෙලාවේ අපි එතුමාට කියා සිටියා, "ඔබතුමා හරි දේ කරන්න, විපක්ෂයක් හැටියට අපි සියලු දෙනා එකතු වෙලා ඔබතුමාව ආරක්ෂා කරනවා" කියලා. මම අද කනගාටු වෙනවා, දුක් වෙනවා අපිට විපක්ෂයක් හැටියට එතුමාව ආරක්ෂා කර ගන්න බැරි වෙච්ච එක ගැන. එතුමාට ඒ තත්ත්වය ඇති වුණේ එතුමා ඇත්ත කියපු නිසායි. නමුත් අද ක්‍රීඩාව

[ගරු අර්ජුන රණතුංග මහතා]

වෙනුවෙන් තරුණ ඇමතිවරයෙක් ඇවිල්ලා ඉන්නවා. එතුමා අපි කැමැති ඇමතිවරයෙක්. අපි බලා ගෙන ඉන්නවා එතුමා කොහොමද මේ ක්‍රිකට් ආයතනය දිහා බලන්නේ කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද මේ ක්‍රිකට් ආයතනයේ 300කට අධික සේවක පිරිසක් ඉන්නවා. 2008 දී මම මේ ආයතනයට ගිය වෙලාවේ ඒ work chart එක අරගෙන බලලා මේ පිරිස කොහොමද අඩු කරන්නේ කියලා බැලුවා. කොටින්ම කියනවා නම් මේ ආයතනයේ හිටපු ප්‍රධානියකුට secretary කෙනෙක් හිටියා. ඒ secretaryට තව secretary කෙනෙක් හිටියා. මේක මම ලෝකයේ කොහේවත් දැකලා නැති දෙයක්. ඉතින් මෙවැනි තත්ත්වයක් පාලනය කරන්නේ කොහොමද කියලා අපි සැලසුම් කරමින් සිටියා. ක්‍රිකට් ආයතනයේ රැකියාව කරන්නේ කොන්ත්‍රාත් පදනම මතයි. කොන්ත්‍රාත් පදනම මත රැකියාව කරන කොට හුඟක් දුරට වන්නේ එන එන ඇමතිවරයාව සන්තෝෂ කරන්න ක්‍රිකට් ආයතනයේ රැකියා කීපයක් ඇමතිවරයාට දෙන එකයි. ඒ ඇමතිවරයාගේ ඥාතියකුට, එහෙම නැත්නම් ලේකම්වරයාගේ ඥාතියකුට රැකියා දෙනවා. මම දන්නවා මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමාටත් මේ ගුලිය දුන්න බව. එතුමා ඒ ගුලිය ගිල්ලේ නැහැ. නමුත් හුඟක් ඇමතිවරු මේ ගුලි ගිල්ලා; ලේකම්වරු ගිල්ලා. දැන් අපට හොඳ අලුත් ක්‍රීඩා ලේකම් කෙනෙක් ඇවිල්ලා ඉන්නවා. මේ දෙපළ තවම ඒ ගුලි ගිල්ලේ නැහැ. ඒ නිසා ඒ දෙපළට තවම මේ වැඩේ හරියට කර ගෙන යන්න පුළුවන්. අපි ආයතනයේ ප්‍රධානින් සමඟ සාකච්ඡා කරලා මේ ගොල්ලන්ව අයින් කරන්න හැදුවා. කොන්ත්‍රාත් ඉවර වෙන කොට නුසුදුසු පුද්ගලයන්ව, අනවශ්‍ය පුද්ගලයන්ව අයින් කරන්න හැදුවා. මේ සියලු දෙනාම හිටපු ක්‍රීඩා ඇමතිතුමා -ගාමිණී ලොකුගේ ඇමතිතුමා- ළඟට ගිහිල්ලා ඒක නවත්වලා දැම්මා. අද 300කට වැඩි පිරිසක් මේ ක්‍රිකට් ආයතනයේ ඉන්නවා ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මේ ක්‍රිකට් ආයතනයේ හැම දාම සිද්ධ වුණේ, එන ඇමතිවරුන් එහෙම නැත්නම් ආණ්ඩුවේ බලධාරින් සන්තෝෂ කර කර කර ඒ ගොල්ලන් හරහා ඒ නිලධාරින්ගේ ඥාතීන් ආයතනයට යෙදවීමයි.

දැනට ක්‍රිකට් ආයතනයේ සේවකයන්ට වැටුප් සඳහා මාසයකට රුපියල් මිලියන 22ක් ගෙවන්න සිද්ධ වෙලා තිබෙනවා. මා හිතන්නේ නැහැ මෙච්චර සේවක පිරිසක් ඉන්න ක්‍රිකට් ආයතනයක් ලෝකයේ කිසිම තැනක ඇති කියලා. මේ තරම් පොඩි රටක ක්‍රිකට් ආයතනයේ මේ තරම් සේවකයන් හිටියාට හරි වැඩක් වෙනවාද කියන එක තමයි ප්‍රශ්නය හැටියට තිබෙන්නේ. ඉතින් මම අපේ ගරු ඇමතිතුමාගෙන් කරුණාවෙන් ඉල්ලනවා මේ ගැන හොයලා බලලා අඩුම ගණනේ කොන්ත්‍රාත් ඉවර වෙන කොටවත් අනවශ්‍ය සේවකයන් ඉවත් කරන්න සුදුසු පියවරක් ගන්න කියලා. අපට ළඟදී ආරංචි වුණා දැන් marketing එකටත් අලුතින් අරගෙන තිබෙනවා කියලා. කරන marketing එකකුත් නැහැ. ක්‍රිකට් ආයතනයේ තිබෙන දේ කකා බිබී ඉන්නවා මිස එවැනි දේවල්වලට අත පොවන්න යන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2011 වර්ෂයේදී පැවැත් වුණු ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලියේදී ක්‍රිකට් ක්‍රීඩාංගණ ගැන අප කථා කළා. මේ ක්‍රීඩාංගණ ගැන කථා කරන කොට මට එක කාරණයක් මතක් වෙනවා. 2008 දී මම සභාපති වෙලා ඉන්න කොට ලෝක ක්‍රිකට් කවුන්සිලයේ රැස්වීමේදී මම කියා සිටියා, අපට මුදල් ප්‍රශ්නයක් තිබෙනවා, ඒ නිසා එක ක්‍රීඩාංගණයක් අපි හොඳ විධියට හදනවා කියලා. අපි බලාපොරොත්තු වුණේ ඩොලර් මිලියන තුනක් වාගේ මුදලක් යොදවලා ආර්. ප්‍රේමදාස ක්‍රීඩාංගණය නවීකරණය කරන්නයි. මොකද අපිට වැඩි සෙනඟක් ගෙන්වා ගන්න අවශ්‍යව තිබුණ නිසා. අපි බලාපොරොත්තු වුණා වැඩි වියදමක් නොකර ඒ ක්‍රීඩාංගණය හදලා ඊට අමතරව තව සාමාන්‍ය ක්‍රීඩාංගණයක් අනික් පොඩි තරගවලට ලබා දෙන්න. ලෝක ක්‍රිකට් කවුන්සිලයේ ඒ මහත්වරු අපිත් එක්ක ඒකට එකඟ වුණා. නමුත් අවාසනාවකට වාගේ ක්‍රිකට් ආයතනයේ මගේ සේවය ඉවර වුණාට පස්සේ ක්‍රිකට් ක්‍රීඩාංගණ තුනක් මේ රටේ ඇති කළා.

ආර්. ප්‍රේමදාස ක්‍රීඩාංගනය නවීකරණය කරනවා නොවෙයි, මුළුමනින්ම බිමට දාලා නැවත වරක් අලුතෙන්ම එම ක්‍රීඩාංගනය හැදුවා. ඒ වාගේම තමයි, පල්ලේකැලේ ක්‍රීඩාංගනය සකස් කරලා තිබෙනවා. ඒ වාගේම තමයි සූරියවැව ක්‍රීඩාංගනය; ජනාධිපතිතුමාගේ ආසනයේ තිබෙන ක්‍රීඩාංගනය. එතුමා සන්තෝෂ කිරීම සඳහා එතුමාටත් ක්‍රීඩාංගනයක් හදලා දුන්නා. සූරියවැව ක්‍රීඩාංගනය ගැන මම ඉන්න කාලයේත් සාකච්ඡා කළා. මම ගිහින් එතුමාට පෙන්වලා දුන්නා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ පැත්තේ කවුරුවත් ක්‍රීඩා කරන්නේ නැහැ. ඉස්කෝල නැහැ. ඒ ප්‍රදේශයේ කොහොමද ක්‍රිකට් දියුණු කර ගන්න ඕනෑ කියලා අපි එතුමාට කිව්වා. නමුත් අවාසනාවකට වාගේ, මුදලාලිලාත් සැහෙන පිරිසක් ඉන්නවා; ඒ ගොල්ලෝ මුල් ගල තියලා ක්‍රීඩාංගන තුනක් හදලා තිබෙනවා. ක්‍රීඩාංගන හරි ලස්සනයි. කවුද කිව්වා ක්‍රීඩාංගන හොඳට හදලා තිබෙනවාය කියලා. නවීකරණය හොඳයි; AC තිබෙනවා. ගරු ඇමතිතුමනි, නමුත් එම ක්‍රීඩාංගන හදන්න අද වන විට රුපියල් බිලියන 7.8ක මුදලක් වියදම් කරලා තිබෙනවා. එම ක්‍රීඩාංගන හදන්න මේ අය මෙතරම් මුදලක් වැය කර තිබෙනවා. ඉස්සෙල්ලාම එම ක්‍රීඩාංගන හදන්න පටන් ගන්න කොට ඒවාට estimate කරලා තිබුණේ රුපියල් බිලියන 3.5යි. නමුත් ඉවර වෙන කොට රුපියල් බිලියන 7.8ක් දක්වා ගිහිල්ලා තිබෙනවා. මම හිතන්නේ ඒකට ප්‍රධානම හේතුව වෙලා තිබෙන්නේ මේකයි. එම ක්‍රීඩාංගන හදන්න tender පටිපාටියකින් තොරව රාජ්‍ය ආයතනයකට ලබා දෙන්න පුළුවන්. රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව අයිති ඇමතිතුමා හිටියා නම් මම එතුමාටත් කියනවා මේ ගැන සොයලා බලන්න කියලා. ඒ හරහා එක එක පෞද්ගලික ආයතනවලට, තමන්ගේ හිතවතුන්ට කොන්ත්‍රාත් ලබා දීලා තමයි ඒ වියදම එතරම් ගණනකට ගිහිල්ලා තිබෙන්නේ. විශේෂයෙන්ම රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, වරාය අධිකාරිය හරහා තමන් දන්න දන්නා අයට tenders ලබා දීලා තිබෙනවා. පසු ගිය කාලයේ ක්‍රිකට් ආයතනය එම ක්‍රීඩාංගන හදන්න මුදල් ලබා දුන් චෙක්පත් කාටද ලබා දුන්නේ කියලා අපට වාර්තාවක් ලබා දෙන්න කියලා ගරු ඇමතිතුමනි මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. එතකොට අපට සොයා ගන්න පුළුවන් ඒ tenders කාටද ලබා දුන්නේ කියලා. හැබැයි තමුන්නාන්සේ පොඩ්ඩක් පරිස්සම් වෙන්න. ඒ ගිහිල්ලා තිබෙන සමහර ඒවා තමුන්නාන්සේට ප්‍රශ්නයක් වෙන්නත් පුළුවන්.

අද ක්‍රිකට් ආයතනයේ ඉන්න අය කියනවා මම අහලා තිබෙනවා, ක්‍රිකට් ක්‍රීඩාව ව්‍යාපාරයක් කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට නම් ක්‍රිකට් ක්‍රීඩාව ව්‍යාපාරයක් වුණේ නැහැ. ආදරයෙන් ක්‍රීඩා කරලා මේ රටට ගෞරවයක් ගෙනෙන එක තමයි අපට තිබුණේ. නමුත් අද මේ ක්‍රීඩාව පාලනය කරන හැමෝටම මේක ලොකු ව්‍යාපාරයක් වෙලා තිබෙනවා. ඒකට ප්‍රධානම හේතුව වෙලා තිබෙන්නේ මුදල. ක්‍රිකට් ආයතනයේ සිටින මහත්වරුන්ගෙන් මම අහන්න කැමැතියි, තමන්ගේ මෙවැනි ලොකු මුදලක් ව්‍යාපාරයකට ආයෝජනය කරනවාද කියලා කවදාද ඒවාට return එක හම්බ වෙන්නේ කියලා දන්නේ නැතිව. අවුරුදු 200කින් වත් එම ක්‍රීඩාංගනවලින් ලාභයක් ගන්න අපට පුළුවන් වෙන්නේ නැහැ. ලස්සන බලන්න කාට කාට හරි පෙන්වන්න, විදේශිකයන්ට පෙන්වන්න මේක ඉතාමත් හොඳ දෙයක්. නමුත් ඒක නොවෙයි අවශ්‍ය වෙන්නේ. ක්‍රීඩාංගන හදනවා නම් හදන්න ඕනෑ සාමාන්‍ය පාසල්වල ක්‍රීඩාංගන හැටියටයි. උතුරු නැඟෙනහිර ඉඳලා දකුණ දක්වා ක්‍රීඩාංගන හදලා ක්‍රීඩාව දියුණු කරනවා මිස, ජාත්‍යන්තර ක්‍රීඩාංගන හදලා බොරු show එකක් කරන එක නොවෙයි අපට අද වැදගත් වෙලා තිබෙන්නේ. ඒ වාගේම මෙපමණ මුදලක් ණයට අරගෙන අපි කොහොමද ඒ මුදල් ගෙවන්න හදන්නේ? ක්‍රිකට් ආයතනය මුදල් ගෙවන්න

හදන්නේ ඉදිරියට එන සංචාරවලින්. ඒ කියන්නේ ළමයා හම්බ වෙන්න ඉස්සෙල්ලා අම්මාගේ බඩේ ඉන්න කොට මේ ගොල්ලෝ විකුණලා ඉවරයි. මෙන්න මේ වාගේ තත්ත්වයක් තමයි අද ක්‍රිකට් ආයතනයේ ව්‍යාපාරික මහත්වරු කරන්නේ. ඒ ගොල්ලන්ගේ අම්මාගේ තාත්තාගේ බුද්දලයක් නොවෙයි, අම්මාගේ තාත්තාගේ සල්ලි නොවෙයි, ක්‍රිකට් ක්‍රීඩකයන් නිසා මේ රටට හම්බ වෙන සල්ලි. ඒ නිසා ඒ මුදල් වියදම් කිරීම ගැන මීට වඩා ලොකු සැලකිලිමත්භාවයකින් කටයුතු කරන්න ඕනෑය කියා මා හිතනවා. මට මතකයි 2008 කාලයේ අපි පාසල් ක්‍රිකට් ක්‍රීඩාව දියුණු කරන්න හැදුවා. අවාසනාවකට වාගේ අද ඒක නැවතිලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද තිබෙන අලුත්ම දේ තමයි Sri Lanka Premier League. එක මන්ත්‍රීවරයෙකුත් ඒ ගැන කථා කළා. IPL එක කරපු දේ දැන් අපිත් කරන්න හදනවා. ඒකේ තිබෙන ලස්සනම දේ තමයි ක්‍රිකට් ආයතනය සමර්සෙට් කියන ආයතනය සමඟ ගිවිසුමක් අත්සන් කර ගත්තා. ඒ ගිවිසුම අත්සන් කළේ tender එකක් හරහා කියලා කියනවා. නමුත් එම tender එකට ලියාපදිංචි වෙලා ඉවර වෙලා දවස් දෙකකින් පස්සේ තමයි,-

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! Hon. Member, you have one minute more.

**ගරු අර්ජුන රණතුංග මහතා**
( மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
One minute more? Sir, I was allotted 40 minutes.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
No, you were allotted 20 minutes.

**ගරු අර්ජුන රණතුංග මහතා**
( மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
No, I was allotted 40 minutes.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
A part of that time was taken by the Hon. Anura Kumara Dissanayake.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නැහැ, නැහැ.

**ගරු අර්ජුන රණතුංග මහතා**
( மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
No, that was from the time allotted to the TNA.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
He had taken 20 minutes more than he was allotted.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම පැහැදිලි ලෙසම දැනුම් දීලා තිබුණා මට විනාඩි 20යි; ගරු අර්ජුන රණතුංග මන්ත්‍රීතුමාට විනාඩි 40යි කියලා. මට කොතැනකින්වත් දැනුම් දුන්නේ නැහැ මගේ විනාඩි 20 ඉවරයි කියලා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
We have to finish this Adjournment Motion by 5.30 p.m.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි,- [බාධා කිරීමක්] ආ ඒකට යන්නද? එහෙම නම් කමක් නැහැ. මොකද, මට විනාඩි 20ක් දෙන්නය කියලා මම ලේකම්තුමාට කිව්වා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Right. Hon. Member, you continue with your speech. I can give you two or three minutes more.

**ගරු අර්ජුන රණතුංග මහතා**
( மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
No, no. In that case, - [*Interruption.*] නැහැ. අපට කාලය පැයක් වෙන් කරලා තිබුණා. මේවා ගැන කථා කිරීම වැදගත් නැත්නම් අපි මේ කථා කිරීම නවත්වන්නම්.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The time allotted for the Motion is three hours.

**ගරු අර්ජුන රණතුංග මහතා**
( மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
I do not want to talk for another three minutes. There is no point in talking for three minutes. If I was allotted 40 minutes, then I should get 40 minutes. If you cannot give me that, then why should I talk about this corruption? The Government does not want us to talk about corruption. That is the problem in this country. - [*Interruption.*] No, that is the problem. - [*Interruption.*] Why not?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage )
The Opposition has taken the time.

**ගරු අර්ජුන රණතුංග මහතා**
( மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
No, the Opposition has not taken the time. අපිට තිබුණු- [බාධා කිරීම්]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපිට පැයක කාලයක් වෙන් කරලා තිබුණා. මට විනාඩි 20යි; අර්ජුන රණතුංග මන්ත්‍රීතුමාට විනාඩි 40යි. [බාධා කිරීමක්]

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඒක දුන්නා නම් ඇති.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මම කථා කර ගෙන යනකොට කිසි විටෙකවත් මගේ කාලය අවසන් වූ බවවත්, දැන් කාලය අවසන් වන බවටවත් කිසිම දැනුම් දීමක් කළේ නැහැ.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Anura Dissanayake, you also took 15 minutes more while making your speech.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මම කාලය ගත්තා නම් ඔබතුමන්ලා-

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The Opposition has been given more time. They have been allotted 105 minutes while the Government has been allotted only 75 minutes.

**ගරු අර්ජුන රණතුංග මහතා**
( மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
I do not want to talk about this hereafter because there is no point in talking about this. When you talk about corruption in this country -

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
I can give you five minutes more. Otherwise, I cannot carry on with this.

**ගරු අර්ජුන රණතුංග මහතා**
( மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
I know your problem. The only unfortunate thing is, if I cannot talk -

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Then, what do you expect? Should the Government not answer your questions?

**ගරු අර්ජුන රණතුංග මහතා**
( மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
There is no point in answering the questions.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Then, how can I finish this by 5.30 pm.?

**ගරු අර්ජුන රණතුංග මහතා**
( மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
That is not my problem. When I was allotted 40 minutes, the Secretary-General should know that I should be allotted 40 minutes.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
( மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, it is our time. - [*Interruption.*]

**ගරු අර්ජුන රණතුංග මහතා**
( மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට ඉතින් මොකද ඔබතුමා ක්‍රිකට් ක්‍රීඩාවට එන්නේ lunch ගන්න නේ. ඔබතුමා කෑ ගහන්නේ නැතුව ඉන්න.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, continue with your speech. I can give you five minutes more.

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
ඔබතුමා matchesවලට එන්නේ දවල්ට කන්න විතරයි. මගෙන් ඒ ටික අහ ගන්න එපා. ක්‍රිකට් ක්‍රීඩා කරන කොට ඔබතුමා හැම දාම කෑම කන්න විතරක් එනවා. ඒවා විතරයි හැම දාම කරන්නේ. කරුණාකරලා මෙතැන වාද කරන්න එපා. මේ රටේ ප්‍රධානම ප්‍රශ්නයක් ගැන අපි මේ කථා කරන්නේ. ක්‍රිකට් ක්‍රීඩාව හදා ගන්න අපි මේ ප්‍රශ්නයක් කථා කරන්නේ. තමුන්නාන්සේට අවශ්‍ය නැති දෙයක්. තමුන්නාන්සේ ඉඳ ගන්න. මම එතුමාත් එක්ක ඒක කථා කරන්නම්. [බාධා කිරීම්]

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Azwer, please sit down. Hon. Member, you can continue with your speech.

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට මේ කරුණු ටික කියන්න කාලය නැත්නම්, මම මේ කරුණු කියලා වැඩක්

නැත්නම්, මෙතුමන්ලාට මේ රටේ සිදු වෙලා තිබෙන දූෂණ නවත්වන්න අවශ්‍ය නැත්නම්, අපි මෙතැන ඇවිල්ලා කථා කිරීමෙන් ඵලක් නැහැ. අපි මේ ක්‍රීඩාව හදන්න කියනවා; ක්‍රීඩාවේ තිබෙන ප්‍රශ්න ගැන කථා කරනවා. නමුත් මේ ක්‍රිකට් ආයතනයේ ඉන්න සියලුම දෙනාත් එක්ක මේ විධියට වැඩ කර ගෙන යන්නය කියලා අපි එතුමාට කියලා, එතුමා කැමැති දෙයක් කරන්නම්. අපිට මීට පස්සේ ක්‍රිකට් ක්‍රීඩාවේ දූෂණ ගැන පාර්ලිමේන්තුවේ කථා කරන්නේ නැතුව එළියට ගිහිල්ලා, අන්තිමටම රූපවාහිනිය හරහා කථා කරන්න සිද්ධ වෙනවා. මම හිතුවා අපි මේවා කථා කළ යුත්තේ පාර්ලිමේන්තුවේ; අපි මේවා ගැන පාර්ලිමේන්තුවේදී ඇමතිතුමා දැනුවත් කරන්න ඕනෑ කියලා. නමුත් මේක නම් තත්ත්වය මම මීට වඩා කථා කරන්න අවශ්‍යතාවක් නැහැ. මම තිබෙන documents ටික **table***කරනවා.

Table කරලා වැඩකුත් නැහැ. මොකද, මේවා කවුරුවත් බලන්නේවත් නැහැ. මේ රටේ දූෂණයෙන් වංචාවෙන් පිරිච්ච රාජ්‍යයක් ඇති වේවා! ඒක වෙලා තිබෙනවා. එලෙසම සිද්ධ වේවා කියලා මට- [බාධා කිරීමක්] මම හිතන්නේ ඇමතිතුමාට අවශ්‍ය නැත්නම් මම මීට වඩා කථා කරන එකේ තේරුමක් නැහැ. අපි රූපවාහිනිය හරහා, මේ රටේ මාධ්‍ය හරහා මේවා දැනුවත් කරන්නම්; මේ තිබෙන හොරකම් ඔක්කෝම පිළිබඳව දැනුවත් කරන්නම්. අඩු ගණනේ පාර්ලිමේන්තුවේදීවත් අපට කාලය ලැබෙන්නේ නැත්නම් මාධ්‍ය හරහා රටේ මනුෂ්‍යයන්ව දැනුවත් කිරීමට මගේ යුතුකමක් තිබෙනවා. මම ඉදිරියේදී ඒක කරන බවට පොරොන්දු වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The next speaker is the Hon. Alhaj A.H.M. Azwer. You have five minutes.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Hon. Deputy Chairman of Committees, I was so surprised to hear that a person of the calibre of the Hon. Arjuna Ranatunga speaking in the way he just did, brought credit to the country as a cricketer, but if he would do well to cleanse his heart of malice and hatred, that would do him good. I know his father, the late Hon. Reggie Ranatunga very well. When Arjuna was playing cricket, I used to send his scores across the Floor to his father. At that time, I was responsible in asking the then Speaker, Hon. Anura Bandaranaike to get a television set installed in the restaurant for those people to watch cricket. That much of interest we showed towards cricket. When Arjuna was batting, Sir, I was in the commentary box not only here, even in other countries. I like this game of cricket very much. මම පුදුම වෙනවා. අර්ජුන රණතුංග මන්ත්‍රීතුමා අද කියනවා, බොරු ෂෝක් එක පෙන්වන්නලු පල්ලේකැලේ, සූරියවැව ක්‍රීඩාංගන හැදුවේ කියලා; ප්‍රේමදාස ක්‍රිඩාංගනය නවීකරණය කෙරුවේ කියලා. ප්‍රේමදාස මහත්මයා එම ක්‍රීඩාංගනය හදනකොටත් මේගොල්ලෝ එහෙම තමයි කිව්වේ. නමුත් අද, one of the greatest achievements is the building of the Suriyawewa Stadium. The Suriyawewa International Cricket Stadium is a masterpiece in architecture. What is he speaking today about this? I should remind him that unfortunately he could not win the election that he fought to become the Chairman of the Cricket Board. He got only two votes; not even his own Club, SSC, voted for him. That is your plight. That is your fate. What can we do? You know how very friendly I was with your late father.

Sir, he made a remark about me, which is against the Standing Orders, which I could not hear properly. Please make an order to expunge that from the Hansard.

I was one who was much privileged to watch the First World Cup played at the London Oval in 1975. It was during that match that Dulip Mendis and Sunil Weththamuni got injured.

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
Sir, I rise to a point of Order.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
What is the point of Order?

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
මම ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමාත් එක්කයි කථා කරන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා ගැන යම් කරුණු වගයක් කථා කරනවා, ඒ ගරු මන්ත්‍රීතුමා. එතුමා දැන ගන්නට ඕනෑ ක්‍රිකට් ක්‍රීඩාව හරහා මා කළ දේවල් මා මෙතැන කථා කළා නොවෙයි-[බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. මා point එක කියන්නම්. ඔබතුමාගේ point එක නැති වුණාට මගේ point එක තියෙනවා. ඔබතුමාගේ point නැහැ නේ.[බාධා කිරීමක්] මා ඔබතුමාට කියන්නම්.[බාධා කිරීමක්]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
එදා ඔබතුමා ලංකාවට විශාල ගෞරවයක් ගෙනාවා. ඒ ගෞරවය හැම දාම තියා ගන්න කියලායි මා කියන්නේ.

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
[බාධා කිරීමක්] මා ඒක තියා ගන්නම්. පොඩ්ඩක් මට- [බාධා කිරීමක්]

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! What is the point of Order?

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ point of Order

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු අර්ජුන රණතුංග මහතා]

එක මෙයයි. ඒ ගරු මන්ත්‍රීතුමා හැම දා ම මෙහෙම බාධා කරනකොට එතුමා හැම දාම National List එකෙන් එන්නේ. කවදාවත් දිනලා එන්න බැහැ. මා කියන්නේ අඩු ගණනේ දිනලා ඇවිත් කථා කරන්න කියලායි. මෙතුමාට කවාදාවත් දිනලා එන්න බැහැ.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Okay. That is not a point of Order. Hon. Azwer, you can carry on.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
He is playing foul, Sir, today and it is very unfortunate. I feel sorry for him. He cannot patiently listen. He brought credit to the country, no doubt. But, "cleanse his heart of malice and hatred, that would do him good". That is what I said.

Sir, when I was watching the Sri Lanka-Australia World Cup at the London Oval, with Azahim Mohamed and Amar Kamil Present Special Commissioner of Colombo, Dulip Mendis and Sunil Weththamuni got injured. I have got some very exclusive pictures taken at that time and I think they are not available even in our media offices today. The Hon. Stanley Tillekeratne, the Speaker at that time and the Hon. Minister of Sports, the Hon. K.B. Ratnayake visited the grounds to see that match. You know the interest I have as far as cricket is concerned. Sir, on this occasion, I must pay a tribute to the memory of that great man, the late Hon. Gamini Dissanayake. It is because of his valiant efforts that we were given the ICC status.[බාධා කිරීමක්] මේ වාගේ සෙල්ලම් කරලා. තමුන්නාන්සේලා මොන සෙල්ලම ද දන්නේ? ජේවීපී දන්නේ ගල්කටස් සෙල්ලම විතරයි. තමුන්නාන්සේලා කවදා ද ක්‍රිකට් ගැහුවේ? මිනිස්සු මරන, ඝාතනය කරන සෙල්ලම තමයි ඒගොල්ලන් කෙරුවේ. [බාධා කිරීම්]

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, you have one more minute.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I must allow time for the Hon. Minister to reply. Sir, His Excellency President Mahinda Rajapaksa,will go on record as one President who helped greatly to develop cricket in this country. Three international cricket stadia were built and developed within a short period of time. Suriyawewa was a place where *ganja* plants were grown. The President built one of the most magnificent cricket stadia or the master pieces in the whole world. It is one of the best stadia in the world. You ask from knowledgeable people, even Tony Greig had eloquently praised about the Suriyawewa Stadium, the R. Premadasa Stadium and the Pallekele Stadium. We have produced great men like Muttiah Muralitharan. I pay my tribute today in this House to Kumar Sangakkara and his team for winning the runners-up cup in India. Sir, in cricketing parlance we say, "it is through a whisk that we lost the World Cup this time". The amount of interest the President is showing towards cricket is highly commendable. It is Arjuna Ranatunga who must praise the President, not anyone else because he knows what cricket is. I pay, as I told, our tribute to the late Hon. Gamini Dissanayake. He made us gain the ICC status. We also have produced great men in other sports. Remember, Mr. M.J.M. Lafir, the person who brought the First World Championship to Sri Lanka.

The other day His Excellency the President himself made use of the opportunity at a Group Meeting to pay a compliment to our new Minister of Sports, the Hon. Mahindanada Aluthgamage for all the efforts he had taken to make the World Cup series a great success in our country.

I would once again say that Hashan Tillakaratne must reveal the names of those people whom he says were involved in match-fixing. Otherwise, he will be playing a foul game. If he is clean, why should he hide the names? He is in the dock now. Now, it is the time of our Hon. Minister to speak.

Thank you very much for giving me this opportunity.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා (ක්‍රීඩා අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே - விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Mahindananda Aluthgamage - Minister of Sports )
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ක්‍රීඩා අමාත්‍යාංශය පිළිබඳව අද පැවැත්වෙන විවාදයේදී අවසාන කථාව ගරු අර්ජුන රණතුංග මන්ත්‍රීතුමා කළා. කතාව අවසානයේ එතුමා බොහොම වේදනාවෙන් වාඩි වුණා. එතුමාට උත්තර දෙන්නට මා ද දත කට මැද ගෙන හිටියා. හැබැයි අවාසනාවකට ඔබතුමාගේම පක්ෂය විසින් කරන ලද සංවිධානාත්මක කුමන්ත්‍රණයක් නිසා ඔබතුමාගේ කාලය අඩු වුණා. [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමාට මා කියන්නට ඕනෑ, අපට විනාඩි 75ක් සහ ඔබතුමන්ලාට විනාඩි 105ක් වශයෙන් තමයි කාලය වෙන් වෙලා තිබුණේ කියලා. විපක්ෂයේ විනාඩි 105න් ගරු අනුර කුමාර මන්ත්‍රීතුමා විනාඩි 30ක් කථා කළා; ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා විනාඩි 15යි; ගරු අජිත් පෙරේරා මන්ත්‍රීතුමා විනාඩි 15යි; ගරු සුජීව සේනාසිංහ මන්ත්‍රීතුමා විනාඩි 15යි; ගරු හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා විනාඩි 10යි; ඔබතුමාට විනාඩි 20යි. විනාඩි 105 විපක්ෂයට බෙදී තිබෙන්නේ ඒ ආකාරයටයි. අපට දොස් කියන්නට එපා. තමුන්නාන්සේලාට වෙන් කළ විනාඩි 105 අප දුන්නා. අප කථා කරන්නේ අපට හිමි විනාඩි 75 දීයි ගරු මන්ත්‍රීතුමා. ආණ්ඩුවට - අපට- ඔබතුමා චෝදනාවක් එල්ල කළා, දූෂණ ගැන කථා කරන්නට යන කොට අප නැවැත්වූවාය කියා. පාර්ලිමේන්තුවේ සම්ප්‍රදාය අපට වෙනස් කරන්නට බැහැ. ආණ්ඩු පක්ෂයට විපක්ෂයට හිමි විය යුතු වේලාවල් තිබෙනවා. එම නිසා මන්ත්‍රීතුමා, තමුන්නාන්සේට අසාධාරණයක් වුණා. මොකද, ජනරාල් ඇතුළට ගියාට පස්සේ, තමුන්නාන්සේ තමයි, දැන් ඔය පක්ෂයේ ඉන්න නියෝජ්‍ය නායකයා. තමුන්නාන්සේ තමයි නායකයා වන්නට යන්නේ. ඕකට හය කට්ටියක් ඕක ඇතුළේත් ඉන්නවා. එම නිසා පාර්ලිමේන්තුවේ මේ වෙන කොට තමුන්නාන්සේට ගහනවා. එම නිසා තමුන්නාන්සේ පරිස්සම් වන්න. මේක පිටිපස්සේ ඇත්තේ අර්ජුන රණතුංග ඔය

පක්ෂයෙන් නෙරපීමේ එකක්. එම නිසා කරුණාකර අර පැත්තෙන් ආපසු මෙහාට එන්න. ඔබතුමාගේ පැත්ත මේහේ. ඒක පොඩ්ඩක් කියන්න ඕනෑ. ඔබතුමාගේ පැත්ත මෙහෙ. ඔබතුමාගේ හදවත මෙහෙ. ඔක්කොම මෙහෙ. කරුණාකර ඔය කැපිලි කෙටිලි තැනින් අයින් වෙලා ඔබතුමා මේ පැත්තට එන්න.[බාධා කිරීමක්] ගරු අනුර මන්ත්‍රීතුමා තොප්පිය දා ගත්තා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අදහස් ප්‍රකාශ කිරීම පිළිබඳව විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා සියලු දෙනාටම මා ස්තුතිවන්ත වෙනවා. ඔබතුමන්ලා අපට ගත යුතු දේවලුත් ප්‍රකාශ කළා; වැරදි දේවලුත් කථා කළා. කෙසේ වෙතත් මා මෙම අමාත්‍යාංශය භාර අර ගෙන මාස පහක් හයක් වාගේ පොඩි කාලයක් වෙන්නේ. එම නිසා මහා දස්කම්, මහා ලොකු දේවල් අපට පෙන්වන්නට බැහැ. මාත් මගේ නව ලේකම්තුමාත් ඉතාමත් කෙටි කාලයක් තුළ තමයි මේ අමාත්‍යාංශයේ වැඩ කටයුතු භාර අර ගෙන මේ ගමන ඉදිරියට යන්නේ. මේ අමාත්‍යාංශය භාර ගනිද්දී මෙහි අප ලැබූ ජයග්‍රහණයන් තිබුණා. අප ලැබූ පරාජයන් තිබුණා. අප පිළිගන්නවා. එම නිසා මේ සියල්ල සැලකිල්ලට ගෙන අප වර්ෂ 2018 පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල ඉලක්ක කර ගෙන අප දැන් වැඩ පිළිවෙළක් හදා ක්‍රියාත්මක කර ගෙන යනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මෙම අමාත්‍යාංශය භාර ගන්නකොට අපට අභියෝග කිහිපයක් තිබුණා. එක පැත්තකින් ආසියානු ක්‍රීඩා උළෙලේ ලැබූ අන්ත පරාජය. තව පැත්තකින් ලෝක කුසලානය සඳහා දින කිහිපයයි තිබුණේ. අපට ක්‍රීඩාංගන හදන්න තිබුණා. ඒ එක්කම අනෙකුත් ක්‍රීඩාවල තිබුණ පසු බෑම් සියල්ලත් එක්ක තමයි අපට මේ අමාත්‍යාංශය භාර ගන්නට සිද්ධ වුණේ. අපට මේක මල් යහනාවක දාලා, පාවඩ එලා, ඔටුණු පළන්දලා, රන් රිදීත් එක්ක හම්බු වුණු දෙයක් නොවෙයි. අභියෝගත් එක්කයි හම්බ වුණේ. එම නිසා අපට මේකේ ප්‍රතිඵල පෙන්වන්නට පොඩි කාලයක් දෙන්න. අභියෝගය භාර ගන්න මා ලැහැස්තියි. අතිගරු ජනාධිපතිතුමා ඒ අභියෝගය මට භාර දී තිබෙනවා. මා ඔබතුමන්ලාට කියනවා, එතුමා වග කීමකින් මට ඒ අභියෝගය භාර දී තිබෙනවා කියලා. මේ කාලය තුළ අපේ ලේකම්තුමා, අපේ අමාත්‍යාංශයේ ආයතන ප්‍රධානීන් සියලු දෙනාම එක්කාසු වී ක්‍රීඩාව, ඒ හරි ගමන ගෙන යන්නට කටයුතු කරනවා. ඒ වගකීම අප ගන්නවා. එම නිසා ඔබතුමන්ලා අපට කාලයක් දෙන්න. අපට සහයෝගය දෙන්න. ඔබතුමන්ලා තුළ අප ගැන යම් කිසි විශ්වාසයක් තිබෙනවා කියලා අපට තේරෙනවා. අප ඒ ගැන සතුටු වෙනවා. එම නිසා අපට එම අවස්ථාව දෙන්නය කියන ඉල්ලීම කරනවා.

ඉතාම කෙටි කාලයක් තුළ කළ දේ ගැන කාරණා කිහිපයක් ප්‍රකාශ කරලා මා ප්‍රශ්නවලට උත්තර දෙන්නම්. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අර කිව්වා වාගේ අපට මේ අමාත්‍යාංශය හරි හැටි කරන්න නම්, අපට හරි නිලධාරි පිරිසක් අවශ්‍යව තිබුණා. මොකද අපට මොක කරන්නත් අපට හරි නිලධාරි පිරිසක් හිටියේ නැත්නම් මේ විෂය පිළිබඳ දැනුමක් තිබෙන, මේ විෂය පිළිබඳ අවබෝධයක් තිබෙන වැඩ කරන පිරිසක් හිටියේ නැත්නම් අපට කරන්නට බැහැ. අතිගරු ජනාධිපතිතුමාත් එක්ක සාකච්ඡා කර අමාත්‍යාංශයට වැඩ කරන්නට පුළුවන් දක්ෂ නිලධාරි පිරිසක් අප අමාත්‍යාංශයට යොදවා ගෙන තිබෙනවා.

ඊළඟට ක්‍රීඩාවේ ඉතිහාසය ගැන කියන්න ඕනෑ. කේ.බී. රත්නායක ඇමතිතුමා හදපු ප්‍රතිපත්තිත් එක්ක තමයි අප තවම දුවන්නේ. ක්‍රීඩාවේ විශාල වෙනස් වීම් තිබෙනවා. අප දැන් ක්‍රීඩාව සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්තියක් සකස් කරමින් යනවා. එහි කටයුතු දැන් අවසන් වෙමින් යනවා. ක්‍රීඩාවේ පරාජයන් ලබන්න, ක්‍රීඩාව පසු බෑමට ලක් වන්න බලපෑ හේතු කාරණා ගැන, සංගම්වල තිබෙන අඩු පාඩුකම් ගැන ඔබතුමන්ලා කිව්වා. ඔබතුමන්ලා නඟන මේ සියලු චෝදනාවලට විසඳුම් මේ ජාතික ප්‍රතිපත්තිය තුළ තිබෙනවා. අප ඒක තවත් මාස දෙකක්, තුනක් වාගේ කාලයක් ඇතුළත පාර්ලිමේන්තුවට ගෙනැල්ලා එළි දක්වන්න යනවා. ඒ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම තුළ ගරු මන්ත්‍රීතුමනි, අපට පුළුවන් ක්‍රීඩාව වෙනුවෙන් තීන්දු තීරණ කීපයක් ගන්න.

ක්‍රීඩාංගන ඉදි කිරීම් පිළිබඳව ඔබතුමන්ලා නොයෙකුත් චෝදනා එල්ල කළා. අප ඒ ඉදි කිරීම් කටයුතු භාර දෙන ආයතන ගැන කිව්වා. අතිගරු ජනාධිපතිතුමා සමඟ අප මේ ගැන සාකච්ඡා කළාම එතුමා අපට හොඳ තීන්දුවක් දුන්නා. 2018 දී පැවැත්වෙන පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙලට සමගාමීව ලංකාවේ ක්‍රීඩා පිටි හදන ක්‍රමවේදයක් ක්‍රීඩා අමාත්‍යාංශය හැදුවා ගරු මන්ත්‍රීතුමා. අපි ලංකාවේ පළාත් නවයේ ක්‍රීඩා සංකීර්ණ නවයක් හදනවා. අපේ ලංකාවේ දැනට එහෙම නැහැ. අපට ඒක දැනුණේ කොහොමද? අපි අපේ සුගතදාස ක්‍රීඩාංගනයේ අලුත්වැඩියාවක් කරන්න යනවා මේ අවුරුද්දේ. අලුත්වැඩියාව කරන්න හදන කොට තමයි අපට මතක් වුණේ ඒ ක්‍රීඩාංගනය අලුත්වැඩියා කළොත් ඉදිරියේදී එන ක්‍රීඩා තරග කොහේද තියන්නේ කියන එක. අප ඒ ක්‍රීඩාංගණය අලුත්වැඩියා කරන කොට ප්‍රධාන ජාත්‍යන්තර තරග තියන්න අපට ස්ථානයක් නැහැ. දැන් තමයි අපට ඒක දැනුණේ. ඒ නිසා 2018 දී පැවැත්වෙන පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙලට සමගාමීව අපේ පළාත් නවයේ ක්‍රීඩා සංකීර්ණ නවයක් හැදෙනවා. ගරු මන්ත්‍රීතුමා, ඒ ක්‍රීඩා සංකීර්ණ නවයේ ක්‍රීඩා පිටි දෙක බැගින් ඉදි වෙනවා. එකක්, ක්‍රිකට් ක්‍රීඩා කරන්න. අනෙක් එක මලල ක්‍රීඩා, රගර් සහ අනෙකුත් ක්‍රීඩා කරන්න. Indoor stadium එකක් හැදෙනවා. Swimming pool එකක් හැදෙනවා. ඒ වාගේම restaurant එකක් හැදෙනවා. 200-metre track එකක් හැදෙනවා. අපි ක්‍රීඩා සංකීර්ණ නවයක් හදනවා පළාත් නවයේ. අපි දිස්ත්‍රික්ක 25 ක්‍රීඩා සංකීර්ණ 25ක් හදනවා. අපි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 324 ක්‍රීඩාංගන 324ක් හදනවා. ඔබතුමන්ලාහිතාවි, "ආ, මහින්දානන්ද ඇමතිතුමාත් ගහන්නයි හදන්නේ ලොකු ගැහිල්ලක් ක්‍රීඩාංගන හදලා" කියලා. නැහැ, අපි අලුතෙන් එක ක්‍රීඩා පිටියක්වත් හදන්නේ නැහැ. තිබෙන ක්‍රීඩා පිටි සැලසුමක් ඇතිව හදන එකයි අප කරන්න යන්නේ ගරු මන්ත්‍රීතුමනි. බදුල්ලේ අපේ මන්ත්‍රීතුමා ඉන්නවා. අප බදුල්ල දිස්ත්‍රික්කයෙන් තෝරා ගත්තේ වින්සන්ට් ඩයස් ක්‍රීඩාංගනය. මොකද ක්‍රිකට් පාලක මණ්ඩලයෙන් ඒ ක්‍රීඩා පිටිය හදලා ඉවරයි. අප කරන්නේ ඉතිරි ටික හදලා අවශ්‍ය පහසුකම් ටික දෙන එකයි. අපි ලබන මාසයේ මුල් ගල තියනවා උතුරු පළාතේ කිලිනොච්චියේදි පළමුවන ක්‍රීඩා සංකීර්ණයට. අපි මේ අවුරුද්දේ ක්‍රීඩා සංකීර්ණ හතරක් හදනවා. ඒ, මධ්‍යම පළාතේ, ඌව පළාතේ, උතුරු පළාතේ කිලිනොච්චියේ සහ උතුරු මැද පළාතේ අනුරාධපුරයේ. මේ පළාත් හතරේ ක්‍රීඩා සංකීර්ණ හදනවා. ගරු අර්ජුන රණතුංග මන්ත්‍රීතුමනි, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ක්‍රීඩා පිටි හදලා අප බලාපොරොත්තු වන්නේ, අප අරමුණු කරන්නේ ඒ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක්ම ක්‍රීඩා සමාජයක් කරන්නයි. ඒ ක්‍රීඩා සමාජයේ සභාපති වන්නේ ප්‍රාදේශීය ලේකම්තුමා. එහි ලේකම් වන්නේ ක්‍රීඩා නිලධාරියා. ක්‍රීඩාව නංවන්න නම්, ක්‍රීඩාවේ ජයග්‍රහණ ලබන්න නම් අපි ක්‍රීඩාව ගමට ගෙන යන්න ඕනෑ. අද හැම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම රගර් ගහන්නේ නැහැ. ක්‍රීඩා සංගම් 52න් අද රගර් ගහන්නේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තිස් ගණනකයි. අද හොකී ගහන්නේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස විසි ගණනකයි. අද ගමේ තිබෙන්නේ වොලි බෝල්, ෆුට් බෝල් සහ ක්‍රිකට් විතරයි. අපි ක්‍රීඩාව ගමට ගෙන යන්න ඕනෑ. ගරු මන්ත්‍රීතුමනි, අපි ඔබතුමාට කියන්නම් කාරණයක්. අප පසු ගිය කාලයේ කරපු වැඩ පිළිවෙළක් නිසා අද අපි netball team එකක් අලුතින් හදලා තිබෙනවා. අපි පුහුණුව සඳහා ඔවුන් යැව්වා විදේශ රටකට. පළමුවැනි වතාවට six-footersලා හය දෙනෙක් අප ගාව ඉන්නවා. එයින් තුන් දෙනෙක්, 6'2", 6'3", 6'4"යි. අපට ඒ අය හම්බ වුණා පළමුවැනි වතාවට. අපි ගමට ගියා. ඒ ළමයි ඔක්කෝම ගමේ අහිංසක දරුවෝ. මේ netball team එකේ දැන් six-footersලා ඉන්නවා. අපි ඔබතුමන්ලාට කියනවා තව අවුරුදු තුන හතරක් යන කොට අපේ netball team එකට ලෝකයේ පස්වැනි හෝ හයවැනි ස්ථානයට එන්න පුළුවන් බව. ගරු

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

මන්ත්‍රීතුමනි, මේක කරන්න නම් අප ක්‍රීඩාව ගමට ගෙන යන්න ඕනෑ. අපි දැන් යටිතල පහසුකම් ටික දෙනවා. අපේ දරුවන් දුවන්නේ ගමේදි ලබපු හැකියාවට. හැබැයි ජාත්‍යන්තරයට ගියාම ඒ දරුවන් දුවන්නේ තාක්ෂණයත් එක්කයි. අපට තාක්ෂණය නැහැ. අපට විදේශීය පුහුණුකරුවෝ නැහැ. ගරු මන්ත්‍රීතුමා, අපි ක්‍රීඩා සංගම් 52 "ඒ", "බී", "සී" කියලා වර්ගීකරණයක් කළා. අපට ජාත්‍යන්තරයට ගිහිල්ලා දිනන්න පුළුවන් ක්‍රීඩා 17ක් අපි තෝරා ගත්තා. ඒ ක්‍රීඩා 17ට අවශ්‍ය පුහුණුව ලබා දීලා, ක්‍රීඩා පිටි දීලා, විදේශීය පුහුණුකරුවන් ගෙනැල්ලා,ගමට ක්‍රීඩාව ගෙනියලා ක්‍රීඩාව නියමිත ඉලක්කය කරා ගෙන යන්න අපි මේ වන කොට කටයුතු යොදලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. ක්‍රීඩාව සම්බන්ධයෙන් අමාත්‍යාංශ හතරක් වැඩ කරනවා. උසස් අධ්‍යාපන අමාත්‍යාංශයත් ක්‍රීඩාව සම්බන්ධව කටයුතු කරනවා. ක්‍රීඩා අමාත්‍යාංශයත් ක්‍රීඩා කටයුතු කරනවා, තරුණ කටයුතු අමාත්‍යාංශයත් කටයුතු කරනවා, අධ්‍යාපන අමාත්‍යාංශයත් කටයුතු කරනවා. මේ හතර හතර විධියකටයි ක්‍රීඩාව සම්බන්ධයෙන් කටයුතු කළේ. පළමුවැනි වතාවට-

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මහවැලිය.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මහවැලියත් කරනවා. බොහොම ස්තුතියි. අපි ඒකත් සම්බන්ධ කර ගන්නම්. ඔබතුමාට බොහොම ස්තුතියි ඒක කිව්වාට. මේ අමාත්‍යාංශ හතරේ ඇමතිවරු හතර දෙනා එකට එක්කාසු වෙලා තීන්දුවක් ගත්තා, "අපි ක්‍රීඩාව සම්බන්ධයෙන් එකට තීරණ ගන්නේ" කියලා. ගරු මන්ත්‍රීතුමනි, ඒ එකඟත්වයේ ප්‍රතිඵලයක් හැටියට විශේෂ කටයුත්තක් කරන්න අපි බලාපොරොත්තු වෙනවා. මේ අවුරුද්දේ ඒක කරන්න අපට බැරි වේවි. අපි ලබන අවුරුද්දේ ඉඳලා ඒක කරන්න බලාපොරොත්තු වෙනවා. අවුරුද්දකට ශිෂ්‍යත්ව විභාගයට ඉඳ ගන්නවා තුන්ලක්ෂ විසිදාහක් දරුවෝ. අපි මේ හැම දරුවකුම වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනවා. ශිෂ්‍යත්ව සහතිකයත් එක්ක අපි දෙමවුපියන්ට සහතිකයක් දෙනවා තමන්ගේ දරුවා මොන ක්‍රීඩාවට ද දක්ෂ කියලා. අපි එහෙම කරන්න බලාපොරොත්තු වෙනවා. අවුරුදු 13න් පහළ තරගකාරී ක්‍රීඩා නවත්වන්න අපි තීරණයක් අර ගෙන තිබෙනවා. අපි ඒ ගැන සාකච්ඡා කර ගෙන යනවා. අද පුහුණුවක් නැති මිනිසුන් පුහුණුකරුවන් යැයි කියා ගෙන කුඩා දරුවන් - අවුරුදු 8, 9 දරුවන්- ගෙනැල්ලා ඒ දරුවන්ට අනවශ්‍ය විධියේ ව්‍යායාම පුරුදු කරවනවා. එතකොට තමන්ගේ හැකියාව පෙන්වන්න ඒ දරුවන්ට ලැබෙන්නේ නැහැ. ගරු මන්ත්‍රීවරයෙක් කිව්වා හොඳම දක්ෂතා පෙන්වන්න පුළුවන් වන්නේ අවුරුදු 15, 18, 19 වුණාට පස්සේ කියලා. හැබැයි පොඩි කාලයේදීම ඒ දරුවන්ගෙන් ගන්න ඕනෑ දේට වැඩි දේ අර ගන්නවා. ඒ නිසා තමන්ගේ දක්ෂතා හොඳින්ම පෙන්නුම් කරන්න පුළුවන් කාලය වන කොට ඒ අයගේ සාරය සියල්ල උරා බීලා ඉවරයි. ඉස්සර 13න් පහළ තරග සඳහා මිත්‍රශීලිවයි ක්‍රීඩා කළේ. දැන් මේ පුංචි දරුවාට වෛරය, ක්‍රෝධය කියන බරපතළ ප්‍රශ්න ගොඩක් තිබෙනවා. අපට විදුහල්වලින් ඉල්ලීම් ඇවිල්ලා තිබෙනවා; දෙමවුපියන්ගෙන් ඉල්ලීම් ඇවිල්ලා තිබෙනවා. අපි ඒ පිළිබඳව අවධානය යොමු කරලායි තිබෙන්නේ. ඒ වාගේම ඔබතුමා දන්නවා ජාත්‍යන්තරයට ක්‍රීඩාව ගෙන යන්න නම් පාසලෙන් තමයි දරුවා හදා ගන්න ඕනෑ කියා. පාසල්වල ඉන්නවා ක්‍රීඩා ගුරුවරු 2,800ක්. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, ඒ අයගෙන් සියයට 70ක් උගන්වන්නේ බුද්ධාගම, සිංහල සහ ඉංග්‍රීසි කියන විෂයයන්. මේ ගොල්ලන් ලස්සනට අත් දිග කමීසයක් ඇඳලා පාසලට එනවා. මේ ගොල්ලන් වෙනත් විෂයනුයි උගන්වන්නේ. මේ ගොල්ලන් ක්‍රීඩාව උගන්වන්නේ නැහැ. අපි ඇමතිතුමාත් එක්ක එකඟතාවකට ආවා මේ සියලු දෙනාට සපත්තු දෙකක්, track bottom එකක්, T-shirt එකක් ඇඳලා මේ අයව ක්‍රීඩාව පමණක් උගන්වන්න යොමු කරමු කියලා. මේ අය දවල් 12ට ඉස්කෝලෙට ඇවිත් හවස 6 වෙන කල් තම රාජකාරිය කරන්න ඕනෑ. ලංකාවේ ක්‍රීඩා පාසල් 25ම අපි දැන් නවීකරණය කරලා, අවශ්‍ය පහසුකම් දීලා වැඩ කටයුතු පටන් ගත්තා. ගරු මන්ත්‍රීතුමනි, මේ මාස 4ක කාලය තුළ අපි ගොඩාක් දේවල් කළා. මේකේ ප්‍රතිඵල ඉදිරි කාලයේ තමුන්නාන්සේලාට දැක ගන්න ලැබෙයි.

මම ඊ ළඟට මගේ ප්‍රශ්න ටිකට උත්තර දෙන්නම්. ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා පොදු රාජ්‍ය මණ්ඩලීය ලංසුව පිළිබඳව කිව්වා. මම ඔබතුමාට මේ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. අපි මේ ගැන web එකේ දැම්මා මේ සඳහා ඕනෑම කෙනෙකුට ඉල්ලුම් කරන්න පුළුවන් කියලා. ගරු මන්ත්‍රීතුමනි, ඒ අනුව ආයතන පහක් මේකට ඉල්ලුම් කළා. මේ ආයතන පහට අපි දුන්නා ලංකාවට ඇවිල්ලා presentations කරන්න කියලා. ඒ අනුව presentations කළාට පස්සේ අපි ඒ ගොල්ලන්ට කිව්වා quotations එවන්න කියලා. ඒ කරපු presentationsවලින් ඒ දාපු quotations වලින් අවමය ආපු ලංසුවට තමයි අපි මේක ලබා දීලා තිබෙන්නේ. ඔබතුමා කිව්වා පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙලය කියලා කියන්නේ ඔලිම්පික් ක්‍රීඩාවට නොදෙවැනි ක්‍රීඩා උළෙලක්ය කියා. මේක විශාල වියදමක් දරලා කරන විශාල උත්සවයක්. ඒකට දාපු ඒ මුදල ගැන ඔබතුමා කිව්වා. අපට මේ bid book එක හදන්න හැකියාවක් නැහැ. අපට අනිවාර්යයෙන් අවශ්‍යයි මෙවැනි දෙයක් කරන්න දන්නා කෙනෙක්. අපට උපදේශකයෙක් -consultant කෙනෙක්- අවශ්‍යයි. මෙතැන කිසිදු වංචාවක් වෙලා නැහැ. ඔබතුමා කිව්වා නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා මේ PMP Legacy කියන සමාගමේ සභාපති හැටියට-

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
සභාපති නොවෙයි, හදපු කොළේ -

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
හදපු කොළේ. ගරු මන්ත්‍රීතුමනි, ඒක මටත් ආවා. ඒක සම්පූර්ණ වැරදි කොළයක්. නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා එංගලන්තයේ කිසිදු ආයතනයක එහෙම තනතුරක් දරන්නේ නැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මම කියන්නේ ඒ ආයතනයේ සභාපති නොවෙයි. මේ සඳහා ඒ ගොල්ලන් යෝජනා කරන ආයතන ව්‍යූහයක් තිබෙනවා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඒකේ සභාපති හැටියට මෙතුමා පත් කරලා තිබුණා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ඒ ආයතන ව්‍යුහයේ සභාපති ධුරයට මෙතුමා පත් කරනවා කියලා තිබුණා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු මන්ත්‍රීතුමනි, ඒක සම්පූර්ණ වැරැදියි. ඒ කළු කොළය මටත් ආවා. ඒක සම්පූර්ණ වැරැදියි. එහෙම කිසිම document එකක් ඇවිල්ලා නැහැ. ඒක සම්පූර්ණ වැරැදියි. මට වෙලාව නැති නිසා මම ඔබතුමාට ඒ සම්බන්ධව වග කීමකින් හා ඉතාම කෙටියෙන් කියනවා. අපි 2018 පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙලට මැලේසියාවට ගිය වෙලාවේ මහතීර් මොහොමඩ් මහත්මයාගේ පොතක් හම්බ වුණා. මට වෙලාව නැහැ, මේකේ පිටු 4ක්, 5ක් කියවන්න. එතුමා ලියා තිබෙනවා 1998 දී මැලේසියාවේ වෙච්ච පරිවර්තනය පිළිබඳව. එතුමා ඒ ගැන කියන්නේ මැලේසියාවේ තිබුණු economic crisis එකත් එක්ක සම්බන්ධ කරලායි. එතුමා මේ පොතේ කියනවා පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල මැලේසියාවට ලැබීමෙන් තමයි ඒ රටේ සංවර්ධන ගමනේ ආරම්භය ඇති වුණේ කියලා. මේ මහතීර් මොහොමඩ් මැතිතුමා කියපු කථාවක්. ඒ නිසා කරුණාකරලා පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල හෑල්ලුවකට ලක් කරන්න එපා. මම අහ ගෙන හිටියා ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමාගේ කථාව. එතුමා ඇහුවා පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල හම්බන්තොට කොහේද කරන්නේ කියලා. මේ පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල ලංසුව ඉදිරිපත් කරන්න අපි මැලේසියාවට ගියා. අපිත් එක්ක සටන් කරන්නේ ඕස්ට්‍රේලියාවයි. එදා මැලේසියාවත් එක්ක තරග කළෙත් ඕස්ට්‍රේලියාවයි. එදා මැලේසියාවට හිනා වුණා. 1998 පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙලට 1992 දී මහතීර් මොහොමඩ් මැතිතුමා ඒ ගොල්ලන්ගේ රට bid කරන කොට හිනා වුණා. මැලේසියාව සංචාරකයන් ගෙන්න ගන්න කරන උත්සාහයක් කියලා කිව්වා. ඒ දේශගුණයේ ඒ දරුවන්ට සෙල්ලම් කරන්න බැහැ කියලා කිව්වා. හැබැයි, මැලේසියාව මේ bid එක දිනා ගත්තා. ඒ නිසා අපි ඔබතුමාට කියන්න ඕනෑ කාරණයක් තිබෙනවා. අපි මැලේසියාවට ගිහිල්ලා මේ bid එක ඉදිරිපත් කරන අවස්ථාවේ ඕස්ට්‍රේලියාවේ ඒ ප්‍රදේශයේ හිටපු අගමැතිවරියයි ආවේ. ඇයගේ පිටි පස්සේ හිටියේ අපේ නියෝජිත මහත්වරු. අපේ presentations කරලා ඉවර වෙච්ච ගමන් ඇය තම නියෝජිතයාට කිව්වා, "ලංකාව හැල්ලුවට ගණන් ගන්න එපා කියලා මම ඔබට කිව්වා නේ" කියා. ඒ කියන්නේ අපි ඉතාම හොඳ presentation එකක් කළා. දැන් මේ වන කොට අපේ bid එකට එකඟ වෙලා තිබෙනවා. ඒ සඳහා විදේශිකයන් ජූනි මාසයේ ලංකාවට එනවා. අපේ ස්ථාන බලනවා. අපට දැඩි විශ්වාසයක් තිබෙනවා මේ පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල ශ්‍රී ලංකාවට ලබා ගන්න පුළුවන් වෙයි කියලා. අපි ඔබතුමාන්ලාට වග කීමෙන් කියනවා අපි එල්ටීටීඊ සංවිධානය පරාජය කරලා යුද ජයග්‍රහණය ලැබුවා වාගේම මේ රටේ ඒ ක්‍රීඩා උළෙල තියන්න අපට පුළුවන් වෙලා, මේ පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල පැවැත් වූවායින් පස්සේ මේ රටේ ආර්ථිකයේ මහා විප්ලවීය වෙනසක් ඇති වෙනවාය කියලා.

ක්‍රිකට් තරග TV ගනුදෙනුවක් පිළිබඳව අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා කිව්වා. මේ පිළිබඳව දිගින් දිගටම මගේ මිත්‍ර අර්ජුන රණතුංග මන්ත්‍රීතුමා කථා කළා. මගේ අමාත්‍යාංශයට ඇවිල්ලා එතුමා මට ෆයිල් ගොඩාක් භාර දුන්නා. මම ක්‍රීඩා ඇමතිවරයා වෙනකොට එතුමා මගේ හොඳ මිත්‍රයෙක්. අපට වැඩියේ මගේ පියා යි, එතුමාගේ පියා යි හොඳ මිත්‍රයෝ. අපේ දෙමවුපියන්ගේ තිබෙන මිත්‍රකම තමයි දරුවන්ටත් ගිහිල්ලා තිබෙන්නේ. ඉතින් ඒ නිසා එතුමා ඒ පැත්තේ සිටියත් අපි හොඳ ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයෝ. අපි ගමේ හැදුණු හොඳ ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයෝ. ඒ හිත මිත්‍රකම තමයි දෙපැත්තේ සිටියත් තවමත් අපි අතර තිබෙන්නේ. මම ක්‍රීඩා ඇමතිවරයා වුණාම අර්ජුන රණතුංග මන්ත්‍රීතුමාට කිව්වා, "ඔබතුමා මේ ක්‍රීඩාවට මෙහෙම කරන්න එපා. ඔබතුමා රූපවාහිනී වැඩසටහන්වලට ගිහින් කථා කරනවා. එහෙම කරන්න එපා, ඔබතුමා මාව විශ්වාස කරලා ඒ කරුණු සියල්ල දෙන්න. මම මේ ගැන සොයා බලා සාධාරණයක් කරන්නම්." කියලා. එතුමා මහත්මයෙක් වාගේ බොහොම හොඳින් ඒක පිළිගෙන, මගේ අමාත්‍යාංශයට ඇවිත් ඒ ටික භාර දුන්නා. එතුමා ඒක භාර දුන්නු දවසේම මම ඒ පිළිබඳව කමිටුවක් පත් කළා. විශ්‍රාමලත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු බාලපටබැඳි මහත්මයාගේ ප්‍රධානත්වයෙන් මම කමිටුවක් පත් කළා. කමිටුවක් පත් කරලා අපි ගරු මන්ත්‍රීතුමාට යැව්වා, මේකට උත්තර එවන්නය කියලා. අවාසනාවකට ඒ වනකොට එතුමා ලෝක කුසලාන ක්‍රිකට් තරගය සඳහා ඉන්දියාවට ගිහින් සිටියේ. අපි එතුමාට ලිඛිතව ලියුම් තුනක් යැව්වා. මොකද එතුමාගේ ඉල්ලීම මත අපි මේ කමිටුව පත් කළේ. නමුත් එතුමා ආවේ නැහැ. පසුව එතුමා අපට කිව්වා, "මම විදේශගත වෙලා සිටියේ" කියලා. නමුත් එතුමාට අපි ආපහු ලියුම් යැව්වා. එතුමා පිටු හතරකින් යුක්ත ලිඛිත සාක්ෂියක් මේ කමිටුවට එවා තිබෙනවා. එතුමා කමිටුවට සහභාගි වෙලා නැහැ. අපට ලිඛිත සාක්ෂි එවා තිබෙනවා. දැන් මේ පැමිණිල්ල පිළිබඳ පරීක්ෂණ පවත්වනවා. විශ්‍රාමලත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරයකුගේ ප්‍රධානත්වයෙන් අපි කමිටුවක් පත් කර තිබෙනවා. මේ ගනුදෙනු සම්බන්ධයෙන් එම කමිටුව විසින් යම් කිසි කෙනෙක් වැරැදි කරලා තිබෙනවාය කියලා, යම් කිසි තීන්දුවක් දුන්නොත් එයාට තරාතිරම නොබලා අවශ්‍ය දඬුවම් ලබා දෙනවාය කියන එක ගරු මන්ත්‍රීතුමාට අපි කියනවා. එතුමා කිව්වා, මේ පාර්ලිමේන්තුවේ කථා කරන්න බැරි නම් ගිහින් රූපවාහිනිවල කථා කරනවා කියලා. මා වැඳලා කියන්නම්, රූපවාහිනීවලට ගිහිල්ලා තනියම ගල් ගහන්න එපා. දැන් පෙනෙනවා නේ, හෂාන් තිලකරත්න පළාත් සභා මන්ත්‍රීතුමාට මොකද වුණේ? දැන් සොයා ගන්න බැහැ. හැංහෙන්න බිංගෙවල් නැහැ. දැන් හෂාන් තිලකරත්නට හැංහෙන්න බිංගෙවල් නැහැ. එතුමාගේ බිරිඳට කථා කළාම කියනවා, මහත්තයාට ප්‍රෙෂර් වැඩි වෙලා කියලා. දැන් එතුමා කියනවා, match fixing කියලා.

ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා කියනවා, ක්‍රිකට් ක්‍රීඩාව වැටිලා කියලා. කවුද කියන්නේ ක්‍රිකට් ක්‍රීඩාව වැටිලා කියලා? ඔබතුමා ඔප්පු කරන්න. ක්‍රිකට් ක්‍රීඩාව වැටිලා නැහැ කියා මම ඔබතුමාට වග කීමකින් කියනවා. අර්ජුන රණතුංග මන්ත්‍රීතුමාත් කිව්වා, ක්‍රිකට් වැටිලා නැහැ කියලා. එක් දින තරගවලින් අද අපි ලෝකයේ දෙවන තැනට ඇවිල්ලා ඉන්නවා. වෙන මොනවාද? අපි World Cup එකේදි semi-final ආවා. අද පිතිකරුවන්ගේ ශ්‍රේණියේ කුමාර් සංගක්කාර උඩට ඇවිල්ලා ඉන්නවා. අද මුත්තයියා මුරලිදරන් spinnersලාගේ උඩටම ඇවිල්ලා ඉන්නවා. කොහේද අපි වැටිලා තිබෙන්නේ? අපේ ක්‍රිකට් ක්‍රීඩාවේ කිසිම වැටිල්ලක් නැහැ. හැබැයි අර්ජුන මන්ත්‍රීතුමා හොඳ කථාවක් කිව්වා. පහළ කණ්ඩායම ගැන එතුමා කිව්වා. මම එතුමාත් එක්ක එකඟයි. මේ ගහන කට්ටිය ගහලා යයි; ඊළඟට ක්‍රිකට්වලට මොකද වෙන්නේ කියන එක අර්ජුන මන්ත්‍රීතුමා ඇහුවා. මම ඒකට එකඟයි. ක්‍රීඩාව අපි ගමට ගෙන යන්නට ඕනෑ. පසු ගිය කාලයේ - මන්ත්‍රීතුමා සිටි කාලයේ- මේ රටේ ක්‍රිකට් ගැහුවේ ඉස්කෝල 310යි. දැන් ඉස්කෝල 525ක් ක්‍රිකට් ගහනවා, ගරු මන්ත්‍රීතුමනි.

මා පසු ගිය දවසේ මුලතිව් ගියා. අපේ සභාපතිතුමා දැඩි උනන්දුවක් දක්වනවා, මේ පාසල් ක්‍රිකට් ක්‍රීඩාව දියුණු කරන්න. එතුමා ඒ ගැන ලොකු උනන්දුවක් දක්වනවා. අපි මුලතිව්, වවුනියාව, කිලිනොච්චිය, යාපනය, මන්නාරම යන මේ දිස්ත්‍රික්ක පහේ පාසල්වලින් ගෙනැල්ලා වෙනම උතුරේ ක්‍රිකට් නංවන වැඩ පිළිවෙළක් අපි හදා ගෙන යනවා. ඒ නිසා ඔබතුමා කියන එකත් එක්ක මමත් එකඟයි ගරු මන්ත්‍රීතුමනි. ඊළඟ පෙළ අපි හදා ගන්නට ඕනෑ. ඒ නිසා අපි පැහැදිලිව ඔබතුමාට කියනවා, අපි

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

